1. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මේ වන විට නිලධාරින් 07 ක් හා සෙසුනිලයින් 21 ගෙන් සමන්විතය. පහත නම් සඳහන් මනෝවිද්‍යා අංශයන් හා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව ඉලක්ක ගත අයවළුන් සඳහා දැනුවත් කිරිමේ වැඩසටහන් විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍යයන් හරහා සිදුකරනු ලබයි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීනව යුද හමුදා සාමාජිකයින්ගේ චිත්ත ධෛර්යය නැංවීමේ මනෝවිද්‍යාත්මක මෙහෙයුම් සිදුකරයි. එමෙන්ම රණවිරුවා මාසික සඟරාව පළකිරිම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් වේ. නිලධාරින් හා සෙසුනිලයින් සඳහා මනෝවිද්‍යා මෙහෙයුම් පාඨමාලා, සිවිල් සම්බන්ධීකරණ පාඨමාලා - නිලධාරි, ත්‍රිවිධ හමුදා නිලධාරි හා සෙසුනිලයින් වෙනුවෙන් මානසික හා ශාරිරික සංවර්ධනය සඳහා වූ භාවනා වැඩසටහන් අනුරාධපුර, කොස්ගම හා කදුබොඩ ස්ථානයන් හි පැවැත්වීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් අතර වේ. ආරක්ෂක මූලස්ථාන යටතේ ඇති මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අංශයන් පහත සඳහන් පරිදිවේ:

අ. <u>ආරක්ෂක සේනා මූලස්ථාන</u>

(1) ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය)
(2) ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි)
(3) ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)
(4) ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි)

ආ. <u>සේනාංක මූලස්ථානය</u>

(1) 22 සේනාංකය
(2) 23 සේනාංකය
(3) 51 සේනාංකය
(4) 52 සේනාංකය
(5) 53 සේනාංකය
(6) 56 සේනාංකය

### කාර්‍යභාරය

2. මනෝ විද්‍යාත්මක මෙහෙයුම් උපාය මාර්ග පිලිබඳව සැලසුම් හා සම්බන්ධිකරණය කිරිම හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මනෝ විද්‍යාත්මක මෙහෙයුම් දියත් කිරිම ප්‍රධාන වගකීම වේ.

### වගකීම්

3. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම් පහත සඳහන් පරිදි වේ.

අ. සිවිල් ජනතාවගේ විශ්වාසය දිනාගැනීම හා සහයෝගය ලබාගැනීම තුලින් සිවිල් ජනතාව සතුරා කෙරෙහි නැඹුරුවීම වලක්වාලීම සඳහා වූ අධීක්ෂණාත්මක ක්‍රියාවලින් සිදුකිරිම.

ආ. සතුරාගේ චිත්ත ධෛර්ය පහත් මට්ටමකට ගෙන ඒම තුලින් ඔවුන් යුද හමුදාව වෙත යටත් වීම හා සතුරු පක්ෂය හැර යාමට කටයුතු සිදුකිරිම.

ඇ. යුද්ධ හමුදා සමාජිකයන්ගේ චිත්ත ධෛර්ය නැංවීම.

<u>**කාර්ය භාරයන්**</u>

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

අ. මනෝවිද්‍යා මෙහෙයුම් ප්‍රතිපත්ති සකස් කිරිම.

ආ. උපරිම ප්‍රතිඵල ලගාකරවනු වස් සේනාංක/බලසේනාවන්ට අයත් ඒකක/උප ඒකක හා මනෝවිද්‍යා මෙහෙයුම් අංශයන්හි මනෝවිද්‍යා මෙහෙයුම් කාර්‍යක්‍ෂම කිරිම හා කළමණාකරණය.

ඇ. සතුරු පක්‍ෂය ඉලක්ක කරගත් මනෝවිද්‍යා මෙහෙයුම් දියත් කිරිම.

ඈ. සතුරාගේ මනොවිද්‍යා මෙහෙයුම් වලට විරුද්ධව කටයුතු කිරිම, ඔවුන්ගේ ප්‍රචාරයන් හා නොමග යවන ආකාරයේ ක්‍රියාකාරකම් නිෂේධ කිරිම ඇතුළු ප්‍රති මනෝවිද්‍යා මෙහෙයුම් ක්‍රියාත්මක කිරිම.

ඉ. යුද හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධතාවයෙන් සමීක්ෂණයන් බලාත්මක කිරිම.

ඊ. හමුදාවේ සාමාජිකයින් දිරිමත් කිරිම, ඔහුගේ මානසික මට්ටම හදිසි අවස්ථාවන්ට මුහුණදීම සහ ඔවුන්ගේ සටන් ක්‍රියාවලිය පවත්වා ගැනීමට හමුදාව සම්පූර්ණයෙන් කාර්යශූර ලෙස තබා ගැනිම.

උ. හමුදාවේ ඇති මනෝමය මෙහෙයුම් වල ඇති සියලුම ක්‍රියාකාරකම්, ජාතික ප්‍රතිපත්ති රාමුවන් තුල සිට වැඩ කිරිමට හැකිවන පරිදි සැලසුම් කිරිම.

<u>**වාර්ෂික සමාලෝචනය**</u>

5. ලොව පුරා යුද හමුදා මනෝවිද්‍යා ක්‍රියාන්විතයන් පිලිගනු ලබන්නේ සතුරට විරුද්ධව ඇති කාර්යක්ෂම ආයුධයක් වශයෙනි. ඉදිරි බලඇණියන් විසින් පාවිච්චි කරන ආධාරක අවි වැනි විවිධ අංගයන් අතර, ආධාරකයන් ලෙස මනෝවිද්‍යාත්මක මෙහෙයුම් ද භාවිතා කරයි. මේ තත්වය තුල ඉදිරි මූල අණදෙන්නන් මනෝවිද්‍යා මෙහයුම්, ක්‍රියාකාරකම් හා පුද්ගලයින් වැඩිකිරිම කෙරෙහි අවධානය යොමු කර ඇත. එම නිසා අතිරේක මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය තුලින් වඩා කාර්‍යක්‍ෂම ලෙස මනෝවිද්‍යා මෙහෙයුම් ක්‍රියාවට නැංවිය හැක.

<u>**කාර්ය සිද්ධින්**</u>

6. <u>මනෝවිද්‍යා ක්‍රියන්විත</u>. මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩය හා මනෝවිද්‍යා අංශයන් එක්ව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ උතුරු නැගෙනහිර සාමාන්‍ය ජනතාව හා එම ප්‍රදේශවල ස්ථානගත හඨපිරිස් ඉලක්ක කොට කාර්‍යක්‍ෂම මනෝවිද්‍යා මෙහෙයුම් දියත් කරන ලදි. අවස්ථානුකූලව ත්‍රෛයිභාෂා පෝස්ටර් හා අත් පත්‍රිකා මගින් ඉලක්කගත ජනකොටස් දැනුවත් කිරිම මෙන්ම පලාලි සම්පේක්ෂණාගාර මගින් දෛනික ප්‍රවෘත්ති විකාශය කිරිම වැනි දේ සිදුකරන ලදි.

7. <u>රණවිරුවා සගරාව මුද්‍රණය කිරිම</u>. රණවිරුවා සගරාව මුද්‍රණය හා බෙදාහැරිම ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වන්නේ මාසිකව රණවිරුවා සගරාව නිර්මාණය කිරිම සංස්කරණය කිරිම, මුද්‍රණය කිරිම හා බෙදා හැරිමයි. පිටපත් **9000** ක් මාසිකව මුද්‍රණය කෙරේ.

8. <u>භාවනා වැඩසටහන්</u>. දශක තුනක් පුරා පැවති කුරිරු යුද්ධය තුරන් කිරීමට ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සුවිශේෂී මෙහෙවරක් ඉටුකරන ලදී. එම ලබාගත් විජයග්‍රහණය හා ලද සාමය බුක්ති විඳින ජනතාවගේ ගෞරවයට රණවිරුවන් පාත්‍ර විය. මෙලෙස ගෞරවයට පත් රණවිරුවන්ගෙන් සුළුතර පිරිසක් නීතිමය නොවන ක්‍රියාකාරකම් වල යෙදී සන්නද්ධ අංශයන් හි කීර්තියට හානිවන ලෙස ක්‍රියා කරයි. මෙම ක්‍රියාදාමයන් හි අගෞරවය ඉඳුරාම සමස්ත ශ්‍රී ලංකා යුද හමුදාව වෙතම බලපායි. දීර්ඝකාලීනව සන්නද්ධ අරගලයකට මැදිවූ සොල්දාදුවන්ගේ මානසික මට්ටම තේරුම්ගෙන ඉහත ක්‍රියාකාරකම් සඳහා පිළියමක් ලෙස භාවනා වැඩසටහනක අවශ්‍යතාවය ඉස්මතු විය. මෙම සංදර්භය තුළ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත පහත භාවනා මධ්‍යස්ථාන තුළදී භාවනා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

අ. ධම්ම අනුරාධා භාවනා මධ්‍යස්ථානය - අනුරාධපුරය

ආ. ධම්ම සෝභා භාවනා මධ්‍යස්ථානය - කොස්ගම

ඇ. විපස්සනා භාවනා මධ්‍යස්ථානය - කඳුබොඩ

**<u>පුහුණුවීම්</u>**

9. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිලධාරින් සහ සෙසුනිලයින් සඳහා **2013** වර්ෂයේ පවත්වන ලද පාඨමාලාවන් පහත සඳහන් පරිදි වේ.

අ. <u>2013 වසර තුළදී නිලධාරින් සඳහා පවත්වන ලද පාඨමාලාවන්</u>. පහත සඳහන් පාඨමාලාවන් නිලධාරින් **86** දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

(1) මනෝවිද්‍යා මෙහෙයුම් පාඨමාලා.

(2) සිවිල් සම්බන්ධීකරණ පාඨමාලාව.

ආ. <u>2013 වසර තුළදී සෙසුනිලයින් සඳහා පවත්වන ලද පාඨමාලාවන්</u>. පහත සඳහන් පාඨමාලාවන් සෙසුනිලයින් **55** දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

(1) මනෝවිද්‍යා මෙහෙයුම් පාඨමාලා

**<u>මූල්‍යමය විස්තරය</u>**

10. වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වේ.

අ. <u>වැය ශීර්ෂය 222-01-3-1405 (xvii)</u>

| | | |
|---|---|---|
| වාර්ෂික ප්‍රතිපාදන - **2013** | - | රු. 5,000,000.00 |
| වියදම | - | රු. 6,357,143.63 |
| ඉතිරිය | - | රු. 1,357,143.63 |

ආ. <u>වැය ශීර්ෂය 222-01-1-1405 (xvii)</u>

| | | |
|---|---|---|
| වාර්ෂික ප්‍රතිපාදන - **2013** | - | රු. 800,0000.00 |
| වියදම | - | රු. 435,500.13 |
| ඉතිරිය | - | රු. 364,499.87 |

| | | | | |
|---|---|---|---|---|
| ඇ. | සුළු මුදල් | - | රු. | 10,000.00 |
| ඈ. | අභ්‍යාස දිමනා | - | රු. | 10,000.00 |
| ඉ. | මාසික සඟරාව | - | රු. | 5,000.00 |
| ඊ. | මනෝ විද්‍යාත්මක මෙහෙයුම් පාඨමාලාව | - | රු. | 221500.00 |

උ. <u>ලිපිද්‍රව්‍ය වැය ශීර්ෂය -222-01-2-1201</u>

| | | | |
|---|---|---|---|
| මුලු මූල්‍ය ප්‍රතිපාදන | - | රු. | 100,000.00 |
| වියදම | - | රු | <u>16,936.00</u> |
| ඉතිරිය | - | රු | <u>83,064.00</u> |
| ලිපිද්‍රව්‍ය | - | රු | 7,742.56 |

## මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධානියා වශයෙන් එහි අධ්‍යක්ෂ කටයුතු කරනු ලබන අතර, අධ්‍යක්ෂ වශයෙන් බ්‍රිගේඩියර් නිලයේ කටයුතු කරනු ලබයි. යුද්ධ හමුදාවට අදාල මාණ්ඩලික රාජකාරි සම්බන්ධව මෙහිදි කටයුතු කරනු ලබයි.

**වගකීම්**

2. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් වනුයේ යුධ හමුදාවේ සිටින බල සංඛ්‍යාව නිසියාකාරව අධ්‍යයනය කිරිම සහ යුධ හමුදාවට අවශ්‍ය සියළුම නිලධාරින්/කෙඩෙට් නිලධාරින් හා සෙසුනිලයින් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබාදීමයි. තවද යුධ හමුදාවේ ඇති සියළුම ආයතන නගාසිටුවීමට උපදෙස් ලබාදීම, එම ආයතන සංශෝධනය කිරිම, සිවිල් සේවක අවශ්‍යතා ඉටු කිරිම ද මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් අතර වේ.

**කාර්යය**

3. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය වනුයේ මාණ්ඩලික රාජකාරි සඳහා අවශ්‍ය වන සියළුම රාජකාරි ඉටු කිරිම, යුධ හමුදාව තුළ ඇති ආයතනවල කාර්යක්ෂමතාවය වැඩිවන පරිදි එම ආයතන සඳහා හටපිරිස්/ සිවිල් සේවකයින් නිසියාකාරව කළමණාකරය කර ලබාදීමට අනුමැතිය ලබාදීම වේ.

**කාර්යයන්**

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කර ඇති සියළුම රාජකාරි සඳහා අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික වෙත වගකිව යුතු වේ.

ආ. යුධ හමුදාවේ ආයතන, රාජකාරි කරනු ලබන පිරිස්, යුධ හමුදාව වෙත සිදු කරනු ලබන බඳවාගැනීම් නිලධාරි/ සෙසුනිල සහ සිවිල් සේවක අවශ්‍යතා සඳහා වන මාණ්ඩලික රාජකාරි ඉටු කරනු ලබයි.

ඇ. යුධ හමුදාධිපතිතුමාගේ අවශ්‍යතාවය පරිදි දී ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා හඨපිරිස් සැළසුම් කිරිම.

ඇ. විවිධ යුද්ධ හමුදා ආයතන මගින් සිදු කරනු ලබන බඳවා ගැනිම් කාලෝචිතව අධ්‍යයනය කිරිම සහ අවශ්‍යතාවය පරිදි වෙනස්කම් සිදුකිරිම.

ඉ. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සමග සම්බන්ධතාවයෙන් යුතුව, නව සංස්ථා අතිරේක හඨපිරිස් බඳවා ගැනිම සහ ලුතිතන් කර්නල් නිලයෙන් ඉහළ නිලයන්හි තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනිම

ඊ. ආරක්ෂක සේනා සහ ඒකක සඳහා හඨපිරිස් වෙන් කිරිම.

උ. නව සංස්ථා සැකසීම සහ ප්‍රතිපත්ති සැකසීම සහ යුද්ධ හමුදා සංස්ථාහි රාජකාරි කිරිම සඳහා අවශ්‍ය කාර්‍ය මණ්ඩල සකස් කිරිම.

ඌ. අවශ්‍යතාවය පරිදි කෙඩෙට් නිලධාරින් රෙජිමේන්තු වෙත ලබාදීමට නිර්දේශ කිරීම.

එ. සංස්ථා සඳහා මණ්ඩල පවත්වාගෙන යාම සහ අවශ්‍ය පරිදි සංස්ථා වෙනස් කිරීම.

ඒ. යුද්ධ හමුදාවේ අනුමත බල සංඛ්‍යාව අධ්‍යයනය කිරීම සහ පවත්වාගෙන යාම.

ඔ. යුද්ධ හමුදාවේ සිවිල් සේවක අවශ්‍යතාවය පවත්වාගෙන යාම.

ඕ. යුද්ධ හමුදාවේ පාවෙන කාර්‍ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගැනීම සහ කාර්යක්ෂමතාවය ලැබෙන පරිදි අනුයුක්ත කිරීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

5. **2013** වර්ෂය සඳහා නිත්‍ය බලසේනාවේ අනුමත නිලධාරි/සෙසුනිලයින් පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | නිලය | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව (2013 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|
| 1. | ලුතිතන් ජෙනරාල් | 01 | 01 |
| 2. | මේජර් ජෙනරාල් | 50 | 40 |
| 3. | බ්‍රිගේඩියර් | 168 | 156 |
| 4. | කර්නල් | 213 | 227 |
| 5. | ලුතිතන් කර්නල් | 564 | 492 |
| 6. | මේජර් සහ ඉන් පහළ | 6738 | 5953 |
| 7. | එකතුව | 7734 | 6869 |
| 8. | සෙසුනිල | 119570 | 113467 |

6. **2013** වර්ෂය සඳහා ස්වේච්ඡා බලසේනාවේ අනුමත නිලධාරි/සෙසුනිලයින් පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | නිලය | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව (2013 දෙසැම්බර් 31 දිනට) |
|---|---|---|---|
| 1. | ලුතිතන් ජෙනරාල් | 01 | 01 |
| 2. | මේජර් ජෙනරාල් | 05 | 06 |
| 3. | බ්‍රිගේඩියර් | 39 | 40 |
| 4. | කර්නල් | 181 | 206 |
| 5. | ලුතිතන් කර්නල් | 2668 | 2529 |
| 6. | මේජර් සහ ඉන් පහළ | 2894 | 2782 |
| 7. | එකතුව | 70149 | 60837 |

7. 2013 වර්ෂය සඳහා අනුමත සිවිල් සේවකයින්ගේ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | සිවිල් සේවක සංස්ථාව | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් අනුමත සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ස්ථිර | 6601 |
| 2. | තාවකාලික | 4537 |
| | එකතුව | 11136 |

8. 2013 වර්ෂය සඳහා ස්වේච්ඡා බලසේනාවේ අනුමත හමුදාගත නිලධාරි/සෙසුනිලයින්ගේ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ඒකකය | යුද්ධ හමුදාධිපති තුමා වෙතින් අනුමත සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | නිලධාරි | සෙසුනිල |
| 1. | 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය | | 02 |
| 2. | 5 (සෙවේච්ජා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | | 01 |
| 3. | 4(සෙවේච්ජා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා ඉංජිනේරු | | 353 |
| 4. | 2(සෙවේච්ජා) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය | 01 | |
| 5. | 4(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | | 26 |
| 6. | 6(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 08 | 1201 |
| 7. | 7(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 09 | 1173 |
| 8. | 8(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 11 | 1163 |
| 9. | 9(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 06 | 1996 |
| 10. | 10(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 05 | 1089 |
| 11. | 14(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 10 | 1074 |
| 12. | 15(සෙවේච්ජා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | 09 | 1074 |
| 13. | 2(සෙවේච්ජා) රෙජිමේන්තුව ශ්‍රීලංකා යුද හමුදා වෛද්‍ය බලකාය | | 20 |
| 14. | 2(සෙවේච්ජා) බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | | 1049 |
| 15. | 2(සෙවේච්ජා) බලඇණිය ශ්‍රීලංකා යුද හමුදා පොදුසේවා බලකාය | 02 | 88 |
| 16. | ශ්‍රීලංකා යුද හමුදා පුරෝගාමී බලකාය | 01 | 278 |
| 17. | 1 වන බලඇණිය ශ්‍රීලංකා ජාතික ආරක්ෂක බලමුළුව | | 18 |
| | එකතුව | 62 | 10605 |

**<u>සාක්ෂාත් කරගැනීම්</u>**

9. පහත සඳහන් සංස්ථා/ආයතන නවතමයෙන් ස්ථාපනය කරන ලදි.

අ. ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ආ. යුද හමුදා මූලික රෝහල(මින්නේරිය).

ඇ යුද්ධ හමුදා ගොවිපල (පලුටුපාන).

ඈ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොල (ජීව වෛද්‍ය අංශය).

ඉ. කල්කුඩා නිවාඩු නිකේතනය.

10. ප්‍රථිව්‍යුහගත කරන ලද සංස්ථාවන් පහත සදහන් පරිදි වේ.

අ. රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව.

ආ. 1 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ඇ. 3 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ඈ. 4 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ඉ. 5 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ඊ. 6 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

උ. 7 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ඌ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු (සන්නද්ධ) බලඇණිය.

එ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කාතු වැඩපල.

ඒ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලික වැඩපල - කොළඹ.

ඔ. ස්වාධින මධ්‍යම වැඩපල ශ්‍රීලවියාඉ - උඩවලව.

ඕ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බර වාහන මූලික වැඩපල - කටුබැද්ද.

ක. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොල (ජීව වෛද්‍ය අංශය).

ග. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණු පාසල.

ජ. 2 (සෙව් ) බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

ට කල්කුඩා නිවාඩු නිකේතනය.

11. පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සමග සමබන්ධතාවයෙන් සංස්ථා නගාසිටුවිම සදහා හමුදා චර්යා නියෝග 8 ක් ප්‍රකාශයට පත් කරන ලදි.

12. නිලධාරින් 939 සහ සෙසුනිලයින් 13898 ක් බඳවා ගැනිම සදහා වර්ෂය තුළදි අනුමැතිය ලබාදෙන ලදි.

<u>**මූල්‍යමය විස්තරය**</u>

7. මුල්‍ය විස්තරය පහත සඳහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අ. | ලිපි ද්‍රව්‍ය | - රු | 205600.00 |
| ආ. | සනිපාරක්ෂක | - රු | 13000.00 |
| ඇ. | පුහුණු අරමුදල | - රු | 10000.00 |
| ඈ. | පුවත්පත් | - රු | 21840.00 |
| ඉ. | සගරා | - රු | 5000.00 |

## ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. බ්‍රිගේඩියර් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ධූරය උසුලන ජනමාධ්‍ය අධ්‍යක්‍ෂ මණ්ඩලය ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ රාජකාරි කටයුතු සිදු කරනු ලැබේ. යුද හමුදා ප්‍රකාශක වශයෙන් රාජකාරි වශයෙන් රාජකාරි කරනු ලබන මෙම ජනමාධ්‍ය අධ්‍යක්ෂ, හමුදා ප්‍රකාශක විදේශගත වන අවස්ථාවල එම තනතුරේ රාජකාරින් ද සිදුකිරීමට නියමිතව ඇත. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය කාර්මික අංශය වෙබ්/පරිගණක අංශය, සම්බන්ධීකරණ අංශය සහ පාලන අංශයකින් සමන්විතව ඇත. තවද ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය), ආරක්‍ෂක සේනා මූලස්ථානය (බටහිර), ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි)හි ස්ථාපිත මාධ්‍ය අංශයන් ද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් පාලනය කරනු ලබයි.

### වගකීම්

2. මාධ්‍ය නිවේදන සකස් කිරීම හා ප්‍රචාරය, යුද හමුදා ක්‍රියාකාරකම් ප්‍රචාරය පිණිස මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය සම්බන්ධීකරණය, යුද හමුදාවට අදාලවන අයුරින් නිෂ්පාදනය කරනු ලබන ටෙලිනාට්‍ය හා චිත්‍රපටවල තිරරචනයන් විමර්ශනය කිරීම, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවල පලකරනු ලබන අසත්‍ය හා යුද්ධ හමුදා ප්‍රතිරූපය හානිවන අයුරින් පලකරන අපකීර්තිමත් ප්‍රවෘත්තීන් නිවැරදි කිරීම සඳහා ප්‍රතිචාර දැක්වීම, පුහුණු වැඩසටහන් මෙහෙයවීම සහ මාධ්‍යයට අදාල දේශන පැවැත්වීම, සිවිල් හමුදා සම්බන්ධීකරණය හා යුද හමුදා වෙබ් අඩවිය පවත්වාගෙන යාම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී තිබෙන ප්‍රධාන වගකීම වේ.

### කාර්යභාරයන්

3. යුද හමුදාවට අදාල වන සියලු මාධ්‍ය කටයුතු සම්බන්ධයෙන් යුද්ධ හමුදාධිපතිතුමාට උපදෙස් ලබාදීම, මාධ්‍යයට අදාලවන කටයුතු සඳහා යුද හමුදාව වෙනුවෙන් නියෝජනය කිරීම, යුද හමුදා වෙබ් අඩවිය පවත්වාගෙන යාම, හමුදාවට අදාල වන නාට්‍ය සහ චිත්‍රපටි විමර්ශනය කිරීම, මාධ්‍යයන්හි ප්‍රචාරය වන අසත්‍ය සහ අපකීර්ති ප්‍රවෘත්ති නිවැරදි කිරීම සහ හඨ පිරිස්වලට මාධ්‍ය කටයුතු පිළිබඳව පුහුණුව සහ අධ්‍යාපනය ලබාදීම මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යභාරය වේ.

### කාර්යයන්

4. පහත සඳහන් කාර්යයන් මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත අදාල වේ.

අ. හමුදා ක්‍රියාකාරකම් වලට අදාලව මාධ්‍ය නිවේදන සැකසීම හා ප්‍රචාරය.

ආ. යුද හමුදා ක්‍රියාකාරකම් සබැඳිව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සම්බන්ධීකරණය.

ඇ. විජයග්‍රහණ සැමරීමේ පෙළපාලිය, නිදහස් දින පෙළපාලිය ඇතුලු වැදගත් උත්සව අවස්ථාවන් සඳහා ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය ආවරන ලබාදීම.

ඈ. යුද හමුදා වෙබ් අඩවිය පවත්වාගෙන යාම සහ යාවත්කාලීන කිරීම.

ඉ. හඨ පිරිස්වල මානසික අභිප්‍රේරණය උදෙසා වාර්ථාමය චිත්‍රපටි සැකසීම සඳහා සහාය දැක්වීම සහ බාහිර ආයතන හා සම්බන්ධව යුද හමුදා ප්‍රතිරූපය ඉහල නැංවීමට කටයුතු කිරීම.

ඊ. යුද හමුදා පුහුණු මධ්‍යස්ථානවලට අවශ්‍ය මාධ්‍ය සහ සන්නිවේදනය මෙන්ම සිවිල් සම්බන්ධීකරන කටයුතු පිළිබඳ අවශ්‍ය කරන දේශන සහාය ලබාදීම.

එ. හමුදා සේවයට අදාලව නිෂ්පාදනය කිරීමට නියමිත ටෙලි නාට්‍ය හා චිත්‍රපටි තිර රචන විමර්ශනය කිරීම.

ඒ. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයකින් ප්‍රචාරය කරනු ලබන අසත්‍ය සහ අපකීර්ති ප්‍රවෘත්තීන් නිවැරදි කිරීම හා ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම.

ඹ. යුද්ධ හමුදා සාමාජිකයින් රචිත කෘතීන් අධ්‍යයනය කර, ප්‍රචාරය සඳහා අනුමැතිය ලබාදීම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

5. යුද්ධ හමුදා උත්සව සඳහා ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සම්බන්ධීකරණය කිරීම.

| අනු අංකය | දිනය | වැඩසටහන |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | 2013.01.08 | 6 වන ශ්‍රී ලංකා යුද හමුදා කාන්තා බලකායට අයත් දමිළ කාන්තා සෙබලියන්ගේ කොළඹ සංචාරය |
| 2. | 2013.01.10 | අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතියෙහි සමාරම්භක උළෙල බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වීම. |
| 3. | 2013.01.21 | යුද හමුදා වර්ණ රාත්‍රිය - මියුසියස් විද්‍යාලය |
| 4. | 2013.01.22 | අභිමංසල සුවසහන මධ්‍යස්ථානය 3 මුල් ගල තැබීම - පාන්ගොල්ල |
| 5. | 2013.01.23 | ආරක්ෂක සංවර්ධන - 2013 මාධ්‍ය සාකච්ඡාව |
| 6. | 2013.01.23 | ස්වේච්ඡා බලසේනාවේ සෙබලුන්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම. |
| 7. | 2013.02.04 | 65 වන ජාතික නිදහස් සැමරුම් උළෙල - ත්‍රිකුණාමලය |
| 8. | 2013.03.02 | අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ ත්‍රිවිධ හමුදා විරුවන් 94 දෙනෙකු සඳහා නිවාස ලබා දීම. |
| 9. | 2013.03.21 | දමිළ කාන්තා සෙබලියන්ගේ විසිර යාමේ පෙළපාළිය කිලිනොච්චි ආරක්ෂක සේනා මූලස්ථානය |
| 10. | 2013.03.22 | විජයබාහු පාබල රෙජිමේන්තුව වෙත ජනපති වර්ණ සහ රෙජිමේන්තු වර්ණ ප්‍රධානෝත්සවය |
| 11. | 2013.03.23 | දැයට කිරුළ - 2013 |
| 12. | 2013.03.30 | මැලේ ජාතික නිලධාරීන් සහ සෙසුනිලයින් වෙනුවෙන් ස්මාරකය ඉදි කිරීම කොම්පඤ්ඤවීදිය |
| 13. | 2013.04.06 | බක්මහ උළෙල - 2013 - අභිමංසල |
| 14. | 2013.04.09.10 | අවුරුදු පොළ - පනාගොඩ |
| 15. | 2013.04.11 | බක්මහ උළෙල - 2013 යුද්ධ හමුදා මූලස්ථානය |
| 16. | 2013.04.18 | තොප්පිගල රණවිරු ස්මාරකය විවෘත කිරීම. |
| 17. | 2013.04.23 | ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා රෙජිමේන්තුව වෙත ජනාධිපති සහ රෙජිමේන්තු වර්ණ ප්‍රධානෝත්සවය |

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| 18. | 2013.05.13 | පකිස්ථානු හමුදාවෙන් ශ්‍රී ලංකා යුද හමුදාව වෙත අශ්වයන් පරිත්‍යාග කිරීම. |
| 19. | 2013.05.18 | විජයග්‍රහණ පෙළපාලිය - කොළඹ |
| 20. | 2013.05.21 | කොළඹ ගාල්ල අධිවේගී මාර්ගයේ වැලිපැන්න ප්‍රදේශයේ නව ලායා ආපන ශාලා සංකීර්ණය විවෘත කිරීම |
| 21. | 2013.06.24 | රණවිරු සම්පත් කේන්ද්‍රය විවෘත කිරීම. |
| 22. | 2013.06.03 | මාතර දිස්ත්‍රික් රණවිරුවන් සඳහා නව නිවාස ලබා දීම. |
| 23. | 2013.06.15 | මිහිඳු සෙත් මැදුර 2 වන සංවත්සරය සමරීම. |
| 24. | 2013.06.16 | කැවල්රි සුපර් ක්‍රොස්ල පාන්ගොල්ල |
| 25. | 2013.06.24 | වලවේ සුපර් ක්‍රොස් මාධ්‍ය සාකච්ඡාව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා මූලස්ථානය |
| 26. | 2013.06.23 | පකිස්ථානු යුද හමුදාපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය |
| 27. | 2013.06.29 | කැඩෙට් නිලධාරීන්ගේ විසිර යාමේ පෙළපාලිය - දියතලාව |
| 28. | 2013.06.30 | මුලතිව් ප්‍රදේශයේ සෙබළෙකුගේ සහ දමිළ කාන්තාවකගේ විවාහ මංගල්‍ය උත්සවය |
| 29. | 2013.07.01 | සාලියපුර ගජබා රෙජිමේන්තු සුහසාධක සංකීර්ණය විවෘත කිරීම. |
| 30. | 2013.07.11 | ගජබා රෙජිමේන්තුවේ ආබාධිත විරුවෙකු සඳහා නිවසක් ප්‍රධානය කිරීම. |
| 31. | 2013.07.18 | ශ්‍රී ලංකා යුද හමුදා ස්වේච්ඡා බලසේනා මලල ක්‍රීඩා තරාවලිය - සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය |
| 32. | 2013.07.19 | ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව සංගමය විසින් යුද්ධ හමුදාව වෙත ගිණි නිවන රථ ලබා දීම - යුද්ධ හමුදා මූලස්ථානය |
| 33. | 2013.07.25 | වීර ක්‍රියා පදක්කම් පිරිනැමීම - පනාගොඩ |
| 34. | 2013.07.26 | අනුරාධපුර අභිමංසල 2 වන සංවත්සරය සැමරීම. |
| 35. | 2013.07.31 | පසුගිය යුද්ධ හමුදාපතිතුමා නික්ම යාමේ ආචාර පෙළපාලිය |
| 36. | 2013.08.01 | නව යුද්ධ හමුදාපතිතුමා වැඩ භාර ගැනීම |
| 37. | 2013.08.21 | විජයබාහු පාබල රෙජිමේන්තුවේ වීර පදක්කම් ප්‍රදානය |
| 38. | 2013.08.26 | වන්නි ආරක්ෂක සේනා මූලස්ථාන දමිළ කාන්තා සෙබළියන්ගේ වැඩසටහන |
| 39. | 2013.08.29 | කුරුවිට ගජබා රෙජිමේන්තු විරු සැමරුම. |
| 40. | 2013.09.01 | ගජබා සුපර් ක්‍රොස් - 2013 |
| 41. | 2013.09.03.04.05 | ආරක්ෂක සම්මන්ත්‍රණය - 2013 |
| 42. | 2013.09.10-25 | දියකාවා යුද අභ්‍යාසය - III |
| 43. | 2013.09.22 | ශ්‍රී ලංකා යුද හමුදා සේවා වනිතා ඒකකයේ 29 වන වාර්ෂික මහා සභා රැස්වීම |
| 44. | 2013.09.24.25.26 | යුද හමුදා පැරා ක්‍රීඩා තරගාවලිය - 2013 සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය |
| 45. | 2013.09.28 | 64 වන යුද හමුදා සංවත්සරයේ ධජයන්ට සෙත් පැතීමේ උත්සවය - දළදා මාලිගාව |
| 46. | 2013.09.28 | රෙජිමේන්තු මූලස්ථානය ගැහේබ වීර ක්‍රියා පදක්කම් පිරිනැමීම |
| 47. | 2013.09.29 | ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ වීර ක්‍රියා පදක්කම් පිරි නැමීම. |

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| 48. | 2013.10.01 | ධජයන්ට සෙත් පැතීම අනුරාධපුර |
| 49. | 2013.10.03 | 64 වන යුද හමුදා දිනය නිමිත්තෙන් මුස්ලිම් ආගමික වතාවත් පැවැත්වීම - දවටගහ ජුම්මා පල්ලිය |
| 50. | 2013.10.06 | 64 වන යුද හමුදා දිනය නිමිත්තෙන් ධජයන්ට සෙත් පැතීම - කතරගම |
| 51. | 2013.10.08 | 64 වන යුද හමුදා දිනය නිමිත්තෙන් හිංදු සහ ක්‍රිස්තියානි ආගමික වතාවත් පැවැත්වීම. |
| 52. | 2013.10.10 | 64 වන යුද හමුදා දිනය |
| 53. | 2013.10.12 | කමාන්ඩෝ රෙජිමේන්තු විශ්‍රාමිකයන්ගේ පා ගමන |
| 54. | 2013.10.13 | 4 x 4 සැපර් ජිම්පො තරගාවලිය |
| 55. | 2013.10.13 | සාලියපුර ගජබා රෙජිමේන්තු විරුවන් සිහි කිරීම. |
| 56. | 2013.10.15 | ආබාධිත විරුවෙකුගේ විවාහ මංගල්‍ය උත්සවය පැවැත්වීම. |
| 57. | 2013.10.16 | ලෝක ළමා දිනය වෙනුවෙන් විරු දරුවන් හට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම. |
| 58. | 2013.10.16.17 | මාන්කුලම් ශ්‍රී සුගත විහාර දාගැබ විවෘත කිරීම. |
| 59. | 2013.10.24 | ඉන්දියානු පාපන්දු කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද හමුදා පාපන්දු කණ්ඩායම අතර තරගය |
| 60. | 2013.10.31 | විරු දෙමාපියන් වෙනුවෙන් පූජනීයයි ඔබ වැඩසටහන පැවැත්වීම |
| 61. | 2013.11.01 | ආබාධිත රණවිරුවන්ට නිවාස ආධාර, ඉඩම් හා ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම |
| 62. | 2013.11.23 | මහකනදරාව 6 වන ශ්‍රී ලංකා පාබල හමුදා දොරටුව විවෘත කිරීම. |
| 63. | 2013.11.24 | නායකත්ව පුහුණු පාඨමාලාව ආරම්භ කිරීම - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා පුහුණු පාසල මින්නේරිය |
| 64. | 2013.11.25.26.27 | 50 වන යුද හමුදා මලල ක්‍රීඩා තරගාවලිය - සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණය |
| 65. | 2013.12.11 | පාබල මේලා -2013 මාධ්‍ය සාකච්ජාව ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු මූලස්ථානය |
| 66. | 2013.12.21 | කැඩෙට් නිලධාරීන්ගේ විසිර යාමේ පෙළපාළිය - ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය |
| 67. | 2013.12.24 | අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරගාවලිය - පනාගොඩ |
| 68. | 2013.12.31 | අන්තර් රෙජිමේන්තු සරඹ සහ තූර්ය වාදක තරගාවලිය - පනාගොඩ |

අ. <u>දේශණ පැවැත්වීම</u>

| අනු අංකය | දිනය | දේශණ මාතෘකාව | දේශක |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| 1. | 2013.03.14 | මාධ්‍ය සහ සිවිල් සම්බන්ධීකරණය | මාධ්‍ය උපදේශක |
| 2. | 2013.05.17 | ආරක්ෂක සේවා අණ හා පාලන විද්‍යාලයේ පැඩෝ ඩාන්ස් අභ්‍යාසයෙන් පසු ආසෙඅමාවි හි මාධ්‍ය සාකච්ජාවක් මෙහෙයවන ආකාරය පිළිබඳව ශිෂ්‍යයින් දැනුවත් කිරීම. | මාධ්‍ය උපදේශක |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
|---|---|---|---|
| 3. | 2013.05.19 | බෝම්බ නිශ්ක්‍රිය කරන්නෙකු විසින් මාධ්‍ය හැසිරවිය යුතු ආකාරය හා ජනමාධ්‍ය කරුවෙකුගේ චර්යාවන් හදුනා ගැනීම- මාදුරුඔය | මාධ්‍ය උපදේශක |
| 4. | 2013.06.19 | මහජන සබඳතා සමග ජනමාධ්‍ය සහ ප්‍රචාරක කටයුතු හැසිරවීම. (මනෝ විද්‍යාත්මක මෙහෙයුම් ලෙස) | මාධ්‍ය උපදේශක |
| 5. | 2013.06.19 | සිවිල් මාධ්‍ය සමග සම්බන්දතාවය | මාධ්‍ය උපදේශක |
| 6. | 2013.11.06.07 | ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා දේශණ | මාධ්‍ය උපදේශක |
| 7. | 2013.11.13 | බෝම්බ නිශ්ක්‍රිය කටයුතු වලදී ජනමාධ්‍ය හැසිරීම සහ හැසිරවීම | මාධ්‍ය උපදේශක |
| 8. | 2013.12.20 | බෝම්බ නිශ්ක්‍රිය කරන්නෙකු විසින් මාධ්‍ය හැසිරවිය යුතු ආකාරය හා ජනමාධ්‍ය කරුවෙකුගේ චර්යාවන් හදුනා ගැනීම- මාදුරුඔය | මාධ්‍ය උපදේශක |

<u>සාක්ෂාත් කරගැනීම</u>

6. යුද්ධ හමුදාව සංවිධානය කර මෙහෙයවනු ලැබූ ප්‍රධාන වැඩසටහන් සඳහා විශාල ප්‍රසිද්ධියක් ලබාදීමටත්, විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යයන්වල පළ කරන ලද අසත්‍ය සහ අපකීර්ති ප්‍රවෘත්තීන් සාර්ථකව නිවැරදි කිරීමටත්, මෙම අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි විය. එසේම 2013 ආරක්පක සමුළුව සඳහා ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍යවේදීන් 148 ක් සහභාගි කරවා ගැනීමට ද හැකිවිය.

<u>මූල්‍යමය විස්තරය</u>

7. මූල්‍ය විස්තරය පහත සඳහන් පරිදි වේ.

| | වැය ශීර්ෂ | වෙන්කළ මුදල (රුපියල්) | වියදම (රුපියල්) |
|---|---|---|---|
| අ | ලිපි ද්‍රව්‍ය | 200000.00 | 154470.26 |
| ආ | පුවත්පත් | 27130.00 | 283250.00 |
| ඇ | පුහුණු අරමුදල | 561087.00 | 561087.00 |
| ඈ | පවිත්‍රතා/ නඩත්තු කටයුතු | 13500.00 | 12051.20 |
| ඉ | සඟරා | 4200.00 | 4200.00 |
| ඊ | මාධ්‍ය වියදම් | 2000000.00 | 1119154.00 |
| | එකතුව | 3050517.00 | 2134212.46 |

## පාබල අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය පාබල රෙජිමේන්තුවල විශේෂිත වූ කාර්යයන් නියෝජනය කරයි. යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත පාබල සේනාවන්ට අදාල කරුණු අධ්‍යක්ෂ පාබල විසින් ක්‍රියාත්මක කරනු ලබයි. අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතේ වන ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක වේ. සියළු පාබල රෙජිමේන්තු මූලස්ථාන හා සම්බන්ධතාවයෙන් ප්‍රතිපත්තිමය කරුණු කාරණා සහ බලඇණි හා විශේෂ පාබල මෙහෙයුම් කණ්ඩායම් හී පුහුණුවීම් සම්බන්ධව ක්‍රියාන්විත මූලස්ථාන සමගද මෙම අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරනු ලබයි. තවද පාබල බලඇණිවල මූලික අවශ්‍යතා වන හඨපිරිස් සණපූරණය, යුධ උපකරණ, නිල ඇඳුම් හා ගිනිඅවි පිළිබඳව සංඛ්‍යා ලේඛණ නඩත්තු කර අඩුපාඩු යුධ හමුදා මූලස්ථානයට දන්වනු ලැබේ. මධ්‍යස්ථාන සේනාවිධායකවරුන් සමග පාබල හමුදාවට අදාළ කරුණු සාකච්ඡා කර පොදු තීරණ ප්‍රකාශයට පත්කරනු ලබයි. බලඇණි පුහුණු පාසල් හා වෙනත් යුධ හමුදා පුහුණු ආයතනවල පාබල පුහුණු කටයුතු පිළිබඳව සොයා බැලීමට මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජෙනරාල් හා මාණ්ඩලික නිලධාරීන් නිරීක්ෂණ චාරිකාවන්හි නිරත වේ.

### වගකීම්

2. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. නිත්‍ය පාබල බලඇණිවල විශේෂ පාබල මෙහෙයුම් පුහුණුව සඳහා මගපෙන්වීම.

ආ. බලඇණි පුහුණුවීම්වලදී පාබල රාජකාරි ඉටුකරනු ලබන සියළු බලඇණිවලට අදාල මගපෙන්වීම.

ඇ. යුධ උපකරණ ප්‍රදර්ශනවලට මගපෙන්වීම.

ඈ. යුධ උපකරණවල තත්ව පාලනය කිරීම.

### කාර්යය

3. පාබල මූලධර්මවලට අනුකූලවන පරිදි ස්වයංපෝෂිත කාර්යක්ෂම සේනාවක් හෝ ඒකාබද්ධ සේනාවක කොටසක් වශයෙන් පවත්වාගෙන යාම පිණිස උපකරණ සැපයීම, සංවිධානගත කිරීම, පිරිස් බලය ලබාදීම, පරිපාලනය සහ පුහුණු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වේ.

### කාර්යයන්

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාධිපති හට පාබල බලඇණි සම්බන්ධව උපදෙස් ලබාදීම.

ආ. උපක්‍රමික මූලධර්ම (බණ්ඩල කණ්ඩායමල බලඇණි සහ ඉන් ඉහල), පුහුණු කටයුතු, නිල උසස්කිරීම්, පරිපාලන සහ සැපයුම් හා සේවා සම්බන්ධ සියළු ප්‍රතිපත්තීන් සකස් කිරීම.

ඇ. පුහුණු පාසැල් හි පවත්වනු ලබන (ප්‍රධාන වශයෙන් පාබල පුහුණු මධ්‍යස්ථානය, යුධ හමුදා පුහුණු පාසැල, සටන් පුහුණු පාසැල හා කොම්පන් නොලත් නිලධාරි පුහුණු පාසැල මෙන්ම බලඇණි පුහුණු පාසැල්) සියළු පාබල පුහුණු පාඨමාලා සඳහා අදාල වන පාබල පුහුණු ප්‍රතිපත්ති අධීක්ෂණය කිරීම හා ඊට අදාල උපදෙස් ක්‍රියාත්මක කිරීම.

ඈ. යුධ හමුදා මූලස්ථනයේ උපදෙස් පරිදි සියළු පාබල හමුදාවන් හි ගිනිඅවි හා උපකරණවල යෝග්‍යතාවය පිලබඳ තත්ව පරීක්ෂාවට ලක්කිරීම හා වාර්ථා කිරීම.

ඉ. පාබල හමුදා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හි ප්‍රගතිය හා ඇගයීම්/පර්යේෂණ ආදිය පිලිබඳ සොයා බැලීම.

ඊ. පාබල සංවිධාන ව්‍යුහගතකිරීම සහ ක්‍රියාන්විත අවශ්‍යතා මත ප්‍රතිසංවිධානගත කිරීම.

උ. සියළු පාබල හමුදා පුහුණු කටයුතු (දේශීය/විදේශීය) සඳහා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය උපදෙස් ලබාදීම.

ඌ. පාබල හමුදා නිලධාරින්ගේ සහ සෙසුනිලයින්ගේ උසස්වීම් පිලිගත් නීතියට අනුකූලදැයි සනාථ කිරීම.

එ. පාබල නිලධාරින්ගේ තනතුරු නීතියට අදාල දැයි සනාථ කිරීම.

ඒ. පාබල කටයුතු ලේඛණගත කිරීම සහ වාර්ථාගත කිරීම.

ඔ. පාබල රාජකාරි සඳහා ඇවැසි මණ්ඩල සහ කමිටු පත්කිරීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

5. <u>පුහුණුවීම්</u>. 2013 - 2014 බලඇණි පුහුණුවීම් සඳහා සකසන ලද පුහුණු සැලැස්මට අනුව 2013 වර්ෂයේ දී පහත සඳහන් බලඇණි ඔවුනට අයත් පුහුණු පාසැලේ දී පුහුණුවන ලදි. මේ බලඇණි පුහුණුවීම් තුලින් සොල්දාදුවාගේ යුධ කාර්යක්ෂමතාවය සහ චිත්ත ධෛර්යය වර්ධනය වූ බව පෙන්නුම් කරයි.

6. වසර තුලදී බලඇණි පුහුණුවීම් සහ විශේෂ පාබල ක්‍රියාන්විත පහත සඳහන් පරිදි වේ:

අ. <u>බලඇණි පුහුණුවීම්</u>

| | | | |
|---|---|---|---|
| (1) | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | - | බලඇණි 10 යි. |
| (2) | ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | - | බලඇණි 12 යි. |
| (3) | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | - | බලඇණි 09 යි. |
| (4) | ආරක්ෂක සේනා මූලස්ථානය(මධ්‍යම) | - | බලඇණි 02 යි |
| (5) | ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) | - | බලඇණි 12 යි |
| (6) | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | - | බලඇණි 08 යි |
| (7) | ස්වාධීන | - | <u>බලඇණි 08 යි</u> |
| | එකතුව | - | <u>බලඇණි 58 යි</u> |

ආ. විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණුවීම්

(1) ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) - පාඨමාලා 03 යි.
(2) ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) - පාඨමාලා 03 යි.
(3) ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) - පාඨමාලා 03 යි.
(4) ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) - පාඨමාලා 03 යි.
(5) ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) - පාඨමාලා 03 යි.
එකතුව - පාඨමාලා 15 යි

**කාර්යය සාධනය**

7. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 වර්ෂයේදී විජයග්‍රහණ පෙළපාලියේ සියළු රෙජිමේන්තු නියෝජනය කරන ලද පාබල රථ පෙළ සම්බන්ධීකරණය කරන ලදි.

8. 2013 දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණයේ දී පාබල රෙජිමේන්තු වලට ආවේණික අවි සහ මානුෂික මෙහෙයුමේදී එල්ටීටීඊ සංවිධානයෙන් අත්අඩංගුවට ගන්නා ලද අවි ප්‍රදර්ශනය කරන ලදි. ඊට අමතරව යුධ හමුදාධිපති තුමාගේ අනුමැතිය මත ප්‍රදර්ශණය කරන ලද ප්‍රදර්ශණ කුටි හි විස්තරය පහත සඳහන් වගුවෙන් නිරූපණය කර ඇත:

| අනු අංකය | ප්‍රදර්ශණයේ නම | පැවැත්වූ ස්ථානය | ප්‍රදර්ශණ කුටි භාරදුන් රෙජිමේන්තුව/ප්‍රදර්ශණ කුටි විස්තර |
|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
| 1. | ගාමිණී අභිමන් | ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය - බෙන්තොට | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 2. | දැයට කිරුළ 2013 | අම්පාර | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව- පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| | | | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලකාය - ත්‍රස්තවාදීන්ගෙන් අත්අඩංගුවට ගත් අවි ආයුධ කුටියක් |
| 3. | වසන්ත උදානය | බණ්ඩාරවෙල නගරය | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලකාය - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |
| 4. | කුරුණෑගල මලියදේව විද්‍යාලයට වසර 125 ක් සපිරීමේ නිමිත්තේන් | විද්‍යාලීය භූමියේදී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |
| 5. | සාරාර්ත අධ්‍යාපණික සංස්කෘතික හා වෙළඳ ප්‍රදර්ශණය | පොලොන්නරුව රාජකීය ම.ම විද්‍යාලීය භූමියේදී | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) |
|---|---|---|---|
| 6. | මාතර රාහුල විද්‍යාලීයේ අධ්‍යාපණික හා වෙළඳ ප්‍රදර්ශණය | විද්‍යාලීය භූමියේදී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලකාය - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |
| 7. | ගාල්ල මාපලගම අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය | යන්ස්ට්‍රා ක්‍රීඩාංගණයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 8. | තිකිණි උදාන සැණකෙළිය - 2013 | සීදූව ක්‍රීඩාංගණයේදී | රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකාය - ඒකකයට ආවේණික අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 9. | දෙහිවල අධ්‍යාපනික හා වෙළඳ ප්‍රදර්ශනය | දෙහිවල මහජන ක්‍රීඩාංගණයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 10. | තාක්ෂණික අධ්‍යාපන ප්‍රදර්ශනය | ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |
| 11. | පානදුර මෝදරවිල අධ්‍යාපනික ප්‍රදර්ශනය | පානදුර මෝදරවිල ක්‍රීඩාංගණයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 12. | කොලින්ජාඩිය අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය | වෙන්නප්පුව ක්‍රීඩාංගණය | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව - පාබල අවි ආයුධ ප්‍රදර්ශණ කුටියක් |
| 13. | පාබල මේලා - 2013 | හික්කඩුව මහජන ක්‍රීඩාංගණයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |
| 14. | රත්මලාන කොතලාවල සැණකෙළිය | කොතලාවල ක්‍රීඩාංගණයේ දී | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව - පාබල අවි ආයුධ ප්‍රදර්ශන කුටියක් |

**මූල්‍යමය විස්තරය**

9. මෙම ශාඛාවේ මූල්‍යමය වියදම් පහත සඳහන් පරිදි වේ.

අ. සුභසාධන වැය ශීර්ෂය - රු. 16,120.00

ආ. ලිපි ද්‍රව්‍ය වැය ශීර්ෂය - රු. 175,000.00

ඇ. පුහුණු ගිණුම - රු. 10,000.00

ඈ. සනීපාරක්ෂක වැය ශීර්ෂය - රු. 8,500.00

## ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. **2003** ඔක්තෝම්බර් මස **31** වන දින යුද්ධ හමුදා මූලස්ථානය යටතේ ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය තනා සිටුවන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු කාර්‍යයන් හා වගකීම් පිළිබඳව ක්‍රීඩා අධ්‍යක්ෂ ජෙනරල් කාර්‍යාලය වෙත වගකිව යුතුවේ.

### වගකීම්

2. ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් සහ කාර්‍යයන් පහත පරිදි වේ.

අ. යුද්ධ හමුදාව තුළ සියළු ක්‍රීඩා කටයුතු අධීක්ෂණය කිරීම.

ආ. ක්‍රීඩා හා සම්බන්ධ සාකච්ඡා, සමුළු හා සම්මේලන සඳහා සහභාගිවීම.

ඇ. ක්‍රීඩා කටයුතු වලදී යුද්ධ හමුදාධිපතිතුමා නියෝජනය කිරීම.

ඈ. ක්‍රීඩා අධ්‍යක්ෂ මණ්ලය යටතේ ඇති අරමුදල් පරිපාලනය සිදුකිරීම.

ඉ. යුද්ධ හමුදා ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම හා බෙදා හැරීම.

ඊ. යුද්ධ හමුදාව තුළ ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම.

උ. **1973** අංක **25** දරණ ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ආරක්ෂක සේවා ක්‍රීඩා මණ්ඩලය නාවික, ගුවන් ක්‍රීඩා මණ්ඩල සහ ජාතික ක්‍රීඩා පාලන ආයතන සියල්ල සමඟ සම්බන්ධකම් පවත්වා ගැනීම.

ඌ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන ක්‍රීඩා කමිටු සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී නියෝග නිකුත් කිරීම.

### වගකීම් සහ කාර්‍යයන්

3. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් කාර්‍යයන් පහත පරිදි වේ.

අ. **1973** අංක **25** දරණ ක්‍රීඩා පනතේ විධිවිධාන හා පසුව විවිධ වකවානු තුළ නිකුත් කරන ලද සංශෝධනයන්ට යටත්ව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ක්‍රීඩා කටයුතු නංවාලීම්, සහයවීම, මගපෙන්වීම, සම්බන්ධීකරණය සිදුකිරීම, දිරිමත් කිරීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකරනු ලැබේ.

ආ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන අරමුදල් වල පාලනය.

ඇ. යුද්ධ හමුදා ක්‍රීඩා කටයුතු පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම හා බෙදා හැරීම.

ඈ. යුද්ධ හමුදාව තුළ ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම.

ඉ. ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව ආරක්ෂක සේවා ක්‍රීඩා මණ්ඩලය සමග සම්බන්ධ වි අනෙකුත් සේවාවන් සහ ජාතික ක්‍රීඩා අමාත්‍යාංශය සම්බන්ධිකරණය කිරීම.

ඊ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන ක්‍රීඩා කමිටු සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදි නියෝග නිකුත් කිරීම.

## වාර්ෂික සමාලෝචනය

4. ජාත්‍යන්තර/ජාතික/ආරක්ෂක සේවා තරඟාවලි. විවිධ ක්‍රීඩා තරඟාවලියන් සඳහා ක්‍රීඩක/ක්‍රීඩිකාවන් රැසක් යුද්ධ හමුදාව නියෝජනය කරමින් සහභාගි කර ඇති අතර, එම ලබාගත් ජයග්‍රහණයන් සැබැදි පදක්කම්/ස්ථාන පහත පරිදි වේ.

අ. අන්තර් ජාතික තරඟාවලිය

| අනු අංකය | ක්‍රීඩා කමිටුව | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|---|
| 1. | යුහ මලල ක්‍රීඩා කමිටුව | 04 | 04 | 02 |
| 2. | යුහ මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩා කමිටුව | 04 | 06 | - |
| 3. | යුහ ක්‍රිකට් ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 4. | යුහ පාපැදි ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 5. | යුහ ආබාධිත ක්‍රීඩා කමිටුව | 05 | 04 | 01 |
| 6. | යුහ හොකි ක්‍රීඩා කමිටුව | 01 | - | - |
| 7. | යුහ ජුඩෝ ක්‍රීඩා කමිටුව | - | - | 01 |
| 8. | යුහ කබඩි ක්‍රීඩා කමිටුව | - | - | 01 |
| 9. | යුහ කරාතේ ක්‍රීඩා කමිටුව | 01 | - | 01 |
| 10. | යුහ දැල්පන්දු ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 11. | යුහ කායවර්ධන හා බර ඉසිලීමේ ක්‍රීඩා කමිටුව | | 03 | 01 |
| 12. | යුහ රගර් ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 13. | යුහ පාපන්දු ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 14. | යුහ වෙඩිතැබීම් ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 15. | යුහ මේසපන්දු ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 16. | යුහ ටයිකොන්ඩෝ ක්‍රීඩා කමිටුව | - | 03 | 02 |
| 17. | යුහ වොලිබෝල් ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 18. | යුහ මල්ලවපොර ක්‍රීඩා කමිටුව | සහභාගිත්වය | | |
| 19. | යුහ වුෂු ක්‍රීඩා කමිටුව | - | - | 01 |

ආ. ජාතික ක්‍රීඩා තරඟාවලිය

| අනු අංකය | ක්‍රීඩා කමිටුව | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | යුහ මලල ක්‍රීඩා කමිටුව | 16 | 13 | 14 |
| 2. | යුහ දුණුවිදීමේ ක්‍රීඩා කමිටුව | 03 | 03 | 06 |
| 3. | යුහ බියඩ් ඇන්ඩ් ස්නුකර් ක්‍රීඩා කමිටුව | - | 01 | |
| 4. | යුහ මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩා කමිටුව | 16 | 24 | 42 |
| 5. | යුහ ක්‍රිකට් ක්‍රීඩා කමිටුව | - | 01 | |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
|---|---|---|---|---|
| 6. | යුහ පාපැදි ක්‍රීඩා කමිටුව | 11 | 01 | 01 |
| 7. | යුහ ආබාධිත ක්‍රීඩා කමිටුව | 01 | - | - |
| 8. | යුහ හොකි ක්‍රීඩා කමිටුව | - | 01 | - |
| 9. | යුහ ජූඩෝ ක්‍රීඩා කමිටුව | 07 | 11 | 21 |
| 10. | යුහ කබඩි ක්‍රීඩා කමිටුව | 01 | | 01 |
| 11. | යුහ කරාතේ ක්‍රීඩා කමිටුව | 01 | 03 | 04 |
| 12. | යුහ මෝටර් රථ ක්‍රීඩා කමිටුව | 02 | 03 | 06 |
| 13. | යුහ දැල්පන්දු ක්‍රීඩා කමිටුව | 01 | 01 | |
| 14. | යුහ කායවර්ධන හා බර ඉසිලීමේ ක්‍රීඩා කමිටුව | 36 | 24 | 11 |
| 15. | යුහ ඔරු පැදීමේ ක්‍රීඩා කමිටුව | 02 | 15 | 14 |
| 16. | යුහ රගර් ක්‍රීඩා කමිටුව | - | 01 | - |
| 17. | යුහ වෙඩිතැබීම් ක්‍රීඩා කමිටුව | 46 | 15 | 16 |
| 18. | යුහ පිහිණුම් හා දියපන්දු ක්‍රීඩා කමිටුව | 44 | 26 | 26 |
| 19. | යුහ මේසපන්දු ක්‍රීඩා කමිටුව | 01 | - | - |
| 20. | යුහ ටයිකොන්ඩෝ ක්‍රීඩා කමිටුව | 11 | 09 | 17 |
| 21. | යුහ ටෙනිස් ක්‍රීඩා කමිටුව | - | 01 | 02 |
| 22. | යුහ වොලිබෝල් ක්‍රීඩා කමිටුව | 01 | - | |
| 23. | යුහ මල්ලවපොර ක්‍රීඩා කමිටුව | 06 | 07 | 08 |

ඇ. <u>ආරක්ෂක සේවා තරගාවලිය</u>

| අනු අංකය | ක්‍රීඩා කමිටුව | රන් | රිදී | ලෝකඩ |
|---|---|---|---|---|
| 1. | යුහ ක්‍රිකට් ක්‍රීඩා කමිටුව | 01 | - | - |
| 2. | යුහ රගර් ක්‍රීඩා කමිටුව | 02 | - | - |
| 3. | යුහ මල්ලවපොර ක්‍රීඩා කමිටුව | 05 | 04 | 08 |
| 4. | යුහ මල්ලවපොර ක්‍රීඩා කමිටුව | 19 | - | - |

**<u>මූල්‍යමය විස්තරය</u>**

5. වර්ෂය තුල ක්‍රීඩා කමිටු සඳහා මුදල් ලබාදීම පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ක්‍රීඩා කමිටුව | එකතුව |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | යුහ මලල ක්‍රීඩා කමිටුව | 15,062,252.17 |
| 2. | යුහ දුණුවිදීමේ ක්‍රීඩා කමිටුව | 678,350.00 |
| 3. | යුහ බැඩ්මින්ටන් ක්‍රීඩා කමිටුව | 294437.5 |
| 4. | යුහ පැසිපන්දු ක්‍රීඩා කමිටුව | 824,025.00 |
| 5. | යුහ බේස්බෝල් ක්‍රීඩා කමිටුව | 92575 |
| 6. | යුහ බියඩ් ඇන්ඩ් ස්නූකර් ක්‍රීඩා කමිටුව | 128,250.00 |
| 7. | යුහ මුෂ්ඨි ප්‍රහාර ක්‍රීඩා කමිටුව | 51054896.64 |
| 8. | යුහ ක්‍රිකට් ක්‍රීඩා කමිටුව | 1,205,700.00 |

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| 9. | යුහ පාපැදි ක්‍රීඩා කමිටුව | 278050 |
| 10. | යුහ ආබාධිත ක්‍රීඩා කමිටුව | 5,276,775.00 |
| 11. | යුහ එල්ලේ ක්‍රීඩා කමිටුව | 130728 |
| 12. | යුහ ගොල්ෆ් ක්‍රීඩා කමිටුව | 1,399,440.00 |
| 13. | යුහ ජිම්නාස්ටික් ක්‍රීඩා කමිටුව | 104635.5 |
| 14. | යුහ හැන්ඩ්බෝල් ක්‍රීඩා කමිටුව | 40,000.00 |
| 15. | යුහ හොකි ක්‍රීඩා කමිටුව | 710,019.00 |
| 16. | යුහ ජූඩෝ ක්‍රීඩා කමිටුව | 744,375.00 |
| 17. | යුහ කබඩි ක්‍රීඩා කමිටුව | 390,312.00 |
| 18. | යුහ කරාතේ ක්‍රීඩා කමිටුව | 360,862.00 |
| 19. | යුහ මෝටර් රථ ක්‍රීඩා කමිටුව | 505,584.00 |
| 20. | යුහ දැල්පන්දු ක්‍රීඩා කමිටුව | 347,943.75 |
| 21. | යුහ කායවර්ධන හා බර ඉසිලීමේ ක්‍රීඩා කමිටුව | 1,695,961.25 |
| 22. | යුහ පැරෂුට් ක්‍රීඩා කමිටුව | 272,925.00 |
| 23. | යුහ ඔරු පැදීමේ ක්‍රීඩා කමිටුව | 303,000.00 |
| 24. | යුහ රගර් ක්‍රීඩා කමිටුව | 5,221,187.76 |
| 25. | යුහ පාපන්දු ක්‍රීඩා කමිටුව | 15,197,542.49 |
| 26. | යුහ වෙඩිතැබීම් ක්‍රීඩා කමිටුව | 31,937.50 |
| 27. | යුහ පිහිණුම් හා දියපන්දු ක්‍රීඩා කමිටුව | 570,400.00 |
| 28. | යුහ ස්කොෂ් ක්‍රීඩා කමිටුව | 114,396.99 |
| 29. | යුහ මේසපන්දු ක්‍රීඩා කමිටුව | 431,300.00 |
| 30. | යුහ ටයිකොන්ඩෝ ක්‍රීඩා කමිටුව | 450,494.75 |
| 31. | යුහ ටෙනිස් ක්‍රීඩා කමිටුව | 1,559,470.00 |
| 32. | යුහ වොලිබෝල් ක්‍රීඩා කමිටුව | 943,214.00 |
| 33. | යුහ මල්ලවපොර ක්‍රීඩා කමිටුව | 375,925.00 |
| 34. | යුහ වුෂු ක්‍රීඩා කමිටුව | 1,179,000.00 |
| | එකතුව | 107,975,965.30 |

6. <u>ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය 2013.12.31 දිනට</u>

| අනු අංකය | විස්තරය | 2013 සඳහා ප්‍රතිපාදන | 2013 වර්ෂයේ බැදීම් | මුළු වියදම් | අත ඉතිරිය 31.12.2013 |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| 1. | ක්‍රීඩා භාණ්ඩ මිළදී ගැනිමේ වැය ශීර්ෂය (222-01-2- 1205(XVI) | 30216100.00 | 68107586.75 | 50237224.87 | (37891486.75) |
| 2. | පිහිණුම් තඨාක රසායනික ද්‍රව්‍ය මිළදී ගැනිමේ වැය ශීර්ෂය (222-01-2-1204(XI) | 1600000.00 | 3287574.72 | 2997286.32 | (1687574.72) |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
|---|---|---|---|---|---|
| 3. | පිහිණුම් තටාක මෙවලම් මිළදී ගැනීමේ වැය ශීර්ෂය (222-01-2-1205(XXI) | 400000.00 | 399868.00 | 381808.00 | 132.00 |
| 4. | ක්‍රීඩාපිටි කුලියට ගැනිමේ වැය ශීර්ෂය (222-01-02-1401(III) | 4200000.00 | 1177055.89 | 1177055.89 | 3022944.11 |
| 5. | පදක්කම්/කුසලාන සෑදිම සදහා වැය ශීර්ෂය (222-01-1-1508(VII) | 2500000.00 | 5104510.60 | 4570831.20 | (2604510.60) |
| 6. | ව්‍යායාම උපකරණ සේවා කිරිමේ වැය ශීර්ෂය (222-01-2-1302(XII) | 500000.00 | 53626.66 | 53626.66 | 446373.34 |

# තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය

## හැඳින්වීම

1. තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය 2010 මාර්තු 01 දින ස්ථාපනය කරන ලදි. ප්‍රධාන සංඥා නිලධාරිතුමාගේ අධීක්ෂණය යටතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය සියලුම තොරතුරු තාක්ෂණ සහ පරිපාලනමය කටයුතු සිදුකරනු ලබයි. 11 වන ශ්‍රී ලංකා සංඥා බලකාය සෘජුවම තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ ක්‍රියා කරනු ලබයි.

## වගකීම්

2. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකිම් පහත සදහන් පරිදි වේ.

අ. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් කරනු ලබන සියලුම කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රධාන සංඥා නිලධාරිතුමා වෙත වගකිම.

ආ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අවශ්‍යතාවය වෙනුවෙන් සම්පාදන කරන ලද සියලුම මෘදුකාංග පද්ධතින් ක්‍රියාවට නැංවීම සහ නඩත්තු කිරිම.

ඇ. ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානයෙහි පර්යේෂණ හා සංවර්ධන කාර්ය මණ්ඩලය සමග සම්බන්ධීකරණය වෙමින් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතින්හි තවදුරටත් වර්ධනය විය යුතු ක්ෂේත්‍රයන් හදුනා ගැනීම.

ඈ. ආරක්ෂක සේනා ආඥාපතිවරුන් හා ස්වාධීන බලසේනාධිපතිවරුන් සමග සම්බන්ධීකරණය වෙමින් සැලසුම් කරන ලද ව්‍යාපෘතින් ක්‍රියාවට නැංවීම.

ඉ. ශ්‍රීලංකා යුද්ධ හමුදාවේ සිටින සියලුම තොරතුරු තාක්ෂණ නිලධාරින්ගේ සහ සෙසු නිලයින්ගේ වෘත්තිමය කළමණාකාරිත්වය පිළිබඳව සංඥා නිලධාරි වෙත වගකීම

ඊ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සහ සෙසුනිළ කාර්ය මණ්ඩලයන් බඳවා ගැනීමේදී ප්‍රධාන සංඥා නිලධාරි සමග සම්බන්ධීකරණය වීම.

උ. තොරතුරු තාක්ෂණයේ වෙනස් වන ඉල්ලුමට අනුව මෘදුකාංග පද්ධති සංවර්ධනය සදහා අවශ්‍ය වන මෘදුකාංග සහ උපාංග පිළිබඳව පූර්ව නිවේදනය කිරිම සහ පරිගණක මෘදුකාංග සහ උපාංගයන්හි තත්වය උසස් මට්ටමක පවත්වාගෙන යාමට ඇති වගකීම.

ඌ. සියලුම දත්ත සන්නිවේදන අවශ්‍යතාවයන් සදහා සංඥා බලසේනාධිපති සමග සම්බන්ධීකරණය විම.

එ. තොරතුරු තාක්ෂණ උපාංගයන්හි අලුත්වැඩියා කටයුතු හා නඩත්තු සදහා 11 වන ශ්‍රී ලංකා සංඥා බලකා වැඩපල හා දේශීය නියෝජිතයන් සමග සම්බන්ධීකරණය වීම.

ඒ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය තොරතුරු තාක්ෂණ වෘත්තිකයින්ගේ අවශ්‍යතාවය සැපිරිම සදහා කටයුතු කිරිමට ඇති වගකීම.

ඔ. ප්‍රතිසම්පාදන ක්‍රියාවලිය සදහා. තොරතුරු තාක්ෂණ දෘඩාංග/මෘදුකාංග සහ අමතර උපකරණ පිළිබඳව ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය දැනුවත් කිරිමේ වගකීම.

ඕ. තොරතුරු තාක්‍ෂණ උපදේශක, පර්යේෂණ හා සංවර්ධන කාර්යය මණ්ඩලය සහ කර්නල් තොරතුරු තාක්‍ෂණගේ උපදෙස් සමගින් විවිධ වූ තොරතුරු තාක්‍ෂණ ව්‍යාපෘතින් ක්‍රියාවට නැංවීම හා නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගතිය අධීක්‍ෂණය කිරීම.

ක. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්‍ෂණයට අදාළ තොරතුරු තාක්‍ෂණ උපාය මාර්ගයන් සහ ප්‍රතිපත්ති තීරණයන් ප්‍රධාන සංඥා නිලධාරීතුමා වෙත ක්‍රමවත්ව දැක්වීමේ වගකීම.

ග. තොරතුරු තාක්‍ෂණ නිලධාරීන් සහ සෙසුනිලයින් දේශීය සහ විදේශීය පාඨමාලාවන්හි පුහුණු කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන සංඥා නිලධාරීතුමා වෙත දැක්වීමේ වගකීම.

ජ. පුහුණු අධ්‍යක්‍ෂ මණ්ඩලය මගින් පෙන්වාදෙනු ලබන ආයතනය සහ පුද්ගලයින්ට පුහුණු සැසියන් සංවිධානය කරමින් යුද්ධ හමුදාව තුළ තොරතුරු තාක්‍ෂණයේ දැනුම බෙදා හැරීමට කටයුතු කිරීම.

<u>**කාර්යභාරය**</u>

**3**. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය මගින් භාරදෙනු ලබන තොරතුරු තාක්‍ෂණ කාර්යයන් ක්‍රියාවට නැංවීම, අධීක්‍ෂණය කිරීම හා වාර්තා කිරීම.

<u>**කාර්‍ය්‍යයන්**</u>

4. මෙම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ සම්පාදන කරනු ලබන තොරතුරු තාක්‍ෂණ පද්ධතීන් සහ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

ආ. තොරතුරු තාක්‍ෂණ සංවර්ධන කණ්ඩායම මගින් අලුතින් ක්‍රියාවට නැංවිය යුතු ව්‍යාපෘතීන් ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයට නිර්දේශ කිරීම.

ඇ. දැනට පවත්නා පද්ධතීන් තොරතුරු තාක්‍ෂණ සංවර්ධන කණ්ඩායම මගින් ඉහළ තත්වයක පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.

ඈ. සංඥා පාසල සමග සම්බන්ධීකරණය වෙමින් තොරතුරු තාක්‍ෂණ පුහුණු සැසියක් පැවැත්වීම.

ඉ. තොරතුරු තාක්‍ෂණ උපාංගයන්ගේ අලුවැඩියා කටයුතු සහ නඩත්තු කටයුතු සඳහා සංඥා මූලික වැඩපල සහ 11 වන ශ්‍රීලංකා සංඥා බලකාය සමග සම්බන්ධීකරණය වෙමින් කටයුතු කිරීම.

ඊ. මෘදුකාංග සංවර්ධන කණ්ඩායමට අවශ්‍ය තොරතුරු තාක්‍ෂණ දෘඩාංග සහ තොරතුරු තාක්‍ෂණ අමතර කොටස්හි අවශ්‍යතාවය සොයා බලා ඒ සඳහා අදාළ කටයුතු කිරීම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

5. <u>ප්‍රධාන ව්‍යාපෘතින්</u>

අ. <u>කාර්යාල මානව සම්පත්ක කළමණාකරණ පද්ධතිය</u>.

(1) මෙය ඉදිරියේදී මිනැම යුද්ධ හමුදා ආයතයක් තුල එදිනෙදා කාර්යාල කටයුතු පහසුවෙන් සිදුකර ගැනිම සඳහා CHRMS පද්ධතිය දිර්ඝ කොට ක්‍රියාත්මක කරනු ලබන අලුත්ම සංස්කරණයකි.

(2) කාර්‍යයන් සඳහා සම්පත් වෙන් කිරිම, නිවාඩු කළමණාකරණ සහ වෛද්‍ය වාර්තා කළමණාකරණය යනාදි මූලික ක්‍රියාකාරකම් වලින් මෙය සමන්විත වේ.

(3) පද්ධතියේ සංවර්ධන කටයුතු 2013 වසරේ සැප්තැම්බර් මසදී ආරම්භ කරන ලදී.

ආ. <u>මානව සම්පත් කළමණාකරණ පද්ධතිය (අදියර II, අදියර III)</u>

(1) මෙම මෘදුකාංග පද්ධතිය යුද්ධ හමුදාවේ සියලුම පුද්ගල කළමණාකරණ පද්ධතින්හි මූලික පද්ධතිය ලෙස ක්‍රියා කරනු ලැබේ.

(2) යුද්ධ හමුදාවෙහි සේවය කරනු ලබන පුද්ගලයන්ගේ අත්‍යාවශ්‍ය තොරතුරු සහ විස්තරයන් මෙම පද්ධතිය තුලට ඇතුලත් කර ඇත.

(3) රෙජිමේන්තු මධ්‍යස්ථානයන් මෙහි තොරතුරු ඇතුලත් කරන ප්‍රධාන පරිශිලකයා වේ. ආරක්ෂක ලේකම් කාර්යාලය, මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලය, විනයාරක්ෂකඅධ්‍යක්ෂ මණ්ඩලය, පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය හා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය යන ආයතන ද මෙම පද්ධතියේ තොරතුරු සඳහා දායකත්වය ලබාදී ඇත.

(4) 2011 සැප්තැම්බර් මස 21 සහ 22 යන දිනයන්හිදී මෙම පද්ධතිය රෙජිමේන්තු මධ්‍යස්ථානයට හඳුන්වා දෙන ලදී. මේ ආකාරයට පද්ධතියේ පළමු අදියර දියත් කළ අතර, එහිදී රෙජිමේන්තු මධ්‍යස්ථානයන්ට පද්ධතියට දත්ත ඇතුලත් කිරිමේ කාර්යය භාර කරන ලදී.

(5) ඒකක මට්ටමේ පරිශිලක පුහුණුව 2012 අප්‍රේල් 05 සිට අගෝස්තු 10 වනදා දක්වා පනාගොඩ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක මණ්ඩලයේදී සිදු කරන ලදී. මෙම පුහුණු සැසියන් සඳහා නිළධාරින් 279 දෙනෙකද සෙසුනිලයින් 290 දෙනෙකු සහභාගී විය.

(6) පළමු ප්‍රගති සමාලෝචන රැස්විම මාණ්ඩලික ප්‍රධානිතුමාගේ මගපෙන්විමෙන් 2013.02.21 දින සියලුම රෙජිමේන්තු අණදෙන නිළධාරින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී. දෙවන අදියරෙහි ප්‍රගති සමාලෝචන රැස්විමද මේ ආකාරයෙන්ම සියලුම රෙජිමේන්තු වල සහභාගිත්වයෙන් 2013.11.05 දින පවත්වන ලද අතර, එහිදී 2013 නොවැම්බර් මාසය වන විට මූලික දත්ත රැස්කිරිමේ ක්‍රියාවලිය අවසන් කිරිමට සැළසුම් කරන ලදී.

(7) අදියර II ක්‍රියාවට නැංවීමේ සාර්ථකත්වයත් සමගින් CHRM පද්ධතියේ 3 වන අදියර ලෙස යුද්ධ හමුදාවේ ඇති විවධ ආයතනයන්ට අවශ්‍ය තොරතුරු රැස්කිරිමට මූලික වන පද්ධතික සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදී.

ඇ. <u>ස්වයංක්‍රිය ද්‍රව්‍ය කළමණාකරණ පද්ධතිය</u>

(1) පද්ධතිය වැඩිදියුණු කිරිමේ සහ නඩත්තු කිරිමේ කාර්යය මෙම වසර තුළදී සිදු කරන ලදී.

(2) පරිශීලක පුහුණුව නිලධාරින් 33 දෙනෙකුගේ හා සෙසුනිල 156 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිදුකරන ලදී.

(3) නව අවශ්‍යතාවයන් යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ඉල්ලුම් කරන ලද අතර, මූලික යුධෝපකරණ ගබඩාවෙහි පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී.

ඈ. <u>ප්‍රසම්පාදන කළමණාකරණ පද්ධතිය</u>

(1) මෙම පද්ධතිය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සදහා සංවර්ධනය කරන ලද්දකි. මිළ ගණන්පත් ඉදිරිපත් කිරිමේ ක්‍රියාවලිය යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව සහ යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය අතර හුවමාරු වන සියලුම ලේඛනයන් මෙම පද්ධතිය මගින් ආවරණය කර ඇත.

(2) තවද මෙම මෘදුකාංග පද්ධතිය මගින් මූල්‍ය කළමනාකරණ ශාඛාව සහ අයවැය හා මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ඇති ජන්ද කළමණාකරණය කිරිමේ පහසුකමද සලසා ඇත.

(3) යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය හි දේශිය මිළදී ගැනිමේ අංශයට අදාළ පරිශිලක පුහුණුව 2012 දෙසැම්බර් මස පවත්වන ලදී. නිලධාරින්ගේ සහ සෙසුනිලයින්ගේ පද්ධතිය පිළිබඳ දැනුම වර්ධනය කිරිම සදහා දින 05 ක පුහුණු සැසියක් යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලයහිදී පවත්වන ලදී. ඒ සදහා නිලධාරින් 18 ක් සහ සෙසුනිලයන් 108 ක් සහභාගී විය.

(4) මේවන විට පද්ධතිය දේශිය ගැණුම් අංශය සහ ටෙන්ඩර් විවෘත කිරිමේ අංශයෙහි සමගාමිව ක්‍රියාත්මක වේ.

ඉ. <u>සුභසාධක රක්ෂණ කළමනාකරණ පද්ධතිය</u>. මෙම පද්ධතිය රක්ෂණ කටයුතු සිදුකිරිම සදහා පහසුකම සකසා දෙන අතර, සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ මානව සම්පත් කළමණාකරණ පද්ධතිය එක්ව් මෙය ක්‍රියාත්මක කරනු ලබයි. සංවර්ධන කටයුතු 2013 සැප්තැම්බර් මස ආරම්භ කරන ලදී.

ඊ. <u>අවි කළමණාකරණ පද්ධතිය</u>

(1) මෙම පද්ධතිය ස්ථාවර මෘදුකාංග (Standalone) ලෙස සංවර්ධන කර ඇති අතර මධ්‍යම ආයුධ ගබඩාවෙහි ස්ථාපනය කර ඇත.

(2) මෙමගින් ඒකකයන්හි දත්ත යුද්ධ සේවා ලෙජරයට ඇතුළත් කිරිම සිදුකරනු ලබයි.

(3) දෙවන අදියරෙන් පසු එකිනෙක සමග සියලුම දත්තයන් සසඳා බලනු ලැබේ.

(4) පද්ධති අධ්‍යයනය මේ වන විට අවසන් වී ඇති අතර ක්‍රියාත්වීත අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මධ්‍යම ආයුධ ගබඩාව සහ ඒකක ආයුධාගාර සම්බන්ධ කිරිමට වෙබ් අඩවි මූලික කරගත් නව මෘදුකාංගයක් සංවර්ධනය කර ඇත.

(5) පද්ධතිය සඳහා ප්‍රධාන මාණ්ඩලික ශාඛාව හි අනුමැතිය ලැබ් ඇති අතර, දත්ත ඇතුලත් කිරිම තාවකාලිකව නතර විමට හේතුවී ඇත්තේ මධ්‍යම ආයුධ ගබඩාවෙහි ආයුධ සහ පතොරම් සංසන්දනය තවමත් ක්‍රියාත්මක විම හේතු කොටගෙනය.

ඩ. <u>බිල්පත් පියවීම් අධීක්‍ෂණ පද්ධතිය</u>

(1) මූල්‍ය කලමනාකරණ ශාඛාවේ අධීක්‍ෂණය කිරීමේ ප්‍රමාණය වැඩි කිරිම සඳහා මෙම පද්ධතිය සංවර්ධන කරන ලදි.

(2) මෙම පද්ධතිය මගින් ප්‍රාදේශිය ගණකාධිකාරිවරුන් සමග මූල්‍ය කලමණාකරණ අධ්‍යක්‍ෂක ජෙනරාල් තුමා සම්බන්ධවේ.

(3) මූල්‍ය කලමනාකරණ අධ්‍යක්‍ෂක ජෙනරාල් තුමාට බිල්පත් පියවීමේ පද්ධතිය අධීක්ෂණය කළ හැකිය.

(4) ප්‍රධාන ගණකාධිවරුන්ගේ කාර්යාලය සහ ප්‍රාදේශිය ගණකාධිකාරිවරුන් මෙම පද්ධතිය මගින් මේ වන විට සම්බන්ධ වී ඇත.

(5) මූල්‍ය කලමනාකරණ ශාඛාව, මුදල් අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ ආරක්‍ෂක සේනා මූලස්ථාන 6 ක නිලධාරින් 15 දෙනෙකුට සහ සෙසුනිලයින් 18 දෙනෙකුට 2013 ජූලි මස 29 වන දින එක් දින වැඩමුළුවක් ලෙස පරිශීලක පුහුණුව ලබාදෙන ලදි.

(6) සියලුම ප්‍රාදේශිය ගිණුම් කාර්යාලයන්හි ගිණුම් ලිපිකරුවන් සඳහා දින 05 ක වැඩමුළුවක් මූල්‍ය කලමනාකරණ ශාඛාව සහ අනෙකුත් ගණකාධිකාරිවරුන්ගේ සහභාගිත්වයෙන් 2013 ඔක්තෝබර් මස 25 සහ 29 යව දෙදින පුරා පවත්වන ලදි.

(7) මේ වන විට පද්ධතිය ප්‍රධාන ගණකාධිකාරිවරුන්ගේ කාර්යාලය සහ ප්‍රාදේශිය ගණකාධිකාරිවරුන්ගේ කාර්යාලය මගින් ඔවුන්ගේ බිල්පත් නිශ්කාපණ ක්‍රියාවලින් සඳහා භාවිතයට ගනු ලැබේ.

ඩා. <u>ප්‍රවාහන කලමණාකරන පද්ධතිය</u>. පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ නඩත්තු කිරිමේ කාර්‍ය්‍යය මෙම වසර තුළදි සිදුකරන ලදි.

එ. <u>රෝහල් තොරතුරු කලමණාකරණ පද්ධතිය</u>

(1) රෝහලට අදාලව සිදුවන සියලුම ක්‍රියාකාරකම් අධ්‍යනය කිරීමෙන් පසුව පද්ධතිය සංවර්ධනය ආරම්භ කරන ලදි.

(2) රෝහල් තොරතුරු කලමණාකරන පද්ධතිය මේ වන විට නාරාහේන්පිට රෝහල් කාඩ් අංශයේ සහ බාහිර රෝගි අංශයේ සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවති.

(3) විශේෂ බෙහෙත් නිකුත් කරන කවුන්ටරය, සාමාන්‍ය PULHEEMS අංශය සහ ETU අංශයද පරිගණක ගත කරමින් පවතී. එම පද්ධතිය 2013 නොවැම්බර් මස අවසන් වන විට සාර්ථකව ක්‍රියාවට නැංවිය හැකි වේ.

(4) මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව නාරාහේන්පිට රෝහලේ පරිශීලක පුහුණුවද ක්‍රියාත්මක වෙමින් පවතී. මීලග මාස කිහිපය තුළ පරිශීලකයන්ගේ පද්ධතිය සමග වැඩ කිරීමේ හැකියාව හොඳින් තහවුරු කළ හැකි ලෙස ඔවුන්ට ක්‍රමානුකූල පුහුණු සැසියන් පවත්වනු ලැබේ.

(5) මීලග පියවර සඳහා අවශ්‍ය උපකරණයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පවතී.

ඒ. <u>බුද්ධිමය තොරතුරු කළමණාකරණය කිරීමේ පද්ධතිය</u>. ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා යෝජනා කරන ලද මූලික යෝජනාවන් ඉදිරිපත් කර ඇති අතර, 2013 දෙසැම්බර් මසදී සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

6. <u>අනෙකුත් ව්‍යාපෘතීන්</u>

අ. 2013 වසරේදී සිදුකරන ලද අනෙකුත් ව්‍යාපෘතීන් පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතිය/ස්ථානය | වත්මන් තත්වය |
|---|---|---|
| 1. | එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් දත්ත කළමණාකරණ පද්ධතිය | අවසන් කර ඇත |
| 2. | යුද්ධ හමුදා නොවන පාඨමාලා කළමණාකරන පද්ධතිය | අවසන් කර ඇත |
| 3. | ව්‍යාපෘති තත්වය අධීක්ෂණ පද්ධතිය | අවසන් කර ඇත |
| 4. | සියලුම ඒකක සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සඳහා ඒකක යහසාධක අරමුදල් කළමණාකරණ පද්ධතිය | අවසන් කර ඇත |
| 5. | යාල නිවාඩු නිකේතනය සඳහා හෝටල් කළමණාකරණ පද්ධතිය | අවසන් කර ඇත |

7. <u>වෙබ් අඩවි</u>

අ. පහත සඳහන් වෙබ් අඩවි වැඩිදියුණු කිරීම සහ පවත්වාගෙන යාම සිදුකරන ලදී.

| අනු අංකය | වෙබ් අඩවිය / ස්ථානය | වත්මන් තත්වය |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | ස්වේච්ඡා බලසේනා මූලස්ථානය | එළි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවතී |
| 2. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | එළි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවතී |
| 3. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකාය | එළි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවතී |

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| 4. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද හමුදා කාන්තා බලකාය | එලි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවති |
| 5. | ආරක්‍ෂක සමුළුව 2013 වෙබ් අඩවිය | ආරක්‍ෂක සමුළුව සඳහා එළිදක්වන ලදි. |
| 6. | ආරක්‍ෂක සමුළුව 2014 වෙබ් අඩවිය | සංවර්ධන කටයුතු ආරම්භ කරන ලදි |
| 7. | සාමසාධක මෙහෙයුම් පුහුණු පාසල - කුකුලේගග | නව වෙබ් අඩවිය එළිදක්වන ලදි |
| 8. | ආරක්‍ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | සංවර්ධනය කරමින් පවති |
| 9. | ආරක්‍ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) | එලි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවති |
| 10. | ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | එලි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවති |
| 11. | ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධාන කාර්යාල වෙබ් අඩවිය | එලි දක්වා ඇති අතර නඩත්තු කටයුතු සිදුකරමින් පවති |
| 12. | යුද හමුදා රෝහල(කොළඹ) | සංවර්ධනය කරමින් පවති |
| 13. | ගුවන් ප්‍රවේශ පත්‍ර අලෙවිය- ගමන් පාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය | සංවර්ධනය කරමින් පවති |

<u>අනෙකුත් දත්තයන්</u>

8. ශ්‍රීලංකා යුද්ධ හමුදාව මගින් ක්‍රියාවට නංවා ඇති දත්ත ජාල සම්බන්ධතාවයන්

| | | | |
|---|---|---|---|
| අ. | වැටුප් හා ලේඛණ අධ්‍යක්‍ෂ මණ්ඩලය | - | 01 |
| ආ. | ශ්‍රී ලංකා යුධ හමුදා යහ සාධක අරමුදල | - | 01 |
| ඇ. | 59 වන සේනාංක මූලස්ථානය | - | 01 |
| ඉ. | 64 වන සේනාංක මූලස්ථානය | - | 01 |
| ඊ. | 11 වන ශ්‍රී ලංකා සංඥා බලකාය | - | 01 |
| | එකතුව | - | 05 |

9. 2013 වසරේදී පරිගණක වැඩපල මගින් අලුත් වැඩියා කරන ලද පරිගණක/ පරිගණක උපාංග පිලිබඳ දත්තයන්.

(1) <u>පනාගොඩ වැඩපල</u>

| අනු අංකය | උපාංගය | වැඩපල | ආයතනය | පාවච්චියට නුසුදුසු |
|---|---|---|---|---|
| 1. | CPU | 245 | 141 | 214 |
| 2. | Monitor | 67 | 50 | 263 |
| 3. | UPS | 92 | 31 | 199 |
| 4. | Laptop | 6 | 20 | 38 |
| 5. | Printer | 102 | 72 | 103 |
| 6. | Other | 52 | 29 | 260 |
| එකතුව | | 564 | 343 | 1077 |

(2) <u>යුද්ධ හමුදා මූලස්ථාන වැඩපල</u>

| අනු අංකය | උපාංගය | වැඩපල | ආයතනය | පාවච්චියට නුසුදුසු |
|---|---|---|---|---|
| 1. | CPU | 674 | 54 | 41 |
| 2. | Monitor | 51 | 8 | 15 |
| 3. | UPS | 67 | 6 | 17 |
| 4. | Laptop | 30 | 6 | 2 |
| 5. | Printer | 110 | 14 | 13 |
| 6. | Other | 32 | - | 33 |
| එකතුව | | 964 | 88 | 121 |

(3) <u>කොකාවිල් වැඩපල</u>

| අනු අංකය | උපාංගය | වැඩපල | ආයතනය | පාවච්චියට නුසුදුසු |
|---|---|---|---|---|
| 1. | CPU | 692 | - | - |
| 2. | Monitor | 38 | - | - |
| 3. | UPS | 37 | - | - |
| 4. | Laptop | 22 | - | - |
| 5. | Printer | 118 | - | - |
| 6. | Other | 17 | - | - |
| එකතුව | | 924 | 0 | 0 |

**<u>පුහුණුවීම්</u>**

10. 2013 වසරේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද බිල්පත් පියවීම අධීක්ෂණ පද්ධතියේ පුහුණු සැසියන්හි දත්තයන් පහත සදහන් වේ.

| අනු අංකය | ස්ථානය | සහභාගි වූ ප්‍රමාණය | |
|---|---|---|---|
| | | (නිලධාරි) | (සෙසුනිල) |
| 1. | මූල්‍ය කළමණාකරන ශාඛාව | - | 01 |
| 2. | මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය | 06 | 06 |
| 3. | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 01 | 02 |
| 4. | ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) | 02 | 03 |
| 5. | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 01 | 02 |
| 6. | ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චි) | 01 | |
| 7. | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 01 | 02 |
| 8. | ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) | 02 | 02 |
| 9. | ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 01 | |
| එකතුව | | 15 | 18 |

11. <u>බඳවාගැනීම්</u>. තොරතුරු තාක්ෂණ නිලධාරින් 04 දෙනෙකු සහ දත්ත ඇතුලත් කිරිමේ ක්‍රියාකරුවන් 78 දෙනෙකු 2013 වසරේදි බඳවාගන්නා ලදි.

## මූල්‍ය කළමනාකරණ ශාඛාව

### හැඳින්වීම

1. මූල්‍ය කළමනාකරණ ශාඛාව ස්ථාපිත කිරීම යුද්ධ හමුදාධිපති විසින් 2005 වසරේ නොවැම්බර් මස 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කර ඇත. ඒ අනුව දැනට මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල 07 කින් සමන්විත වේ:

අ. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය.

ආ. වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය.

ඇ. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය.

ඈ. මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය.

ඉ. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය.

ඊ. යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය.

උ. කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය.

### වගකීම්

2. මූල්‍ය කළමනාකරණ ශාඛාව සමස්ථ යුද්ධ හමුදාවේ සියලුම මූල්‍ය කටයුතු පිළිබඳ පිළිවෙත් පාලන නිලධාරි වශයෙන් කටයුතු කරන අතර, මූල්‍ය කළමනාකරණ ශාඛාවේ පාලනය යටතේ ඇති පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල වල පාලනය අධීක්ෂණය සහ සම්බන්ධතාවය යන කාර්යයන් සඳහා වගකිව යුතුවේ.

අ. <u>අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුද්ධ හමුදාධිපති විසින් ලබාදෙන උපදෙස් හා මාර්ගෝපදේශයන් අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාල කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය කළමනාකරණ අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා වැය ශීර්ෂ යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම, වියදම් කළමනාකරණය, සමාලෝචනය කිරීම සහ අවශ්‍යතාවය පරිදි මූල්‍ය කළමනාකරණ තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට ලබාදීමට පියවර ගැනීම අධ්‍යක්ෂ අයවැය හා මුදල් පරිපාලන වෙත පවරා ඇති වගකීම වේ.

ආ. <u>වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුද්ධ හමුදා චර්යා නියෝග 18/94, 1994 අප්‍රේල් 30 අනුව වැටුප්, දීමනා, වන්දි ගෙවීම්, පුද්ගලික වාර්තා පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ඇ. <u>අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුද්ධ හමුදාව තුල අඛණ්ඩ සමීක්ෂණ සිදුකිරීම තුලින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම අලාභ, නාස්තිය හා අකර්මන්‍ය වීම් වලින් වත්කම් සුරක්ෂිත කිරීම දුර්වල පද්ධතීන් හඳුනාගෙන එම පද්ධතීන් වැඩි දියුණු කිරීම වැරදි හා වංචාවන් වැලැක්වීම සහ හෙළිදරව් කරගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ඈ. <u>මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි, වෙනත් අදාල පනත්, මහාභාණ්ඩාගාරය වෙතින් නිකුත්කර ඇති චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ වලට අනුව යුද්ධ හමුදාවේ සියලුම රාජ්‍ය මුදල් පාලනය කිරීම ගිණුම් කටයුතු පවත්වාගෙන යාම වාර්තා කිරීම් සහ වෙනත් අදාල ක්‍රියාකාරකම් සඳහා වගකිවයුතු වේ.

ඉ. <u>වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුද්ධ හමුදාව සතු වත්කම් වඩාත් සකසුරුවම්, කාර්යක්ෂමව සහ ඵලදායි ආකාරයෙන් කළමනාකරණය කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ඊ. <u>යුහ යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය</u>. සාමාජිකයන්ගෙන් දායකත්ව මුදල් එකතුකර ගැනීම සහ වඩා වැඩි ප්‍රතිලාභයක් ලැබෙන සේ ලාභදායී සහ ආරක්ෂාකාරී අයුරින් ආයෝජනය කිරීම යුහ යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

උ. <u>කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුද්ධ හමුදා ගොවිපලවල් හි සිටින නිලධාරි සහ සෙසුනිලයින් හට අති නවීන අධි තාක්ෂණික නූතන කෘෂි කාර්මික දැනුම ලබාදීම, රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත කෘෂි නිලධාරින් සහ කෘෂිකාර්මික හඨ පිරිස් යාකිරීම් සඳහා උපදෙස් ලබාදීම, කෘෂිකාර්මික යන්ත්‍රසූත්‍ර ගොවිපල සඳහා වෙන් කිරීම සහ බෙදාහැරීම, යුද්ධ හමුදාවේ ඇති කෘෂිකර්මාන්ත ව්‍යාපෘති සහ යුද්ධ හමුදා ගොවිපලවල් වල අභිවෘද්ධිය සඳහා අවශ්‍ය වන දැනුම සහ උපදෙස් ලබාදීම වගකීම් වේ.

<u>**කාර්‍යභාරය**</u>

**3**. අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය, වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය, වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය යන අධ්‍යක්ෂ මණ්ඩලවලට අදාලවන සියලුම කාර්යයන් පාලනය අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම මූල්‍ය කළමනාකරණ ශාඛාවේ කාර්යභාරය වේ.

<u>**කාර්‍යයන්**</u>

4. මෙම ශාඛාවේ කාර්‍යයන් පහත සඳහන් පරිදි වේ.

අ. ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල වල රාජකාරින් සහ වගකීම් හි සමස්ථ තාක්ෂණික පාලනය අධීක්ෂණය සහ සම්බන්ධීකරණය කිරීම.

ආ. ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩලවල සියලු තාක්ෂණික අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිපත්ති සකස්කිරීම ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

ඇ. ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩලවල සියලුම මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලින්, අයවැය සකස්කිරීම්, වැය සම්මත අරමුදල් ලබාගැනීම් සහ බෙදාහැරීම් වලට අදාලව පාලනය සහ සමස්ථ අධීක්ෂණය සිදුකිරීම.

ඈ. යුද්ධ හමුදාව වෙත වෙන්කර ඇති වත්කම් සහ අරමුදල් ප්‍රසස්ථ අයුරින් උපයෝජනය කිරීම සඳහා වන මූල්‍ය කළමනාකරණ ක්‍රියාපිළිවෙත්, ගිණුම්කරණ පද්ධතින්, අභ්‍යන්තර විගණන ක්‍රමයන්, වත්කම් කළමනාකරණ පද්ධතින් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑම.

ඉ. රාජ්‍ය මූල්‍ය සහ රාජ්‍ය විගණනයට අදාලව රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, මහාභාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධතා පවත්වාගෙන යාම.

ඊ. ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල වෙත යුද්ධ හමුදාධිපති විසින් ලබාදෙන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

උ. මූල්‍ය කළමනාකරණ ශාඛාව තුළ මූල්‍ය තොරතුරු දත්ත ගොනු සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

5. 2014 වර්ෂය සඳහා වෙන්කරනු ලබන රාජ්‍ය මුදල් උපරිම අයුරින් උපයෝජනය කිරීම සඳහා සියලුම වැය පාලන නිලධාරින් සහ ප්‍රතිපත්ති පාලන නිලධාරින් දැනුවත් කිරීම සඳහා 2013 නොවැම්බර් 26 සහ 27 දිනයන් හි "2014 අයවැය සමුළුව" පවත්වන ලදී "

6. ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) තුළ මුදල් අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ ප්‍රාදේශිය ගණකාධිකාරි කාර්යාලය ස්ථාපිත කිරීමට 2013 අප්‍රේල් 03 දින සිට අනුමැතිය ලබාගන්නා ලදී.

**<u>සාක්ෂාත් කරගැනීම</u>**

7. 2013 වර්ෂයේ යුද්ධ හමුදාව වෙත වෙන්කරන ලද ප්‍රතිපාදනයන් වඩාත් කාර්‍යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගෙන ඇති බව මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පවත්වාගෙන යන සත්‍ය වියදම් වාර්තාවලට අනුව පහත පරිදි වේ:

| අනු අංකය | වර්ගය | වෙන්කිරීම් රු | වියදම රු | % |
|---|---|---|---|---|
| 1. | පුනරාවර්ථන | 116,900,114,000.00 | 116,842,837,305.00 | 99.95 |
| 2. | ප්‍රාග්ධන | 6,055,225,000.00 | 6,049,964,879.00 | 99.91 |
| | එකතුව | 122,955,339,000.00 | 122,892,802,184.00 | 99.95 |

**<u>මූල්‍යමය විස්තරය</u>**

8. මෙම ශාඛාවෙහි මූල්‍ය ප්‍රතිපාදන පහත සඳහන් පරිදි වේ:

අ. 2013 වසර සඳහා සම්පූර්ණ ප්‍රථිපාදන පහත සඳහන් පරිදි වේ:

| අනු අංකය | වර්ගය | වටිනාකම රු | % |
|---|---|---|---|
| 1. | පුනරාවර්ථන | 116,900,114,000.00 | 95% |
| 2. | ප්‍රාග්ධන | 6,055,225,000.00 | 5% |
| | එකතුව | 122,955,339,000.00 | 100% |



ආ. සත්‍ය වියදම (මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රාදේශීය ගණකාධිකාරි කාර්යාලයන්ගේ වාර්තා වලට අනුව 2013.12.31 දිනට)

| අනු අංකය | වර්ගය | වටිනාකම රු | % |
|---|---|---|---|
| 1. | පුනරාවර්ථන | 116,842,837,305.00 | 95% |
| 2. | ප්‍රාග්ධන | 6,049,964,879.00 | 5% |
| | එකතුව | 122,892,802,184.00 | 100% |




ඇ. ප්‍රධාන වර්ග කිරීම් වලට අනුව 2013 වර්ෂය සඳහා වියදම

| අනු අංකය | වර්ගය | මුදල රු | % |
|---|---|---|---|
| 1. | වැටුප් හා දීමනා | 91,741,600,653.00 | 75% |
| 2. | වෙනත් පුනරාවර්ථන | 25,101,236,652.00 | 20% |
| 3. | ප්‍රාග්ධන | 6,049,964,879.00 | 5% |
| | එකතුව | 122,892,802,184.00 | 100% |



## අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. 1981 වර්ෂයේදී ස්ථාපනය කරණ ලද අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාධිපතිගේ සෘජු අධීක්ෂණය යටතේ පාලනය විය.

2. 1994 වසරේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රතිසංවිධානය කර ප්‍රතිව්‍යුහගත කිරීමේදී අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණ කිරීමේ වගකීම අධ්‍යක්ෂ ජෙනරල් ප්‍රධාන මාණ්ඩලික යටතට පැවරී ඇති අතර, 1994 සිට 2006 දක්වා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධාන මාණ්ඩලික ශාඛාව යටතේ පාලනය විය.

3. මහා භාණ්ඩාගාරය සහ අර්නස්ට් ඇන්ඩ් යන්ග් විගණන ආයතනයේ නිර්දේශ අනුව 2006 වසරේදී මූල්‍ය කළමනාකරණ ශාඛාව ස්ථාපනය කරන ලදී. ඉන් අනතුරුව 2006 වසරේ සිට මේ දක්වා අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, මූල්‍ය කළමනාකරණ ශාඛාවේ අධීක්ෂණය යටතේ රාජකාරීන් ඉටුකරනු ලැබේ.

**වගකීම්**

4. යුද්ධ හමුදාධිපති විසින් ලබාදෙන උපදෙස් හා මාර්ගෝපදේශයන් අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාලව කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය කළමනාකරණය, අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම හා වැය ශීර්ෂ යටතේ ප්‍රතිපාදන වෙන්කිරීම, වියදම් කළමණාකරණය, සමාලෝචනය කිරීම සහ අවශ්‍යතාවය පරිදි මූල්‍ය කළමනාකරණ තොරතුරු අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන්ට ලබාදීමට පියවර ගැනීම අධ්‍යක්ෂ අයවැය හා මුදල් පරිපාලන වෙත පවරා ඇති වගකීම වේ.

**කාර්යභාරය**

5. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාලව රාජ්‍ය මුදල් කළමනාකරණය සහ රාජ්‍ය නොවන මුදල් පරිපාලනය කිරීම අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය සතු කාර්යභාරය වේ.

**කාර්‍ය්‍යයන්**

6. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්‍ය්‍යයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාවේ මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කළමනාකරණ වෙතින් යුද්ධ හමුදාධිපති වෙත ලබාදීම.

ආ. යුද්ධ හමුදාවේ මූල්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය සැලසුම් සකස් කිරීමට සහ මූල්‍ය පාලනය වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිට අවශ්‍ය වන මූල්‍ය තොරතුරු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.

ඇ. ප්‍රාග්ධන වියදම් හා පුනරාවර්තන වියදම් යටතේ යුද්ධ හමුදාවට අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන හා අමතර ප්‍රතිපාදන පිළිබඳව විස්තර සකස් කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත්කිරීම.

ඈ. ව්‍යාපෘති හා වැය ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරුකිරීමට අභ්‍යන්තර අනුමැතිය ලබාදීම හා මහා භාණ්ඩාගාරයෙන් අවසර ලබාගැනීම.

ඉ. පිලිවෙත් පාලන නිලධාරීන් හා ක්‍රියාකාරී පාලන නිලධාරීන් වෙත උපදෙස් ලබාදීම සහ ප්‍රතිපත්ති උපදෙස් නිකුත් කිරීම.

ඊ. මූල්‍ය සහ අයවැය තොරතුරු පාලනය, සමාලෝචනය හා විශ්ලේෂණය කිරීම.

උ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මූල්‍ය කටයුතු මහා භාණ්ඩාගාරය හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය සමඟ නිරතුරුව සම්බන්ධීකරණය කිරීම.

ඌ. රාජ්‍ය නොවන ගිණුම් සම්බන්ධ කටයුතු පාලනය, අධීක්ෂණය, ප්‍රතිපත්ති උපදෙස් නිකුත්කිරීම.

එ. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී කටයුතුවලට අදාලව පවත්වාගෙන යන උප තැන්පත් ගිණුම/තත්කාර්ය අතුරු අක්මුදල් ගිණුම් සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබාදීම, අධීක්ෂණය සහ ප්‍රතිපත්ති උපදෙස් නිකුත් කිරීම.

<u>වාර්ෂික පොදු සමාලෝචනය</u>

7. <u>පුනරාවර්තන</u>. **2013** වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සඳහා පුනරාවර්තන වියදම ලෙස රුː මිː **133,550.00** ක් ඇස්තමේන්තු කරණ ලදි. එනමුත් මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් රුː මිː **118,167.00** කට සීමාකර ලබාදී ඇත. එම ප්‍රතිපාදන තුලින් වැටුප් හා දීමනා ගෙවීම වෙනුවෙන් රුː මිː **88,289.00** ක් වෙන්කරණ ලද අතර, අනෙකුත් පුනරාවර්තන වියදම් ඉතිරි රුː මිː **29,878.00** ක ප්‍රතිපාදන ප්‍රමාණය (රුːමිː **118,167.00** - රුː මිː **88,289.00**) තුල කළමනාකරණය කරගැනීමට සිදුවිය.

8. <u>මූලධන</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් **2013** වර්ෂය සඳහා රුː මිː **11,786.00** ක් මූලධන වියදම් වශයෙන් ඇස්තමේන්තුගත කල නමුත් මහා භාණ්ඩාගාරය විසින් එය රුː මිː **3,999.00** ක ප්‍රතිපාදනයකට සීමාකරණ ලදි.

<u>සාක්ෂාත් කරගැනීම</u>

9. **2013** වසර සඳහා පුනරාවර්තන හා මූලධන වැය ශීර්ෂ යටතේ ලබාදුන් ප්‍රතිපාදනයන්ට අමතරව මහා භාණ්ඩාගාරය වෙතින් පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත අමතර ප්‍රතිපාදන ලබාදී තිබේ.

අ. <u>පුනරාවර්තන වියදම්</u>

| අනු අංකය | වැය ශීර්ෂය | රුː ශතː |
|---|---|---|
| 1. | ඉන්ධන | 500,000,000.00 |
| | මුලු එකතුව | 500,000,000.00 |

ආ. <u>මූලධන වියදම්</u>

(1) <u>මූලධන වියදම් අත්පත් කරගැනීම</u>

| අනු අංකය | වැය ශීර්ෂය | රුː ශතː |
|---|---|---|
| 1. | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 74,000,000.00 |
| | මුලු එකතුව | 74,000,000.00 |

(2) <u>මානව සම්පත් සංවර්ධන කාර්ය මණ්ඩල පුහුණුව</u>

| අනු අංකය | වැය ශීර්ෂය | රු: ශත: |
|---|---|---|
| 1. | දේශීය පුහුණුකිරීම් හා හැකියා වර්ධනය | 14,000,000.00 |
| 2. | විදේශීය පුහුණුකිරීම් හා හැකියා වර්ධනය - විදේශීය පුහුණු පාඨමාලා මිලදීගැනීම | 1,000,000.00 |
| 3. | විදේශීය පුහුණුකිරීම් හා හැකියා වර්ධනය - විදේශීය පුහුණු පාඨමාලා දීමනා | 170,000,000.00 |
| 4. | විදේශීය පුහුණුකිරීම් හා හැකියා වර්ධනය (ගුවන්ගමන් බලපත්‍ර හා මුහුදු ප්‍රවාහනය) | 15,000,000.00 |
| එකතුව | | 200,000,000.00 |
| මුළු එකතුව | | 274,000,000.00 |

**<u>මූල්‍යමය විස්තරය</u>**

10. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් 2013 වර්ෂය සඳහා පහත සඳහන් ප්‍රතිපාදනයන් ජාතික අයවැය වෙන්කිරීම් තුලින් ලබාගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| අ. | මූලධන | - රු: | 3,999,225,000.00 |
| ආ. | පුනරාවර්තන | - රු: | 118,167,214,000.00 |
| | එකතුව | - රු: | **118,566,439,000.00** |

## අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. මූල්‍ය කටයුතු වලට අදාල පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියේ කාර්ය සාධනය අධීක්ෂණය, ඇගයීම සහ කාලීනව වෙනස්වන මූල්‍ය රෙගුලාසින් වලට අනුකූලව පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතියේ කටයුතු වැඩි දියුණු කිරීමේ අරමුණින් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය යුද්ධ හමුදාධිපති විසින් හමුදා චර්යා නියෝග 20/2006 යටතේ ස්ථාපිත කරන ලදි .

**වගකීම්**

2. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත සඳහන් පරිදි වේ:

අ. අඛණ්ඩ සමීක්ෂණ සිදුකිරීම තුලින් පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම.

ආ. අලාභ, නාස්තිය හා යල්පැනීම් වලින් වත්කම් සුරක්ෂිත කිරීම.

ඇ. දුර්වල පද්ධතීන් හඳුනාගෙන එම පද්ධතීන් වැඩි දියුණු කිරීම.

ඈ. වැරදි හා වංචාවන් වැලැක්වීම සහ හෙළිදරව් කරගැනීම සඳහා අවශ්‍ය වන අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම.

**කාර්‍යභාරය**

3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ කර්‍යභාරය වනුයේ අඛණ්ඩ සමීක්ෂණයන් සිදුකිරීම සහ යුද්ධ හමුදාව සතු වත්කම් කළමණාකරණයෙහි මූල්‍ය කාර්‍යසාධනය ස්වාධීන ඇගයීමකට ලක්කිරීම, ඵලදායි අභ්‍යන්තර පරීක්ෂණ ක්‍රම මගින් වැලැක්වීම්, හෙළිදරවු කිරීම් සිදුකිරීම සහ ආයතනයේ ආර්ථිකමය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිවැරදි පාලන විධි හඳුන්වාදීම වේ.

**කාර්‍යයන්**

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්‍යයන් පහත සඳහන් පරිදි වේ:

අ. රජයේ පවත්නා මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන විධි, ආයතන සංග්‍රහ රෙගුලිසි හා කලින් කලට අතිරේකයන් මගින් නිකුත් කරන්නාවූ උපදෙස් නිවැරදිව ක්‍රියාත්මක කරන බවට තහවරු කිරීම.

ආ. පවත්නා අභ්‍යන්තර පරීක්ෂණ හා පාලන පද්ධතියේ ප්‍රමාණාත්මක බව සහ එය නිසි පරිදි ක්‍රියාත්මකවන්නේද යන්න  සොයා බැලීම.

ඇ. යුද්ධ හමුදාව තුල පවත්වාගෙන යනු ලබන ගිණුම්කරණ සහ නඩත්තුකරනු ලබන අනෙකුත් වාර්ථාවල විශ්වාසවන්තභාවය හා නිරවද්‍යතාවය සොයා බැලීම.

ඈ. යුද්ධ හමුදාවේ වත්කම් කොතෙක් දුරට සියලු ආකාරයන්ගේ අලාභවලින් ආරක්ෂාවී ඇද්ද, එම වත්කම්වලට අදාලව සිදුවිය හැකි නාස්තීන් වැලැක්වීම සහ හෙළිදරවු කරගැනීම සොයාබැලීම සහ එම වත්කම් කොතෙක් දුරට කාර්‍යක්ෂමව යොදාගන්නේද යන්න සොයා බැලීම.

ඇ. අවශ්‍යතාවයන්ට අනුකූලව විශේෂ විමර්ශණ පැවැත්වීම හා එහි කාර්යඵල අදාල උසස් අංශයන් වෙත වාර්තා කිරීම.

**වාර්ෂික සමාලෝචනය**

5. **2013 වර්ෂය තුල සිදුකල කාර්‍යයන්**

අ. 2013 වර්ෂය තුල රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණයට නගන ලද විගණන නිරීක්ෂණයන් සඳහා පිළිතුරු සැපයීම හා සම්බන්ධීකරණය.

(1) **විගණන විමසුම්**

| | | | |
|---|---|---|---|
| (අ) | 2013 1 වන කාර්තුව තුල ලද විගණන විමසුම් | - | 02 |
| (ආ) | 2013 11 වන කාර්තුව තුල ලද විගණන විමසුම් | - | 04 |
| (ඇ) | 2013 111 වන කාර්තුව තුල ලද විගණන විමසුම් | - | 04 |
| (ඈ) | 2013 IV වන කාර්තුව තුල ලද විගණන විමසුම් | - | 01 |
| (ඉ) | ලද මුලු විගණන විමසුම් ගණන | - | 11 |
| (ඊ) | රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත පිළිතුරු ඉදිරිපත්කරන ලද විගණන විමසුම් ගණන | - | 09 |
| (උ) | පිළිතුරු ඉදිරිපත් කල යුතුව ඇති විගණන විමසුම් ගණන | - | 02 |
| | මුලු විගණන විමසුම් ගණන | - | 11 |

ආ. 2013 මූල්‍ය වර්ෂය තුලදී අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරන ලද අභ්‍යන්තර විගණන සංඛ්‍යාව.

(1) 2013 වර්ෂයේ විගණන සැලසුමට අනුව සිදුකිරීමට සැලසුම්කල විගණනයන් සංඛ්‍යාව - 647

(2) **2013 මූල්‍ය වර්ෂය තුල සිදුකල විගණනයන් සංඛ්‍යාව**

| | | | |
|---|---|---|---|
| (අ) | සාමාන්‍ය විගණන සංඛ්‍යාව | - | 293 |
| (ආ) | විශේෂ විගණන සංඛ්‍යාව | - | 06 |
| (ඇ) | සිදුකරන ලද සම්පූර්ණ විගණන සංඛ්‍යාව | - | 299 |

**සාක්ෂාත් කරගැනීම්**

6. 2013 වර්ෂය තුල රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණයට නගන ලද විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම.

7. මාණ්ඩලික ප්‍රධානිගේ මෙහෙය වීම මත හා 29/2006 හමුදා චර්යා නියෝග අනුව 2013.07.05 විගණන හා කළමණාකරණ කමිටු රුස්වීම පැවැත්වීම.

8. 2013.02.08 හා 2013.11.02 යන දිනයන්හිදී රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමණාකරණ කමිටු රුස්වීම සඳහා සහභාගිවීම.

## වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. 1949 ඔක්තෝබර් 10 වෙනි දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ආරම්භයේ සිට වැටුප් හා ලේඛණ කාර්යාලය ක්‍රියාත්මක විය. හමුදා චර්යා නියෝග 18/94 ට අනුව 1994 මැයි 01 දින වැටුප් හා ලේඛණ කාර්යාලය, අධ්‍යක්ෂ මණ්ඩලයක් ලෙසට වැඩිදියුණු විය. වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරීන් තවදුරටත් කාර්‍යක්ෂමව සිදුකිරීමේ අරමුණින් 2006 නොවැම්බර් 02 දින හමුදා චර්යා නියෝග 4/2007 හා 5/2007 ට අනුව 3 සහ 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය (වැටුප් හා ලේඛන) ඒකකයන් ආරම්භ කරන ලදී. මෙම ඒකකයන්ට ආවේනික රාජකාරීන් වඩාත් පහසුවෙන් ඉටුකරනු වස් මෙහෙයුම් කටයුතු ඉදුරාම අධ්‍යක්ෂක - වැටුප් හා ලේඛණ යටතේ ක්‍රියාත්මක වන අතර, පාලන කටයුතු පමණක් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය යටතේ සිදුවේ.

### වගකීම්

2. වැටුප් හා දීමනා, වන්දි පාරිතෝෂික සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීම, පුද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම, වාර්ෂික ඇස්තමේන්තු හා අතිරේක සංඛ්‍යා වාර්ථා සැකසීම සහ 1994 අප්‍රේල් 30 දිනැති හමුදා චර්යා නියෝග 18/94 ට අනුව යුද හමුදා සංස්ථාව දත්ත නඩත්තු කිරීම වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම වේ.

### කාර්‍යයන්

3. වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි භූමිකාව හා කාර්‍යයන් පහත පරිදි වේ.

අ. වැටුප් හා දීමනා, වන්දි හිමිගැන්වීම සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීම හා පුද්ගලික දත්ත නඩත්තු කිරීම.

ආ. වැටුප් හා දීමනා සම්බන්ධ කාර්යයන් නිසිපරිදි සම්බන්ධීකරණය කිරීම හා වාර්ෂික වැටුප් හා දීමනා ඇස්තමේන්තු පිළියෙල කිරීම.

ඇ. පුද්ගලික ලිපිගොනු නඩත්තුව හා නිලධාරීන් හා සෙසුනිලයින්ගේ සේවා ස්ථාන විස්තර පවත්වාගෙන යාම.

ඈ. ඉදිරියට අවශ්‍ය කරන ශ්‍රමදායකත්වය හා සංඛ්‍යා ලේඛණ නඩත්තුකිරීම සඳහා සැලසුම් සැකසීම් කටයුතු සිදුකිරීම.

### වාර්ෂික සමාලෝචනය

4. මියගිය, ආබාධිතව අස්වගිය රණවිරුවන්ද ඇතුළුව නිලධාරි/සෙසුනිලයන් 210,835 ක ගේ වැටුප් හා ලේඛණ සම්බන්ධ රාජකාරීන් සඳහා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ වර්තමානය වනවිට අංශ 63 ක් 3 හා 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා (වැටුප් හා ලේඛන) ඒකක යටතේ ස්ථාපිත කොට ඇත. ඊට අමතරව මාසික වැටුප් හා දීමනා සකස් කිරීම, වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම, විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ගණනය කිරීම, නිත්‍ය හමුදා සාමාජියන්ගේ පුද්ගලික ලිපිගොනු නඩත්තුව, දෙවන කොටසේ නියෝග පලකිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ණය අයදුම්පත් ලේඛණගත කිරීමට හා ණය මුදල්/අත්තිකාරම් හිමිගැන්වීම ඉහත වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයේ අංශයන් විසින් ඉටුකරනු ලබන සුවිශේෂී රාජකාරීන් අතර වේ. 3 සහ 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා

බලකාය (වැටුප් හා ලේඛන) වශයෙන් ඒකකයන් 02 ක් වෙන් වෙන්ව පරිපාලනමය වශයෙන් පැවතුනද වැටුප් හා දීමනා හිමිගැන්වීම සඳහා සෑම මාසයකම රු.මි. 8250.0 ක පමණ මූල්‍ය වගකීමක් දරන බැවින් අධ්‍යක්ෂ මණ්ඩලය සහ මෙම ඒකක දෙක ඒකාබද්ධව කටයුතු කරයි.

5. වැටුප් බලසණයන් 4 යටතේ වැටුප් අංශයන් 29 පිහිටුවා ඇති අතර, එය නිලධාරි 27 දෙනෙකුගෙන් හා සෙසුනිලයින් 352 දෙනෙකුගෙන් සමන්විත වේ. ලේඛණ බලසණයන් නිලධාරින් 15 ක් හා සෙසුනිල 314 ගෙන් සමන්විත වේ. සෑම වැටුප් අංශයකම වැටුප් ගොණු 7000 - 7500 ප්‍රමාණයක් නඩත්තු කරන අතර, එක් ලෙජර් ලිපිකරුවෙකු විසින් අවම වශයෙන් වැටුප් ගොනු 600 - 650 අතර ප්‍රමාණයක් නඩත්තු කරනු ලැබේ. මෙම සෑම වැටුප් ගොනුවක්ම ප්‍රධාන දත්ත හා වෙනස් වන දත්ත එනම් ඒකාබද්ධ වැටුප, උසස් කිරීම්, සලාක, ගෙවල් කුලී, සුදුසුතා වැටුප, දුෂ්කර දීමනා, සුහසාධක දීමනා, අතුරු දීමනා හා අනෙකුත් දීමනාවලින්ද සමන්විත වේ.

6. අවශ්‍ය අවස්ථාවන්හිදී මාසික වැටුප් හා දීමනා, ණය, විදේශ පුහුණු දීමනා පිළිබඳ වාර්ෂික ඇස්තමේන්තු හා අතිරේක ඇස්තමේන්තු වාර්ථා අදාල වර්ෂයන්හි වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය සහ 3 සහ 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා (වැටුප් හා ලේඛන) ඒකකයන් වෙතින් ලබාගන්නා දත්තයන් අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලැබේ.

7. 2013.12.31 වන විට වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැටුප් හිමිගන්වනු ලබන මියගිය, ආබාධිතව අස්වගිය අයවලුන්ගේ සංඛ්‍යාව 26,879 කි. මියගිය අයවලුනගේ යැපෙන්නන් හට ගෙවන ලද සංඛ්‍යාව මාසිකව වෙනස් වේ. යැපෙන්නන් හට මාසික වැටුප් හා දීමනා හිමිගැන්වීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුකරනු ලබන අතර, වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් හා යැපෙන්නන්ගේ දීමනා ගෙවීම සඳහා අවැසි ලියකියවිලි 3 සහ 4 ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකා (වැටුප් හා ලේඛන) ඒකකයන් වෙතින් යොමුකල පසු අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවීම් සිදුකරනු ලබයි. මානුෂීය මෙහෙයුම් වලදී ත්‍රස්තවාදී ප්‍රහාරයන් හේතුවෙන් වැන්දඹු භාවයට පත්වූවන් 2007.11.21 දිනෙන් පසු නැවත විවාහ වන්නේනම් එම අයවලුන් වෙනුවෙන්ද විශේෂ වන්දියක් හිමිගන්වනු ලබයි.

8. නිත්‍ය හමුදාවේ සියලුම අයවලුන්ගේ පුද්ගලික ලිපිගොනු මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ස්ථාපිත ලේඛණාගාරය මගින් නඩත්තුවේ. රෙජිමේන්තු මධ්‍යස්ථාන හා නිත්‍ය/ස්වේච්ඡා ඒකක වෙතින් ඉදිරිපත් කරනු ලබන යුආපා 9 පදනම් කරගෙන ඒ සඳහා දෙවන කොටසේ නියෝග පලකිරීම මාසිකව සිදුකෙරේ. මීට අමතරව සේවයට අදාළ සියලුම වෙනස්වීම් දෙවන කොටසේ නියෝග ලෙස පලකරනු ලබන අතර, එම ලේඛණ වෙනම නඩත්තු වේ. වැටුප් හා දීමනා ක්‍රියාවලිය හා දෙකොනි පලකිරීම් සියල්ල පරිගණක ගත වැඩසටහනක් මගින් ක්‍රියාත්මක වුවද මෙතෙක් එම වැඩසටහනේ සම්පූර්ණ අයිතිය එම ආයතනය වෙතින් වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබාදී නොමැත.

**<u>සාක්ෂාත් කරගැනීම</u>**

9. 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා වැටුප් හා දීමනා ගෙවූ නිලධාරි/ සෙසුනිල හා 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුල වැටුප් හා දීමනා හිමිගන්වන ලද මියගිය, ආබාධිතව අස්කල අයවලුන්ගේ විස්තර පහත සඳහන් පරිදි වේ.

අ. **<u>2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා නිලධාරි සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම</u>**

(1) <u>නිලධාරි</u>

| මාසය | නිත්‍ය<br>රු. ශත | ස්වේච්ඡා<br>රු. ශත | එකතුව<br>රු. ශත |
|---|---|---|---|
| ජනවාරි | 395,455,446.47 | 156,313,179.98 | 551,768,626.45 |
| පෙබරවාරි | 382,614,767.71 | 152,114,164.73 | 534,728,932.44 |
| මාර්තු | 384,017,008.15 | 149,784,238.94 | 533,801,247.09 |
| අප්‍රේල් | 382,605,385.45 | 150,502,479.45 | 533,107,864.90 |
| මැයි | 394,385,339.47 | 155,681,712.52 | 550,067,051.99 |
| ජුනි | 390,035,048.08 | 152,373,875.80 | 542,408,923.88 |
| ජූලි | 401,361,507.43 | 152,038,191.48 | 553,399,698.91 |
| අගෝස්තු | 416,532,135.56 | 163,540,276.91 | 580,072,412.47 |
| සැප්තැම්බර් | 396,106,307.97 | 154,129,573.89 | 550,235,881.86 |
| ඔක්තෝබර් | 410,965,974.49 | 153,447,337.97 | 564,413,312.46 |
| නොවැම්බර් | 405,335,320.90 | 154,448,172.29 | 559,783,493.19 |
| දෙසැම්බර් | 399,884,710.17 | 154,448,172.29 | 554,332,882.46 |
| එකතුව | 4,759,298,951.85 | 1,848,821,376.25 | 6,608,120,328.10 |

(2) <u>සෙසුනිල</u>

| මාසය | නිත්‍ය<br>රු.ශත | ස්වේච්ඡා<br>රු.ශත | එකතුව<br>රු.ශත |
|---|---|---|---|
| ජනවාරි | 4,828,123,773.48 | 2,640,660,477.93 | 7,468,784,251.41 |
| පෙබරවාරි | 4,373,862,440.26 | 2,342,709,541.91 | 6,716,571,982.17 |
| මාර්තු | 4,334,869,883.71 | 2,355,888,111.20 | 6,690,757,994.91 |
| අප්‍රේල් | 4,348,645,379.67 | 2,355,751,387.12 | 6,704,396,766.79 |
| මැයි | 4,417,565,827.25 | 2,379,552,284.16 | 6,797,118,111.41 |
| ජුනි | 4,391,442,251.19 | 2,350,492,817.33 | 6,741,935,068.52 |
| ජූලි | 4,351,501,615.86 | 2,341,267,843.14 | 6,692,769,459.00 |
| අගෝස්තු | 4,436,724,265.48 | 2,364,893,669.99 | 6,801,617,935.47 |
| සැප්තැම්බර් | 4,490,103,473.94 | 2,423,841,844.68 | 6,913,945,318.62 |
| ඔක්තෝබර් | 4,900,769,629.54 | 2,622,093,462.39 | 7,522,863,091.93 |
| නොවැම්බර් | 4,424,865,307.99 | 2,368,023,762.40 | 6,792,889,070.39 |
| දෙසැම්බර් | 4,412,150,940.56 | 2,342,562,991.34 | 6,754,713,931.90 |
| **එකතුව** | **53,710,624,788.93** | **28,887,738,193.59** | **82,598,362,982.52** |

**<u>සම්පූර්ණ ගෙවීම් (නිලධාරි + සෙසුනිල) රු 6,608,120,328.10 + රු 82,598,362,982.52 = රු 89,206,483,310.62</u>**

ආ. **<u>2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා මියගිය/ආබාධිතව අස්කරන ලද නිලධාරි සහ සෙසුනිලයන් හට වැටුප් හා දීමනා හිමිගැන්වීම</u>**

(1) <u>නිලධාරි</u>

| මාසය | නිත්‍ය රු.ශත | ස්වේච්ඡා රු.ශත | එකතුව රු.ශත |
|---|---|---|---|
| ජනවාරි | 65,693,482.02 | 7,562,082.60 | 73,255,564.62 |
| පෙබරවාරි | 56,466,638.09 | 7,308,511.12 | 63,775,149.21 |
| මාර්තු | 64,562,292.18 | 7,729,415.75 | 72,291,707.93 |
| අප්‍රේල් | 59,889,915.04 | 7,515,067.87 | 67,404,982.91 |
| මැයි | 62,009,680.33 | 7,532,517.03 | 69,542,197.36 |
| ජූනි | 59,063,248.90 | 8,160,493.72 | 67,223,742.62 |
| ජූලි | 59,504,675.75 | 7,698,645.65 | 67,203,321.40 |
| අගෝස්තු | 59,055,960.97 | 7,642,002.41 | 66,697,963.38 |
| සැප්තැම්බර් | 63,408,985.95 | 7,589,838.40 | 70,998,824.35 |
| ඔක්තෝබර් | 62,084,576.54 | 7,836,591.53 | 69,921,168.07 |
| නොවැම්බර් | 60,636,450.86 | 7,722,633.75 | 68,359,084.61 |
| දෙසැම්බර් | 61,132,141.57 | 7,793,551.65 | 68,925,693.22 |
| එකතුව | 733,508,048.20 | 92,091,351.48 | 825,599,399.68 |

(2) <u>සෙසුනිල</u>

| මාසය | නිත්‍ය රු.ශත | ස්වේච්ඡා රු.ශත | එකතුව රු.ශත |
|---|---|---|---|
| ජනවාරි | 1,006,564,770.29 | 172,735,735.86 | 1,179,300,506.15 |
| පෙබරවාරි | 884,629,216.85 | 150,523,812.19 | 1,035,153,029.04 |
| මාර්තු | 919,157,959.28 | 169,077,709.90 | 1,088,235,669.18 |
| අප්‍රේල් | 865,741,243.33 | 186,282,060.74 | 1,052,023,304.07 |
| මැයි | 928,769,810.62 | 164,939,188.87 | 1,093,708,999.49 |
| ජූනි | 890,618,808.06 | 160,334,453.94 | 1,050,953,262.00 |
| ජූලි | 937,326,566.61 | 163,166,105.40 | 1,100,492,672.01 |
| අගෝස්තු | 910,188,094.89 | 164,099,425.49 | 1,074,287,520.38 |
| සැප්තැම්බර් | 949,694,984.19 | 172,256,074.31 | 1,121,951,058.50 |
| ඔක්තෝබර් | 1,063,179,088.55 | 187,103,145.11 | 1,250,282,233.66 |
| නොවැම්බර් | 954,326,525.66 | 169,895,629.42 | 1,124,222,155.08 |
| දෙසැම්බර් | 931,141,469.49 | 163,348,279.15 | 1,094,489,748.64 |
| එකතුව | 11,241,338,537.82 | 2,023,761,620.38 | 13,265,100,158.20 |

**<u>සම්පූර්ණ ගෙවීම් (නිලධාරි + සෙසුනිල) රු 825,599,399.68 + රු 13,265,100,158.20 = රු 14,090,699,557.88</u>**

10. **2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා නිලධාරි සහ සෙසුනිලයන් විදේශ පාඨමාලා/සංචාර සඳහා ගෙවීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත:**

| අනු අංකය | විස්තරය | සහභාගී වූ සංඛ්‍යාව | මුදල රු.මි |
|---|---|---|---|
| 1. | සංචාර/ චාරිකා | 536 | 134.0 |
| 2. | පාඨමාලා | 1428 | 891.9 |
| | එකතුව | 1964 | 1025.9 |

11. **2013 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් වල පාරිතෝෂික සහ දූබලතා විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:**

| අනු අංකය | විස්තරය | සහභාගී වූ සංඛ්‍යාව | මුදල රු.මි |
|---|---|---|---|
| 1. | විශ්‍රාම | 4606 | 2518.3 |
| 2. | පාරිතෝෂික | 881 | 263.3 |
| 3. | දූබලතා විශ්‍රාම වැටුප් | 155 | 92.3 |
| | එකතුව | 5642 | 2873.9 |

12. ඉදිරිපත් කර ඇති ණය අයදුම්පත් සඳහා ආපදා ණය ගෙවීම් (10 x මාසික ඒකාබද්ධ වැටුප හෝ උපරිම රු. 250,000.00) පිළිබඳ විස්තර හා රාජ්‍ය බැංකු මගින් හිමිගන්වනු ලබන දේපල ණය සහ ප්‍රවාහන ණය අයදුම්පත් ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවන් පිළිබඳ පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | අයදුම්පත් ලද සංඛ්‍යාව | හිමිගන්වන ලද මුදල (රු. මි) | වෙනත් |
|---|---|---|---|---|
| 1. | ආපදා ණය | 4298 | 753.0 | - |
| 2. | දේපල ණය | 458 | - | බැංකු මගින් ගෙවීම් කෙරේ |
| | එකතුව | 4756 | 753.0 | - |

13. **2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රධාන පත්‍ර, විශේෂ වන්දි, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම දායක මුදල්, යැපෙන්නන්ගේ දීමනා හා මරණ පාරිතෝෂික හිමිගැන්වීමට අදාල විස්තර පහත සඳහන් පරිදි වේ.**

| අනු අංකය | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | හිමිගන්වන ලද මුදල (රු. මි) |
|---|---|---|---|
| 1. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් | 350 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවීම් කෙරේ |
| 2. | විශේෂ වන්දි | 69 | 98.5 |
| 3. | වන්දි - රා.ප.ච 21/88 | 39 | 3.1 |
| 4. | වන්දි - භ.ව.නි 12/86 | 458 | 27.7 |
| 5. | වැන්දඹුව නැවත විවාහවීමේදී වන්දි | 117 | 322.4 |
| 6. | වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ආපසු ගෙවීම | 2585 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවීම් කෙරේ |
| 7. | යැපෙන්නන්ගේ දීමනා | 271 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවීම් කෙරේ |
| 8. | මරණ පාරිතෝෂික | 826 | 157.9 |
| | එකතුව | 4715 | 609.6 |

14. ජනාධිපති ලේකම් කාර්යාලය, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ යුද්ධ හමුදා මූලස්ථානය වෙත යොමුකරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දුක්ගැනවිලි/ලිපි මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති සංඛ්‍යාවන් පහත දක්වා ඇත. එම සියලුම දුක්ගැනවිලි/ලිපි අධ්‍යක්ෂක - වැටුප් හා ලේඛණ විසින් පුද්ගලිකවම පරීක්ෂාකර ඉදිරිපත් කරන ලද කරුණු පිළිබඳව ප්‍රමුඛත්වයක් මත පවත්නා නීති/රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකිරීමට සහ ඒ පිළිබඳව ලියුම්කරු/ලියුම්කාරිය දැනුවත් කිරීම සඳහා අදාල පාර්ශවයන් වෙත යොමු කරනු ලැබේ.

| අනු අංකය | ස්ථානය | දුක්ගැනවිලි/ලිපි ලද සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් කාර්යාලය | 661 |
| 2. | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 23 |
| 3. | යුද්ධ හමුදා මූලස්ථානය | 734 |
| 4. | වෙනත් | 758 |
| | එකතුව | 2176 |

15. දශක 3 ක යුද්ධය නිමාවෙන් පසුල රාජ්‍ය සහ පුද්ගලික බැංකු මගින් යුද්ධ හමුදා සාමජිකයින් හට පුද්ගලික ණය මුදල් නිකුත් කිරීමේ ප්‍රවනතාවය වැඩිවී ඇත. ඒ අනුව 2013 ජනවාරි 01 සිට දෙසැම්බර් දක්වා 44,797 ක ණය ආකෘතිපත් (375 හි) හා වැටුප් වාර්ථාවන් ප්‍රමාණයක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් නිකුත් කරන ලදි. එමෙන්ම යුද හමුදා යහසාධක අරමුදල වෙත ලෙජර් උපුටන 159039 ක ප්‍රමාණයක්ද සකසාදී තිබේ.

16. 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුල යුද්ධ හමුදා සෙසුනිලයන්ගේ සේවය දීර්ඝ කිරීම් හා නැවත බඳවා ගැනීම් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | නැවත බඳවා ගැනීම් | 6091 |
| 2. | සේවය දීර්ඝ කිරීම් | 12408 |
| 3. | එකතුව | 18499 |

17. 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුල යුද්ධ හමුදා නිලධාරි/සෙසුනිලයන් හට සේවා සහතික අධ්‍යක්ෂ - වැටුප් හා ලේඛණගේ අත්සනින් යුතුව නිකුත් කර ඇති සංඛ්‍යාවන් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | සංඛ්‍යාව |
|---|---|---|
| 1. | සේවා සහතික (නිලධාරි) | 124 |
| 2. | සේවා සහතික පොත් (යුපො 58) - ඉංග්‍රීසි | 4534 |
| 3. | සේවා සහතික පොත් (යුපො 58) - සිංහල | 510 |
| 4. | සේවා සහතික (යුආපා 19) - ඉංග්‍රීසි | 248 |
| 5. | සේවා සහතික (යුආපා 19) - සිංහල | 485 |
| 6. | සේවා සහතික (යුආපා 19 'අ') | 3232 |
| | එකතුව | 9133 |

18. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ පවුල්වල උපදින 3 වන දරුවා වෙනුවෙන් රු. 100,000.00 දීමනාවක් හිමිගැන්වීම සඳහා 2011 අයවැය කථාව මගින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව 2013 වර්ෂය සඳහා ගෙවීම් කරන ලද නිලධාරි/සෙසුනිලයන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | අයදුම්පත් සංඛ්‍යාව | රු.මිලියන |
|---|---|---|---|
| 1. | නිලධාරි | 130 | 13.0 |
| 2. | සෙසුනිල | 2273 | 227.3 |
| | එකතුව | 2403 | 240.3 |

19. යුද්ධ හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වනුවෙන් රු. 750.00 බැගින්වූ විශේෂ දීමනාවක් හිමිගැන්වීම සඳහා 2011 අයවැය කථාව මගින් අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව 2013 වර්ෂය සඳහා නිලධාරි/සෙසුනිලයන් වෙනුවෙන් ගෙවීම් කරන ලද සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

| විස්තරය | දෙමව්පියන් සංඛ්‍යාව | රු.(මිලියන) |
|---|---|---|
| දෙමව්පියන් | 144924 | 1072.2 |

20. 2013 වර්ෂය සඳහා සිවිල් උසාවි නඩු 52 ක් සඳහා වැටුප් වාර්ථා ලබාදෙන ලෙස අධ්‍යක්‍ෂක වැටුප් හා ලේඛණ වෙත ගරු අධිකරණයන් මගින් දැනුම්දීම් සිදුකර ඇත. ඒ සඳහා සාක්ෂි ලබාදීමට අවශ්‍ය වැටුප් ලියකියවිලි රැගෙන නිලධාරින්/ජ්‍යොකොනොතීන් (මූලික වශයෙන් නඩත්තු හා දික්කසාද නඩු සඳහා) ගරු අධිකරණයේ පෙනී සිටීම සඳහා රපෝර්තු කරවන ලදී.

21. 2013 වර්ෂය සඳහා වැටුප් හා ලේඛණ ක්‍රියාවලිය සබැඳිව දේශණයන් සිදුකිරිමට නිලධාරින් 76 ක් සහ ජ්‍යොකොනොතීන් 54 ක් විවිධ යුද්ධ හමුදා පුහුණු ආයතනයන් වෙත හා ඒකකයන් වෙත රපෝර්තු කරවන ලදී.

22. 2013 ජනවාරි 01 සිට 2013 දෙසැම්බර් 31 දක්වා වැටුප් හා ලේඛණ අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් පුද්ගලික ලිපි ගොණු තිරවුල් කරන ලද විස්තරයන් පහත දක්වා ඇත.

| අනු අංකය | මාසය | ආබඅම වෙතින් ලද සංඛ්‍යාව |
|---|---|---|
| 1. | ජනවාරි | 1711 |
| 2. | පෙබරවාරි | ලැබී නොමැත |
| 3. | මාර්තු | ලැබී නොමැත |
| 4. | අප්‍රේල් | 2125 |
| 5. | මැයි | ලැබී නොමැත |
| 6. | ජූනි | 4242 |
| 7. | ජූලි | 4765 |
| 8. | අගෝස්තු | ලැබී නොමැත |
| 9. | සැප්තැම්බර් | 246 |
| 10. | ඔක්තෝබර් | ලැබී නොමැත |
| 11. | නොවැම්බර් | ලැබී නොමැත |
| 12. | දෙසැම්බර් | 496 |
| | එකතුව | 13585 |

**<u>මූල්‍යමය විස්තරය</u>**

23. 2013 දෙසැම්බර් මස මූල්‍ය වාර්ථාව අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වැටුප් ගෙවූ සංඛ්‍යාව 183,956 ක් වේ (ක්‍රියාන්විතයේදී මියගිය සහ ආබාධිතව අස්කල අයවලුන් හැර). 2013 දෙසැම්බර් 31 දිනට ආපදා ණය අයදුම්පත් සංඛ්‍යාව 4298 කි. කෙසේ වෙතත්, 2011 ඔක්තෝබර් 04 දක්වා ඉදිරිපත් කරන ලද ආපදා ණය අයදුම්පත් 1190 ක් වෙනුවෙන් රු.මිලියන 179.8 ගෙවීම් කර ඇත. ඉතිරි ණය අයදුම්පත් නිරවුල් කිරීම සඳහා රු.මිලියන 750.0 ක් අවශ්‍ය වේ. ඉතිරි ආපදා ණය හිමිගැන්වීම සඳහා එම මුදල් ලැබීම තුලින් සෙබලුන්ගේ චිත්ත ධෛර්ය ඉතා උසස් මට්ටමකින් පවත්වා ගැනීමට මහා පිටුවහලක් වේ. 2013 වර්ෂය වෙනුවෙන් විදේශ පාඨමාලා/ සංචාර සඳහා රු.මිලියන 354.0 ක් වෙන්කරන ලදී. පසුව අතිරේකව රු.මිලියන 671.2 ක් ලබාදුන් අතර, ඒ අනුව 2013 වර්ෂය සඳහා මුළු වියදම රු.මිලියන 1025.9 කි. 2014 වර්ෂය සඳහාද ඒ අනුව රු.මිලියන 210.0 ක මුදලක් වෙන්කර ඇතත්, එය ප්‍රමාණවත් නොමැත. එබැවින් යෝජිත පරිදි අවම වශයෙන් රු.මිලියන 1222.0 ක මුදලක් අදාල අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා අනිවාර්යයෙන්ම 2014 වර්ෂය වෙනුවෙන් වෙන්කල යුතුය.

24. විශ්‍රාම වැටුප් හිමිගැන්වීම පහත සඳහන් පරිදි වර්ග කල හැක.

අ. සේවා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

ආ. දුබලතා විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

ඇ. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම. (නිත්‍ය සහ ස්වේච්ජා)

ඈ. යැපෙන්නන්ගේ දීමනා හිමිගැන්වීම.

25. විශ්‍රාම වැටුප් අයදුම්පත් පිළියෙල කිරීම සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ගෙවීමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ වගකීම වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. ඉහත දක්වා ඇති විශ්‍රාම වැටුප් ගෙවීමේ අනුමැතිය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙතින් ලද පසු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම අදාල ප්‍රදේශීය ලේකම් කාර්යාල මගින් සිදුකෙරේ.

26. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(iv) හි සඳහන් වැටුප් පරිමාණයන්ට අනුව 2007 ජූනි 01 සිට 2011 ජූනි 30 දක්වා කාලසීමාව තුල විශ්‍රාමගිය යුද හමුදා සාමාජිකයින් දල වශයෙන් 8890 ක ගේ පමණ විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 28/2010(1) පරිදි ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර ඇත. එම ක්‍රියාවලිය විශේෂ වැඩසටහනක් වශයෙන් ක්‍රියාත්මක කරන ලද අතර විශ්‍රාමිකයින් 6219 කගේ ප්‍රතිශෝධිත අයදුම්පත් සකස්කර ගෙවීම් කටයුතු සඳහා අදාල ප්‍රදේශීය ලේකම් කාර්යාල වෙත යොමුකර ඇත.

27. 2013 වර්ෂයේ වියදම් වාර්ථා සාරාංශය පහත සඳහන් පරිදි වේ.

අ. <u>යුද්ධ හමුදා වැය ශීර්ෂ</u>

| අනු අංකය | විස්තරය | රු. මිලියන |
|---|---|---|
| (අ) | (ආ) | (ඇ) |
| 1. | වැටුප් හා දීමනා | 88,624.1 |
| 2. | විදේශ පාඨමාලා/සංචාර දීමනා | 1,056.5 |
| 3. | දේපල ණය පොලිය | 210.3 |
| 4. | වන්දි | 60.9 |
| 5. | සංයුක්ත දීමනා | 0.1 |

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| 6. | සලාක | 853.5 |
| 7. | අභ්‍යාස දීමනා | 24.8 |
| 8. | වෙනත් | 2.0 |
| 9. | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමහි | 1,333.3 |
| | එකතුව | 92,165.5 |

ආ. <u>වෙනත් වැය ශීර්ෂ</u>

| අනු අංකය | විස්තරය | රු. මිලියන |
|---|---|---|
| 1. | මියගිය සහ ආබාධිතව අස්කළ (වැය ශීර්ෂය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) | 13,975.0 |
| 2. | යුද හමුදා සාමජිකයින්ගේ පවුල්වල උපදින 3 වන දරු උපත සඳහා (වැය ශීර්ෂය - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය) | 240.3 |
| 3. | රණවිරු දෙමම්පියන් වෙත (වැය ශීර්ෂය - රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය) | 1,072.8 |
| 4. | පාරිතෝෂික (වැය ශීර්ෂය - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) | 3,222.2 |
| | එකතුව | 18,510.3 |

2013 වර්ෂය සඳහා වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් මිලියන 110,669.5 ක ඉතා විශාල මූල්‍ය වගකීමක් දරා ඇති බව ඉහත දත්තයන් අනුව පිළිහිබිඹුවේ.

## වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය 21/2006 හමුදා චර්යා නියෝගයට අනුව 2005.11.14 දින ස්ථාපනය කරන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ පාලනය කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු කාර්යයන් සම්බන්ධව වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ ජෙනරල් මූල්‍ය කළමනාකරණ වෙත වගකීමට බැඳී සිටී.

### වගකීම

2. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත මහජන අරමුදලින් මිලදීගෙන ඇති වත්කම් පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබාදීම සහ මුදල් රෙගුලාසි අනුව ක්‍රියාකිරීම මගින් යුද්ධ හමුදා වත්කම් කාර්යක්ෂමව හා ප්‍රතිඵලදායී ලෙස කළමනාකරණය කිරීම.

### අරමුණ

3. වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යුද්ධ හමුදාවේ සියළු වත්කම් සම්බන්ධ කටයුතුවලට මැදිහත් වියයුතු අතර, වත්කම් ආර්ථිකව පිරිමැසුම්දායකව, ප්‍රතිඵලදායීව කළමනාකරණය කිරීම මූලික අරමුණ වේ.

### කාර්ය භාරයන්

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාවේ සියළු වත්කම් පිළිබඳ වාර්තා තබාගැනීම සහ නඩත්තුකිරීම. එසේම නව වත්කම් මිලදීගැනීම, නවීකරණය, අළුත්වැඩියා හා නඩත්තු කිරීම, වැඩිදියුණු කිරීම වැනි අවස්ථාවලදී වත්කම්වල වටිනාකම යාවත්කාලීන කිරීම සහ ක්ෂයවීම්ද ඇතුළත්කළ යුතුය.

ආ. වත්කම් අත්පත් කර ගැනීම, ප්‍රතිස්ථාපනය කිරීම, මූලික අළුත්වැඩියා කිරීම්, අපහරණය කිරීම් පිළිබඳ විස්තර යුද්ධ හමුදාධිපතිතුමා සහ උපදේශක කමිටුව වෙත තොරතුරු ලබාදීම.

ඇ. කාලානුරූපව ස්ථාවර වත්කම් සඳහා මණ්ඩල පත්කිරීම (උදා: තක්සේරුකිරීම, හරිවැරදි බැලීම, අපහරණය කිරීම) වාර්ෂිකව සහ විශේෂ තක්සේරු කිරීම් මගින් වත්කම්වල නිවැරදිභාවය තහවුරුකර ගැනීම.

ඈ. පාවිච්චියට නුසුදුසු සහ අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ප්‍රතිඵලදායක නොවන වත්කම් වෙන්දේසි කිරීමට අදාළ ප්‍රතිපත්ති සහ පිළිවෙත් සකස්කිරීම. විනාශ කිරීමට අනුමැතිය ලබාදීම.

ඉ. වත්කම් අත්පත්කර ගැනීම, ආරක්ෂාකිරීම, නඩත්තුකිරීම සහ නාස්තිය අවමකිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනක්‍රම හඳුන්වාදීම එම පාලනක්‍රම අධීක්ෂණය කිරීම.

ඊ. යුද්ධ හමුදාවේ සියළු වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් රෙජිස්ටරය, පාලන ගිණුම් සහ ලෙජර් නඩත්තු කළයුතු අතර ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත බැංකුවක් නඩත්තු කරමින් ඒකක සමග සබඳතාවයෙන් වාර්තා යාවත්කාලීන කිරීමත් වත්කම් පිළිබඳ තොරතුරු ලබාදීම, නඩත්තු කිරීම, ආරක්ෂාවල තක්සේරු කිරීම සහ සියළුම වත්කම් හරිවැරදි බැලීම සිදුකල යුතුය.

උ. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව නිරන්තර විමර්ශනය තුලින් පාවිච්චියට නුසුදුසු වත්කම් හදුනාගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුලින් විකිණීමට කටයුතු කිරීම සහ සියළුම වත්කම් අත්පත්කර ගැනීමේදී ප්‍රමුඛතා පිළියෙල කිරීම.

ඌ. මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන උපදෙස්වලට අනුකූලව වත්කම් පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් යාවත්කාලීන කිරීම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

5. පොදු සමීක්ෂණය පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

අ. <u>මුදල් රෙගුලාසි 758/759 අනුව ගබඩාවන්හි සෝදිසි පරීක්ෂා සිදුකිරීම</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 758/759 ට අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතනය භාර නිලධාරි විසින් තමා යටතේ පවතින ගබඩාහල්වල තොග තත්වය නඩත්තු කරන ලේඛණවලට අනුව නිවැරදිව තිබේද යන්න සනාථකර ගැනීමට සෝදිසි පරීක්ෂාවන් අනිවාර්යයෙන්ම සිදුකල යුතුය. සමස්ථයක් වශයෙන් සියළුම මූලස්ථාන/ඒකක මුදල් රෙගුලාසි අනුව නිවැරදිව සෝදිසි පරීක්ෂණ සිදුකරන අතර නිවැරදි ක්‍රියාපිළිවෙත් හා අවශ්‍ය උපදෙස් නිකුත්කර ඇත. තොග නඩත්තු කරනු ලබන සියළු මූලස්ථාන/ඒකක වෙතින් සිදුකරනු ලබන සෝදිසි පරීක්ෂාවන්ගේ ත්‍රෛමාසික වාර්තාවක් වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට දැනුවත්කර ඇත. ත්‍රෛමාසික වාර්තාවන්ට අනුව විශාල වශයෙන් අතිරික්තව පවතින ඉන්ධන හා සලාක වැනි ද්‍රව්‍ය නැවත තොගයට ගනු ලබයි. 2012 වර්ෂයේ 4 වන කාර්තුවේ හා 2013 වසරේ පළමු කාර්තු තුනෙහි අතිරික්ත ද්‍රව්‍ය වටිනාකම්හි සාරාංශ වාර්තාව පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | වර්ෂය | සලාක | | | | ඉන්ධන | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා ඒකක | | වෙනත් | | ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා ඒකක | | | |
| | | රු: | ශ: | රු: | ශ: | රු: | ශ: | රු: | ශ: |
| 1. | 2012 (4 වන කාර්තුව) | 1,211,613 | 23 | 2,175,414 | 13 | 610,858 | 00 | 3,997,921 | 36 |
| 2. | 2013 (1 වන කාර්තුව) | 1,198,292 | 20 | 1,389,232 | 09 | 571,968 | 59 | 3,159,492 | 88 |
| 3. | 2013 (2 වන කාර්තුව) | 1,201,407 | 78 | 1,958,161 | 60 | 478,219 | 58 | 3,637,788 | 96 |
| 4. | 2013 (2 වන කාර්තුව) | 1,010,197 | 65 | 1,115,537 | 66 | 576,649 | 76 | 2,702,385 | 07 |
| මුළු එකතුව | | 4,621,509 | 86 | 6,638,344 | 48 | 2,237,694 | 93 | 13,497,552 | 27 |

ආ. <u>වාර්ෂික සමීක්ෂණ මණ්ඩල හරිවැරදි බැලීම</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 756/757 අනුව යුද්ධ හමුදාවේ ස්වයං ගිණුම් තබන මූලස්ථාන/ඒකකවල නඩත්තු කරන ගබඩාහල්වල පවතින උපකරණ/භාණ්ඩවල නිවැරදිතාවය තහවුරුකර ගැනීමට හා පාවිච්චියට නුසුදුසු භාණ්ඩ හඳුනාගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණ මණ්ඩල පත්කරනු ලබයි. 2012 වර්ෂය තුල සිදුකරනු ලැබූ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයන්හි විස්තර පහත පරිදි වේ.

| මණ්ඩල පත්කල යුතු ස්ථාන ගණන | මණ්ඩල පත්කර ඇති ස්ථාන | මණ්ඩල වාර්ථා එවා ඇති ස්ථාන ගණන | එවිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|
| 589 | 589 | 589 | නොමැත |

ඇ. <u>වාර්ෂික අයෝග්‍ය කිරීමේ මණ්ඩල</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 770/771 අනුව පාවිච්චියට නුසුදුසු භාණ්ඩ/උපකරණ හඳුනාගැනීම අරමුණු කරගෙන මණ්ඩල පත්කරනු ලබන අතර මණ්ඩල නිර්දේශයෙන් විකිණීම/ මාරුකිරීම/ අළුත්වැඩියා කිරීම/ විනාශකිරීම වශයෙන් සිදුකරනු ලබයි. 2012 වර්ෂය තුල සිදුකරනු ලැබූ වාර්ෂික අයෝග්‍ය කිරීම් මණ්ඩලයන්හි විස්තර පහත සඳහන් පරිදි වේ.

| මණ්ඩල පත්කල යුතු ස්ථාන ගණන | මණ්ඩල පත්කර ඇති ස්ථාන | මණ්ඩල වාර්ථා එවා ඇති ස්ථාන ගණන | එවිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|
| 518 | 518 | 518 | නොමැත |

ඇ. <u>වාර්ෂික බඩුභාහිරාදිය විනාශකිරීම</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 772/773 ට අනුව අයෝග්‍ය කරන ලද පාවිච්චියට නුසුදුසු භාණ්ඩ විකිණීම, මාරුකිරීම හෝ අළුත්වැඩියාකිරීමට සුදුසු නොමැතිනම් එම භාණ්ඩ විනාශකිරීම සඳහා විනාශකිරීම් මණ්ඩල පත්කරනු ලබයි. 2012 වර්ෂයට අදාලව සිදුකරනු ලැබූ වාර්ෂික විනාශකිරීම් මණ්ඩලයන්හි විස්තර පහත පරිදි වේ.

| මණ්ඩල පත්කල යුතු ස්ථාන ගණන | මණ්ඩල පත්කර ඇති ස්ථාන | මණ්ඩල වාර්ථා එවා ඇති ස්ථාන ගණන | එවිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|
| 450 | 450 | 450 | නොමැත |

ඉ. <u>තොග නඩත්තු කරන ඒකකයන්හි වර්ෂය අවසානයේ පවතින තොග වට්නාකම් ගණන් ගැනීම</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 507(1) අනුව තොග නඩත්තුකරනු ලබන ඒකකයන්හි වර්ෂය අවසානයේ පවතින ප්‍රායෝගික තොග තත්වයන්හි වටිනාකම් ගණනය කිරීම හා වාර්ෂික ගිණුම් කටයුතු අරමුණු කරගෙන මෙම තොගගැනීම් සිදුකරනු ලබයි. තොග නඩත්තුකරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදා සන්නාහ සන්නද්ධ බලසේනාවල කාලතුවක්කු බලසේනාවල ඉංජිනේරු බලසේනාවල සංඥා බලසේනාවල වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය හා සේවා බලකා/ යුද්ධෝපකරණ බලකා යන ස්ථානයන්හි නඩත්තුකරනු ලබන තොග තත්වයන්ගේ නිවැරදිතාවය හා වර්ෂ අවසානයේ ප්‍රායෝගිකව පවතින ප්‍රමාණය සොයාබැලීම හා එහි වටිනාකම වාර්ෂික ගිණුම් කටයුතුවලට ඉදිරිපත්කිරීම අරමුණු කරගෙන වාර්ෂික තොග ගණන්ගැනීම සිදුකරනු ලබයි. 2012 වර්ෂයේ තොග වටිනාකම් කරනු ලැබූ ස්ථානයන්ගේ විස්තර පහත පරිදිවේ.

| මණ්ඩල පත්කල යුතු ස්ථාන ගණන | මණ්ඩල පත්කර ඇති ස්ථාන | මණ්ඩල වාර්ථා එවා ඇති ස්ථාන ගණන | එවිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|
| 201 | 201 | 201 | නොමැත |

ඊ. <u>වර්ෂය අවසානයේ ස්ථාවර වත්කම්වල පැවැත්ම හරිවැරදි බැලීම</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 507 (2) අනුව සෑම මුදල් වර්ෂයක් අවසානයේම ස්ථාවර වත්කම්වල පැවැත්ම හරිවැරදි බලා සටහන් කල යුතුය. ස්ථාවර වත්කම්වල පැවැත්ම හරිවැරදි බැලීම අරමුණුකොට මණ්ඩල පත්කරන අතර 2012 වර්ෂය හරිවැරදි බැලීම් මණ්ඩල විස්තර පහත සඳහන් පරිදිවේ. පෙර වර්ෂයේ මණ්ඩල පත්කිරීමේ වාර්තා ලබන්නා වූ වර්ෂයේ ලබාදීම සිදුවේ. තවද වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලය තවත් පියවරක් ඉදිරියට තබමින් ස්ථාවර වත්කම්වල පැවැත්ම හරිවැරදි බැලීමේ ක්‍රියාවලිය සඳහා නව පරිගණක මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදෙන ලදි.

| මණ්ඩල පත්කල යුතු ස්ථාන ගණන | මණ්ඩල පත්කර ඇති ස්ථාන | මණ්ඩල වාර්ථා එවා ඇති ස්ථාන ගණන | එවිය යුතු මණ්ඩල වාර්තා ගණන |
|---|---|---|---|
| 476 | 476 | 476 | නොමැත |

(1) පවතින ස්ථාවර වත්කම් පරිගණක මෘදුකාංග පද්ධතිය වඩාත් කාර්‍යක්ෂම ලෙස වෙන් වෙන්ව නිවැරදි වත්කම් විස්තර ලබාගැනීම සඳහා පරිගණක ජාලගත කිරීමේ වැඩසටහනක් බවට වැඩිදියුණු කිරීමට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ ක්‍රියාකරනු ලබයි. වර්තමානයේ එම ජාලගත පරිගණක වැඩසටහනේ නිවැරදිතාවය පරීක්ෂා කරමින් පවතී.

(2) මෙතෙක් මූල්‍ය පදනම යටතේ ඉදිරිපත් කල ජංගම නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාව 2013 වර්ෂයේ සිට නියමු ව්‍යාපෘතියක් ලෙස උපචිත පදනම යටතේ ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

උ. <u>නැතිවීම් හා අලාභහානිවීම් යටතේ යුද්ධ හමුදා දේපල පොත්පත් වලින් කපාහැරීමේ ක්‍රියාපිළිවෙත</u>. රාජ්‍ය මුදල් රෙගුලාසි 102-109 අනුව යුද්ධ හමුදා දේපල නැතිවීමක් හෝ අලාභහානිවීමක් සිදුවූ විට එයට හේතුව හා එම බඩුහාහිරාදියට අදාල විස්තර වාර්තාවක් නිසිඅයුරු සකසා එම වගකීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්විය යුතුය. විශේෂයෙන් නැතිවීම් හා අලාභහානිවීම් යටතේ ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් සැලකියයුතු අලාභහානි සංඛ්‍යාවක් සිදුවී ඇතිබව නිරීක්ෂණයවී ඇත.

ඌ. අදාල පරීක්ෂණ මණ්ඩල සහ මූපඋ වල බහුතරයක ක්‍රියාමාර්ග සම්බන්ධීකරණ හා පරිපාලන දුර්වලතා නිසා අවසන්වී නොමැති අතර එම දුර්වලතා මගහරවාගෙන කඩිනමින් එය නිරාකරණය කිරීම සඳහා වත්කම් කළමනාකරණ අධ්‍යක්ෂ මණ්ඩලයෙ වෙතින් එම සේනාංක මූලස්ථාන/රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත අවැසි උපදෙස් ලබාදී ඇති බවත් මුදල් රෙගුලාසි 102-109 අනුව අදාල වාර්තා සකස්කිරීම ඒ අනුව සිදුවේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අදාල සිදුවීම් සමථයකට පත්කිරීම සඳහා දීර්ඝකාලයක් ගතවී ඇති බවත් එහි විස්තර වාර්ථාව පහත සඳහන් පරිදි දක්වා ඇත.

| අනු අංකය | පියවරයන් අනුව ලිපිගොනු | සිදුවීම් සංඛ්‍යාව | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | රු: | ශත |
| 1. | මුදල් රෙගුලාසි 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තා | 88 | 82,287,636 | 03 |
| 2. | මුදල් රෙගුලාසි 104(4) යටතේ පරීක්ෂණ මණ්ඩල /මූපඋ අවසන් වාර්තා | 155 | 1,850,334,266 | 46 |
| 3. | මුදල් රෙගුලාසි 109 යටතේ කපාහැරීම් වාර්තා | 77 | 458,080,581 | 49 |

**මූල්‍යමය විස්තරය**

6. ටෙන්ඩර් ක්‍රියාපිළිවෙත. ශ්‍රීලයුයුබ ඒකකයන්හි භාණ්ඩ ආපසු භාරගැනීමේ ගබඩාවල (භාආභාග) ගබඩාකර ඇති සියලු පාවිච්චියට නුසුදුසු වාහන සහ පොදු භාණ්ඩ ටෙන්ඩර් පිළිවෙත අනුව අපහරණය කරනු ලබයි. **2013** වර්ෂයේ ටෙන්ඩර් ක්‍රියාපිළිවෙත අනුව රජයේ ආදායමට බැරකල සම්පූර්ණ මුදල රු: 66,648,132.21 කි. එහි විස්තර පහත දැක්වේ.

| අනු අංකය | ඒකකය | වාහන සංඛ්‍යාව (ලොට්) | වාහන ආදායම | | පොදුභාණ්ඩ සංඛ්‍යාව (ලොට්) | පොදුභාණ්ඩ ආදායම | |
|---|---|---|---|---|---|---|---|
| | | | රු: | ශ: | | රු: | ශ: |
| 1. | 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 165 | 24,985,670 | 0 | 22 | 6,566,630 | 10 |
| 2. | 2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 126 | 11,909,414 | 11 | 7 | 1,060,994 | 0 |
| 3. | 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 37 | 3,122,130 | 0 | 10 | 1,182,018 | 0 |
| 4. | 5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 53 | 2,523,800 | 0 | 7 | 1,020,200 | 0 |
| 5. | 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 34 | 2,950,127 | 0 | 4 | 1,407,499 | 0 |
| 6. | 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 67 | 6,353,400 | 0 | 7 | 3,566,250 | 0 |
| මුළු එකතුව | | 482 | 51,844,541 | 11 | 57 | 14,803,591 | 10 |

## යුහ යහසාධක අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. යුධ හමුදාවේ සාමාජිකයන් හට ඉතිරි කිරීමේ පළපුරුද්ද හා සකසුරුවම් බව ඇති කිරීම අරමුණු කර ගෙන යුධ හමුදා සුහ සාධක අරමුදල 1981 වසරේදී ආරම්භ කරන ලද අතර, එම අරමුදල 1996 ජනවාරි 06 වන දින සිට ශ්‍රීලංකා යුධ හමුදා යහසාධක අරමුදල වශයෙන් නම් කරන ලදි. එහි කාර්‍යයන් තවදුරටත් විකාශනය වීම හේතුවෙන් යහසාධක අරමුදල 2009 අගෝස්තු 30 වන දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයක් බවට පත් කරන ලදි.

**වගකීම්**

2. සාමාජිකයන් වෙතින් දායක මුදල් ලබා ගැනීම හා එම දායක මුදල් ලාභදායී ලෙස හා ආරක්ෂාකාරී ලෙස ආයෝජනය කිරීම තුලින් ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීම.

**අරමුදල පිහිටුවීමේ පොදු අරමුණු**

3. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ සාමාජිකයන් තුල සකසුරුවම් බව ප්‍රවර්ධනය කිරීම වේ.

4. මෙම අරමුදලේ මූලික කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද හමුදා සාමාජිකයින් හට මෙම අරමුදලේ සාමාජිකත්වය ලබා දීම.

ආ. සාමාජිකයින්ගෙන් දායක මුදල් ලබා ගැනීම හා ලෙජර්පත් නඩත්තු කිරීම.

ඇ. දායක මුදල් රාජ්‍ය බැංකු භාණ්ඩාගාර බිල්පත් වල කෙටි හා දිගු කාලීනව ආයෝජනය කිරීම.

ඈ. තැන්පතු සඳහා ලැබෙන පොලියෙන් සාමාජිකයාට වැඩි පොලී අනුපාතයක් ලබා දීම.

ඉ. තැන්පතු මුදලින් 85% ක ණය මුදලක් ලබා දීම.

ඊ. සාමාජිකයන් හට සාමාජික මුදලින් 80% ක මුදලක් ලබා දීම.

උ. විශ්‍රාම යාමේදී ප්‍රතිලාභ මුදල් ගෙවීම.

ඌ. ප්‍රතිලාභීන් හට ප්‍රතිලාභ මුදල් ගෙවීම. (සාමාජිකයා මියගිය විට)

**වාර්ෂික සමාලෝචනය**

5. <u>අරමුදල සහ සාමාජිකයන්ගේ විස්තර</u>. **2013** වර්ෂය තුලදී යුධ හමුදා සාමාජිකයන් **7597** දෙනෙකුට අරමුදලේ සාමාජිකත්වය ලබා දී ඇති අතර, වර්ෂය අවසානයේ සම්පූර්ණ සාමාජිකයන් සංඛ්‍යාව **189731** ක් විය. වර්ෂය තුලදී අරමුදල රුපියල් බිලියන **6.027** කින් වර්ධනය වී ඇති අතර, වර්ෂය අවසානයේ අරමුදලේ සම්පූර්ණ වටිනාකම රුපියල් බිලියන **44.2** ක් වේ.

6. ආයෝජන. 2012 මූල්‍ය වර්ෂයේ යුධ හමුදාව තුලින් නිරවුල් කල යුතු බිල්පත් නිරවුල් කිරීම සදහා මහා භාණ්ඩාගාරය වෙත රුපියල් බිලියන 5 ක මුදලක් ඉහල පොලී අනුපාතයක් යටතේ 2013 ජනවාරි 18 වන දින ලබා දෙන ලදි.

7. 2013.12.31 වන දිනට රාජ්‍ය බැංකු වල ආයෝජනය කර ඇති ඇති මූල්‍ය විස්තර පහත සදහන් පරිදි වේ.

අ. බැංකුවල ආයෝජන විස්තර (ස්ථාවර තැන්පතු) - 2013.12.31 දිනට

| විස්තරය | ලංකා බැංකුව (රු.මිලි) | ජා.ඉ.කි. බැංකුව (රු.මිලි) | මහජන බැංකුව (රු.මිලි) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (රු.මිලි) | මහා භාණ්ඩාගාරය (රු.මිලි) | එකතුව (රු.මිලි) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රතිමිලදී ගැණුම් (රු.මිලි) | | | 175.00 | | | 175.00 | 0.49% |
| ස්ථාවර තැන්පතු (රු.මිලි) | 7,548.87 | 9,986.04 | 10,315.04 | 382.07 | | 28,232.02 | 79.74% |
| ණයකර (රු.මිලි) | 2,000.00 | | | | | 2,000.00 | 5.65% |
| මහා භාණ්ඩාගාරය වෙත ණය මුදල් (රු.මිලි) | | | | | 10,000.00 | 10,000.00 | 14.12% |
| එකතුව (රු.මිලි) | 9,548.87 | 9,986.04 | 10,490.04 | 382.07 | 10,000.00 | 40,407.02 | 100% |

ආ. වර්ෂය තුල සිදු කරන ලද ගෙවීම්

(1) 80% මුදල් ආපසු ගෙවීම්

| අනු අංකය | මාසය | සංඛ්‍යාව | වටිනාකම (රු.ශත) |
|---|---|---|---|
| 1. | ජනවාරි | **520** | 215,269,311.95 |
| 2. | පෙබරවාරි | **368** | 166,863,575.44 |
| 3. | මාර්තු | **614** | 341,557,013.94 |
| 4. | අප්‍රේල් | **586** | 354,975,767.68 |
| 5. | මැයි | **652** | 335,641,320.89 |
| 6. | ජුනි | **567** | 259,562,765.81 |
| 7. | ජුලි | **527** | 245,890,460.26 |
| 8. | අගෝස්තු | **538** | 233,886,615.03 |
| 9. | සැප්තැම්බර් | **517** | 206,101,716.30 |
| 10. | ඔක්තෝබර් | **396** | 166,716,441.70 |
| 11. | නොවැම්බර් | **445** | 186,865,735.73 |
| 12. | දෙසැම්බර් | **255** | 99,998,596.11 |
| | එකතුව | **5985** | 2,813,329,320.84 |

(2) අවසන් ගෙවීම් හා ප්‍රතිලාභීන් වෙත මුදල් ගෙවීම.

| අනු අංකය | මාසය | සංඛ්‍යාව | වටිනාකම (රු.ශත) |
|---|---|---|---|
| 1. | ජනවාරි | 353 | 129,529,915.66 |
| 2. | පෙබරවාරි | 726 | 540,791,972.76 |
| 3. | මාර්තු | 899 | 564,706,369.46 |
| 4. | අප්‍රේල් | 1125 | 556,416,551.83 |
| 5. | මැයි | 807 | 404,257,084.40 |
| 6. | ජූනි | 855 | 406,122,100.94 |
| 7. | ජූලි | 880 | 383,208,333.03 |
| 8. | අගෝස්තු | 755 | 315,023,018.50 |
| 9. | සැප්තැම්බර් | 707 | 260,115,559.94 |
| 10. | ඔක්තෝබර් | 498 | 168,684,482.24 |
| 11. | නොවැම්බර් | 940 | 363,869,986.38 |
| 12. | දෙසැම්බර් | 73 | 15,580,177.91 |
| | එකතුව | 8618 | 4,108,305,553.05 |

(3) 85% ණය මුදල් ගෙවීම

| අනු අංකය | මාසය | සංඛ්‍යාව | වටිනාකම (රු.ශත) |
|---|---|---|---|
| 1. | ජනවාරි | 571 | 100,548,000.00 |
| 2. | පෙබරවාරි | 648 | 121,561,000.00 |
| 3. | මාර්තු | 932 | 160,075,000.00 |
| 4. | අප්‍රේල් | 1033 | 175,090,000.00 |
| 5. | මැයි | 891 | 154,479,000.00 |
| 6. | ජූනි | 1061 | 178,508,000.00 |
| 7. | ජූලි | 1034 | 171,630,000.00 |
| 8. | අගෝස්තු | 1115 | 187,151,000.00 |
| 9. | සැප්තැම්බර් | 1273 | 208,461,000.00 |
| 10. | ඔක්තෝබර් | 1044 | 172,861,000.00 |
| 11. | නොවැම්බර් | 1380 | 227,956,000.00 |
| 12. | දෙසැම්බර් | 803 | 132,839,000.00 |
| | එකතුව | 11785 | 1,991,159,000.00 |

**වෙනත් කරුණු**

**8.** අභ්‍යන්තර විගණනය. පසුගිය වසර 10 ක් සඳහා (2001 සිට 2012 දක්වා) යහසාධක අධ්‍යාපන මණ්ඩල ගිණුම් විගණනය කිරීමේ කටයුතු නිහාල් හෙට්ටිආරච්චි විගණන සමාගම විසින් 2012 නොවැම්බර් 12 වන දින ආරම්භ කරන ලදි. නමුත් විගණන කටයුතු කරගෙන යැමේදී එම කටයුතු සාර්ථකව කරගෙන යැම සඳහා මාසික දායක මුදල් ලැයිස්තු හා ලෙජර් උපුටන වලට අනුව ලෙජර්පත් යාවත්කාලීන කිරීම, අක්‍රිය සාමාජිකයන් නිවැරදිව හඳුනා ගැනීම හා නිවැරදි ශේෂයන් සහිතව සාමාජික දත්තයන් යාවත්කාලීන කිරීම මූලික හා අත්‍යවශ්‍ය කරුණක් බවට හඳුනා ගන්නා ලදි. ඒ අනුව 2013 සැප්තැම්බර් 12 වන දින නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී

කාර්යාලයේ පවත්වන ලද මෙම අධ්‍යක්ෂ මණ්ඩල භාරකාර මණ්ඩලයේදී නිවැරදිව සාමාජික ගිණුම් විස්තර පරිගණක ගත කරන තෙක් අභ්‍යන්තර විගණන කටයුතු නැවැත්වීමට තීරණය කරන ලදි. සාමාජික ගිණුම් විස්තර පරිගණක ගත කිරීම හා අරමුදල් කළමනාකරණ පරිගණක වැඩසටහන යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, එම කටයුතු 2014 මාර්තු 31 දිනට පෙර අවසන් කිරීමට සැලසුම් කර ඇත.

9. <u>යහසාධක අධ්‍යක්ෂ මණ්ඩයේ පරිගණකගත වැඩසටහන/අරමුදල් කළමනාකරණ පරිගණක වැඩසටහන/යුධ හමුදා දත්ත ජාලය සමග සම්බන්ධවීම/යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙබ් අඩවිය.</u> 2013 වසර තුළදී යහසාධක අධ්‍යක්ෂ මණ්ඩල අරමුදල් කළමනාකරණ පරිගණක වැඩසටහන ණය අවකරණ ක්‍රියාවලිය සඳහාද ව්‍යාප්ත කරන ලදි. යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරි නියුතු මාණ්ඩලික නිලධාරීන්ගේ ඉල්ලීම මත රාජකාරීන් ව්‍යාප්ත වීමට සමගාමීව අරමුදල් කළමනාකරණ පරිගණක වැඩසටහනෙහි වෙනස්කම් සිදුකරන ලදි. යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් කඩිනම් කිරීම සඳහා භාවිතයේ පැවති අතින් සකසන ලද වාර්ථා අවම කරන ලදි. තවද 2013 වර්ෂයට අදාල නව සාමාජිකත්ව ලබාදීම් හා ලෙජර්පත් විස්තර පරිගණකගත කරන ලදි. 2013 වසර අවසාන වන විට යහසාධක අධ්‍යක්ෂ මණ්ඩල දත්ත ජාලය, යුධ හමුදා දත්ත ජාලය සමග සම්බන්ධ කරන ලද අතර, මාසික අඩුකිරීම් ලැයිස්තු හා ණය අවකරණ විස්තර වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් යුධ හමුදා දත්ත ජාලය ඔස්සේ ලබාදීම ආරම්භ කරන ලදි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ සාර්ථකත්වය හා සියලු සාමාජික ගිණුම් විස්තර අරමුදල් කළමනාකරණ පරිගණක වැඩසටහන තුල යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කිරීමත් සමගම 2014 වසරේ මැද භාගය වන විට යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු කටයුතු පරිගණක වැඩසටහන යටතේ ඉටුකිරීමට හැකියාවක් ලැබෙනු ඇති අතර, විශාල පරාසයක් යටතේ යුධ හමුදා සාමාජිකයන්ගේ සුභසාධන කටයුතු සඳහා දායක වීමට යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හැකියාව ලැබෙනු ඇත.

## මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. රජය විසින් වාර්ෂිකව ජාතික අයවැයෙන් වැඩි ප්‍රමාණයක් ආරක්ෂක අංශය වෙත යොමුකරන අතර, එයින් විශාල කොටසක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දෙපාර්තමේන්තු පාලනය, කළමනාකරණය සහ අරමුදල් සම්පාදනය සඳහා තබා ගනු ලැබේ.

2. මහජන මුදල් පාලනයේ ප්‍රධාන කාර්යභාරය (රාජ්‍ය අයවැයෙන් මහා භාණ්ඩාගාරය වෙත ලබාදෙන ද්‍රවශීල මුදල් කළමනාකරණය සහ පාලනය කිරීම) මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පංතියේ නිලධාරියෙකු විසින් සිදුකරනු ලබයි.

### කාර්යභාරය

3. රජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අදාළ මහජන මුදල් ගිණුම්ගත කිරීම හා අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීම, මුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යභාරය වන අතර මහා භාණ්ඩාගාරය මගින් ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හා අදාළ චක්‍රලේඛ නිකුත් කිරීම සිදුකරනු ලැබේ.

### කාර්යයන්

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. දෙපාර්තමේන්තුගත වියදම් පාලනය සඳහා වැය ශීර්ෂ ලෙජරය නඩත්තු කිරීමක් සිදුකරනු ලබන අතර, ඒ සඳහා අනිවාර්යයෙන්ම අදාළ වර්ෂයේ ජාතික අයවැයෙන් වාර්ෂික ප්‍රතිපාදනයන් බෙදා වෙන් කරනු ලැබේ.

ආ. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම.

ඇ. උපකාර්යාලවලට ඇවැසි පරිදි මහා භාණ්ඩාගාරය මගින් අක්මුදල් හා උප අක්මුදල් ලබාගෙන නිකුත් කිරීම.

ඈ. දෙපාර්තමේන්තු ආදායම් සහ වියදම් රජයේ ගිණුම්කරණ පද්ධතිය මගින් ගිණුම්ගත කිරීම.

ඉ. දෙපාර්තමේන්තු කාර්යාලීය බැංකු ගිණුමේ ණයවර ලිපි ගෙවීම් කටයුතු නඩත්තු කිරීම.

ඊ. දෙපාර්තමේන්තු සහ අනෙකුත් ප්‍රතිසම්පාදන කටයුතු සඳහා ඉදිරිපත් කිරීම් සිදු කිරීම.

උ. අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමග තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ක්‍රියාකාරකම් සමායෝජනය කිරීම.

ඌ. වාර්ෂික ගිණුම් වාර්තා සැකසීම. (විසර්ජන ගිණුම සහ අත්තිකාරම් “බී” ගිණුම) හා ඒවා විගණකාධිපතිවරයා හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් වෙත යොමු කිරීම.

**5**. මූල්‍ය කළමනාකරණ ශාඛාව යටතේ මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරනු ලැබේ. ඒ අනුව මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තම කාර්යභාරය වඩාත් සුපැහැදිලිව හා විනිවිදභාවයෙන් සිදුකිරිම සඳහාත් ප්‍රධාන කාර්යාලයේ කාර්යභාරය විමධ්‍යගත කිරිමක් ලෙසත් පනාගොඩ, අනුරාධපුර, මින්නේරිය, පලාලි, මුලතිව් හා කිලිනොච්චි යන ප්‍රදේශයන්හි ප්‍රාදේශීය වශයෙන් ගණකාධිකරණ ආයතන පිහිටුවා ඇත.

**6**. අදාල මූලස්ථාන මගින් තම කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ක්‍රියාවට නැංවිම ඉහත උප ප්‍රාදේශීය කාර්යාල පූර්ණ දායකත්වයක් ලබාදෙන අතර, අවසානයේ මෙය රටේ සංවර්ධන ක්‍රියාවලිය උදෙසා අර්ථාන්විත දායකත්වයක් සපයනු ලබයි.

<u>**වාර්ෂික සමාලෝචනය**</u>

**7**. **2013** වර්ෂයේදී පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා ජාතික අයවැයෙන් රුː123,080,939.00 ක මුදලක් වෙන් කරනු ලැබිය. **2013** වසරේදී වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය සහ සත්‍ය වියදම පහත දැක්වේ.

<u>**මූල්‍යමය විස්තරය**</u>

| වැය ශීර්ෂය | විස්තරය | මුලු ප්‍රතිපාදන | සත්‍ය ප්‍රතිපාදන | සත්‍ය වටිනාකම |
|---|---|---|---|---|
| **පුනරාවර්ථන වියදම්** | | | | |
| **1001-1003** | පුද්ගලික පඩිනඩි | 91,769,925000 | 91,741,600,653 | 28,324,347 |
| **1101-1508** | වෙනත් පුනරාර්ථන | 25,130,189,000 | 22,701,757,659 | 2,428,431,341 |
| | එකතුව | 116,900,114,000 | 114,443,358,312 | 2,456,755,688 |
| | ප්‍රාග්ධන වියදම් | | | |
| **ප්‍රාග්ධන වත්කම්වල පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරිම්** | | | | |
| **2001** | ගොඩනැගැලි හා ඉදිකිරිම් | 298,500,000 | 297,919,869 | 580,131 |
| **2002** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 126,000,000 | 125,838,551 | 161,449 |
| **2003** | වාහන | 118,000,000 | 80,698,437 | 37,301,563 |
| **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනිම්** | | | | |
| **2101** | වාහන | 105,000,000 | 16,149,291 | 88,850,709 |
| **2102** | ගෘහ හා කාර්යාලීය උපකරණ | 124,500,000 | 123,868,199 | 631,801 |
| **2103** | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 354,500,000 | 354,411,209 | 88,791 |
| **2104** | ගොඩනැගිලි හා ඉදිකිරිම් | 902,000,000 | 900,496,847 | 1,503,153 |
| **2105** | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරිම් | 1,000,000 | 968,793 | 31,207 |
| **2401** | පුහුණු කිරිම් සහ හැකියා වර්ධන | 909,100,000 | 907,559,207 | 1,540,793 |
| **2502** | අනෙකුත් ආයෝජන | 3,242,225,000 | 3,242,054,476 | 170,524 |
| | එකතුව | 6,180,825,000 | 6,049,964,880 | 130,860,120 |
| | මුලුඑකතුව | 123,080,939,000 | 120,493,323,192 | 2,587,615,808 |
| **අත්තිකාරම් ගිණුම** | | | | |
| උපරිම සීමාව | 2,450,000,000 | | | |
| සත්‍ය වියදම් | 1,427,119,159 | | | |
| සත්‍ය බැර වටිනාකම | 1,731,702,085 | | | |

## <u>කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය</u>

### <u>හැඳින්වීම</u>

1. 2013 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 5.8% ක්ව පැවති අතර දළ දේශීය නිෂ්පාදනය සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය 9.9% ක් විය. ඒ අනුව රටේ ආහාර සුරක්ෂිතභාවය වෙනුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය ප්‍රධාන දායකත්වයක් සපයනු ලබයි. දශක 3 ට අධික කාලයක් ශ්‍රී ලංකාද්වීපයේ පැවති රුදුරු ත්‍රස්ථවාදයේ නිමාවත් සමග ශ්‍රී ලංකා යුද හමුදාවද ජාතියේ උන්නතිය සහ සංවර්ධනය උදෙසා විවිධ ක්ෂේත්‍රයන්ගේ දායකත්වය සපයමින් සිටී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව දිර්ඝ කාලයක සිට කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් ගොවිපලවල් පවත්වාගෙන ආ නමුත් ඒ සඳහා නිසි සම්බන්ධීකරණයක් හෝ සැලසුම් යාන්ත්‍රනයක් නොපැවතුනි. එබැවින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙතින්ද කෘෂිකාර්මික ක්ෂේත්‍රය වඩා හොඳ දායකත්වයක් සැපයිම අරමුණු කරගෙන 2010 වර්ෂයේදී කෘෂිකාර්මික අංශයක් රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය යටතේ ස්ථාපනය කරන්නට යෙදුනි. ඒ අනුව කෘෂිකාර්මික අංශයේ මෙහෙයවිම යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්ත කිරිම සඳහා මහා පරිමානයේ ගොවිපලවල් ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකා යුද හමුදාව තුල කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්තියත් සමග එහි මනා කලමණාකාරිත්වයක් සහ නිසි මෙහෙයවිමක් යටතේ කටයුතු කරගෙන යාම අරමුණු කොට ගෙන 2011 වර්ෂයේ නොවැම්බර් මස කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය නමින් නව අධ්‍යක්ෂ මණ්ඩලයක් ශ්‍රී ලංකා යුද හමුදාවට එක් විය. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙහෙයවිම යටතේ විධිමත් සම්බන්ධීකරණයක් හා උපකාරක යාන්ත්‍රණයක් පැවතිම හේතු කොටගෙන පසුගිය වර්ෂ දෙකක කාල පරාසය තුල යුද හමුදා ගොවිපලවල් හි සැලකියයුතු මට්ටමේ නිෂ්පාදනයක් හා ලාභයක් පෙන්වනු ලැබිය. මේ වනවිට කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ යුද හමුදා ගොවිපල 06 ක් පවත්වාගෙන යනු ලබන අතර රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකායට අයත් නිත්‍ය හා ස්වේච්ඡා ඒකක 04 ක් යටතේ ගොවිපල 07 ක් දිවයිනේ විවිධ ප්‍රදේශවල ස්ථාපිතව ඇත. මෙම ගොවිපල වෙතින් වී වගාව මෙන්ම එළවළු සහ පලතුරු භෝග වගාවද, එළකිරි සහ මිකිරි නිෂ්පාදනයද එළු පාලනය මෙන්ම ලේයර් සහ බ්‍රොයිලර් කුකුල් පාලනය ඉතා සාර්ථකව සිදුකරනු ලබයි. තවද දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අයත් ගොවිපලවල්හි සියලුම කෘෂිකර්ම කටයුතු වෙනුවෙන් අවශ්‍ය උපදේශක දායකත්වයද ලබාදෙනු ලබයි.

### <u>වගකීම්</u>

2. යුද හමුදා ගොවිපලයන්හි නිලධාරින් හා සෙසු නිලයන්හට අධි තාක්ෂණික, නවින හා නව කෘෂි අධ්‍යාපනයක් ලබාදිම.

3. යුද හමුදා ගොවිපලවල්හි අවශ්‍යතාවයට අනුව ඉදුරා බඳවාගත් කෘෂිකර්ම නිලධාරින් හා කෘෂිකර්ම ප්‍රදර්ශක/උපදේශක සෙබල කණ්ඩායම් පත් කිරිම හා ස්ථානගත කිරිම පිලිබඳව රෙජිමේන්තු මූලස්ථාන දැනුවත් කිරිම.

4. යුද හමුදා ගොවිපලවල්හි අවශ්‍යතාවයට අනුව කෘෂිකාර්මික යන්ත්‍ර හා උපකරණ වෙන් කිරිම හා බෙදාහැරිම.

5. යුද හමුදා ගොවිපලවල් හා යුද හමුදාව මගින් ක්‍රියාත්මක කෘෂිකාර්මික ව්‍යාපෘති වල සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සඳහා පහත සඳහන් විෂයයන්ට අදාල දැනුම හා උපදෙස් ලබාදිම.

   අ. කෘෂිකර්ම හා පශු සම්පත් ක්‍රියාකාරකම් සඳහා නවින යන්ත්‍ර උපකරණ භාවිතය.

ආ. බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පදනය සඳහා වඩාත් උචිත කළමණාකරණ ක්‍රම.

ඇ. ගොවිපල සතුන් තෝරා ගැනිම (විශාල/කුඩා).

ඈ. රෝපණ ද්‍රව්‍ය හා බෝග ප්‍රභේද තෝරා ගැනිම.

ඉ. ගොවිපල සතිපාරක්ෂාව, බෝග ආරක්ෂණය හා සෞඛ්‍ය ආරක්ෂාව.

ඊ. ඒකාබද්ධ පලිබෝධ පාලනය.

උ. කෘෂි රසායන යෙදිම, රසායනික ද්‍රව්‍ය හා කාබනික පොහොර යෙදිම.

ඌ. කොම්පෝස්ට් හා ජිව පොහොර නිෂ්පාදනය හා භාවිතය.

එ. නවින ජල සම්පාදන ක්‍රම ස්ථාපිත කිරිම හා කළමණාකරණය.

ඒ. හරිතාගාර හා පොලිතින් ගෘහ කළමණාකරණය.

ඔ. පාංශු සංරක්ෂණය.

ඕ. අස්වනු නෙලිම හා පසු අස්වනු තාක්ෂණය.

ක. බීජ නිෂ්පාදනය හා සත්ත්ව අභිජණනය.

<u>**කාර්යය**</u>

6. සියළුම යුද හමුදා ගොවිපලයන්හි අණදිම හා සම්බන්ධිකරණ කටයුතු කාර්‍යක්ෂමව සිදුකිරිම මෙන්ම කෘෂිකාර්මික ව්‍යාපෘතිය හා ඒකාබද්ධ කෘෂිකාර්මික ව්‍යාපෘති ආරම්භ කර පවත්වාගෙන යාම.

<u>**කාර්යයන්**</u>

7. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද හමුදා ගොවිපලවල සහ කෘෂිකාර්මික ව්‍යාපෘති වල සිටින නිළධාරින් හා සෙසුනිලයන් සඳහා අධි තාක්ෂණික නවින කෘෂි අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කිරිම.

ආ. යුද හමුදා ගොවිපලවල් හි අවශ්‍යතාවය අනුව ඉදුරා බඳවාගත් කෘෂිකාර්මික නිළධාරින් හා සෙබල කණ්ඩායම් (කෘෂිකර්ම ප්‍රදර්ශක/උපදේශක) පත් කිරිම හා ස්ථානගත කිරිම.

ඇ. යුද හමුදා ගොවිපලවල්හි අවශ්‍යතාවයට අනුව කෘෂිකාර්මික යන්ත්‍ර හා උපකරණ වෙන් කිරිම හා බෙදාහැරිම.

ඈ. හමුදා ගොවිපලවල් හා යුද හමුදාව මගින් ක්‍රියාත්මක කෘෂිකාර්මික ව්‍යාපෘතින්හි සාමාන්‍ය ක්‍රියාකාරිත්වය සඳහා සියළුම කෘෂිකාර්මික හා පශු සම්පත් කටයුතු වලට අදාල දැණුම හා උපදෙස් ලබාදිම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

8. වාර්ෂික සමාලෝචනය පහත සඳහන් පරිදි වේ.

අ. <u>පවත්වන ලද පාඨමාලාවන්</u>

(1) ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) යටතේ විවිධ ස්ථානයන්හි රාජකාරි නියුතු සෙසුනිලයන් සඳහා මූලික කෘෂිකර්ම පාඨමාලා පැවැත්වීම.

(2) 6 ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය (සෙව්) ට අයත් සෙසුනිලයන්ගේ වෘත්තිය දැණුම වර්ධනය කිරීමට සහ වෘත්තිය පරිකෂණයන්ට මගපෙන්වීම සඳහා වන මූලික කෘෂිකර්ම පාඨමාලා දෙකක් පැවැත්වීම.

ආ. <u>කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරින් හට සම්පාදනය කරනු ලබන පාඨමාලා</u>

(1) කෘෂිකාර්මික නිලධාරින් වෙනුවෙන් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයෙන් පවත්වන ලද සත්ව පාලනය පිලිබඳ පාඨමාලාව.

(2) ඉදුරාම බඳවාගත් කෘෂිකර්ම නිලධාරින් හට යුද හමුදා ලිපි සැකසීම හුවමාරුව, කාර්යාලීය ක්‍රියාපිලිවෙත පිලිබඳ දෙදින වැඩමුළුවක් 6 ශ්‍රී ලංකා යුද හමුදා පොදුසේවා බලකාය (සෙව්) ඒකකය වෙතින් පැවැත්වීම.

ඇ. <u>විදේශ සංචාර</u>. ඉන්දුනිසියාවේ ක්‍රියාත්මක කකුළුවන් රෝපනය (වගාව) කිරීම පිලිබඳ තාකෂණික දැණුම ලබා ගැනීම සඳහා කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂක මණ්ඩලයට අයත් එක් නිලධාරියෙකු ඉන්දුනිසියාවේ සංචාරයක නිරතවීම.

ඈ. <u>අනෙකුත් ක්‍රියාකාරකම්</u>. පරිසර අමාත්‍යාංශය විසින් දිප ව්‍යාප්තව දියත් කරනු ලැබූ රුක් රෝපන ව්‍යාපෘතියෙහි එක් අධියරක් වශයෙන් යුහ ගොවිපල කන්දකාඩුහි රුක් රෝපන ව්‍යාපෘතියක් සංවිධානය කිරීම.

ඉ. <u>යුද හමුදා ගොවිපල ක්‍රියාකාරකම්</u>.

(1) යුද හමුදා ගොවිපල කන්දකාඩු

(අ) කෘෂිකාර්මික ක්‍රියාකාරකම් සඳහා හමුදාගත පදනම මත සෙබළුන් 200 ක් අලුතින් බඳවා ගැනීම.

(ආ) වී නිෂ්පාදනය සහ බීජ වී නිෂ්පාදන වෙනුවෙන් අක්කර 100 ක කුඹුරු ඉඩම් අස්වැද්දීම.

(ඇ) අභිජනන අවශ්‍යතාවයන් වෙනුවෙන් එළු පාලන ඒකකය විවිධාංගීකරණය කිරීම.

(ඈ) දිනකට එළදෙනකගෙන් ලබාගත හැකි එළකිරි ප්‍රමාණය අවම වශයෙන් ලීටර් 10 ක් බවට පත් කිරීම සඳහා එළකිරි නිෂ්පාදන ඒකකය නගාසිටුවීම.

(ඉ) සාම්ප්‍රදායික වී ප්‍රභේද වගා කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම.

(ඊ) අක්කර 20 ක භූමි භාගයක පටක රෝපිත කෙසෙල් වගාව ආරම්භ කිරීම.

(උ) මනා ජල කළමණාකරණය තුළින් වසර පුරා ඉහළ කෙසෙල් අස්වැන්නක් ලබා ගැනීම සඳහා අක්කර 20 ක භූමි භාගයක ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමයක් ස්ථාපනය කිරීම.

(ඌ) අක්කර 50 ක භූමි ප්‍රමාණයක් කජු වගාව ආරම්භ කිරීම.

(එ) අක්කර 5 ක භූමි ප්‍රමාණයක පොල් වගාව ආරම්භ කිරීම.

(ඒ) නියමු ව්‍යාපෘතියක් ලෙස අක්කර 7.5 ක භූමි ප්‍රමාණය රබර් වගාව ආරම්භ කිරීම.

(ඔ) පාරිසරික සංචාරක ව්‍යාපාරය අරමුණු කරගෙන නිවාඩු නිකේතනයක් ඉදි කිරීම.

(ඕ) වැසි රහිත කාලයේදී ජල පහසුකම් සපයා ගැනීම සඳහා කුඩා ජල මූලාශ්‍රයක් ඉදිකිරීම.

(ක) ශ්‍රීලංකා යුද හමුදා සලාක අවශ්‍යතාවය වෙනුවෙන් ශ්‍රීලයුසේබ අංශය වෙත එළවළු හා පලතුරු අඛණ්ඩව සැපයීම.

(2) <u>යුද හමුදා ගොවිපල උදයාර්කට්ටුකුලම</u>.

(අ) දොඩම් සහ කොස් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් ලෙස නව දොඩම් ඇසුරුම් හා බෝතල්කල වරකා හඳුන්වා දෙමින් එම ව්‍යාපෘති ඉදිරියට කරගෙන යාම.

(ආ) නිලධාරින් සහ සෙසුනිලයින්ගේ පාලන අවශ්‍යතාවය සඳහා කරණවැම් හලක් ඉදිකිරීම.

(ඇ) කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

(ඈ) සෙසුනිලයින් 50 කට ප්‍රමාණවත් හථ නිවාසයක් ඉදිකිරීම.

(ඉ) එළවළු වගා භූමි වපසරිය අක්කර 10 ක් දක්වා ඉහළ දැම්ම.

(ඊ) රුපියල් මිලියන 3.6 ක මුදලක් වැයකර ජල සම්පාදන ක්‍රමය වැඩිදියුණු කිරීම.

(උ) පුවක් පැල 2000, දොඩම් පැල 250, අඹ පැල 150, පේර පැල 150 ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම.

(ඌ) ශ්‍රී ලංකා යුද හමුදා සලාක අවශ්‍යතාවය වෙනුවෙන් ශ්‍රීලයුසේබ අංශය වෙත එළවළු සහ පලතුරු අඛණ්ඩව සැපයීම.

(3) <u>යුද හමුදා ගොවිපල නව්විකුඩා</u>

(අ) කජු අක්කර 400 ක භූමි ප්‍රමාණයකින් 3661 කිංග්‍රෑම් කජු අස්වැන්නක් ලබා ගැනීම.

(ආ) අක්කර 10 ක භූමි ප්‍රමාණයක වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම.

(4) <u>යුද හමුදා ගොවිපල වෙල්ලම්කුලම්</u>

(අ) අක්කර 5 ක භූමි භාගයක වී වගාව ආරම්භ කිරීම.

(ආ) සෙසුනිලයින් 60 කට පහසුකම් සලසන හඨ නිවාසයක් ඉදිකිරීම.

(ඇ) නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

(ඈ) නව නිලධාරි භෝජනාගාරක් ඉදිකිරීම.

(උ) අක්කර 228 ක භූමි ප්‍රමාණයකින් කජු කිංග්‍රෑම් 1708 ක අස්වැන්නක් ලබාගැනීම.

(5) <u>යුද හමුදා ගොවිපල මැණික්ෆාම්</u>

(අ) අක්කර 25 ක භූමි ප්‍රමාණයක වී වගාව ආරම්භ කිරීම.

(ආ) එළවලු වගාව සඳහා අක්කර 8 ක භූමි ප්‍රමාණයක විසුරුම් ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ඇ) සෙසුනිලයින් 100 කට පහසුකම් සලසන හඨ නිවාසයක් ඉදිකිරීම.

(ඈ) ශ්‍රී ලංකා යුද හමුදා සලාක අවශ්‍යතාවය වෙනුවෙන් ශ්‍රීලයුසේබ අංශය වෙත එළවළු සහ පලතුරු අඛණ්ඩව සැපයීම.

(6) <u>යුහ ගොවිපල යාල පලටුපාන</u>

(අ) අක්කර 3 ක භූමි ප්‍රමාණයක කාබනික ගොවිපලක් ආරම්භ කිරීම.

<u>**සාක්ෂාත් කරගැනීම**</u>

9. 2013 වර්ෂයේ ගොවිපල මුළු ආදායම රුපියල් මිලියන 21.84 වූ අතර, ලාභය රුපියල් මිලියන 9.62 ක් විය.

10. ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) හා 21 සේනාංක මූලස්ථානය යටතේ යුද හමුදා සලාක අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ප්‍රාදේශියව වී මිලදී ගැනීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම තුලින් සලාක අවශ්‍යතාවය සඳහා සහල් සකස්කර ලබාදීමට ක්‍රියා කිරීම හේතුවෙන් යුද හමුදාව වෙත සහල් අවශ්‍යතාවය සපයනු ලබන සැපයුම් කරුවන්ගේ ටෙන්ඩර් මිල ගණන් අඩු කිරීමට හැකි වීම.

11. ශ්‍රී ලංකා යුද හමුදා සලාක අවශ්‍යතා වෙනුවෙන් යුද හමුදා ගොවිපල වෙතින් එළවළු සහ පලතුරු ශ්‍රීලයුසේබ අංශ වෙත සැපයීම හේතුවෙන් යුද හමුදාව වෙත ප්‍රාදේශියව එළවළු සහ පලතුරු සපයන්නන්ගේ ටෙන්ඩර් මිල ගණන්හි මිලෙහි කැපී පෙනෙන වෙනසක් සිදු කිරීම.

12. එළවලු බීජ නිෂ්පාදනය අඛණ්ඩව පවත්වාගෙන යාම හා එම බීජ යුද හමුදා ගොවිපලවල් අතර හුවමාරු කර ගැනීම.

13. <u>යුද හමුදා ගොවිපලවල් වල අදායම, වියදම සහ ලාභය</u>

| අනු අංකය | ගොවිපල | ආදායම (රු) | වියදම් (රු) | ලාභය (රු) |
|---|---|---|---|---|
| 1. | කන්දකාඩු | 9,905,889.23 | 8,502,999.88 | 1,402,889.35 |
| 2. | මැණික්ෆාම් | 5,343,934.20 | 8,508,30.05 | 4,493,104.15 |
| 3. | නච්චිකුඩා | 1,096,859.55 | 439,775.00 | 6,570,84.55 |
| 4. | වෙල්ලන්කුලම් | 691,206.65 | 589,906.18 | 101,300.47 |
| 5. | උදයාර්කට්ටුකුලම් | 4,853,546.16 | 1,885,379.66 | 2,968,166.50 |
| | එකතුව | 21,891,435.79 | 12,268,890.77 | 9,622,545.02 |

14. <u>2013 දෙසැම්බර් 31 ආයෝජන</u>

| අනු අංකය | ගොවිපල | බැංකු ඉතුරුම් | |
|---|---|---|---|
| | | ජංගම ගිණුම (රු) | ස්ථාවර තැන්පතු (රු) |
| 1. | කන්දකාඩු | 1,142,088.20 | 2,172,531.36 |
| 2. | මැණික්ෆාම් | 1,499,481.90 | 1,000,000.00 |
| 3. | නච්චිකුඩා | 603,610.00 | 1,500,000.00 |
| 4. | වෙල්ලන්කුලම් | 1,778,602.67 | 2,500,000.00 |
| 5. | උදයාර්කට්ටුකුලම් | 91,754.96 | 3,497,157.23 |
| | එකතුව | 5,115,537.73 | 10,669,689.59 |

<u>**අභියෝග**</u>

15. මුහුණදුන් අභයෝග පහත සදහන් පරිදි වේ.

අ. 2013 වර්ෂය තුල දිවයිනටම බලපෑ දැඩි නියං තත්වය හේතුවෙන් සියලුම ගොවිපල වල බෝග වාගාවන්ට දැඩි බලපෑමක් සිදුවූ බැවින් ආදායම් තත්වය පහල බැසීම.

ආ. කජු වගාවට බලපෑ දරුණු කෘමි හානිය සහ අහිතකර දේශගුණික තත්වය හේතුවෙන් විශාල ලෙස අස්වනු අඩුවීම සහ ආදායම් තත්වය පහත බැසීම.

ඇ. සියලුම ගොවිපල වල මාස් කන්නය සදහා නවතමයෙන් ස්ථාපිත කල භෝග වගාවන්ට බලපෑ නියං තත්වය හේතුවෙන් අනපේක්ෂිත වියදමක් දැරීමට සිදුවීම.

ඈ. ගොවිපල සත්ත්ව පාලනයේදී උසස් තත්වයේ නොමැති මෙන්ම පිරිමි සතුන් වැඩි වීම හේතුවෙන් එම සතුන් ඉවත් කිරිමට සුදුසු ක්‍රමෝපායක් නොමැති වීම.

ඉ. එදනෙදා කටයුතු සදහා අත්‍යවශ්‍ය මානව සම්පත් හිගය, යන්ත්‍ර සූත්‍ර හා ප්‍රමාණවත් ඉන්ධන නොමැතිවිම හේතුවෙන් ගොවිපලවල් වල නිෂ්පාදන තත්වය පහත වැටීම.

ඊ. එළිපෙහෙළි නොකල ඉඩම් පැවතිම හේතුවෙන් ආයෝජන සදහා පැමිනෙන ආයෝජකයන් මන්දෝත්සාහි වීම.

## විධායක ජෙනරල් ශාඛාව

### පොදු කරුණු

1. ප්‍රධාන මාණ්ඩලික නිලධාරි තනතුරු හොබවන ලබන මේජර් ජෙනරල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් අතරින් යුද්ධ හමුදා මූලස්ථානයේ විධායක ජෙනරල් ශාඛාවේ ආයතන ප්‍රධානි වන විධායක ජෙනරල් විසින් සියළුම පරිපාලනමය විෂය පථයට අදාල කරුණු සබැඳිව යුද්ධ හමුදාධිපති වෙත වගකීම් දරණු ලබයි.

### වගකීම්

2. විධායක ජෙනරල් ශාඛාව වෙතින් විනය, නියමයන් හා සේවා කොන්දේසි, උත්සව, වෛද්‍ය සේවාවන් වෙනුවෙන් යුද්ධ හමුදා නීතියට යටත්ව වගකීම් දරණු ලබයි.

3. විධායක ජෙනරල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩල සහ ආයතන පහත සදහන් පරිදි වේ.

අ. පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය.

ආ. විනය ආරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය.

ඇ. නීතිසේවා අධ්‍යක්ෂ මණ්ඩලය.

ඈ. සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය.

ඉ. රණසේවා අධ්‍යක්ෂ මණ්ඩලය.

ඊ. පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය.

(1) රණවිරු සෙවන - රාගම.

(2) රණවිරු ඇපරල්ස් -යක්කල/අලව්ව.

(3) අභිමංසල I.

(4) අභිමංසල II.

(5) අභිමංසල III.

(6) මිහිඳු සෙත් මැඳුර.

(7) රණවිරු සම්පත් කේන්ද්‍රය.

උ. මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය.

ඌ. ආධුනිකයන් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය.

එ. සෙනෙහස අධ්‍යාපන සම්පත් පර්යේෂණ හා තොරතුරු කේන්ද්‍රය.

ඒ. සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය.

ඔ. මූලස්ථාන බලඇණිය.

### කාර්යභාරය

4. විධායක ජෙනරල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත පවරනු ලබන කාර්යයන් සම්බන්ධව අධීක්ෂණය කර ඒවා කාර්‍ය්‍යක්ෂමව හා වඩාත් ප්‍රතිපලදායි ලෙස ක්‍රියාවට නංවන්නේදැයි සොයා බැලීමේ වගකීම දැරීම.

**කාර්යයන්**

5. විධායක ජෙනරල් ශාඛාව වෙත පැවරී ඇති කාර්යයන් පහත පරිදි වේ.

අ. විධායක ජෙනරල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලයන් හි විෂයයන් සබැඳිව විධායක ජෙනරල් විසින් යුද්ධ හමුදාධිපති දැනුවත් කිරීමේ වගකීම දැරීම.

ආ. විධායක ජෙනරල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙනුවෙන් පාලන කටයුතු සම්බන්ධව ලබා දෙනු ලබන නියෝග වලට අනුකූලව ප්‍රතිපත්ති සැකසීම හා අදාල අධ්‍යක්ෂ මණ්ඩල වෙතින් නිසි පරිදි ඒවා ක්‍රියාත්මක වන්නේදැයි සොයා බැලීම.

ඇ. යුද්ධ හමුදාධිපතිගේ ප්‍රතිපත්ති වලට අදාලව යුද්ධ හමුදාධිපති වෙනුවට අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත නිසි නියෝග/උපදෙස් නිකුත් කිරීම.

ඈ. සුළු ටෙන්ඩර් මණ්ඩලයේ කටයුතු වෙනුවෙන් එහි සභාපති වශයෙන් විධායක ජෙනරල් වගකීම දැරීම.

**වාර්ෂික සමාලෝචනය**

6. අධ්‍යක්ෂ මණ්ඩලයන් සමග සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලද ජාතික උත්සව පහත සඳහන් පරිදි වේ:

අ. නිදහස් සැමරුම් උළෙල.

ආ. විජයග්‍රහණ පෙළපාළිය .

ඇ. ‘අපි වෙනුවෙන් අපි’ නිවාස ව්‍යාපෘතිය.

ඈ. ජය පිරිත.

ඉ. ගංගාරාම වෙසක් කළාපය.

ඊ. දැයට කිරුළ.

7. අධ්‍යක්ෂ මණ්ඩලයන් සමග සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලද යුද්ධ හමුදා උත්සව පහත සඳහන් පරිදි වේ:

අ. පදක්කම් ප්‍රදානය.

ආ. විවිධ ප්‍රශ්ණ වලට මුහුණ පා ඇති යුද්ධ හමුදා සාමාජිකයින් ඇමතීම.

ඇ. ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව පදනම මගින් සිදුකරනු ලබන පරිත්‍යාග කටයුතු සම්බන්ධීකරණය කිරීම.

ඈ. යුද්ධ හමුදාවෙන් පැන ගිය අයවලුන් අස් කිරීමේ විශේෂ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

ඉ. රණවිරු රියල් ස්ටාර් අධියර IV.

ඊ. පිරික්සුම් පහන් සංදර්ශනය 2012.

උ. යුද්ධ හමුදා වර්ණ ප්‍රදානෝත්සවය.

ඌ. අලුත් අවුරුදු උත්සවය.

එ. යුද්ධ හමුදා දිනය සැමරීම.

ඒ. ආරක්ෂක සේවා ක්‍රීඩා උළෙල.

ඔ. විදේශ ආරාධිත අමුත්තන් පැමිණීම සම්බන්ධීකරණය කිරීම.

8. විධායක ජෙනරල් ශාඛාවේ වෙතින් 2013 වර්ෂයේ ඉටුකළ විශේෂ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධයෙන් තුවාල ලැබූ නිලධාරි/සෙසුනිලයින්ගේ සියලු නිම නොවූ මූපැට අවසන් කිරීම.

ආ. යුද්ධයෙන් තුවාල ලැබූ නිලධාරි/සෙසුනිලයින්ගේ සියලුම වෛද්‍ය වර්ග කිරීම් කටයුතු අවසන් කිරීම.

ඇ. යුද්ධයෙන් මියගිය නිලධාරි/සෙසුනිලයින් ගණන මණ්ඩලයක් මගින් අවසන් කිරීම.

ඈ. යුද්ධයෙන් තුවාල ලැබූ නිලධාරි/සෙසුනිලයින් ගණන මණ්ඩලයක් මගින් අවසන් කිරීම.

ඉ. යුද්ධයෙන් තුවාල ලැබූ නිලධාරි/සෙසුනිලයින්ගේ උසස් කිරීම් කටයුතු නිරවුල් කිරීම.

ඊ. යුද්ධ හමුදා සාමාජිකයින් සහ පවුලේ අය වෙනුවෙන් උත්සව ශාලා නිවාඩු නිකේතන ඉදිකරදීම.

උ. යුද්ධ හමුදා සුවසහන අරමුදල ආරම්භ කිරීම.

ඌ. යුද්ධ හමුදා සාමාජිකයන් සහ පවුලේ අයවළුන්ගේ සුභසාධනය වෙනුවෙන් සහනදායි පදනම මත සුවසහන බස් රථ 5 ක් මිලදීගෙන සේවාව ආරම්භ කිරීම.

එ. මහල් දහයකින් සමන්විත යුද්ධ හමුදා රෝහලක් වෙනුවෙන් සැලසුම් දියත්කිරීම.

## පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. 1994 අප්‍රේල් මස 30 වන දින හමුදා නියෝග 18/1994 මගින් යුද්ධ හමුදා මූලස්ථානයේ සංස්ථාව අනුව විධායක ජෙනරල් ශාඛාව යටතේ පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය නගා සිටුවන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෙසු නිලයින්ගේ බඳවා ගැනීමේ සිට විශ්‍රාම යන අවස්ථාව දක්වා පරිපාලනමය කටයුතු සහ රාජ්‍ය සහ හමුදා උත්සව සංවිධානය කිරීමේ කටයුතු සිදු කරනු ලබයි.

### වගකීම

2. පිරිස් පරිපාලනය සම්බන්ධයෙන් වන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍ය සහ හමුදා උත්සව සංවිධානය කිරීම සම්බන්ධයෙන් වන වගකීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලැබේ.

### කාර්යයභාරය

3. ප්‍රතිපලදායක ලෙස මිනිස් සම්පත කළමනාකරණය, සෙසුනිලයින් බඳවා ගැනීමේ සිට විශ්‍රාමයාම දක්වා පරිපාලනය සහතික කිරීම, ප්‍රතිපත්ති සහ සේවා කොන්දේසි සකස් කිරීම සහ සමාලෝචනය, රාජ්‍ය සහ හමුදා උත්සව සංවිධානය පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව වේ.

### කාර්යයන්

4. පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. මානව සම්පත් කළමනාකරණය, කෙඩෙට් නිලධාරින් සහ වෘත්තීය නිලධාරින් බඳවා ගැනීම සහ සේවා කොන්දේසි.

ආ. සෙසුනිලයින් සේවයෙන් අස්කිරීම, සේවය දීර්ඝ කිරීම සහ නැවත බඳවා ගැනීම.

ඇ. හමුදා ආයතන නගා සිටුවීම, පරිවර්තනය, විසුරුවා හැරීම සහ විවිධ විෂයන්ට අදාල හමුදා නියෝග පළ කිරීම.

ඈ. රාජ්‍ය සහ හමුදා උත්සව සංවිධානය සහ පැවැත්වීම.

ඉ. හමුදා තූර්යවාදක කණ්ඩායම් සහ සංස්කෘතික කණ්ඩායම් සම්බන්ධීකරණය.

ඊ. හමුදා උපදෙස් සහ නිල ඇඳුම්වලට අදාල රෙගුලාසීන් නිකුත් කිරීම.

උ. පදක්කම්, පළඳනා සහ ප්‍රසාදනා ප්‍රදානය කිරීම.

ඌ. අතිරේක රෙජිමේන්තු රාජකාරි සහ යාකිරීම් වලට අදාල ප්‍රතිපත්ති සමාලෝචනය සහ පත්කිරීම.

එ. සෙසුනිලයින්ගේ උසස්කිරීම් සහ විනය පවත්වා ගෙන යාම.

ඒ. විදේශ පාඨමාලා, සංචාර, සම්මන්ත්‍රණ ආදිය සඳහා සහභාගී වන සෙසුනිලයින්ට හා නිලධාරින්ට විදේශ දීමනා හිමිගැන්වීම.

ඹ. සෙසුනිලයින් අධිකාරියට පත්කිරීම.

ඹ්. රෙජිමේන්තු ආරක්ෂණ සේනා මූලස්ථාන සහ පුහුණු පාසැල්හි පාලන පරිපාලන සම්බන්ධීකරණය සහ පැවැත්වීම.

ක. මියගිය සහ තුවාල ලැබූ නිලධාරීන් සහ සෙසුනිලයින් සඳහා වන්දි ගෙවීම.

ග. නිලධාරීන් සහ සෙසුනිලයින් වෛද්‍ය හේතූන් මත අස්කිරීම.

ච. පිරිස් පරිපාලනයට සම්බන්ධ ප්‍රතිපත්ති සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

5. <u>උත්සව</u>. **2013.01.01** දින සිට **2013.12.31** දින දක්වා පහත සඳහන් උත්සව සහ සම්මාන මුර සංවිධානය කර පවත්වන ලදි.

අ. **<u>2013.01.02</u>**. **2013** වර්ෂය ආරම්භය නිමිති කොටගෙන යුද්ධ හමුදාධිපති විසින් නිලධාරීන් සහ සෙසුනිලයින් ඇමතීමෙන් අනතුරුව යුද්ධ හමුදා මූලස්ථානයේ කාර්යමණ්ඩලය නියෝජනය වන පරිදි තේ පැන් සංග්‍රහයක් යුද්ධ හමුදා මූලස්ථානය තුල පිහිටි ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි.

ආ. **<u>2013.01.10</u>**. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා දායකත්වය දැක්වූ පුද්ගලයින්ට සහතිකපත් සහ ත්‍යාග ප්‍රධානෝත්සවයක් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි.

ඇ. **<u>2013.01.16</u>**. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් මොනරාගල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ගේ ලගම ඥාතීන් සඳහා උත්තම පූජා පදක්කම ප්‍රදානය කිරීමේ උත්සවයක් කුඩාවැව පිහිටි කමාන්ඩෝ පුහුණු පාසැලේදී පවත්වන ලදි.

ඈ. **<u>2013.01.22</u>**. යුද්ධ හමුදාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් අභිමන්සල III පාන්ගොල්ල ව්‍යාපෘතිය සඳහා මුල්ගල් තැබීමේ උත්සවය පවත්වන ලදි.

ඉ. **<u>2013.02.04</u>**. ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ සහභාගීත්වයෙන් **65** වන නිදහස් දින උත්සවය ත්‍රිකුණාමලයේදී පවත්වන ලදි. මෙම උත්සවයේදී අතිගරු ජනාධිපතිතුමන් සඳහා ත්‍රිවිධ හමුදා සම්මාන මුරයක් සහ ආචාර වෙඩි මුර **21** ක් පවත්වන ලදි.

ඊ. **<u>2013.02.09</u>**. මියගිය කර්නල් පීබී පතිරණ (විශ්‍රාමික) කේඑස් නිලධාරීතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව තලාහේන, මාලඹේ පිහිටි ආදාහනාගාරයේදී පවත්වන ලදි.

උ. **<u>2013.03.02</u>**. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස යෝජනා ක්‍රමය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ රණවිරුවන් සඳහා නිවාස බෙදාදීමේ උත්සවයක් පවත්වන ලදි.

ඌ. **<u>2013.03.13</u>**. මියගිය බ්‍රිගේඩියර් එජ්එස් පෙරේරා (විශ්‍රාමික) නිලධාරීතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව බොරැල්ල කනත්තේදී පවත්වන ලදි.

එ. **2013.03.30**. ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක තුමන් විසින් මැලේ ජාතික රණවිරුවන් සඳහා කොළඹ 02 පිහිටි මැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ඉදිකල ස්මාරකය විවෘත කරන ලදි.

ඒ. **2013.04.11**. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය (බක්මහ උළෙල) මැලේ ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී පවත්වන ලදි. මෙම අවස්ථාව සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් යුද්ධ හමුදාධිපතිතුමන් සහභාගී වන ලදි.

ඔ. **2013.04.16**. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සැමරීම සඳහා යුද්ධ හමුදාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සියලු නිලයන් සඳහා තේ පැන් සංග්‍රහයක් යුද්ධ හමුදා මූලස්ථාන ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි.

ඕ. **2013.04.16**. සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය නිමිත්තෙන් යුද්ධ හමුදාධිපතිතුමන් ඇතුලු ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් විමසා ඔවුන් සඳහා තෑගි පාර්සල් බෙදාදෙන ලදි.

ක. **2013.05.09**. ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ජය පිරිත සඳහා අවශ්‍ය සේවාවන් යුද්ධ හමුදාව වෙතින් සපයන ලදි. බොරුල්ල කනත්ත මංසන්ධියේ සිට බෞද්ධ සම්මන්ත්‍රණ ගොඩනැගිල්ල තෙක් මාර්ගය දෙපස වෙසක් කූඩු එල්ලා සරසන ලදි.

ග. **2013.05.18**. ත්‍රස්ථවාදය ජයග්‍රණය කිරීම සැමරීම වස් විජයග්‍රණ පෙළපාලිය ගාලු මුවදොරදී පවත්වන ලද අතර ඒ සඳහා ප්‍රධාන අමුත්තා වශවෙන් අතිගරු ජනාධිපතිතුමන් සහභාගී විය. ත්‍රිවිධ හමුදා සම්මාන මුරයක්, ආචාර වෙඩි මුර 21 ක් සහ ත්‍රිවිධ හමුදාවේ සහභාගීත්වයෙන් සම්මාන පෙළපාළියක් අතිගරු ජනාධිපතිතුමා වෙනුවෙන් පවත්වන ලදි.

ච. **2013.05.18**. ශ්‍රී ලංකාවේ ආරක්ෂාව වෙනුවෙන් දිවි පිදූ රණවිරුවන්ට ගෞරවය සහ ප්‍රණාමය පුදකිරීම සඳහා රණවිරු උපහාර උත්සවයක් බත්තරමුල්ල රණවිරු ස්මාරකය අභියසදී පවත්වන ලදි.

ජ. **2013.05.18**. වෙසක් උත්සවයට සමගාමීව පවත්වනු ලැබූ දියවන්නා සහ සම්බෝධි වෙසක් කලාපය සඳහා වෙසක් කූඩු සැරසිලි සහ විදුලි ආලෝකය ලබාදෙමින් ශ්‍රී ලංකා යුද හමුදාව දායකත්වය ලබාදෙන ලදි.

ට. **2013.05.27**. ඉන්දිය යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් ලුතිනන් ජෙනරාල් ආර්කේ සිංග් ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකාවේ සාම සාදක රාජකාරින්හි නිරතව සිටියදී මියගිය ඉන්දිය රණවිරුවන්ට ගෞරව ප්‍රණාමය පුදකිරීම සඳහා පුෂ්පෝපහාර උත්සවයක් බත්තරමුල්ලේ පිහිටි ඉන්දියානු සාමසාධක ස්මාරකය අභියසදී පවත්වන ලදි.

ඩ. **2013.06.03**. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස යෝජනා ක්‍රමය යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ රණවිරුවන් සඳහා නිවාස බෙදාදීමේ උත්සවයක් හෙට්ටිපොල නුගවෙල මහා විද්‍යාලයේදී පවත්වන ලදි.

ත. **2013.06.13**. මියගිය කර්නල් එච්පීආර් හඳුනපතිරණ ආර්එස්පී පීඑස්සී නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව කුලියාපිටිය කනත්තේදී පවත්වන ලදි.

ද. <u>2013.06.18 සිට 20 දක්වා</u>. මාදිවෙල පිහිටි ජයම්පෝරුව ගංගාතිලක විහාරයේ මකරතොරණ හා බුදු මැදුර අතිගරු ජනාධිපතිතුමන් විසින් විවෘත කිරීමේ උත්සවයට සමගාමීව පැවති පෙරහැර සඳහා යුද හමුදා භට පිරිස් සහභාගී කරවන ලදි.

න. <u>2013.06.17</u>. යුද හමුදාධිපතිතුමන් ජෙනරාල් නිලයට උසස් කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමන් වෙත සම්මාන මුරයක් යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වන ලදි.

ප. <u>2013.06.27</u>. මියගිය බ්‍රිගේඩියර් පීආර් ජයසිංහ (විශ්‍රාමික) වීඑස්වී නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව කුලියාපිටිය කනත්තේදී පවත්වන ලදි.

බ. <u>2013.06.28.</u> පකිස්ථාන් හමුදා ප්‍රධානී ජෙනරල් අෂ්ෆාක් පර්වෙස් කයානි නිලධාරිතුමන්ගේ සංචාරය නිමකර නික්ම යන අවස්ථාවේදී වීදි පෙළසැදීමක් පවත්වන ලදි.

ම. <u>2013.07.05 සිට 07 දක්වා</u>. මාලදිවයින් අතිගරු ජනාධිපති ආචාර්ය මොහොමඩ් වහීඩ් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා වෛද්‍ය කණ්ඩායමක් සහ ගමන් මළු රැගෙන යාමේ රාජකාරි සඳහා භට පිරිස් සහ වාහන යුද්ධ හමුදාව විසින් සපයන ලදි.

ය. <u>2013.07.15</u>. අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් ත්‍රිවිධ හමුදාවට වික්‍රම සම්මාන ප්‍රධානය කිරීමේ උත්සවයක් අරලියගහ මන්දිරයේදී පවත්වන ලද අතර, එහිදී ත්‍රිවිධ හමුදා සාමාජිකයින් 232 දෙනෙකු වෙත වීරවික්‍රම විභූෂණය, රණවික්‍රම පදක්කම සහ රණශූර පදක්කම ප්‍රධානය කරන ලදි.

ර. <u>2013.07.19</u>. ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව සංගමය මගින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ගිනි නිවන රථ 02 ක් ප්‍රධානය කිරීමේ උත්සවය යුද්ධ හමුදා මූලස්ථානයේදී පවත්වනු ලැබූ අතර එම උත්සවයේ ප්‍රධාන අමුත්තා වශයෙන් යුද්ධ හමුදාධිපතිතුමන් සහභාගී විය.

ල. <u>2013.07.25</u>. යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වික්‍රම සම්මාන ප්‍රධානය කිරීමේ උත්සවයක් යුද්ධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල් ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි.

ව. <u>2013.07.25</u>. යුද්ධ හමුදාධිපති ජෙනරාල් ජේ ජයසූරිය ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යුද්ධ හමුදාපති තනතුර අත්හැරීම නිමිති කොට ගෙන සම්මාන පෙළපාලියක් කොළඹ 7 මේට්ලන්ඩ් පෙදෙසෙහි පිහිටි සීඑච් එන් එෆ්සී ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.

අ. <u>2013.07.30</u>. යුද්ධ හමුදාධිපති ජෙනරාල් ජේ ජයසූරිය ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යුද්ධ හමුදාපති තනතුර අත්හැරීම නිමිති කොට ගෙන වීථිපෙළ සැදීමක් සහ සම්මාන මුරයක් ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ හෙළියානා පථයේදී පවත්වන ලදි.

අා. <u>2013.08.01</u>. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී යුද්ධ හමුදාපති තනතුරෙහි වැඩ භාර ගැනීම නිමිති කොට ගෙන සම්මාන පෙළපාලියක් කොළඹ 7 මේට්ලන්ඩ් පෙදෙසෙහි පිහිටි සීඑච් ඇන් එෆ්සී ක්‍රීඩාංගනයේදී පවත්වන ලදි.

අඈ. 2013.08.01. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි එයාර් චීෆ් මාර්ෂල් ඩබ්ඩීආර්එම්ජේ ගුණතිලක ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන තනතුර අත්හැරීම නිමිති කොට ගෙන ත්‍රිවිධ හමුදා සම්මාන මුරයක් පවත්වන ලදි.

අඈ. 2013.08.01. සක්‍රිය සේවයේ යෙදී සිටියදී තම ජීවිතය කැප කල රණවිරුවන්ට පුෂ්පෝපහාර පිරිනැමීමේ උත්සවයක් යුද්ධ හමුදාපති තනතුරෙන් නික්මයන ජෙනරාල් ජේ ජයසූරිය ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහ යුද්ධ හමුදාපති තනතුර භාරගනු ලැබූ ලුතිනන් ජෙනරාල් ආර්එම්ඩී රත්නායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල පිහිටි රණවිරු ස්මාරකය අභියසදී පවත්වන ලදි.

අඉ. 2013.08.02. ජෙනරාල් ජේ ජයසූරිය ආර්ඩබ්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී මැතිතුමන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන තනතුරෙහි වැඩභාර ගැනීම නිමිති කොටගෙන ත්‍රිවිධ හමුදා සම්මාන මුරයක් පවත්වන ලදි.

අඊ. 2013.08.11. මියගිය කර්නල් ආර්එම්ජී රත්නායක (විශ්‍රාමික) නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව නියදගම හෝමාගම පිහිටි කනත්තේදී පවත්වන ලදි.

අඋ. 2013.08.12. මියගිය මේජර් ජෙනරල් එම්ජී කුරුකුලසූරිය (විශ්‍රාමික) නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව බොරුල්ල කනත්තේදී පවත්වන ලදි.

අඌ. 2013.08.14. මියගිය මේජර් ජෙනරල් දේශමාන්‍ය ජේඒඩී පෙරේරා (විශ්‍රාමික) ඩීලිට් (ගෞරව) එෆ්සීඑම්අයි එෆ්අයි (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව බොරුල්ල කනත්තේදී පවත්වන ලදි.

අඑ. 2013.08.18. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස යෝජනා ක්‍රමය යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගුවන් හමුදාවට අයත් රණවිරුවන් සඳහා නිවාස බෙදාදීමේ උත්සවයක් නුවරඑළියේදී පවත්වන ලදි. මේ සඳහා යුධ හමුදාව වෙතින් කෑම පාර්සල් 1250 ක් ලබාදෙන ලදි.

අඒ. 2013.08.27. සුඩාන් ආරක්ෂක අමාත්‍යාංශයේ මහලේකම් වන ජෙනරාල් අබ්දුල් රහමන් මොහොමඩ් ෂීන් අහමඩ් මැතිතුමාගේ යුධ හමුදා මූලස්ථාන සංචාරය වෙනුවෙන් යුධ හමුදා පොලිස් පරිවාරක ධාවන පැදි ලබාදෙන ලදි.

අඔ. 2013.08.28 සිට 30 දක්වා. කොරියානු අගමැතිතුමන් වන අතිගරු චන් හොන් වොන් මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය සඳහා ගමන් මලු නිශ්කාශන සේවාවන් වෙනුවෙන් වාහන සහ භට පිරිස් ලබාදෙන ලදි.

අඕ. 2013.09.03 සිට 5 දක්වා. ගලධාරි හෝටලයේදී පැවති 2013 ආරක්ෂක සමුලුවේ රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා යුධ හමුදා තූර්ය වාදක කණ්ඩායමේ සේවය ලබාදෙන ලදි.

අක. 2013.09.03 සිට 5 දක්වා. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ධජයන්ට සෙත්පැතීම සඳහා උත්සවය අනුරාධපුර ශ්‍රී මහා බෝධි උඩමළුවේදී පවත්වන ලදි.

අග. 2013.09.28. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ධජයන්ට සෙත්පැතීම සඳහා උත්සවය නුවර දළදා මාලිගාවේදී පවත්වන ලදි.

අච. 2013.10.03. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව මුස්ලිම් ආගමික වතාවත් කොළඹ 7 දවටගහ ජුම්මා මුස්ලිම් පල්ලියේදී යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

අජ. 2013.10.04. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනාවක් පනාගොඩ බෝධිරාජාරාමයේදී යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

අට. 2013.10.06. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ධජයන්ට සෙත්පැතීම සඳහා උත්සවයක් කතරගම කඳසුරිඳු දේවාලයේදී යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

අඩ. 2013.10.08. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව ක්‍රිස්තියානි ආගමික වතාවත් බොරුල්ල සියළු සාන්තුවරයන්ගේ දේවස්ථානයේදී පවත්වන ලදි.

අත. 2013.10.10. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපතිතුමන් වෙත සම්මාන පෙළපාළියක් පවත්වන ලදි. ඉන් අනතුරුව යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවකයින්ගේ සහභාගීත්වයෙන් තේ පැන් සංග්‍රහයක් පවත්වන ලදි. මිහිඳු සෙත් මැදුරේ නේවාසිකව සිටින රණවිරුවන්ගේ සුවදුක් විමසීම සඳහා යුධ හමුදාධිපතිතුමන් සංචාරය කරන ලදි.

අද. 2013.10.12. 64 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සියළුම නිලයින් සඳහා රාත්‍රී භෝජන සංග්‍රහයක් පනාගොඩ යුධ හමුදා පුහුණු පාසැල් ක්‍රීඩාගාරයේදී පවත්වන ලදි.

අන. 2013.10.30. මියගිය මේජර් ජෙනරල් එස් උඩුමලගල (විශ්‍රාමික) ආර්එස්පී එල්ඩීඑම්සී නිලධාරිතුමන්ගේ ආදාහන උත්සවය පූර්ණ හමුදා ගෞරව සහිතව ගාල්ල සමනල ක්‍රීඩාංගණයේදී පවත්වන ලදි.

අප. 2013.11.10. කොළඹ විහාර මහා දේවි උද්‍යානයේ පිහිටි යුධ ස්මාරකය අභියසදී ත්‍රිවිධ හමුදා සහභාගීත්වයෙන් රණවිරුවන් සිහිකිරීමේ උත්සවයක් පවත්වන ලදි.

අබ. 2013.11.18. අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ‘අපි වෙනුවෙන් අපි නිවාස යෝජනා ක්‍රමය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරුවන් සඳහා නිවාස බෙදාදීමේ උත්සවයක් පවත්වන ලදි.

අම. 2013.11.28. ඉන්දියානු නාවික හමුදාවේ නාවික හමුදාපති අද්මිරාල් ඩීකේ ජෝෂි පීවීඑස්එම් ඒවීඑස්එම් වයිඑස්එම් එන්එම් වීඑස්එම් මැතිතුමාගේ යුධ හමුදා මූලස්ථාන සංචාරය වෙනුවෙන් යුධ හමුදා සම්මාන මුරයක් පවත්වන ලදි.

අය. 2013.12.13. පකිස්තානු නාවික හමුදාධිපති අද්මිරාල් ඒඑස්අයිඑෆ් සන්දිලා එන්අයි (එම්) එල් මෙරිට් මැතිතුමාගේ යුධ හමුදා මූලස්ථාන සංචාරය වෙනුවෙන් යුධ හමුදා සම්මාන මුරයක් පවත්වන ලදි.

අර. 2013.12.30. අන්තර් රෙජිමේන්තු සරඹ සහ තූර්ය වාදක කණ්ඩායම් තරගාවලියේ ත්‍යාග ප්‍රධානෝත්සවය යුධ හමුදාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසැලේදී පවත්වන ලදි. මෙම උත්සවයේදී අලංකාර සරඹ හා තූර්ය වාදක සංදර්ශනයක් පවත්වන ලදි.

**<u>මූල්‍යමය විස්තරය</u>**

6. මූල්‍යමය කරුණු පහත සඳහන් පරිදි වේ.

අ. <u>දිරි දීමනාව</u> - 2013 වර්ෂය සඳහා දීමනා ගෙවීමට ආරක්ෂක ලේකම් විසින් අනුමැතිය ලබාදී ඇත.

ආ. <u>සලාක දීමනාව</u>

(1) නිලධාරීන් - 2013 වර්ෂයේ දිනකට රු: 481.66 යි.
(2) සෙසුනිලයින් - 2013 වර්ෂයේ දිනකට රු: 425.28 යි.

ඇ. <u>ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් විනාශයට පත් නිවාස/දේපල සඳහා වන්දි ගෙවීම</u>. 2013 වර්ෂය සඳහා රු:312,500.00 ක මූල්‍යමය ප්‍රතිපාදන ලබාදුන් අතර වන්දි ගෙවීම සඳහා එම මුළු ප්‍රතිපාදනයම වැය කරන ලදි.

ඈ. <u>යුධ හමුදා/ සිවිල් වෛද්‍ය සහ දන්ත වෛද්‍ය නිලධාරීන් සඳහා ගෞරවනීය දීමනාව.</u> 2013 වර්ෂයේ වෙනසක් සිදුවී නොමැත.

ඉ. <u>ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් මියගිය අතුරුදහන්වූ සහ පැහැරගත් පුද්ගලයින්ගේ යැපෙන්නන් සඳහා වන්දි ගෙවීම</u>. 2013 වර්ෂයේ ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් යුධ හමුදා නිලධාරීන් හෝ සෙසුනිලයින් ජීවිතක්ෂයට පත්වී නොමැත. එහෙත් පෙර සිදුවූ ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් තුවාල ලැබූ සෙසුනිලයින් 09 දෙනෙකු ජීවිතක්ෂයට පත්විය.

ඊ. <u>වෛද්‍ය හේතූන් මත වැටුප් හා වන්දි සහිතව යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ගැන්වීම</u>. 2013 වර්ෂයේ නිලධාරීන් 53 දෙනෙක් හා සෙසුනිලයින් 919 දෙනෙක් ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් ඇති වූ ආබාධිත තත්ත්වය හේතුවෙන් වෛද්‍ය මණ්ඩල වෙත පමුණුවා විශ්‍රාම ගන්වා ඇත.

උ. <u>වන්දි ගෙවා සේවයේ තබාගැනීම</u> 2013 වර්ෂයේ නිලධාරීන් 17 දෙනෙක් සහ සෙසුනිලයින් 72 දෙනෙක් 2009 වර්ෂයේ ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් සිදුවූ ආබාධිත තත්ත්වය හේතුවෙන් වන්දි ගෙවා සේවයේ තබා ගන්නා ලදි.

ඌ. <u>හමුදා සේවයට අදාල හේතූන් මත මියගිය පුද්ගලයින්ගේ යැපෙන්නන් සඳහා වන්දි ගෙවීම</u>. 2013 වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකු සහ සෙසුනිලයින් 66 දෙනෙකු හමුදා සේවයට අදාල හේතූන් නිසාවෙන් මියගොස් ඇත. එම නිලධාරීන් දෙදෙනාගේ යැපෙන්නන් සඳහා හිමිකම පරිදි මාස 120 ක වැටුප් හා සෙසුනිලයින් 66 දෙනාගේ යැපෙන්නන් සඳහා හිමිකම පරිදි මාස 60 ක, 42 ක සහ 24 ක වැටුප් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 346 සහ 22/93 ප්‍රකාරව වන්දි ගෙවන ලදි.

එ. <u>දැන්වීම් සහ ප්‍රචාරණය</u>. 2013 වර්ෂය සඳහා රු: 14,000,000.00 ක මුදල් ප්‍රතිපාදනයක් මූලිකව ලබාදෙන ලදි. පසුව දෙන ලද අමතර මුදල් ප්‍රතිපාදනය වන රු:966,010.60 ක් 2012 වර්ෂයේ බැරකම් පියවීම සඳහා ලබාදෙන ලදි. 2013 වර්ෂය සඳහා දෙන ලද මුදල් ප්‍රතිපාදනය පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා වැයවූ මුදල් පියවීම සඳහා යොදා ගන්නා ලදි.

ඒ. <u>සම්මුඛ පරීක්ෂණ හා ඇගයීම් මණ්ඩල සඳහා ගෙවීම්</u>. 2013 වර්ෂය වෙනුවෙන් සම්මුඛ පරීක්ෂණ හා ඇගයීම් මණ්ඩල ගෙවීම් සඳහා රු: 2,000,000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබාදෙන ලදි. එම මුළු ප්‍රතිපාදනය රු: 1,097,723.50 ක මුදලක් ගෙවීම් සඳහා වැයකල අතර ඉතිරි මුදල වන රු: 9,020,276.50 වර්ෂය අවසානයේ වැයශීර්ෂයේ ඉතිරිව තිබුණි.

ඔ. <u>පදක්කම් හා සැරසිලි</u>. 2013 වර්ෂය සඳහා රු: 800,000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබාදෙන ලදි. එම මුදල් ප්‍රතිපාදනයෙන් රු: 690,000.00 2012 වර්ෂයේ බැරකම් පියවීම සඳහා වියදම් කරන ලදි. ඉතිරි මුදලින් රු: 62,617.00 ක මුදලක් 2013 වර්ෂය සඳහා වියදම් කල අතර වර්ෂය අවසානයේ රු:47,383.00 මුදලක් වැයශීර්ෂයේ ඉතිරිව තිබුණි.

ඕ. <u>භාෂා පරිවර්ථන ගෙවීම</u>. 2013 වර්ෂය සඳහා රු: 200,000.00 ක මුදල් ප්‍රතිපාදනයක් ලබාදෙන ලදි. එම ප්‍රතිපාදනයෙන් රු: 122,742.00 ක මුදලක් භාෂා පරිවර්ථන ගෙවීම් සඳහා වැය කල අතර රු: 77,258.00 ක මුදලක් වර්ෂය අවසානයේ ඉතිරිව තිබුණි.

7. ඉහත සඳහන් වැයශීර්ෂයන් සඳහා 2013 වර්ෂයේදී වෙන් කරන ලද මුදල් හා පෙර වර්ෂයන්වලදී අදාල වැයශීර්ෂයන් සඳහා වෙන් කරන ලද මුදල් සන්සන්ධනය කිරීමේදී සම්මුඛ පරීක්ෂණ හා ඇගයීම් මණ්ඩල සඳහා ගෙවීම්, ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් විනාශයට පත් නිවාස/ දේපල සඳහා වන්දි ගෙවීම හා පදක්කම් හා සැරසිලි වැයශීර්ෂ සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදනය අඩුවී ඇති බැව් පෙනෙන අතර දැන්වීම් හා ප්‍රචාරණ සඳහා ලබාදී ඇති මුදල් ප්‍රතිපාදනය වැඩිවී ඇති බැව් නිරීක්ෂණය වේ. පහත සඳහන් වගුවෙන් ප්‍රතිපාදනය අඩු/වැඩි කිරීම දක්වා ඇත.

| අනු අංකය | වර්ෂය | දැන්වීම් හා ප්‍රචාරණ (රු) | සම්මුඛ පරීක්ෂණ හා ඇගයීම් කමිටු (රු) | ත්‍රස්ථවාදී ක්‍රියා හේතුවෙන් විනාශයට පත් නිවාස/දේපල සඳහා වන්දි ගෙවීම (රු) | කැටයම්, සැරසිලි හා පදක්කම් (රු) |
|---|---|---|---|---|---|
| 1. | 2011 | 8,830,900.00 | 3,150,000.00 | 300,000.00 | 150,000.00 |
| 2. | 2012 | 10,454,053.00 | 3,300,300.00 | 900,000.00 | 1,325,000.00 |
| 3. | 2013 | 12,000,000.00 | 2,200,000.00 | 312,500.00 | 800,000.00 |

**<u>උසස් කිරීම්</u>**

8. 2013 වර්ෂය තුල පහත සඳහන් උසස් කිරීම් සඳහා පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් අනුමැතිය ලබාදී ඇත.

| රෙජිමේන්තුව | 2013.01.01 සිට 2013.06.31 | | | 2013.07.01 සිට 2013.12.31 | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | අභිබවනය කර උසස් කිරීම | ඉදිරි දින සිට ක්‍රියාත්මක කරන ලද උසස් කිරීම් | සමස්ථ බල සංඛ්‍යාව මත උසස් කිරීම් | අභිබවනය කර උසස් කිරීම | ඉදිරි දින සිට ක්‍රියාත්මක කරන ලද උසස් කිරීම් | සමස්ථ බල සංඛ්‍යාව මත උසස් කිරීම් | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| රෙම ශ්‍රීලසසබ | 20 | 13 | | 43 | 20 | | 96 |
| රෙම ශ්‍රීලකාහ | 120 | 25 | | 206 | 40 | | 391 |
| රෙම ශ්‍රීලංඉ | 112 | 21 | | 197 | 20 | | 350 |
| රෙම ශ්‍රීලංසංබ | 25 | 9 | | 103 | 10 | 1 | 148 |
| රෙම ශ්‍රීලපාහ | 353 | 350 | 3 | 800 | 1402 | 7 | 2915 |
| රෙම ශ්‍රීලංසිරෙ | 90 | 95 | | 162 | 235 | | 582 |
| රෙම ගැහේබ | | 73 | | 102 | 270 | | 445 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| රෙම ගරෙ | 150 | 391 | 21 | 200 | 802 | 31 | 1595 |
| රෙම විපාරෙ | 125 | 273 | | 324 | 415 | | 1137 |
| රෙම යාපාරෙ | | 57 | | 202 | 102 | | 361 |
| රෙම කරෙ | 58 | 19 | | 280 | 34 | | 391 |
| රෙම විබ | | 153 | | | 165 | | 318 |
| රෙම සබුබ | | 3 | | | 2 | | 5 |
| රෙම ඉසේරෙ | 45 | 33 | | 86 | 69 | | 233 |
| රෙම ශ්‍රීලයුසේබ | 36 | 21 | | 80 | 56 | | 193 |
| රෙම ශ්‍රීලයුවෛබ | 83 | 30 | | 90 | 23 | | 226 |
| රෙම ශ්‍රීලයුයුබ | 125 | 6 | | 269 | 5 | | 405 |
| රෙම ශ්‍රීලවියාඉරෙ | 3 | 32 | | 2 | 35 | | 72 |
| රෙම ශ්‍රීලයුපොහේබ | 120 | 35 | | 114 | 10 | | 279 |
| රෙම ශ්‍රීලයුපොදුසේබ | 64 | 1 | | 101 | | 1 | 167 |
| රෙම ශ්‍රීලයුකාබ | | 4 | | 38 | 5 | | 47 |
| නොතා ඒකක | 5 | | | | | | 5 |
| | 1534 | 1644 | 24 | 3399 | 3720 | 40 | 10361 |

**<u>බඳවා ගැනීම් සහ අස්කිරීම්</u>**

9. **2013** වර්ෂයේ බඳවාගැනීම් සහ සෙසුනිල අස්කිරීම්.

අ. <u>නිලධාරින් බඳවාගැනීම්.</u> නිලධාරින්, කෙඩෙට් නිලධාරින් සහ වැටුප් හා විශ්‍රාම වැටුප් පදනම මත සෙසුනිලයින් බඳවාගැනීම පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | බඳවාගැනීම් | පාඨමාලාව | බඳවා ගත් දිනය | බඳවා ගත් අංකය |
|---|---|---|---|---|
| 1. | කෙඩෙට් නිලධාරින් | පාඨමාලා අංක 80 | 2013.01.08 | 50 |
| | | පාඨමාලා අංක 81 | 2013.07.13 | 50 |
| | | කාන්තා පාඨමාලා අංක 12 | 2013.01.08 | 11 |
| | | ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව | 2013.03.18 | 02 |
| | | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ | 2013.04.17<br>2013.04.30 | 07<br>01 |
| 2. | වැටුප් හා විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ බඳවා ගැනීම (සෙසුනිල) | | | 53 |
| 3. | සෙසුනිලයින් බඳවා ගැනීම | | | 02 |

ආ. <u>අස්කිරීම්</u>

(1) සේවය අනවශ්‍ය හේතුන් මත - 898

(2) සේවය අනවශ්‍යහේතුන් මත (වර්ගීකරණ 4 යටතේ) - 10369

(3) සේවය මිලදීගැනීම් යටතේ අස්කිරීම් - 71

(4) යුධ හමුදාවෙන් පැනගිය අයවළුන් අස්කිරීම් වැඩසටහන් යටතේ යටතේ අස්කිරීම (දීර්ඝකාලීන පැනගිය අයවළුන්) - 10369

<u>**නැවත බඳවාගැනීම් සහ සේවය දීර්ඝ කිරීම්**</u>

10. 2013 වර්ෂය තුළ නැවත බඳවාගැනීම් සහ සේවය දීර්ඝ කිරීම් පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත.

අ. වසර 12 න් පසු නැවත බැඳීම් - 4463

ආ. වසර 5 න් පසු සේවය දීර්ඝකිරීම් - 1323

ඇ. වසර 22 න් පසු සේවය දීර්ඝකිරීම් - 297

<u>නිවාඩු නොමැතිව නොපැමිණි/නිවාඩු නොමැතිව නොපැමිණිමෙන් පසු නැවත රපෝර්තු කිරීම්</u>

11. නිවාඩු නොමැතිව නොපැමිණි/නිවාඩු නොමැතිව නොපැමිණිමෙන් පසු නැවත රපෝර්තු කිරීමේ සංඛ්‍යාවන් පහත සඳහන් පරිදි වේ.

අ. නිවාඩු නොගෙන නොපැමිණි/පැනගිය - 6625

ආ. නිවාඩු නොගෙන නොපැමිණි අයවලුන් රපෝර්තු කිරීම් - 5576

<u>**ප්‍රදක්කම් ප්‍රදානය**</u>

12. 2013 වර්ෂයේදී පහත සඳහන් පදක්කම් ප්‍රදානය කරන ලදි.

අ. දේශපුත්‍ර සම්මානය - 862

ආ. වික්‍රම පදක්කම් - 16389

ඇ. ශ්‍රී ලංකා යුධ හමුදා දීර්ඝසේවා පදක්කම් - 1324

ඈ. ශ්‍රී ලංකා යුධ හමුදා දීර්ඝසේවා පදක්කම් (සන්දාරය)- 193

ඉ. පූර්ණ භූමි පදක්කම් - 10163

ඊ. උත්තම සේවා පදක්කම

ත්‍රිවිධ හමුදා හමුදා මණ්ඩල වාර්තාව අනුමැතිය සඳහා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ වෙත ඉදිරිපත් කර ඇත.

## වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විධායක ජෙනරාල්ගේ සෘජු අණදීම යටතේ සමස්ථ යුද්ධ හමුදා වෛද්‍ය සේවයේ සම්බන්ධීකරණ ව්‍යුහය ලෙස ක්‍රියාත්මක වන අතර, යුද්ධ හමුදා වෛද්‍ය සේවය මෙරට දෙවෙනි විශාලතම වෛද්‍ය සේවාව වේ.

2. යුද්ධය පැවැතුණු කාලසීමාව තුළදී තුවාල ලැබූ රෝගීන් හට ප්‍රතිකාර ලබාදීම යුද්ධ හමුදා වෛද්‍ය සේවාවේ මූලික කාර්ය විය. මෙම වකවානුව තුළදී අනෙකුත් සියලු සාමාන්‍ය සේවාවන් පවත්වාගෙන යමින් යුද්ධයේදී තුවාල ලැබූ රෝගීන් හට ප්‍රතිකාරමය වශයෙන් කාර්‍යක්ෂම සේවාක් ලබාදීමට යුද්ධ හමුදා වෛද්‍ය සේවාව සමත්වී ඇත. තවද, පශ්චාත් යුද සමය තුල සේවයෙහි ගුණාත්මක බව වැඩිදියුණු කිරීම, පවුල්වල සාමාජිකයින් හා අනෙකුත් සේවා මුක්ත භටයින් දක්වා වෛද්‍ය සේවාව පුළුල් කිරීම හා යුද්ධයේදී තුවාල ලැබුවන් මෙන්ම යුද්ධය නිසා මානසිකව පීඩනයට ලක්වූ පුද්ගලයින් පුනරුත්ථාපනය කිරීම සහ රෝග නිවාරණ ක්ෂේත්‍රයට වැඩි අවධානයක් යොමුකර තිබේ.

**වගකීම**

3. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාවේ පවතින කායික හා මානසික සෞඛ්‍යයට/ නිරෝගීතාවයට බලපාන සියළු කරුණු පිළිබඳව විධායක ජෙනරල් හරහා යුද්ධ හමුදාධිපති වෙත උපදෙස් ලබා දීම.

ආ. යුහ වෛද්‍ය සේවාව පිළිබඳව යුද්ධ හමුදාධිපති විසින් පණවන ලද ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම.

(1) අධ්‍යක්ෂ මණ්ඩලයේ මනා ක්‍රියාකාරිත්වය පිළිබඳව යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ විසින් විධායක ජෙනරල් හට වගකිව යුතු වේ.

(2) යුද්ධ හමුදාවේ උපරිම පුද්ගලයින් සංඛ්‍යාවක්, සෞඛ්‍යමය වශයෙන් ඉහළම කාර්යක්ෂම තත්වයේ පවත්වා ගැනීමට සහතික කිරීමට අවශ්‍ය සියළු පියවරයන් ක්‍රියාවේ යෙදවීම.

(3) සියළුම හමුදා පුද්ගලයින්ගේ නිරෝගීභාවය හා ඉහළම කාර්‍යක්ෂමතාවය ලඟා කර ගැනීමට අවශ්‍ය සියළු වෛද්‍ය උපකරණ, ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය ආදිය මිලදීගැනීම, පවත්වාගැනීම/නඩත්තු කිරීම සම්බන්ධයෙන් පුරෝකථන සිදුකිරීම හා එම සැලසුම් ඉදිරිපත් කිරීම.

(4) යුද්ධ හමුදාවේ අමතර අවශ්‍යතාවයන්ට හා සෞඛ්‍යය අවශ්‍යතාවය පුළුල් විමට සරිලනපරිදි හා සේවයෙන් ඉවත්වන (වෛද්‍ය හා අතුරු වෛද්‍ය වෘත්තිකයින්ගේ) පුද්ගලයින් වෙනුවෙන් හා හිගතාවයන්/පුරප්පාඩු සපුරා ගැනීමට ඇවැසි ආධුනිකයින් බඳවා ගැනීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(5) රෝහල් සංවර්ධන අරමුදල රෝහල් සංවර්ධන මණ්ඩලය විසින් පනවන ලද නිර්දේශ රාමුව තුල ක්‍රියාත්මක වන බවට අධීක්ෂණය කිරීම.

(6) යුද්ධ හමුදා රෝහලෙහි ප්‍රතිකාර ගනු ලබන රෝගීන් සදහා ලැබෙන පරිත්‍යාග මනාව ලේඛණ ගත කොට ඒවා නිසි පරිදි තිකුත් කෙරෙන්නේ ද යන්න සහතික කර ගැනීම වෛද්‍යසේවා අධ්‍යක්ෂ කටයුතු කල යුතු වේ.

(7) අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වෛද්‍ය බලකා පුද්ගලයින් සදහා උසස් වීම් නිර්දේශකිරිම, ස්ථාන මාරු සිදු කිරිම හා ඔවුන් සේවයේ යෙදවීම.

(8) අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වෛද්‍ය බලකා පුද්ගලයින්ගේ විනය උසස් තත්වයක පවතින බවට සහතික වීම සහ අවශ්‍ය විටදී විනය ක්‍රියාමාර්ග ගැනීමට මධ්‍යස්ථාන සේනා විධායක මගින් ආරම්භ කිරිම. අන්තරාය සාධකයන් හදුනා ගැනීමේ ක්‍රියා මාර්ග පවත්වාගෙන යාම.

(9) යුද්ධ හමුදා රෝගීන් වෙනුවෙන් අවශ්‍ය වන විශේෂඥ වෛද්‍ය උපදේශක සේවාවන් සදහා ඇවැසි විශේෂඥ වෛද්‍යවරුන්ගේ සේවය ලබා ගැනීම වෛද්‍ය සේවා අධ්‍යක්ෂගේ වගකිම වේ.

<u>කාර්යභාරය</u>

4. යුහ සේවයේ නියුතු පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් සාමාජිකයින්, සේවා මුක්ත භටයින් හා සිවිල් කාර්යන් මණ්ඩලයේ කායික හා මානසික යහ සාධනය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිකාරය හා නිවාරණ සෞඛ්‍යය පහසුකම් සැපයීම් හා අවශ්‍ය අවස්ථාවන්හිදී එම සේවාවන් අනෙකුත් සන්නද්ධ හමුදා සහ සිවිල් ජනතාව වෙත සැපයීම.

<u>කාර්යන්</u>

5. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සදහන් පරිදි වේ.

අ. යුහ සේවයේ නියුතු පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සේවා මුක්ත භටයින්/විශ්‍රාමික අයවළුන් සහ සිවිල් කාර්ය මණ්ඩලය වෙත ප්‍රතිකාර සෞඛ්‍ය පහසුකම් සැපයීම.

ආ. යුහ සේවයේ නියුතු පුද්ගලයින්, ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සේවා මුක්ත භටයින්/විශ්‍රාමික අයවළුන් සහ සිවිල් කාර්ය මණ්ඩලයට රෝග නිවාරණ සෞඛ්‍යය පහසුකම් සැපයීම.

ඇ. ප්‍රතිකාර සහ නිවාරණ සෞඛ්‍ය පහසුකම් අනෙකුත් ආරක්ෂක හමුදා හා පොලිසිය වෙත අවශ්‍යතා සැපයීම.

ඈ. යුහ පුද්ගලයින් බඳවා ගැනීමේදී විවිධ වෘත්තීමය/ රාජකාරි කඩඉම් වලදී සහ විශ්‍රාම යාමේදී රෝගාබාධ හා අන්තරාය සාධකයන් හදුනා ගැනීමේ ක්‍රියාමාර්ග පවත්වාගෙන යාම.

ඉ. එක්සත් ජාතින්ගේ සංවිධානයේ මෙහෙවරයන්/ මෙහෙයන් සදහා වෛද්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් සැපයීම.

ඊ. ස්වභාවික ආපදාවන්හිදී වෛද්‍ය සේවාවන් පවත්වා ගැනීම සදහා රාජ්‍ය ආයතන වලට සහය වීම.

උ. විශේෂ ප්‍රභූන්ට හා සංචාරක විදේශ නියෝජිත මණ්ඩල වලට වෛද්‍ය සේවාවන් සැපයීම.

ඌ. රාජ්‍ය උත්සව, ක්‍රීඩා ඉසව් ආදියෙහි දී වෛද්‍ය සේවාවන් සැපයීම.

එ. නොයෙකුත් පුහුණු මධ්‍යස්ථාන හා අනෙකුත් විවිධ යුහ හා අනෙකුත් රාජ්‍ය වෛද්‍ය පුහුණු මධ්‍යස්ථාන හරහා වෛද්‍ය නිලධාරින් හෙද හා අතුරු වෛද්‍ය කාර්ය මණ්ඩල පුහුණු කිරිම.

ඒ. යුහ පුද්ගලයින් වෙත මූලික වෛද්‍ය පුහුණුවීම ලබා දීම.

ඔ. යුධ වෛද්‍ය විද්‍යාවේ ප්‍රගමනය සඳහා අවැසි වෛද්‍ය පර්යේෂණ සිදු කිරිම.

ඕ. ඉල්ලනු ලබන අවස්ථා වලදී, ජාතික සෞඛ්‍ය සේවාවන් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන විශේෂිත පුහුණු කාර්‍ය මණ්ඩල සැපයීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

6. 2012 වසර තුළ වෛද්‍ය සේවාව විසින් 200,000 කට අධික හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල් සාමාජිකයින් සහ විශ්‍රාමික හමුදා සාමාජිකයින් සඳහා වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂණ පහසුකම් ලබාදී ඇත. යුද්ධ හමුදාවේ ඵලදායි වෛද්‍ය සේවාවක් පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් රෝහල්, වෛද්‍ය ආයතන විසින් මීට අවශ්‍ය වෛද්‍ය/ශල්‍ය වෛද්‍ය පිළිවෙත් අනුගමනය කර ඇත:

අ. යුහ රෝහල කොළඹ.

ආ. යුද්ධ හමුදා මූලික රෝහල අනුරාධපුරය.

ඇ. යුද්ධ හමුදා මූලික රෝහල පනාගොඩ.

ඈ. යුද්ධ හමුදා මූලික රෝහල පලාලි.

ඉ. යුද්ධ හමුදා මූලික රෝහල කිලිනොච්චිය.

ඊ. යුද්ධ හමුදා මූලික රෝහල මුලතිව්.

උ. යුද්ධ හමුදා මූලික රෝහල මින්නේරිය.

ඌ. ප්‍රාදේශිය රෝහල දියතලාව.

එ. ක්ෂේත්‍ර රෝහල වව්නියාව.

ඒ. ක්ෂේත්‍ර රෝහල මන්නාරම.

ඔ. ක්ෂේත්‍ර රෝහල ත්‍රිකුණාමලය.

ඕ. රෝගීන් භාර ගැනීමේ ස්ථාන/ප්‍රධාන සැරහුම් මධ්‍යස්ථාන - 26.

ක. ඉදිරි සැරහුම් මධ්‍යස්ථාන - 50.

ග. අනුබද්ධිත වාට්ටු 04.

ච. වෛද්‍ය පරීක්ෂණාගාර 204.

7. එම වසර තුළ 81118 කට අධික යුද්ධ හමුදා සාමාජිකයින් ඉහත සඳහන් යුද්ධ හමුදා රෝහල් /වෛද්‍ය ආයතන වෙතින් නේවාසික ප්‍රතිකාර ලබා ගෙන ඇත.

8. පහත සදහන් වෛද්‍ය සහ සෞඛ්‍ය ආරක්ෂක පහසුකම් යුද හමුදා රෝහල/යුධ හමුදා මූලික රෝහල්/ප්‍රාදේශිය රෝහල/ක්ෂේත්‍ර රෝහල් වැනි වෛද්‍ය ආයතන වෙතින් සපයා ඇත.

අ. බාහිර රෝගි ප්‍රතිකාර.

ආ. විශේෂ වෛද්‍ය සායන.

ඇ. රෝග වැලැක්වීමේ මර්ධන සේවාවන්.

ඈ. විශේෂඥ උපදෙස් සමග නේවාසික ප්‍රතිකාර.

ඉ. රෝග විනිශ්වය සේවාවන්.

ඊ. සෞඛ්‍ය නිවාරණ සායනය.

9. යුද්ධ හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් හා විශ්‍රාමික හමුදා සාමාජිකයන් සදහා පහත සදහන් විශේෂඥ වෛද්‍ය සායන යුද්ධ හමුදා රෝහල/අනෙකුත් මූලික රෝහල් වල පැවැත්වීමට කටයුතු කරන ලදී.

අ. විකලාංග ශල්‍ය වෛද්‍ය සායනය.

ආ. ස්නායු සායනය.

ඇ. ආහාර හා පෝෂණ සායනය.

ඈ. වෛද්‍ය සායනය.

ඉ. සමේ රෝග සායනය.

ඊ. මනෝවෛද්‍ය සායනය.

උ. මානසික උපදේශන සායනය.

ඌ. උගුර කණ නාසය සායනය.

එ. ළමා රෝග සායනය.

ඒ. වේදනා සායනය.

ඔ. මුඛ හා හනුක සායනය.

ඕ. අක්ෂි සායනය.

ක. පූර්ව ප්‍රසව සායනය.

ග. රක්තවාත සායනය.

ජ. ප්ලාස්ටික් ශල්‍ය සායනය.

ට. ආමාශ හා අන්ත්‍රයික රෝග සායනය.

ඩ. ප්‍රසව හා නාරි සායනය.

න. කථන චිකිත්සක සායනය.

10. එක්සත් ජාතින්ගේ සාම සාධක රාජකාරියෙහි යෙදී සිටින ශ්‍රී ලාංකික භටපිරිස් සදහා වෛද්‍ය පහසුකම් ලබා දීම සදහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ 1 වන මට්ටමේ රෝහල් දෙකක් හයිටි රාජ්‍ය තුළ පවත්වා ගෙන යනු ලබන අතර, එක් වෛද්‍ය පරීක්ෂණාගාරයක් ලෙබනන් රාජ්‍ය තුළ පවත්වා ගෙන යන ලදී. මීට අමතරව කොලරාව වසංගතය හයිටි රාජ්‍ය තුල පැතිර යාමත් සමග ශ්‍රී ලාංකික භට පිරිස් ඉන් ආරක්ෂා කර ගැනීම සදහා වැඩ පිළිවෙත් දියත් කරන ලදී.

11. ගෙවී ගිය වසර තුළ ඉතා මිළ අධික ශල්‍යකර්ම පිළිවෙත් අනුගමනය කරමින් හමුදා සාමාජිකයින් 24 දෙනෙකු සඳහා ප්‍රතිකාර ලබා දී ඇති අතර, මේ සඳහා රුපියල් මිලියන 27 ක පමණ මුදලක් වැය දරා ඇත.

12. ඩෙංගු උවදුර මැඩලීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ සමග සම්බන්ධතාවයෙන් යුතුව ජාතික මට්ටමේ ඩෙංගු මැඩලීමේ වැඩ සටහන් ශ්‍රී ලංකාවේ සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලද අතර, පහත සඳහන් බෝවන රෝග තත්වයන් වැළැක්වීමේ වැඩපිළිවෙත් සෞඛ්‍ය අමාත්‍යාංශ සමග සම්බන්ධතාවයෙන් ඉටු කරන ලදී.

අ. මැලේරියාව.

ආ. ඉන්ෆ්ලුවෙන්සා.

ඇ. හෙපටයිටිස්.

13. යුද්ධ හමුදා මූලස්ථානයේ උපදෙස් පරිදි රට තුළ පවත්වනු ලැබූ ජාතික උත්සව හා රාජ්‍ය නායකයින් ඇතුළු විදේශීය දූත පිරිස් සඳහා වෛද්‍ය කණ්ඩායම් මෙම අම අධීක්ෂණය යටතේ ලබා දෙන ලද අතර, ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ ක්‍රීඩා/සැණකෙළි සඳහාද වෛද්‍ය කණ්ඩායම් ලබාදීමට ක්‍රියා කර ඇත.

14. පහත සඳහන් විශේෂිත පුහුණු වැඩ සටහන් ඇතුළු යුධ හමුදාවේ සියලුම පුහුණු අවශ්‍යතා සඳහා වෛද්‍ය පහසුකම් ලබා දෙන ලදී.

අ. විශේෂ බලකා පුහුණු පාඨමාලාව.

ආ. විශේෂ බලකා උසස් පුහුණු පාඨමාලාව.

ඇ. විශේෂ බලකා විශේෂිත පුහුණු පාඨමාලාව.

ඈ. ක්ෂේත්‍ර ඒකාබද්ධ පුහුණු අභ්‍යාස.

15. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යනු ලබන යුධ හමුදා හෙද විදුහල වෙතින් හා ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකා ඒකකය වෙතින් පහත සඳහන් පාඨමාලා පවත්වන ලදී.

අ. හෙද ඩිප්ලෝමා පාඨමාලාව.

ආ. රෙජිමේන්තු හෙද සහායක පාඨමාලාව.

ඇ. 111 වන පෙළ හෙද සහායක පාඨමාලාව.

ඈ. සංග්‍රාමික ජීවිත ගලවා ගැනීමේ පාඨමාලාව.

ඉ. සංස්කරණ පාඨමාලාව.

16. පහත සඳහන් පුහුණු අභ්‍යාස වල අවශ්‍යතාවයන් වලට හා කාල සටහන් වලට අනුව වෛද්‍ය හා සෞඛ්‍ය ආරක්ෂණය පිළිබඳව අධ්‍යාපන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

අ. ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය- දියතලාව.

ආ. ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනය - කුකුලේගඟ.

ඇ. ශ්‍රීලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තු මධ්‍යස්ථානය - මත්තෙගොඩ.

ඈ. කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල- ඌවකුඩාඔය.

ඉ. විශේෂ බලකා පුහුණු පාසල- මාදුරු ඔය.

ඊ. සේනාංක/බලසේනා මූලස්ථාන - මහජන සෞඛ්‍ය.

උ. සේනාංක/බලසේනා මූලස්ථාන - මානසික සෞඛ්‍ය.

17. ගෙවී ගිය වසර තුළ දේශීය හා විදේශීය පාඨමාලා සඳහා සහභාගි කරවූ නිලධාරි/සෙසුනිලයින්ගේ විස්තර පහත සඳහන් පරිදි වේ.

අ. <u>එතෙර පාඨමාලා</u>

(1) නිලධාරි - 05

ආ. <u>දේශීය පාඨමාලා</u>

(1) නිලධාරි - 15
(2) සෙසුනිල - 142

18. යුද්ධ හමුදා මූලස්ථානය හරහා ජනාධිපති අරමුදල සමග සම්බන්ධතාවයෙන් ක්‍රියා කර මූල්‍යමය සහයෝගය ලබාගෙන බාහිර රෝහල්වලින් ශල්‍යකර්ම සිදුකර හමුදා අයවළුන්ගේ ජීවිත රැකගැනීමට කටයුතු කර ඇත.

19. යුද්ධ හමුදා වෛද්‍ය බලකායේ පහත සඳහන් පලපුරුදු විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් හා වෛද්‍යවරුන්ගෙන් සමන්විත වේ.

| | | |
|---|---|---|
| අ. | විකිරණරශ්මි විශේෂඥ වෛද්‍ය | - 03 |
| ආ. | දන්ත සංරක්ෂණ විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඇ. | ශල්‍ය වෛද්‍ය විශේෂඥ | - 03 |
| ඈ. | කායික රෝග විශේෂඥ වෛද්‍ය | - 04 |
| ඉ. | පිළිස්සුම් හා ප්ලාස්ටික් ශල්‍ය විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඊ. | ළමා රෝග විශේෂඥ වෛද්‍ය | - 01 |
| උ. | ව්‍යාධිවේදී විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඌ. | නිර්වින්දන විශේෂඥ වෛද්‍ය | - 02 |
| එ. | මනෝ චිකිත්සක විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඒ. | ප්‍රසව හා නාරිවේදී විශේෂඥ වෛද්‍ය | - 02 |
| ඔ. | සමේ රෝග විශේෂඥ වෛද්‍ය | - 01 |
| ඕ. | මුඛ හා හනුක විශේෂඥ වෛද්‍ය | - 02 |
| ක. | ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍ය | - 01 |
| ග. | වෛද්‍ය නිලධාරි | - 80 |
| ජ. | ලියාපදිංචි වෛද්‍ය නිලධාරි/ සහකාර වෛද්‍ය නිලධාරි | - 27 |

19. **2013** වසර තුළ මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පහත සඳහන් වෛද්‍ය වෘත්තිකයින් හා ආධුණික සෙබලුන් යුද්ධ හමුදා වෛද්‍ය සේවයට බඳවා ගැනීමට හැකි විය.

අ. විශේෂඥ වෛද්‍ය නිලධාරි - 01

ආ. වෛද්‍ය නිලධාරි/වෛද්‍ය ශිෂ්‍ය - 06

ඇ. <u>ආධුණිකයින්</u>

(1) හෙද - 41

| 11. | රෙජිමේන්තු මධ්‍යස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුව | | 15 | 15 | 3 | 58 | 61 |
| 12. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකාය | | 6 | 6 | | 2 | 2 |
| 13. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | | 1 | 1 | | | |
| 14. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා යුද හමුදා පුරෝගාමී බලකාය | | | | | 1 | 1 |
| 15. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා යුද හමුදා ජාතික ආරක්ෂක බලමුළුව | | 17 | 17 | | 2 | 2 |
| එකතුව | | 29 | 564 | 593 | 10 | 153 | 163 |

11. ආබාධිත නිලධාරි/සෙසුනිලයින් සඳහා 2013 වසරේ ලබාදී ඇති බස් ගමන් බලපත් හා දුම්රිය බලපත් විස්තරය.

| අනු අංකය | රෙජිමේන්තුව | බස් ගමන් බලපත්‍ර | | එකතුව | දුම්රිය ගමන් බලපත්‍ර | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | නිලධාරි | සෙසුනිල | | නිලධාරි | සෙසුනිල | |
| 1. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | | 5 | 5 | | | |
| 2. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | | 5 | 5 | | 1 | 1 |
| 3. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | | 32 | 32 | | 7 | 7 |
| 4. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකාය | | 4 | 4 | 1 | | 1 |
| 5. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව | | 37 | 37 | | 1 | 1 |
| 6. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 2 | 34 | 36 | 2 | 16 | 18 |
| 7. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලක | 4 | 97 | 101 | 2 | 3 | 5 |
| 8. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගජබා රෙජිමේන්තුව | | 22 | 22 | 1 | 2 | 3 |
| 9. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව | | 59 | 59 | | 1 | 1 |
| 10. | රෙජිමේන්තු මධ්‍යස්ථානය යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | | 4 | 4 | 1 | | 1 |
| 11. | රෙජිමේන්තු මධ්‍යස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුව | | 6 | 6 | | 2 | 2 |
| 12. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකාය | | 11 | 11 | | | |
| 13. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද හමුදා යුධෝපකරණ බලකාය | | 1 | 1 | | | |
| 14. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තු | | 1 | 1 | | 1 | 1 |
| 15. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා යුද හමුදා පුරෝගාමී බලකාය | | 1 | 1 | | | |
| 16. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | | 3 | 3 | | | |
| එකතුව | | 6 | 319 | 325 | 7 | 34 | 41 |

12. ආබාධිත රණවිරුවන් සඳහා 2013 වසරේ පරිත්‍යාග කර ඇති ඉඩම් පිළිබඳ විස්තර.

| අනු අංකය | රෙජිමේන්තුව | ඉඩම් ගණන | |
|---|---|---|---|
| | | පයාගල මිල්ලගහලන්ද | |
| | | නිලධාරි | සෙසුනිල |
| 1. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | - | 2 |
| 2. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව | - | 2 |
| 3. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | - | 2 |
| 4. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලකාය | - | 3 |
| 5. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව | - | 2 |
| 6. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකාය | - | 1 |
| එකතුව | | - | 12 |

## පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. ත්‍රස්ත්‍රවාදී ප්‍රහාරයන්ගෙන් තුවාල ලැබූ යුද්ධ හමුදා නිලධාරීන් හා සෙසුනිලයින් පුනරුත්ථාපනය කිරිමේ අරමුණින් 1988 දී පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවන ලදී. එසේ වුවත් බලඇණි තුල තුවාල ලැබූ සංඛ්‍යාව වැඩි වීම හේතුවෙන් යුද්ධයෙන් තුවාල ලැබූ සෙබළුන්ගේ පෞද්ගලික වශයෙන් ඵලදායි සේවයක් ලබාගැනීම සඳහා අවශ්‍ය සේවාවන් ශ්‍රී ලංකා යුධ හමුදාව තුල ආරම්භ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් ආයතනයන් පිහිටුවන ලදී:

අ. රණවිරු සෙවන

ආ. රණවිරු ඇපරල්ස්

ඇ. මිහිඳු සෙත් මැඳුර

ඈ. අභිමංසල 1

ඉ. අභිමංසල 2

ඊ. අභිමංසල 3

උ. රණවිරු සම්පත් කේන්ද්‍රය

### කාර්‍යයන්

2. පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වසර මුළුල්ලෙහිම එම කාර්‍යය ඉතා ඉහළ ආකාරයෙන් සිදු කරනු ලැබේ. එයට ප්‍රධාන දායකත්වය පහත සඳහන් පරිදි හමුදා චර්යා නියෝග 14/89 යටතේ ප්‍රකාශ කරනු ලැබේ.

අ. යුද්ධයේදි ආබාධිත තත්ත්වයට පත්වූ සියලුම සෙබළුන් පුනරුත්ථාපනය කිරිම.

ආ රාජකාරියේ යෙදි සිටින අතර තුර තුවාල ලබා ආබාධිත තත්ත්වයට පත්ව සිටින සහ ස්වාභාවික අනතුරුවල ප්‍රථඵලයක් වශයෙන් ආබාධිත තත්ත්වයට පත්ව සිටින සියළුම දෙනා පුනරුත්ථාපනය කිරිම.

ඇ ආබාධිත සෙබළුන්ගේ ආබාධිත තත්ත්වය අනුව ඔවුන්ව විවිධ වෘත්තිය පුහුණු පාඨමාලා සඳහා යොමුකිරිම.

ඈ ඒ සඳහා අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ සිවිල් සංවිධාන සහ වෙනත් ආයතන සමග සම්බන්ධතාවයෙන් කටයුතු කිරිම.

ඉ රෙජිමේන්තු මධ්‍යස්ථාන සමග සම්බන්ධතාවයෙන් යුතුව යුද්ධ හමුදා සේවයෙන් විශ්‍රාමලත් ආබාධිත සෙබළුන්ගේ ශාරිරික හා මානසික සෞඛ්‍ය වර්ධනය පිළිබඳව සොයාබැලීම.

3. ඉහත සඳහන් ඉලක්ක ලඟාකරගැනිම සඳහා අදාල වන ක්‍රියාපිළිවෙත් හා මාර්ගයන් පසුව විවරණය කරනු ලැබේ.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

4. පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් අවධාරණය කර වාර්ථා සකස්කරනු ලැබේ.

- අ වෘත්තිය පාඨමාලා.
- ආ පාලනමය ගැටළු.
- ඇ මූලික ප්‍රජා පුනරුත්ථාපනය.
- ඈ මූලික ආයතනික පුනරුත්ථාපනය.
- ඉ. වෙනත් පොදු ගැටළු.

**<u>වෘත්තීය පුහුණු පාඨමාලා</u>**

**5.** පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ආබාධිත රණවිරුවන් **397** දෙනෙකු සඳහා වෘත්තීය පුහුණු පාඨමාලා ලබාදී ඇත, එම පාඨමාලා වෘත්තීය පුහුණු අධිකාරියෙහි සහ ජාතික ආධුනිකත්ව අභ්‍යාස පුහුණු ආයතනයෙහි අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

**<u>පාලන ගැටළු</u>**

6. පහත සඳහන් පාලනමය කරුණු කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලය නිරීක්ෂණය කරනු ලැබේ.

- අ. අතිරේක රෙජිමේන්තු සේවාව හා යාකිරීම්.
- ආ. සුභසාධක පුනරුත්ථාපන වැය ශීර්ෂය.
- ඇ. ශ්‍රී ලංකා යුධ හමුදා පුනරුත්ථාපන අරමුදල.
- ඈ. පාලන පරීක්ෂාව (රණවිරු සෙවන/රණවිරු ඇපරල්ස්).

**<u>අතිරේක රෙජිමේන්තු සේවාව හා යාකිරීම්</u>**

7. සැලසුම් වලට අනුව අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පුද්ගලයින් **50** ක පමණ පිරිසක් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර අන්තර් රෙජිමේන්තු සේවාව සඳහා නිර්දේශ කිරීම.

8. පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව මැදිහත්වීම තුලින් නිසි සොයාබැලීමක් සිදුකෙරේ.

- අ. තුවාල වූවන් සම්බන්ධව නිමනොවූ මූපලු.
- ආ. ප්‍රතිලාභීන් හට අවශ්‍ය සුභසාධක කටයුතු.

**<u>මූලික ප්‍රජාපුනරුත්ථාපනය/පුනරුත්ථාපන සංචාරය</u>**

9. මූලික ප්‍රජාපුනරුත්ථාපනය මගින් ආබාධිත සෙබළුන් සමාජගත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ සොයාබැලීම සහ ඒ සඳහා සහය ලබාදීම.

10. ඉහත අරමුණ ලඟාකර ගැනීම සඳහා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම රෙජිමේන්තු මූලස්ථාන බලඇණිල පුනරුත්ථාපන මධ්‍යස්ථාන සහ රණවිරු ගම්මාන වෙත සංචාරයන් සිදුකිරීමට සැලසුම් කිරීම.

11. සියළුම සංචාරයන් පහත සඳහන් වෘත්තිකයින්ගෙන් යුක්ත පුනරුත්ථාපන කණ්ඩායම් මගින් සිදුකරනු ලබයි.

අ. පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රජා පුනරුත්ථාපන කණ්ඩායම.

ආ. වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයෙක්.

ඇ. රණවිරු සෙවන වෙතින් වෛද්‍ය/ඍජුකාරක හා අංගාදේශක හා වෘත්තීය විකිත්සකයින්.

**<u>මූලික පුනරුත්ථාපන ආයතන</u>**

12. මූලික පුනරුත්ථාපන ආයතනය විසින් පහත සඳහන් ආයතනයන් සමග සම්බන්ධීකරණය වීම තුලින් එහි ක්‍රියාකාරිත්වය හා ඵලදායිතාවය පිලිබඳ අධීක්ෂණය කිරීම.

අ. රණවිරු සෙවන.

ආ. රණවිරු ඇපරල්ස්.

ඇ. මිහිදු සෙත් මැඳුර.

ඈ. අභිමංසල 1

ඉ. අභිමංසල 2

ඊ. අභිමංසල 3

උ. රණවිරු සම්පත් කේන්ද්‍රය

**<u>වාර්ෂික කාර්ය සාධනය</u>**

**13.** රණවිරු සෙවන දෘෂ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම 2013 සැප්තැම්බර් මස 27 වන දින “ඩෙල්මා” එලකය ජයග්‍රහණය කරන ලදී.

14. සාර්ථක පුනරුත්ථාපනයෙන් පසු රණවිරු සෙවනෙහි නේවාසික ප්‍රතිකාර ලැබූ සොල්දාදුවන් 158 දෙනෙකු මුදා හැර ඔවුන්ගේ රෙජිමේන්තු මූලස්ථාන වෙත යවන ලදී.

15. අතිරේක ව්‍යාපෘතියක් වශයෙන් රණවිරු ඇපරල්ස් ආයතනය මගින් නිලධාරීන් සඳහා සුදු පැහැති අත්දිග කමිස නිෂ්පාදනය කරන ලදී.

16. අභිමංසල 1, අභිමංසල 2, අභිමංසල 3 හා මිහිදු සෙත් මැඳුරෙහි නේවාසික සොල්දාදුවන් හට විවිධ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම තුලින් හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සැලකිය යුතු මට්ටමකින් ඔවුන්ගේ ශාරීරික හා මානසික සුවතාවයක් වර්ධනය කිරීමට කටයුතු කරන ලදී.

17. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා 2013 මැයි මස 24 වන දින වත්තල හේකිත්ත පාරෙහි පිහිටි රණවිරු සම්පත් කේන්ද්‍රය උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර, වෘත්තීය පුහුණු අධිකාරියේ අනුග්‍රහය මත දැනට නිලධාරි 01 ක් සහ ආබාධිත සෙබළුන් 132 ක් පුහුණුවීම් කටයුතු වල නිරතව සිටියි.

<u>පාලන පරීක්ෂාව (රණවිරු ඇපරල්ස් සහ රණවිරු සෙවන)</u>

18. පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රථම වතාවට රණවිරු ඇපරල්ස් සහ රණවිරු සෙවන යන ආයතන වල පාලන පරීක්ෂාවන් සිදුකරන ලදි. එහිදී එම ආයතනයන් වල සැලකියයුතු ප්‍රශ්ණ තිබූ අතර, පාලන පරීක්ෂණය අතරතුර ඇතැම් පාලන ගැටළු හා භකාස ගැටළු ඉදිරිපත් විය.

19. මෙයින් වැඩි ගැටළු සංඛ්‍යාවක් විසදාගත් අතර, ඉතිරි ගැටළු විසදාගැනීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙල ආරම්භ කරන ලදී.

<u>මූල්‍යමය තොරතුරු</u>

20. <u>සුභසාධන පුනරුත්ථාපන වැය ශීර්ෂය.</u> පහත සඳහන් කර ඇති මුදල් පමාණය අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා 2013 වසර ඇතුලත පුනරාවර්ථන වියදම් වශයෙන් අනුමත කර තිබේ.

| | | |
|---|---|---|
| අ. | වැය ශීර්ෂය අංකය | - 222-01-2-1204 (vii) |
| ආ. | වැය ශීර්ෂය නම | - සුභසාධන පුනරුත්ථාපන වැය ශීර්ෂය |
| ඇ. | වාර්ෂිකව වෙන්කල මුදල | - රු 121,400,000,000 |

21. <u>ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුනරුත්ථාපන අරමුදල</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුනරුත්ථාපන අරමුදල මගින් 2013 දෙසැම්බර් 30 දිනට මුළු වත්කම් ප්‍රමාණය වශයෙන් රු: 55,040,523.65 ක මුදලක් හසුරුවන ලදි. ඒ සඳහා විස්තර වාර්ථාවක් පහත දැක්වේ:

| | | | |
|---|---|---|---|
| අ. | වාර්ෂික පරිත්‍යාග/ස්ථිර තැන්පතු පොල | - | රු: 8,468,791.33 |
| ආ. | ස්ථිර තැන්පතු | - | රු:52,519,518.72 |
| ඇ. | ජංගම ගිණුම | - | <u>රු: 2,521,004.93</u> |
| | මුළු වත්කම | - | <u>රු: 55,040,523.65</u> |

## මානව හිමිකම් සහ මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය හා අනුගත වෙමින් යුධ හමුදා මෙහෙයුම් අතරතුර එහි සාමාජිකයින් මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය **1997** ජනවාරි **06** වන දින ස්ථාපනය කරන ලදී. **2001** නොවැ **15** දින සිට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය නමින් නම් කර ඇත. මානව හිමිකම් සම්බන්ධයෙන් එහි සාමාජිකයින් බලගැන්වීම තුලින් සියලුම අවස්ථාවන් හිදී මානව හිමිකම් පිළිබඳව දැනුවත් භාවයක් ඇති කර ඒවා අගය කරමින් හා සුරක්ෂිත කරමින් මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති උල්ලංඝණය කිරීම් වලක්වාලීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ප්‍රධාන පරමාර්ථය වේ.

### වගකීම්

2. මානව හිමිකම් සම්මත මූලධර්ම හා සම්මුති බලාත්මක කරමින් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය අගයමින් හා සහයෝගිතාවයෙන් යුතුව ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ පුහුණු කිරීම්, අධීක්ෂණය කිරීම්, වාර්ථා තැබීම්, පැමිණිලි කිරීම් යනාදි අරමුණු ගෙනහැර දැක්වීම මෙහි වගකීම් වේ.

### කාර්යභාරය

3. ඕනෑම ගැටුම්කාරී වාතාවරණයක් තුළ ශ්‍රී ලංකා යුධ හමුදාව තුළ මානව හිමිකම් සහ මානුෂවාදී නීති බලගැන්වීම සාක්ෂාත් කිරීම මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාර්‍ය්‍යභාරය වේ.

### කාර්යයන්

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. මානව හිමිකම් හා මානුෂවාදී නීති සම්බන්ධ සියලුම කරුණු පිළිබඳව යුද්ධ හමුදාධිපති තුමා වෙත උපදෙස් ලබාදීම.

ආ. සක්‍රිය යුධමය වාතාවරණයක් තුළ මානව හිමිකම් හා මානුෂවාදී නීතිය බලගැන්වීම.

ඇ. ක්‍රියාන්විත ප්‍රදේශයන් හා පුහුණු ආයතනයන් තුළ මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති පිළිබඳ මූලික පුහුණු ව්‍යාප්ත වැඩසටහන් සැලසුම් කිරීම හා බලාත්මක කිරීම.

ඈ. නිල උසස් කිරීමේ විභාග සඳහා අනිවාර්‍ය්‍ය විෂයක් ලෙස මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති පිළිබඳව යුධ හමුදා ආධුනිකයාගේ සිට කපිතන් නිලය දක්වා සාමාජිකයන් දැනුවත් කිරීම සහ අනිවාර්‍ය්‍ය විෂයක් ලෙස ඇතුලත් කොට අදාල විෂය නිර්දේශයන් සැකසීම.

ඉ. පොත්පත් සඟරා හා වීඩියෝ චිත්‍රපට වැනි පුහුණු ආධාරක සකස් කිරීම.

ඒ. කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කොටගෙන පිහිටා ඇති ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ මූලස්ථානය, මානව හිමිකම් කොමිෂන් සභාව, මානව හිමිකම් ආයතනය හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමග සුහදශීලී සේවා සබඳතාවයක් පවත්වාගෙන යාම.

ඖ. අතුරුදහන් බවට වාර්තා වූ සියලුම පුද්ගලයන් සම්බන්ධයෙන් වාර්තා තබා ගනිමින් හා නියෝජිත ආයතන වන ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ හා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් කලින් කලට ස්ථාපනය කොට ඇති විමර්ශන කණ්ඩායම් හා කොමිෂන් සභාවන් හි පරීක්ෂක ප්‍රයත්නයන් සඳහා සහයෝගය පල කිරීම (පුද්ගලයන් අතුරුදහන් වූ බවට වාර්තා වූ විට ඒ පිළිබඳව ගත් සෑම උත්සාහයක්ම සහ ක්‍රියාමාර්ගයක්ම සඳහන් වාර්තාවක් ක්ෂේත්‍ර නිලධාරීන් වෙතින් ඉදිරිපත් කල යුතුය).

ඖෟ. යුධ හමුදාවට එරෙහිව නගා ඇති පැමිණිලි හා පෙත්සම් සම්බන්ධයෙන් සලකා බැලීම හා ඒ සඳහා ගත යුතු යෝග්‍ය පියවරයන් පිළිබඳව යුද්ධ හමුදාධිපති වෙත උපදෙස් හා නිර්දේශ ලබාදීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

5. යුධ හමුදා චර්යා නියෝගය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, බලඇණි යටතේ අදාල ප්‍රදේශයන් හි මානව හිමිකම් කමිටු ස්ථාපිත කර ඇත.

6. එසේ ස්ථාපනය කරන ලද මානව හිමිකම් කමිටු පහත දක්වා ඇති පරිදි වේ.

| ආසේමු | සේමු | බසේමු | රෙම | ඒකක (නිත්‍ය) | ඒකක (ස්වේච්ඡා) | වෙනත් මූලස්ථාන | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 07 | 22 | 72 | 22 | 166 | 102 | 10 | 401 |

7. <u>දෙසති වාර්ථා</u>. මානව හිමිකම් කමිටු රැස් වී අදාල කරුණු සම්බන්ධයෙන් වන විෂයගත කරුණු පිළිබඳව සාකච්ඡා කොට ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව දෙසතියකට වරක් වාර්ථාවක් ඉදිරිපත් කල යුතුය. සේනාංක මූලස්ථාන/බලසේනා මූලස්ථාන තුළ ස්ථාපිත අදාල ඒකකයන් මෙසේ එක්රැස් වී මානව හිමිකම් ක්‍රියාකාරකම්/කඩකිරීම් පිළිබඳව වාර්ථාවක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබූ අතර, ඒවා සමාලෝචනය කරන ලදී.

8. <u>පොදු තත්වය</u>.

අ. සියලුම ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන හා ඒකක තුළ ස්ථාපිත මානව හිමිකම් කමිටු ක්‍රියාකාරකම් කාලීන සමාලෝචනයට ලක් කරනු ලබයි.

ආ. යුධ හමුදාව තුළ සිදුවන නීත්‍යානුකූල නොවන අත් අඩංගුවට ගැනීම් හා රඳවා තබා ගැනීම් අවම කිරීම හා ඒවා අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපනය කරන ලද සියලුම කමිටු වෙතින් පියවි හා විවෘත සිර අඩස්සියේ සිටින පුද්ගලයන් පිළිබඳව සලකා බලමින් මාසික වාර්ථාවක් අදාල වර්ෂය තුළ ලබා දිය යුතුය.

ඇ. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී උපදේශකයන්ගේ පරිශීලනය සඳහා මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති වාර්ථා අංශයක් පවත්වාගෙන යනු ලබයි.

ඇ. ආරක්ෂක සේනා මූලස්ථාන සහ සේනාංක මූලස්ථාන මට්ටමින් මානව හිමිකම් හා මානුෂවාදී නීති ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් අධීක්ෂණය කිරීම, මානව හිමිකම් හා ජාත්‍යන්තර මානුෂවාදී නීති හැදෑරූ අයවලුන් වෙත උපදෙස් හා අදහස් ව්‍යාප්ත කරවීමේදී සහයෝගය ලබාදීම.

<u>පුහුණු කටයුතු</u>

9. නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරී සඳහා මානව හිමිකම් හා මානුෂවාදී නීතිය පිළිබඳව මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් වාර්ෂිකව මූලික පුහුණු පාඨමාලා 2 ක් හා උසස් සංස්කරණ පාඨමාලා 2 ක් ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනය - කුකුලේගග හිදී පවත්වන ලදී.

10. මානව හිමිකම් කොමිසම, මානව හිමිකම් ආයතනය හා ළමා ආරක්ෂක අධිකාරිය සමග ඒකාබද්ධව ආරක්ෂක සේනා මූලස්ථාන/පුහුණු පාසැල් /රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකක තුළ නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා මානව හිමිකම් ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 64 ක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී.

11. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය හා ඒකාබද්ධතාවයෙන් යුතුව නිලධාරීන් සඳහා ආරක්ෂක සේනා මූලස්ථාන/පුහුණු පාසැල් /රෙජිමේන්තු මධ්‍යස්ථාන තුළ ජාත්‍යන්තර මානුෂවාදී නීති වැඩමුළු 13 ක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සංවිධානය කරන ලදී.

12. මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් තවදුරටත් ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ සහයෝගය සමග ජාත්‍යන්තර සාම සාධක බලඇණි පාඨමාලා 7 ක් සඳහා පුහුණු වැඩසටහන් මෙම වර්ෂය සඳහා ශ්‍රී ලංකා සාමසාධක මෙහෙයුම් පුහුණු ආයතනය - කුකුලේගග හිදී පැවැත්වීමට කටයුතු කරන ලදී.

13. පුහුණු ආයතනයන් විසින් වාර්ෂිකව සැලසුම් කර ඇති මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂවාදී නීති පුහුණු වැඩසටහන් 106 ක් පැවැත්වීම් සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂවාදී නීති උපදේශකයින් නම් කරන ලදී.

14. නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් සඳහා ආරක්ෂක සේනා මූලස්ථාන, සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන, රෙජිමේන්තු මධ්‍යස්ථාන හා ඒකකයන් හි පැවැත්විය යුතු බවට මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සැලසුම් කරන ලද මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂවාදී නීති පුහුණු වැඩසටහන් 834 ක් සඳහා මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂවාදී නීති නිත්‍ය උපදේශක මඩුල්ලක් තෝරා නම් කරන ලදී.

15. තෙදින සහතිකපත් වැඩමුළු 38 ක් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් රෙජිමේන්තු මට්ටමින් පැවැත්වීමට සැලසුම් කර පවත්වනු ලැබිය.

16. සියලුම බලප්‍රදේශයන් හි ව්‍යාප්ත වී සිටින පුහුණු නිලධාරීන් විසින් අමතර පුහුණු අධියර 30 ක් පැවැත්වීමට කටයුතු කරනු ලැබිය.

17. 2013 වර්ෂයේ පුහුණු දත්ත අනුව මානව හිමිකම් හා මානුෂවාදී නීති අධ්‍යක්ෂ මණ්ඩලය මගින් නිලධාරීන් සහ සෙසුනිල 83376 ක් පුහුණු කරන ලදී.

**<u>මූල්‍යමය විස්තර</u>**

18. **<u>වැයකිරීම් සඳහා වෙන් කළ මුදල</u>**

| | | |
|---|---|---|
| පුහුණු ප්‍රදානයන් සඳහා වාර්ෂික වෙන් කිරීම් | - | රු: 10000.00 |
| සගරා මිලදී ගැනීම සඳහා වාර්ෂික වෙන් කිරීම් | - | රු: 4050.00 |
| | | --------------- |
| එකතුව | - | රු: 14050.00 |

## ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය

**හැඳින්වීම**

1. හමුදා චර්යා නියෝගය 18/94 ට අනුව 1994 අප්‍රේල් මස ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය ලෙස ආරම්භ කර හමුදා චර්යා නියෝග 06/2012 මත 2012 ජනවාරි 01 වන දින සිට ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස නැවත ප්‍රතිස්ථාපනය කරන ලදි. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විධායක ජෙනරල් ශාඛාව යටතේ ක්‍රියාකරනු ලබන අතර පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්පව කටයුතු කරනු ලබයි. තවද මෙහි රාජකාරි කරනු ලබන සහ තාවකාලිකව යාකර ඇති නිලයින්ගේ සියලුම පාලනමය කටයුතු යුද්ධ හමුදා මූලස්ථානයේ මූලස්ථාන බලඇණිය විසින් සිදුකරනු ලබයි.

**වගකීම**

2. සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රාජකාරි කිරීමට නිලධාරින්/සෙසු නිලයින් ලෙස විධායක ජෙනරාල්ගේ අධීක්ෂනයෙන් හා යුද්ධ හමුදාපති තුමාගේ අනුමැතිය මත බඳවා ගැනීම.

**කාර්යය**

3. පිරිමි හා කාන්තා පුරවැසියන් වෘත්තීය ආධුනික නිලධාරි/නිලධාරිනියන්, කෙඩෙට් නිලධාරි/නිලධාරිනියන් සහ ආධුනික සෙබල/සෙබලියන් ලෙස යුද්ධ හමුදා නිත්‍ය බලසේනාව වෙත බඳවා ගැනීම් සිදුකිරීම.

**කාර්ය භාරයන්**

4. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් පහත සඳහන් පරිදි වේ.

අ. මාණ්ඩලික රාජකාරි අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලසේනාව වෙත සෙසුනිලයින් ලෙස බඳවා ගැනීම සඳහා ප්‍රසිද්ධ කිරීම් හා ප්‍රචාරණය සිදුකිරීම.

ආ. පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත වෘත්තීය නිලධාරින් සහ කෙඩෙට් නිලධාරින් බඳවා ගැනීම.

ඇ. බඳවා ගැනීමට නියමිත අයවලුන්ගේ පුද්ගලික සහතිකපත් හි නිවැරදිතාවය තහවුරු කරගැනීමෙන් පසු කෙටි අංක/ආධුනික අංක නිකුත් කිරීම.

ඈ. පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත බඳවා ගන්නා ලද අයවලුන් හට ගමන් නියෝග නිකුත් කර පුහුණු පාසල් වෙත රපෝර්තු කරවීම.

ඉ. බඳවා ගන්නා ලද අයවලුන්ගේ යුආපා 09 හා වැටුප් හා දීමනා ඉල්ලුම් කිරීමේ නාම ලේඛණ වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

ඊ. බඳවා ගන්නා ලද අයවලුන් සැබැඳි ආරක්ෂක නිශ්කාපණ ලිපිගොණු බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආරක්ෂක නිශ්කාපණ ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීම.

උ. ඒ ඒ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් බඳවාගන්නා ලද අයවලුන්ගේ පුද්ගලික ලිපිගොණු නිවැරදිතාවය පරීක්ෂා කර බලා වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේඛණාගාරය වෙත භාරදීම.

ඌ. ස්වේච්ඡා බලසේනාව වෙත බඳවා ගන්නා ලද සෙසුනිලයින් නිත්‍ය හමුදාගත කිරීම.

එ. වසර 12 ක සේවා කාලයකින් පසු අස්වගිය සෙසුනිලයින් විනය වාර්ථා සහ වෛද්‍ය වාර්ථා යහපත් නම් නැවත බඳවා ගැනීමේ කටයුතු සිදුකිරීම.

ඒ. බඳවා ගනු ලබන ආධුනිකයින්ගේ සංඛ්‍යාවන් නිවැරදිව සහ කඩිනම්ව යුද්ධ හමුදා මූලස්ථානය වෙත දැන්වීම.

**වර්ෂික සමාලෝචනය**

5. ආයතන හා සම්බන්ධතාවය

අ. දක්ෂතාවයන්ගෙන් පිරි තරුණ තරුණියන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත බඳවා ගැනීමේ අරමුණින් සහ බඳවා ගැනීම් සැබැදි ප්‍රචාරණයන් ලබාදීම සඳහා 2013 වර්ෂය පුරාවට ප්‍රදර්ශණ/සැණකෙළි/රැකියා පොළවල් සඳහා ආධුනිකයින් බඳවා ගැනීමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහභාගී වන ලදි.

(1) ජාත්‍යන්තර රිස්ගෝ බාලදක්ෂ ව්‍යාපාරය - ධර්මරාජ විද්‍යාලය - නුවර
(2) රැකියා වෙළඳපොල ගාල්ල - නුවර - අනුරාධපුර
(3) දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය - අම්පාර
(4) කැගලු සංවර්ධන නවෝදය ප්‍රදර්ශණය - කෑගල්ල
(5) 2013 එරඹුදු වසන්ත උදානය - කෑගල්ල
(6) බණ්ඩාරවෙල වසන්ත උදානය හා සැණකෙලිය - බණ්ඩාරවෙල
(7) රජරට නවෝදය වානිජ ප්‍රදර්ශණය හා සැණකෙලිය - පදවිය
(8) වේල්ස් කුමර අධ්‍යාපන ප්‍රදර්ශණය - මොරටුව
(9) බමුණුගම නවෝදය ජාතික පාසැල - සියවස් සැමරුම - කඹුරුපිටිය
(10) කසාගල රාජ්‍ය උත්සවය - කසාගල, හම්බන්තොට
(11) මෝදරවිල සැණකෙලිය සහ වානිජ ප්‍රදර්ශණය - පානදුර

ආ. බඳවා ගැනීම් විස්තරය - නිළධාරි (නිත්‍ය බලසේනාව) ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය දියතලාව, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය සහ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙත ඇතුලත් කරගනු ලබන විවිධ ක්ෂේත්‍රයන්ට අයත් නිළධාරි/නිළධාරිණියන්ගේ බඳවා ගැනීමට අදාල ලියකියවිලි සහ සහතික පත් නිසි අයුරු සකසා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් 2013 වසරේ දෙසැම්බර් 31 දින දක්වා බඳවා ගැනීම් කරන ලද සංඛ්‍යාවන් පහත සඳහන් පරිදි වේ.

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු නිළධාරි | - | 02 | |
| (ආ) | දන්ත වෛද්‍ය නිළධාරි | - | 01 | |
| (ඇ) | වෛද්‍ය නිළධාරි | - | 06 | |
| (ඈ) | ඉංජිනේරු නිළධාරි | - | 02 | |
| (ඉ) | කෙඩෙට් නිළධාරි | - | 49 | (යුහවිපි) |
| (ඊ) | කෙඩෙට් නිළධාරි | - | 74 | (කොආවිවි) |
| (උ) | කෙඩෙට් නිළධාරි (කාන්තා) | - | 11 | (යුහවිපි) |
| (ඌ) | කෙඩෙට් නිළධාරි (කාන්තා) | - | 14 | (කොආවිවි) |
| එකතුව | | - | **159** | |

ඇ. බඳවා ගැනීම් විස්තරය - සෙසුනිළ (නිත්‍ය බලසේනාව). 2013 වසරේ ආධුනිකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය සක්‍රියව දායකත්වය දක්වන ලදි. ඒ සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් නම් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල මගින් සම්මුඛ පරීක්ෂණයන් පවත්වන ලදි. ඒ අනුව රෙජිමේන්තු මධ්‍යස්ථාන වෙතින් ඉඩුරාම /පොදු බඳවා ගැනීම් යටතේ බඳවා ගන්නා ලද සංඛ්‍යාවන් - 2013 දෙසැම්බර් 31 දක්වා

| අනු අංකය | රෙජිමේන්තුව | ඉඩුරාම ආධුනික බඳවා ගැනීම් |
|---|---|---|
| 1. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 470 |
| 2. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව | 379 |
| 3. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය | 470 |
| 4. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකාය | 404 |
| 5. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව | 388 |
| 6. | රෙම ශ්‍රීලංසිරෙරෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 594 |
| 7. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගැමුණු හේවා බලකාය | 500 |
| 8. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ගජබා රෙජිමේන්තුව | 201 |
| 9. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු පාබල රෙජිමේන්තුව | 498 |
| 10. | රෙජිමේන්තු මධ්‍යස්ථානය යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | 157 |
| 11. | රෙජිමේන්තු මධ්‍යස්ථානය කමාන්ඩෝ රෙජිමේන්තුව | 3 |
| 12. | රෙජිමේන්තු මධ්‍යස්ථානය විශේෂ බලකාය | 291 |
| 13. | රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය | 460 |
| 14. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ඉංජිනේරුසේවා බලකාය | 508 |
| 15. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය | 258 |
| 16. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | 97 |
| 17. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය | 450 |
| 18. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව | 371 |
| 19. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය | 100 |
| 20. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකාය | 281 |
| 21. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය | 78 |
| 22. | ස්වේච්ඡා නිත්‍යගත කිරීම් | 56 |
| | එකතුව | **7013** |

**<u>මූල්‍යමය විස්තරය</u>**

6. මූල්‍යමය විස්තර පහත සදහන් පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| අ. | පුවත්පත් දැන්වීම් සහ ප්‍රචාරණයන් සඳහා | - | රු: 2600000.00 |
| ආ. | සතිපාරක්ෂක කටයුතු සඳහා | - | රු: 18500.00 |
| ඇ. | භූමි නඩත්තු සඳහා | - | රු: 3000.00 |
| ඈ. | අභ්‍යාස දීමනා සඳහා | - | රු: 10000.00 |

## සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 11,000 කට අධික සිවිල් කාර්ය මණ්ඩලයේ පාලන කටයුතු සිදුකරනු ලබන්නේ සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය මගිනි. ආරක්ෂක සේනා මූලස්ථාන වශයෙන් පිහිටි අනුරාධපුරය, මින්නේරිය, යාපනය, කිලිනොච්චිය, මුලතිව් සහ දියතලාව ප්‍රදේශවල ප්‍රාදේශීය සිවිල් පරිපාලන කාර්යාල ස්ථාපනය කර සිවිල් පරිපාලන අධ්‍යක්ෂ සතු බලතල විමධ්‍ය ගතකර ඇත.

2. ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් මෙම කාර්ය මණ්ඩලය ප්‍රධාන වශයෙන් අරක්කැමි, භෝජනාගාර සේවක, කම්කරු සහ සනීපාරක්ෂක කම්කරු තනතුරු වලට අමතරව විදුලි කාර්මික පෙදරේරු, වඩු කාර්මික යනාදි වශයෙන් තනතුරු රැසක සේවය කරනු ලැබේ. මෙම කාර්ය මණ්ඩලය දිවයින පුරා පිහිටි යුද්ධ හමුදා කඳවුරුවල උපකාරක සේවාවන් පවත්වා ගනිමින් සේවය කරනු ලැබේ.

### වගකීම්

3. උපරිම කාර්යක්ෂම හා ඵලදායි ලෙස සේවාවක් ලබා ගැනීම සඳහා සිවිල් කාර්ය මණ්ඩලයේ පරිපාලන කටයුතු සිදු කරනු ලැබේ.

### කාර්ය සහ කාර්යභාරය

4. සිවිල් කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම, ස්ථිර පත්වීම් ප්‍රධානය කිරිම, ස්ථාන මාරුවීම් කිරිම, පුහුණු හා සංවර්ධන කටයුතු, උසස් කිරිම්, පුද්ගලික ලිපි ගොනු යාවත්කාලීන කිරිම්, ණය ලබාදීම, ණය අනුමත කිරිම්, දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම, විශ්‍රාම ගැන්වීම සහ සුභ සාධන කටයුතු යන කාර්ය භාරයන් මෙම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරනු ලබයි.

### වාර්ෂික සමාලෝචනය

5. <u>බඳවා ගැනීම</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අනුමත සිවිල් කාර්ය මණ්ඩලය 11,138 ක් වන අතර, එම සේවක සංඛ්‍යාවෙන් **2013** වසරේ පවතින පුරප්පාඩු **2490** ක් සම්පූර්ණ කිරිම සඳහා කොළඹ ප්‍රධාන කාර්යාලයේ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදි. ඒ සඳහා නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති තරුණ/කඩවසම් කාර්ය මණ්ඩලය තෝරා ගන්නා ලදි.

6. <u>දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම</u>. උපකරණ පාලන නිලධාරින් හා සිවිල් විෂයභාර ලිපිකරුවන් සිවිල් පාලනය සම්බන්ධයෙන් දැනුවත් කිරිමේ වැඩසටහන් ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් පවත්වන ලදි.

7. සිවිල් පරිපාලනය සම්බන්ධයෙන් නව උපදෙස් සංග්‍රහය **2013** නමින් සංයුක්ත තැටියක් නිකුත් කරන ලදි.

8. **2012** වර්ෂයේ අනුමත කරන ලද නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව ස්ථිර කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතා කඩ ඉම් පරීක්ෂණ දිවයින පුරා පවත්වන ලදි.

**<u>සාක්ෂාත් කරගැනීම</u>**

9. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිවාඩු නිකේතන තුල අරක්කැමි හා භෝජනාගාර සේවක කාර්ය මණ්ඩලය සඳහා දින 05 ක පුහුණු වැඩසටහනක් පවත්වන ලදි. මීට අමතරව පේරාදෙණිය උද්භිත උද්‍යානයේ උද්‍යාන අලංකරණය පිලිබඳ පාඨමාලාවක් 700 දෙනෙකුගෙන් යුත් කම්කරු කාර්ය මණ්ඩලයකට පවත්වන ලදි.

10. සියලුම සිවිල් කාර්ය මණ්ඩලයට නව නිල ඇඳුම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සඳහා සිවිල් පරිපාලන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් යුත් මණ්ඩලයක් පත්කර එහි වාර්තාව විධායක ජෙනරාල් වෙත භාරදෙන ලදි.

11. සිවිල් පරිපාලන අධ්‍යක්ෂ සතු පහත සඳහන් බලතල ආරක්ෂක සේනා මූලස්ථාන වශයෙන් පිහිටි ප්‍රාදේශීය කාර්යාල වෙත විමධ්‍යගත කරන ලදි.

අ. සංඛ්‍යා වාර්තා යාවත් කාලීන කිරිම සහ නිවාඩු වාර්තා යාවත් කාලීන කිරිම.

ආ. හැඳුනුම්පත්, පදක්කම් සහ නිල ඇඳුම් නිකුත් කිරිම.

ඇ. අභ්‍යන්තර ස්ථාන මාරුවීම් සිදුකිරිම.

ඈ. අතිකාල දීමනා, සංයුක්ත දීමනා සහ ණය ලබාදීම ඉදිපත් කිරිම.

ඉ. සුභ සාධක හා විමර්ශණ කටයුතු.

ඊ. ප්‍රාදේශීය සිවිල් පරිපාලන නිලධාරි කාර්යාල සහ ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධතා පවත්වා ගැනීම.

## <u>උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව</u>

### <u>හැඳින්වීම</u>

1. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන මාණ්ඩලික ශාඛාවන් අතුරින් එකක් වේ. යුද්ධ හමුදා මූලස්ථානය වෙතින් ප්‍රකාශිත හමුදා චර්යා නියෝග 18/94 අනුව ශ්‍රී ලංකාව තුල සහ ඉන් පිටත දුම්රිය, ගොඩබිම් මාර්ග, ගුවන් සහ මුහුදු මාර්ග මගින් හඨ පිරිස් සහ භාණ්ඩ ප්‍රවාහනය මෙම ශාඛාව මගින් පාලනය කරණු ලබයි. යුධ හමුදා ජනපද, හඨ නිවාස පරිපාලනය, නවාතැන් පහසුකම් ලබාදීම, සලාක සැපයීම, සියලුම ප්‍රවාහන අවශ්‍යතා, වාහන සහ යුද්ධ හමුදාවේ සියලුම ඉදිකිරීම් සහ ඉංජිනේරු සේවා ක්‍රියාත්මක කිරීම උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව සතු වගකීම් වේ.

2. පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයන් මෙම ශාඛාව වෙතින් පාලනය කරණු ලබයි.

අ. <u>හඨ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම් වනුයේ යුධ හමුදා ජනපද සහ බැරැක්ක පරිපාලනය කිරීම, සියළුම විවාහක නිවාස සහ නිවාඩු බංගලා වෙන් කිරීම් සහ සැළසුම් කිරීම, යුධ හමුදාවට අවශ්‍ය වන ගොඩනැගිලි සහ ඉඩම් යුධ හමුදාව වෙත පවරා ගැනීම හා නිදහස් කිරීම.

ආ. <u>සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම් වනුයේ යුධ හමුදාව සඳහා සලාක අවශ්‍යතා ලබාදීම, කුලී ගෙවීමේ පදනම මත හා පවරාගැනීමේ පදනම මත වාහන ලබා ගැනීම ඇතුළු යුධ හමුදාවට ප්‍රවාහන අවශ්‍යතා ලබාදීම.

ඇ. <u>ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය</u>. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයෙහි වගකීම් වනුයේ රට තුල හා ඉන් පරිබාහිරව ගොඩබිම්, මුහුදු, ගුවන් හා දුම්රිය මගින් හඨ පිරිස් හා භාණ්ඩ ප්‍රවාහනය සිදුකිරීම, කුලී ගෙවීමේ පදනම මත අවශ්‍ය ශ්‍රමිකයන් ලබාගැනීම හා එම කාර්යයන් පාලනය කිරීම.

ඈ. <u>ඉංජිනේරු සේවා අධ්‍යක්ෂක මණ්ඩලය</u>. මෙහි ප්‍රධාන වගකීම වනුයේ යුද්ද හමුදාව තුල මෙන්ම ඉන් පරිබාහිරවද යුද්ද හමුදා අනුමැතිය මත ඉටුකරනු ලබන ව්‍යාපෘතීන් හි ඉංජිනේරු සේවා කාර්යයන් ඉටුකිරීමය.

### <u>වගකීම්</u>

3. මෙම ශාඛාවේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. මෙම ශාඛාවේ කාර්‍යභාරය නිසියාකාරව ඉටු කරණු ලබන බව යුද්ධ හමුදාධිපති වෙත වගකීම.

ආ. මෙම ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල විෂය පථයන්ට අදාල කාර්‍යයන් නිසි පරිදි ඉටුකිරීම සම්බන්ධිකරණය හා පරීක්ෂා කිරීම.

ඇ. මෙම ශාඛා විෂය පථයන්ට ගැනෙන කාර්යයන් සබැඳිව යුද්ධ හමුදාධිපති වෙත අවශ්‍ය අවස්ථාවන්හි උපදෙස් ලබාදීම.

ඉ. යුද්ධ හමුදාධිපති තුමා විසින් පනවන ලද ප්‍රතිපත්තීන් නිසියාකාරව අදාල අධ්‍යක්ෂ මණ්ඩල හරහා ක්‍රියාත්මක කරවීම.

ඊ. යුද්ධ හමුදාධිපති තුමා විසින් පනවන ලද ප්‍රතිපත්තීන් වලට අනුකූලව ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල වෙත නියෝග/උපදෙස් ලබාදීම.

උ. යුද්ධ හමුදාධිපති තුමා විසින් පනවන ලද ප්‍රතිපත්තීන් වලට අනුකූලව යුද්ධ හමුදාධිපති වෙනුවෙන් තීරණ ගැනීම.

ඌ. මුදල් රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ආරක්ෂක අමාත්‍යාංශ උපදේශ සැලකිල්ලට ගෙන උපකරණ පරිපාලන ව්‍යුහය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා එම ප්‍රතිපත්තීන් අදාල අධ්‍යක්ෂ මණ්ඩල හරහා ක්‍රියාත්මක කරවීම.

එ. මූල්‍ය රෙගුලාසි, ප්‍රසම්පාදන නිර්දේශ, භාණ්ඩාගාර චක්‍රලේඛ, ආරක්ෂක අමාත්‍යාංශ උපදේශ මගින් පනවන ලද නිර්දේශයන්ට අනුකූලව යුද්ධ හමුදාධිපති වෙනුවෙන් තීරණ ගැනීම.

ඒ. මෙම ශාඛාව යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල වෙත නියම කරණු ලැබූ ඉලක්ක/අරමුණු සාක්ෂාත් කිරීම නිරීක්ෂණය කිරීම හා එහි ප්‍රගතිය යුද්ධ හමුදාධිපති වෙත දැණුම්දීම.

ඔ. සැළසුම් කල ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩල වෙත ලබාදුන් ඉලක්කයන් අනුව ක්‍රියා කිරීම සනාථ කර ගැනීම සඳහා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඕ. මෙම ශාඛා විෂය පථයට ගැනෙන සියළුම වැය ශීර්ෂයන්හි ප්‍රතිපත්තිමය පාලක වශයෙන් ක්‍රියා කිරීම

**<u>කාර්යයන්</u>**

4. උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවෙහි කාර්‍යභාරය පහත පරිදි වේ.

අ. දුම්රිය/ගුවන්/නාවික මගින් මෙරට හා ඉන් පරිබාහිරව සිදුවන්නාවූ සියළුම පුද්ගල/භාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතා කළමණාකරණය කිරීම.

ආ. ඉඩම්, යුධ හමුදා ජනපද, හඨ නිවාස සහ හඨ කාර්‍ය සම්පාදනය පිළිබඳව සම්බන්ධීකරණය කිරීම.

ඇ. යුධ හමුදාව වෙත සැපයෙන ඉන්ධන සලාක/ලිහිසිතෙල් ලබාදීම සහ අධීක්ෂණය කිරීම, වාහන හා ප්‍රවාහන අවශ්‍යතා පාලනය කිරීම.

ඈ. සියළුම යුද්ධ හමුදා ගොඩනැගිලි ඉදිකිරීම්, ඉංජිනේරු සේවාවන් පිළිබඳව වගකීම.

**<u>වාර්ෂික සමාලෝචනය</u>**

**5.** හඨ නිවාස සම්පාදක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් ඉඩම් අක්කර **2311** ක ප්‍රමාණයක් යුද්ධ හමුදා කඳවුරු ඉදිකිරීම හා වෙනත් අවශ්‍යතා වෙනුවෙන් යුද්ධ හමුදාව වෙත අත්පත් කරගෙන ඇත. තවද යුද්ධ හමුදාව විසින් ආරක්ෂක හේතුන් මත උතුරු නැගෙනහිර පළාත් වල තාවකාලික පදනම මත භාවිතා කරමින් තිබූ ඉඩම් අක්කර **273** ක ප්‍රමාණයක් අදාල හිමිකාර පාර්ශවයන් වෙත මුදවා හැර ඇත.

6. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යුධ හමුදාවට අවශ්‍ය ගොඩනැගිලි සහ නිවාස ව්‍යාපෘති රාශියකට දායකත්වය දක්වන ලදි. තවද, ජනාධිපති ලේකම් කාර්‍යාලය මෙන්ම, ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශ උපදෙස් පරිදි පොදු යටිතල පහසුකම් සංවර්ධන කාර්‍යයන් සඳහා විශාල වශයෙන් දායකත්වය සපයන ලදි. රජය විසින් ඉදිකිරීම් කාර්‍යයන් සඳහා වැය කල යුතු මූල්‍ය පිරිවැය අවම කර ගැනීම සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය සපයන ලදි. එම කාර්යයන් අතුරින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පහත සඳහන් පරිදි වේ.

අ. "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘතිය යටතේ ත්‍රිවිධ හමුදාව වෙනුවෙන් පහත සඳහන් දිස්ත්‍රික්ක තුල නිවාස 153 ක් මෙම වසර තුල ඉදි කර භාර දෙන ලදි.

(1) නුවරඑළිය - නිවාස 48

(2) කොළඹ - නිවාස 86

(3) අනුරාධපුරය - නිවාස 19

ආ. මහල් දහයකින් යුත් නව යුද්ධ හමුදා රෝහල නාරාහේන්පිට ඉදිකරණ ලදි.

ඇ. පසුගිය යුධමය වාතාවරණ හේතුවෙන් පූර්ණ මෙන්ම අර්ධ වශයෙන් ආබාධිත තත්වයට පත් යුධ හමුදා සාමාජිකයින් පූර්ණ කාලීනව රැක බලා ගැනීම සඳහා අභිමංසල II මාතර කඹුරුපිටිය ප්‍රදේශයේ ඉදිකිරීම.

ඈ. තුරග තරඟ පිටිය ජාත්‍යන්තර රග්බි ක්‍රීඩාංගණයක් බවට ප්‍රති නිර්මාණය කිරීම සහ තුරග තරඟ පිටිය අවට තිබූ පැරණි ගොඩනැගිලි නවීකරණය කර අති නවීන වෙළඳ සංකීර්ණ බවට පත් කිරීම.

7. පොදුරුදමඩුළු නායක සමුළුව 2013 සඳහා සියළුම ප්‍රවාහන අවශ්‍යතා සම්බන්ධීකරණය කිරීම යුධ හමුදාව වෙත පැවරුණු අතර, එම ප්‍රවාහන අවශ්‍යතාවය උපකරණ මාස්ටර් ජෙනරල්ගේ කළමණාකරණය හා අධීක්ෂණය යටතේ සිදුකල අතර, සැපයුම් අධ්‍යක්ෂ හා ප්‍රවාහන අධ්‍යක්ෂගේ ඍජු අධීක්ෂණය යටතේ එම කටයුතු සිදු කරණ ලදි.

<u>**මූල්‍යමය විස්තරය**</u>

9. උපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව යටතේ පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩල හතර මගින් පවත්වාගෙන යනු ලබන සියළුම ගිණුම් හි ප්‍රතිපත්ති පාලක උපකරණ මාස්ටර් ජෙනරල් වන අතර, 2013 වර්ෂයට අදාල සුළු ප්‍රසම්පාදන කමිටු වල මූල්‍ය විස්තරය පහත සඳහන් වේ.

| අනු අංකය | අධ්‍යක්ෂ මණ්ඩලය | ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| 1. | හට නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය | 38 | 6,597,178.46 |
| 2. | සැපයුම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය | 68 | 42,290,463.03 |
| 3. | ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය | 11 | 5,443,744.60 |
| 4. | ඉංජිනේරුසේවා අධ්‍යක්ෂ මණ්ඩලය | 661 | 357,329,746.66 |
| | එකතුව | 778 | 411,661,132.75 |

## හඬ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. යුද්ධ හමුදා චාර්යා නියෝග 48/94, යුද්ධ හමුදා චර්යා නියෝග 37/94, සහ යුද්ධ හමුදා චර්යා නියෝග 9/2011 ට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත ඉඩම්/ගොඩනැගිලි පවරා ගැනීම, කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිලි ලබාගැනීම සහ යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයන් සඳහා විවාහක නිවාස වෙන් කිරීම හඬ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඉටු කරනු ලබයි.

### වගකීම්

2. යුද්ධ හමුදාව වෙතින් විවිධ අවස්ථාවන් වලදී පවත්වනු ලබන උත්සව, සංදර්ශන වැනි කටයුතු වලදී සියළුම නිලයන් හට තවාතැන් පහසුකම් සලසා දීම, යුද්ධ හමුදාව වෙත අවශ්‍ය ඉඩම්/ගොඩනැගිලි පවරා ගැනීම, කුලී ගෙවීමේ පදනම මත යුද්ධ හමුදාව වෙත පවරා ගනු ලබන ඉඩම්/ගොඩනැගිලි සඳහා කුලී ගෙවීම මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම සහ කාර්ය භාරය වේ.

### වගකීම් සහ කාර්යයන්

3. හඬ නිවාස සම්පාදන අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් සහ කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාව සඳහා අවශ්‍ය ඉඩම් සහ ගොඩනැගිලි පවරාගැනීම.

ආ. කුලී, වරිපනම්/බදු නිරවුල් කිරීම.

ඇ. යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින් සඳහා විවාහක නිවාස වෙන් කිරීම.

ඈ. යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින් සඳහා නිවාඩු බංගලා වෙන් කිරීම.

### වාර්ෂික සමාලෝචනය

4. <u>ඉඩම් සහ ගොඩනැගිලි පවරා ගැනීම</u>. මැණුම් කටයුතු සඳහා වන වියදම් මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නිරවුල් කර ඇති අතර, අනෙකුත් වියදම් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිරවුල් කර ඇත.

| අනු අංකය | ඉඩම | අනුමැතිය | ගෙවන ලද මුදල (රු.) | වෙනත් |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | 21 සේනාංක මූලස්ථානය (අනුරාධපුරය) - මැනුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 81,373.82 | ගෙවීම් නිරවුල් කර ඇත |
| 2. | 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව (කරවිලගල) - තක්සේරු මුදල් | සුළු ප්‍රසම්පාදන කමිටුව | 190,000.00 | |
| 3. | 7 ශ්‍රී ලංකා සංඥා බලකාය - ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 11,424.00 | |
| 4. | 121 බලසේනා මූලස්ථානය - තක්සේරු මුදල් | සුළු ප්‍රසම්පාදන කමිටුව | 110,000.00 | |
| 5. | 2 ශ්‍රී ලංකා රයිෆල් බලකාය - මැණුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 25,040.00 | |
| 6. | 21 සේනාංක මූලස්ථානය - පරිපාලන වියදම් | සුළු ප්‍රසම්පාදන කමිටුව | 40,320.00 | |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | |
|---|---|---|---|---|
| 7. | 22 විජයබාහු පාබල රෙජිමේන්තුව - මැණුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 39,142.66 | |
| 8. | රෙජිමේන්තු මූලස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව - මැනුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 55,900.00 | |
| 9. | ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය (දියතලාව) - පරිපාලන වියදම් | සුළු ප්‍රසම්පාදන කමිටුව | 7,974.40 | |
| 10. | 53 සේනාංක මූලස්ථානය - මැනුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 210,784.36 | |
| 11. | නිවාඩු බංගලා ඉඩම (සුහ සාධක අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වනු ලබන) - පරිපාලන වියදම් | යුහ ප්‍රසම්පාදන කමිටුව | 2,076,000.00 | මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ඇත. |
| 12 | රෙජිමේන්තු මූලස්ථානය ශ්‍රී ලංකා විශේෂ බලකාය - පරිපාලන වියදම් | සුළු ප්‍රසම්පාදන කමිටුව | 50,000.00 | |
| 13 | 17(ස්වේච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාව - මැනුම් ගාස්තු | සුළු ප්‍රසම්පාදන කමිටුව | 72,206.31 | |

5.. ගාස්තු, බදු සහ කුලී ගෙවීම්

| වැය ශීර්ෂය | ප්‍රතිපාදන මුදල | අතිරේක ප්‍රතිපාදන ප්‍රමාණය | සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය | සම්පූර්ණ වියදම් | ඉතිරි මුදල |
|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) |
| කුලී ගෙවීම් | | | | | |
| 222-01-1-1404-(i) | 62,810,000.00 | 58,790,000.00 | 121,600,000.00 | 167,983,174.99 | (46,383,174.99) |
| 222-01-2-1404-(i) | 7,040,000.00 | | 7,040,000.00 | 7,039,727.39 | 272.61 |
| 222-01-3-1404-(i) | 2,100,000.00 | | 2,100,000.00 | 1,568,000.00 | 532,000.00 |
| නවාතැන් හා අනෙකුත් පහසුකම් | | | | | |
| 222-01-3-1405-(xxiii) | 5,000,000.00 | | 5,000,000.00 | 3,879,736.14 | 1,120,263.86 |
| වරිපනම් බදු | | | | | |
| 222-01-1-1404(ii) | 18,700,000.00 | | 18,700,000.00 | 15,447,285.96 | 3,252,714.04 |

නිවාඩු බංගලා

6. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය කරනු ලබන සියළුම නිවාඩු බංගලාවන්හි අළුත්වැඩියාවන් සඳහා ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩල ඉසේඅම/ගිණුම්/පුන/05(173) හා 2013.01.08 දිනැති ලිපිය මගින් රු. 6,000,000.00 ක මුදලක් වෙන් කර ඇත.

7. පහත සඳහන් නිවාඩු බංගලාවන්හි අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇත.

අ. 11 සේනාංක මූලස්ථානය - නුවර

(1) පොල්ගොල්ල අංක 2 සහ 3 නිවාඩු බංගලාවන්. රු. 1,190,021.00 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

ආ. <u>ඉදිරි නඩත්තු පෙදෙස (උතුරු මැද)</u>

(1) <u>ජෙනරල් නිවාඩු බංගලාව</u> රු. 1,335,298.60 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

(2) <u>අනුරාධපුර අංක 03 (කනිෂ්ඨ නිලධාරි) සහ අංක 04 (සෙසුනිල) නිවාඩු බංගලාවන්</u>. රු. 2,200,858.61 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

ඇ. <u>ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) - දියතලාව</u>

(1) <u>වීඕ 1, එච්එච්ම් 1 නිවාඩු බංගලාවන්</u>. රු. 1,407,206.90 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

ඇ. <u>141 බලසේනා මූලස්ථානය (ගාල්ල)</u>

(1) <u>ගාල්ල ජ්‍යෙෂ්ඨ නිලධාරි නිවාඩු බංගලාව</u>. රු. 185,168.50 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

ඈ. <u>ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) - පනාගොඩ</u>

(1) <u>කැන්දලන්ද අරලිය සහ රෝස නිවාඩු බංගලාවන්</u> රු. 574,722.50 ක මුදලක් මිලදී ගැනීම් සහ නඩත්තු කටයුතු සඳහා අනුමත කර වෙන් කරදී ඇත.

**<u>සාක්ෂාත් කරගැනීම</u>**

7. වර්ෂය තුළදී පහත සඳහන් ඉඩම් පවරාගැනීම් සිදු කර ඇත.

| අනු අංකය | ඒකකය | ඉඩමේ ප්‍රමාණය | | | | ස්ථානය | භාරදුන් දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | හෙක්ටයාර් | අක්කර | රූඩ් | පර්චස් | | |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
| 1 | 11 ශ්‍රීලපාහ | 0.8267 | | | | කරෙයිනගර් | 16.07.2013 |
| 2 | 7 විජයබාහු පාබල රෙජිමේන්තුව | 1.6 | | | | මනල්කාඩු | 23.07.2013 |
| 3 | 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | 8 | | | | කිලිනොච්චිය | 29.08.2013 |
| 4 | 19(ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 0.6 | | | | කුඩත්තානෙ | 02.10.2013 |
| 5 | 15 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | 0.5693 | | | | පච්චලාපලෙයි | 11.11.2013 |
| 6 | 10(ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුව | 4.0472 | | | | වඩමාරච්චි නැගෙනහිර | 12.11.2012 |
| 7 | 11 ශ්‍රී ලංකා පාබල හමුදාව | 1.6114 | | | | අරාලි දකුණ | 20.11.2013 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 8 | සටන් පුහුණු පාසල (සෙසුතිල විවාහක නිවාස) | 1.2713 | | | | අම්පාර | 22.08.2013 |
| | | 0.1853 | | | | | 22.08.2013 |
| 9 | 8 ගැමුණු හේවා බලඇණිය | 1.6 | | | | පුල්ලුමලෙයි | 26.08.2013 |
| 10 | 2(ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව | 2 | | | | කන්තලේ | 04.09.2013 |
| | | 2 | | | | පන්කුලම | |
| 11 | 232 බලසේනා මූලස්ථානය | 22.5 | | | | මඩකලපුව කිරාන් | 05.09.2013 |
| 12 | 5 ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය | 2 | | | | හබරන | 11.09.2013 |
| 13 | 7 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 4.4 | | | | බටුඔය | 14.10.2013 |
| 14 | 54 සේනාංක මූලස්ථාන නිවාඩු බංගලාව | | 3 | | | කුරායි තලාඩි | 06.06.2013 |
| | | | | | | මන්නාරම | |
| | 54 සේනාංක මූලස්ථානය | | 50 | | | පෙරියනාවට්කුලම් | |
| | | | | | | තල්ලඩි මන්නාරම | |
| | 10 ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව 101 බතරොයි | | 20 | | | මාන්තෙයි මන්නාරම | |
| | 19 විජයබාහු පාබල රෙජිමේන්තුව | | 10 | | | නාගතාලු | |
| 15 | 611 බලසේනා මූලස්ථානය | 1.9905 | | | | වවුනියා | 21.06.2013 |
| | | 1.0452 | | | | | |
| 16 | 612 බලසේනා මූලස්ථානය | 59.1234 | | | | මාන්තෙයි නැගෙනහිර | 24.06.2013 |
| 17 | විශේෂ සටන් පුහුණු පාසල කමාන්ඩෝ රෙජිමේන්තුව | 162 | | | | වෙඩිතලතිවු | 18.07.2013 |
| | | | | | | මන්නාරම | |
| 18 | 9 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 8 | | | | වවුනියා | 26.07.2013 |
| 19 | 613 බලසේනා මූලස්ථානය | | 10 | | | මඩු | 30.07.2013 |
| 20 | 2 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 11.2 | | | | අනුරාධපුරය | 30.07.2013 |
| 21 | 19 (ස්වේච්ඡා) ගජබා රජිමේන්තුව | 2.5 | | | | ඔඩ්ඩුසුඩාන් | 07.08.2013 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 22 | 53 සේනාංක මූලස්ථානය | 20 | | | | ඉනාමළුව | 13.08.2013 |
| 23 | සේවා බලකා පුහුණු පාසල | 8 | | | | අනුරාධපුරය | 15.08.2013 |
| 24 | 24 ශ්‍රී ලංකා පාබල හමුදාව | 12 | | | | සෙට්ටිකුලම් | 26.08.2013 |
| 25 | 623 බලසේනා මූලස්ථානය | 12 | | | | වැලිඔය | 05.09.2013 |
| 26 | 613 බලසේනා මූලස්ථානය | 3.2 | | | | මඩු | 06.09.2013 |
| 27 | 61 සේනාංක මූලස්ථානය | 40 | | | | පුරවසන්කුලම් | 09.09.2013 |
| 28 | 2 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | 40.4 | | | | සෙට්ටිකුලම් | 09.09.2013 |
| 29 | 26 ශ්‍රී ලංකා පාබල හමුදාව | 5<br>0.75 | | | | පෙරියමඩු | 13.09.2013 |
| 30 | 20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 4 | | | | මඩු | 16.09.2013 |
| 31 | 20 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 8 | | | | මාන්තෙයි | 16.09.2013 |
| 32 | උසස් පාබල බණ්ඩ පුහුණු පාසල | 10 | | | | වවුනියා | 25.09.2013 |
| 33 | 4 වන ගැමුණු හේවා බලකාය | 10 | | | | අගුනුවැල්පැලැස්ස | 25.09.2013 |
| 34 | 24 වන ගජබා රෙජිමේන්තුව | 4 | | | | මඩු | 04.10.2013 |
| 35 | 33 වන ශ්‍රී ලංකා ජාතික ආධුනිකත්ව බලමුළුව<br>(2 වන යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව) | 15 | | | | කරුම්පුලියන් මුන්ඩිමුරුප්පු | 14.10.2013 |
| 36 | ශ්‍රී ලංකා යුද්ධ හමුදා තූර්ය වාදක කණ්ඩායම | 0.3647 | | | | මෙට්ලන්ඩ් පෙදෙස | 24.01.2013 |
| 37 | රෙජිමේන්තු මූලස්ථානය ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | | 25 | | | හෙරලියාවල<br>කුරුණෑගල | 07.03.2013 |
| 38 | රෙජිමේන්තු මූලස්ථානය විශේෂ බලකාය | 0.2628<br>0.456 | | | | සීදුව | 07.03.2013 |
| 39 | අභිමංසල 2 | 4.4623 | | | | මාතර අතුරලිය | 09.04.2013 |
| 40 | 142 බලසේනා මූලස්ථානය | | 36 | 2 | 2.3 | දෙහිවල අත්තිඩිය | 29.04.2013 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 41 | 16(ස්වේච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාව | 3.9264 | | | | ඉංගිරිය | 03.06.2013 |
| 42 | රෙජිමේන්තු මූලස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය | 2.6475 | | | | කිරුළපන | 17.08.2013 |
| 43 | 11 වන ශ්‍රී ලංකා සංඥාව බලකාය | 0.0585 | | | | හෝමාගම | 23.08.2013 |
| | | 1.2141 | | | | පුවක්පිටිය | |
| 44 | 1 වන විජයබාහු පාබල රෙජිමේන්තුව | 4.08 | | | | පුත්තලම | 21.10.2013 |
| 45 | සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය, ගැරිසන් ඉංජිනියරින් (ට්‍රිපොලි) | | | 2 | 7.53 | කොලොන්නාව | 19.11.2013 |
| | | | | | | ඔරුගොඩවත්ත | |
| 46 | 111 බලසේනා මූලස්ථානය | 1.259 | | | | දොළුව | 01.03.2013 |
| 47 | 2 වන ශ්‍රී ලංකා රයිෆල් බලකාය | 2.2135 | | | | නවදෙව්ට | 21.03.2013 |
| | | | | | | ගම්පොල | |
| 48 | 5(ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 2.173 | | | | මහබේරියතැන්න | 03.06.2013 |
| 49 | රෙජිමේන්තු මූලස්ථානය විශේෂ බලකා රෙජිමේන්තුව | 5.1095 | | | | පල්ලෙපොල | 19.06.2013 |
| | | 23.2085 | | | | නාලන්දාවත්ත | |
| 50 | 11 සේනාංක මූලස්ථානය | 0.2 | | | | නුවර | 30.07.2013 |
| | | | | | | බහිරවකන්ද | |
| 51 | 112 බලසේනා මූලස්ථානය | 1.6523 | | | | බදුල්ල | 08.08.2013 |
| | | | | | | එලදළුව වත්ත | |
| 52 | 20(ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුව | 12.8311 | | | | කරච්චි | 25.06.2013 |
| | | | | | | අනවිලදන්කුලම් | |
| 53 | 10(ස්වේච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාව | 3.5395 | | | | මාන්තෙයි තැගෙනහිර | 26.06.2013 |
| 54 | 19 වන ශ්‍රී ලංකා පාබල හමුදාව | 20 | | | | මුලන්කාවිල් | 29.06.2013 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 55 | **653** බලසේනා මූලස්ථානය | 10 | | | | තුනුක්කායි | 29.06.2013 |
| 56 | **15**(ස්වේච්ඡා) ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 3.8647 | | | | ඔඩ්ඩුසුඩාන් | 10.07.2013 |
| 57 | **7** වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | 5 | | | | කරච්චි | 26.07.2013 |
| 58 | **8** වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 5 | | | | තුනුක්කායි | 26.07.2013 |
| 59 | **11**(ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව | 10 | | | | පූනගරි | 01.08.2013 |
| 60 | **652** බලසේනා මූලස්ථානය | 16 | | | | අක්කිරියන් | 05.08.2013 |
| 61 | **663** බලසේනා මූලස්ථානය | 2 | | | | කිරන්චි | 05.08.2013 |
| 62 | **20** වන ගජබා රෙජිමේන්තුව | 12 | | | | තුනුක්කායි | 05.08.2013 |
| 63 | **5**(ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව | 2 | | | | කිරන්චි | 06.08.2013 |
| 64 | **7** වන ශ්‍රී ලංකා පාබල හමුදාව ‘සී’ අනුබණ්ඩය | 1 | | | | කරච්චි | 06.08.2013 |
| 65 | **27** වන ශ්‍රී ලංකා ජාතික අධූනිකත්ව බලමුළුව | 0.8<br>2<br>4 | | | | පූනරින් පළෙයි | 12.08.2013 |
| 66 | **2** වන කමාන්ඩෝ රෙජිමේන්තුව | 20 | | | | තුනුක්කායි | 13.08.2013 |
| 67 | **5**(ස්වේච්ඡා) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව | 1.6 | | | | අර්සපුරකුලම්<br>පූනරින් | 14.08.2013 |
| 68 | **4** වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව | 8 | | | | කන්දාවේලි | 15.08.2013 |
| 69 | **21**(ස්වේච්ඡා) ශ්‍රී ලංකා පාබල හමුදාව | 19.8 | | | | තුනුක්කායි<br>ආලන්කුලම් | 04.10.2013 |
| 70 | **66** වන සේනාංක මූලස්ථාන බලඇණි පුහුණු පාසල | 8 | | | | පූනරින් | 12.10.2013 |
| 71 | **31** වන ජාතික ආරක්ෂක බලමුළුව | 1 | | | | කරප්පට්ටමුරිප්පු | 14.10.2013 |
| 72 | **574** බලසේනා මූලස්ථාන පුහුණු | 10 | | | | අම්පකාමම් | 21.10.2013 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 73 | 574 බලසේනා මූලස්ථාන වෙඩි පිටිය | 10 | | | | අම්පකාමම් | 21.10.2013 |
| 74 | 651 බලසේනා මූලස්ථානය | 8 | | | | නාගපට්ටුවාන් | 31.10.2013 |
| 75 | 3 වන ගජබා රෙජිමේන්තුව | 3 | | | | ඕලුමඩු | 07.11.2013 |
| | | | | | | අම්පකාමම් | |
| 76 | 3 වන ගජබා රෙජිමේන්තුව | 1 | | | | මාන්කුලම් | 07.11.2013 |
| | | 1 | | | | ඕලුමඩු | |
| | | 1 | | | | මාන්කුලම් | |
| | | 4 | | | | අම්පකාමම් | |
| 77 | 20 වන ගජබා රෙජිමේන්තුව | 4 | | | | තුනුක්කායි | 20.11.2013 |
| 78 | 57 වන සේනාංක මූලස්ථානය පාලන ප්‍රදේශය | 2.2085 | | | | කරච්චි | 29.11.2013 |
| 79 | 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාව | 10 | | | | මුල්ලියාවේලි දකුණ | 24.07.2013 |
| 80 | 14 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව | 10 | | | | ඔඩ්ඩුසුඩාන් | 25.07.2013 |
| | | 40 | | | | | 25.09.2013 |
| 81 | 23 වන විජයබාහු පාබල රෙජිමේන්තු මධ්‍යස්ථානය | 4 | | | | ඔඩ්ඩුසුඩාන් | 08.08.2013 |
| 82 | 592 බලසේනා මූලස්ථානය | 3 | | | | මුලතිව් | 14.08.2013 |
| 83 | 11 වන ශ්‍රී ලංකා කාල තුවක්කු හමුදාව | 14.1 | | | | කන්දාවේලි | 21.08.2013 |
| 84 | 20(ස්වේච්ඡා) ගැමුණු හේවා බලකාය | 2 | | | | මුල්ලියාවේලි | 21.08.2013 |
| 85 | 68 වන සේනාංක මූලස්ථානය | 10.6 | | | | මුලතිව් | 22.08.2013 |
| 86 | 19 වන ගැමුණු හේවා බලඇණිය | 3 | | | | ඔඩ්ඩුසුඩාන් | 29.08.2013 |
| 87 | 16 වන ගජබා රෙජිමේන්තුව | 4 | | | | ඔඩ්ඩුසුඩාන් | 12.09.2013 |
| | | 2.5 | | | | නාගචෝලෙයි | |
| | | 2.5 | | | | තන්නිමුරුප්පු | |
| | | 2.5 | | | | කාලමුරිප්පු | |
| | | 2.5 | | | | ඔටියාමලෙයි | |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) | (ඌ) |
|---|---|---|---|---|---|---|---|
| 88 | 5 වන ශ්‍රී ලංකා සංඥා බලකාය | 5 | | | | පුදුකුඩුඉරිප්පු | 07.10.2013 |
| 89 | 29 වන ජාතික ආරක්ෂක බලමුළුව මූලස්ථානය | 2 | | | | සිවනගර් | 08.10.2013 |
| | 29 වන ජාතික ආරක්ෂක බලමුළුව විජයග්‍රාහී ස්මාරකය | 3 | | | | | |
| 90 | 682 බල්සේනා මූලස්ථාන ගොවිපොල | 5 | | | | පුතුකුඩුඉරිප්පු | 15.10.2013 |
| 91 | 68 සේනාංක මූලස්ථාන පාබල අනුබණ්ඩ පුහුණු පාසල/වෙඩි පිටිය | 15 | | | | පුතුකුඩුඉරිප්පු | 15.10.2013 |
| 92 | 17 වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 10 | | | | පුතුකුඩුඉරිප්පු | 21.10.2013 |
| 93 | 683 බලසේනා මූලස්ථානය | 4 | | | | පුතුඩුකුඩුඉරිප්පු | 08.11.2013 |
| 94 | 641 බලසේනා මූලස්ථානය | 4 | | | | පුතුඩුකුඩුඉරිප්පු | 13.11.2013 |
| | | 5 | | | | | 03.12.2013 |

## ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. යුද හමුදා නිලධාරින්ගේ/සෙසුනිලයින්ගේ ගමන් පාලන කටයුතු සඳහා ස්ථාපිත කර තිබූ ගමන් පාලන අංශය 1994 වර්ෂයේ යුද හමුදා චර්යා නියෝග 18/94 ට අනුව ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස ස්ථාපනය කරන ලදි.

2. ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රී ලංකාව තුල හා ඉන් පිටත සියලුම ගොඩබිම්, දුම්රිය, ගුවන්, නාවික මාර්ගයෙන් සිදුවන ප්‍රවාහනය (සෙබලුන්/ ද්‍රව්‍ය) පාලනය කිරිම සිදුවේ. මෙම කාර්ය භාරයන් කරගෙනයාම සඳහා ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සංවිධානාත්මක සටහන පහත සඳහන් අයුරු වේ.

අ. නාවික කටයුතු අංශය.

ආ. විදේශ සංචාර අංශය.

ඇ. බස් /දුම්රිය ගමන් බලපත්‍ර අංශය.

ඈ. පාලන අංශය.

### වගකීම්

3. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය උපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ පාලනය වේ.

4. යුධ හමුදාවට අයත් මිනිසුන් සහ ද්‍රව්‍යයන් ප්‍රවාහනය කිරිමේදි ඒවා අතර ප්‍රතිපත්තින් අනුව ක්‍රියාත්මක කිරිම සම්බන්ධව සොයා බැලීම.

5. තවද පහත සඳහන් කරුණු වෙනුවෙන්ද වගකිව යුතු වේ.

අ. ගොඩබිම්, දුම්රිය, ගුවන් නාවික මගින් සිදුවන සියලුම ගමන් සැළසුම් කර සම්බන්ධීකරණය කිරිම ඇතුලුව ඒවා ක්‍රියාත්මක වනවාද යන්න සොයා බැලීම.

ආ. අතරමැදි කඳවුරුවල සහ ගමන් පාලන මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය සහ කාර්මික පාලනය.

### කාර්ය භාරයන්

7. ගමන් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරයන් පහත සඳහන් පරිදි වේ.

අ. ගොඩබිම්, දුම්රිය, ගුවන් හා නාවික මගින් සිදුවන සියලුම ගමන් සැළසුම් කර සම්බන්ධීකරණය කිරිම.

ආ. අතරමැදි කඳවුරුවල සහ ගමන් පාලන මධ්‍යස්ථානවල ක්‍රියාකාරිත්වය සහ කාර්මික පාලනය.

ඇ. පිටතවාසී නිලධාරි/සෙසුනිලයින් හට නිදහස් බස් ගමන් බලපත්‍ර නිකුත් කිරිම.

ඈ. විදේශ පාඨමාලා/සංචාර සඳහා සහභාගී වන නිලධාරි/සෙසුනිලයින් හට ගුවන් යානාපත්‍ර සහ අමතර භාණ්ඩ ප්‍රවාහනය කිරිම සඳහා පහසුකම් සළසා දීම.

### වාර්ෂික සමාලෝචනය

8. දිවයින තුළ හා පිටත ගොඩබිම්, දුම්රිය, ගුවන් හා නාවික මගින් සිදුවන සියලුම ගමන් සැලසුම් කර සම්බන්ධීකරණය කිරීම.

9. <u>ගුවන්/මුහුදු සහ දුම්රිය</u>. ගුවන්/මුහුදු සහ දුම්රිය මගින් නිවාඩු ලබා පැමිණෙන හා නිවාඩු අවසන්ව නැවත රපෝර්තු කරන නිලධාරී/සෙසුනිලයින් සහ ඒ 9 මාර්ගය ඔස්සේ භාණ්ඩ හා භටපිරිස් ප්‍රවාහනය කිරීම.

අ. <u>අතරමැදි කඳවුර (රත්මලාන)</u>.

(1) 2013 වර්ෂයේ ගුවන් මගින් 9140 ක භටපිරිස් ප්‍රමාණයක් සහ කි.ග්‍රෑ. 32187.5 ක් රත්මලාන සිට පලාලි දක්වා ප්‍රවාහනය කරන ලදී.

(2) අතරමැදි කඳවුර (රත්මලාන) වෙත රපෝර්තු කරන අමතර භටපිරිස් දුම්රිය මගින් අතරමැදි කඳවුර (අනුරාධපුර) දක්වා රපෝර්තු කර යුද හමුදා බස් රථ මගින් යාපනය දක්වා ප්‍රවාහනය කරන ලදී.

ආ. <u>අතරමැදි කඳවුර (අනුරාධපුර)</u>.

(1) මුලිකව සිවිල් බස් රථ 02 ක් මගින් අනුරාධපුර සිට යාපනය දක්වා භටපිරිස් ප්‍රවාහනය කරන ලදී.

(2) අනුරාධපුරය සිට යාපනය දක්වා භටපිරිස් 11626 ක් ප්‍රවාහනය කිරීමට සේනාවිධායක විසින් කටයුතු කරන ලදී.

ඇ. <u>අතරමැදි කඳවුර (කන්කසන්තුරය)</u>.

(1) 5 වන ශ්‍රීලංකා යුද හමුදා සේවා බලකාය විසින් බස් රථ 15 ක් මගින් කන්කසන්තුරය සිට ඒ 9 මාර්ගය ඔස්සේ භටපිරිස් ප්‍රවාහනය කරන ලදී.

(2) කන්කසන්තුරය සිට අනුරාධපුරය දක්වා භටපිරිස් 19768 ක් ප්‍රවාහනය කිරීමට සේනාවිධායක විසින් කටයුතු කරන ලදී.

ඈ. <u>දුම්රිය මගින් මගීන් / භාණ්ඩ ප්‍රවාහනය කිරීම</u>.

(1) මෙම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මගීන් සහ භාණ්ඩ දුම්රිය මගින් ප්‍රවාහනය කරන ලදී.

(2) රු. 54,070,226.80 ක් වටිනා නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර සහ රු. 14,070,946.97 ක් වටිනා රාජකාරී දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කරන ලදී.

(3) දුම්රිය ගැල් මගින් කොළඹ සිට අනුරාධපුරය සහ අනෙකුත් ප්‍රදේශ වෙත භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා රු. 5,271,529.76 ක මුදලක් වැයකර ඇත.

(4) 2013 වර්ෂය සඳහා මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මුදල් ප්‍රතිපාදන වැය ශීර්ෂයන් පහත සඳහන් පරිදි වේ.

(අ) <u>දුම්රිය ගමන් සඳහා ප්‍රතිපාදන</u>

| | |
|---|---|
| වැය ශීර්ෂ අංකය | - 222-01-2-1401 (ii) |
| 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන | - රු. 15,000,000.00 |

(ආ) <u>වියදම් - 2013 වර්ෂය</u>

| | |
|---|---|
| මුයුග (මරදාන) | - රු. 4,925,691.68 |
| ඉසේඅම | - රු. 345,838.08 |
| 2013 වර්ෂය සඳහා මුලු වියදම | - රු. 5,271,529.76 |
| 2013 වර්ෂය සඳහා ප්‍රතිපාදන | - රු. 15,000,000.00 |
| 2013.12.31 දිනට මුලු වියදම | - රු. 5,271,529.76 |
| පොදු 35 මගින් මුදල් අම වෙත ලබාදීම | - රු. 4,816,332.16 |
| 2013 වර්ෂය සඳහා ඉතිරි ප්‍රතිපාදන | - රු. 9,728,470.24 |

ඉ. <u>නාවික අංශය</u>. හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරීන් සඳහා රපෝර්තු කර ඇති හමුදාපිරිස් සඳහා අවශ්‍ය අත්‍යවශ්‍ය භාණ්ඩ අවස්ථා දෙකකදී එනම් 2013.06.29 දින සහ 2013.12.19 දින අඩි 40 කන්ටේනර් බහාලුම් 02 ක් මගින් භාණ්ඩ ප්‍රවාහනය කරන ලදී.

ඊ. <u>විදේශ සංචාර අංශය</u>.

(1) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2008.04.24 දිනැති චක්‍රලේඛන PE/FS/01/XXXV හි සඳහන් පරිදි නිලධාරි/සෙසුනිලයින් සඳහා පාඨමාලා/සම්මන්ත්‍රණ/අධ්‍යාපන චාරිකා සඳහා ගුවන් යානාපත්‍ර හා අමතර භාණ්ඩ යානාපත්‍ර සකසන ලදී.

(2) යුද හමුදාපතිගේ උපදෙස් පරිදි ආරක්ෂක සමුලුව 2013 සඳහා සහභාගී වන ලද ආරාධිත දේශකයින් සඳහා ගුවන් යානාපත්‍ර සකසන ලදී.

උ. <u>බස්ගමන් බලපත්‍ර සහ දුම්රිය ගමන් බලපත්‍ර අංශය</u>

(1) <u>නිදහස් බස්ගමන් බලපත්‍ර</u>. පිටතවාසීන් සඳහා තම නිවසේ සිට සේවා ස්ථානය දක්වා (සැතපුම් 30 ට අඩු) ශ්‍රී ලංගම බස්රථ මගින් නොමිලේ ප්‍රවාහන පහසුකම් ලබාගැනීම සඳහා රු. 103,634,523.30 ක් වටිනා නිදහස් බස්ගමන් බලපත්‍ර ලබාදෙන ලදී.

(2) <u>රාජකාරි බස්ගමන් බලපත්‍ර</u>. යුද හමුදා වාහන පහසුකම් නොමැති අවස්ථා වලදී විවිධ ස්ථාන දක්වා රාජකාරීන් සඳහා ගමන් ගැනීමට රු. 10,305,097.32 ක් වටිනා රාජකාරි බස්ගමන් බලපත්‍ර ලබාදෙන ලදී.

(3) <u>රාජකාරි දුම්රිය ගමන් බලපත්‍ර</u>. විවිධ පාලන රාජකාරීන් සඳහා ගමන් ගැනීමට රු. 14,070,946.97 ක් වටිනා රාජකාරි දුම්රිය ගමන් බලපත්‍ර ලබාදෙන ලදී.

(4) <u>නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර</u>. යුද හමුදා අයවලුන් සහ සිවිල් සේවකයන් සඳහා රු. 54,070,226.80 ක් වටිනා නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර ලබාදෙන ලදී.

**<u>මූල්‍යමය විස්තරය</u>**

10. 2013 වර්ෂයේ මුහුදු මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම, ගුවන් යානාපත්‍ර සැකසීම, නිදහස් බස් ගමන් බලපත්‍ර, දුම්රිය ගැල් මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම, නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර, රාජකාරි දුම්රිය ගමන් බලපත්‍ර හා රාජකාරි බස්ගමන් බලපත්‍ර පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | 2013 වර්ෂය සඳහා ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය 67 | අමතර ප්‍රතිපාදන ප්‍රමාණය | මුළු ප්‍රතිපාදන ප්‍රමාණය | 2013.12.31 දිනට මුළු වියදම | 2013.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |
| 1. | ගුවන් යානාපත්‍ර සැකසීම හා අමතර භාණ්ඩ ප්‍රවාහනය 222-01-1-1102(II) | 5,930,000.00 | (2,559,990.00) | 3,370,010.00 | 11,589,152.00 | -8,219,142.00 |
| 2. | ගුවන් යානාපත්‍ර සැකසීම හා අමතර භාණ්ඩ ප්‍රවාහනය 222-01-1-2401(IV) | 35,000,000.00 | 15,000,000.00 | 50,000,000.00 | 65,146,231.26 | -15,146,231.26 |
| 3. | එජාසාසා රාජකාරීන් සඳහා ගුවන් යානාපත්‍ර සැකසීම හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම 6000-0-0-15-0-103-01 | 30,000,000.00 | - | 30,000,000.00 | 29,969,356.00 | 30,644.00 |
| 4. | එජාසාසා රාජකාරීන් සඳහා ගුවන් යානාපත්‍ර සැකසීම හා භාණ්ඩ ප්‍රවාහනය කිරීම (විශේෂ) 6000-0-0-15-0-103-01 | 2,801,120.00 | - | 2,801,120.00 | 2,801,120.00 | - |
| 5. | මුහුදු මගින් භාණ්ඩ ප්‍රවාහනය සහ ශ්‍රමිකයින්ට ගාස්තු ගෙවීම 222-01-1-1401(I) | 12,000,000.00 | - | 12,000,000.00 | 6,266,984.35 | 5,733,015.65 |
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) | (ඊ) | (උ) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6. | මුහුදු මගින් භාණ්ඩ ප්‍රවාහනය සහ ශ්‍රමිකයින්ට ගාස්තු ගෙවීම 222-01-1-2401(IV) | 5,000,000.00 | - | 5,000,000.00 | 1,195,712.87 | 3,804,287.13 |
| 7. | එජාසාසා රාජකාරීන් සඳහා මුහුදු මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ ශ්‍රමිකයින්ට ගාස්තු ගෙවීම (විශේෂ) 6000-0-0-15-0-103-01 | 2,415,630.00 | - | 2,415,630.00 | 2,415,630.00 | - |
| 8. | දුම්රිය ගැල් මගින් භාණ්ඩ ප්‍රවාහනය 222-01-2-1401(II) | 15,000,000.00 | - | 15,000,000.00 | 9,656,206.48 | 5,343,793.52 |
| 9. | නිදහස් බස්ගමන් බලපත්‍ර 114-02-3-1503-2-02 | 52,669,930.00 | - | 52,669,930.00 | 103,634,523.30 | -50,964,593.30 |
| 10. | නිවාඩු දුම්රිය බලපත්‍ර 222-01-1-1003(iv) | 46,000,000.00 | - | 46,000,000.00 | 54,070,226.80 | -8,070,226.80 |
| 11. | රාජකාරී දුම්රිය බලපත්‍ර 222-01-1-1101(i) 222-01-4-1101(i) | 18,200,000.00 | - | 18,200,000.00 | 14,070,946.97 | 4,129,053.03 |
| 12. | රාජකාරී බස් ගමන් බලපත්‍ර 222-01-1-1101(ii) | 10,000,000.00 | - | 10,000,000.00 | 10,305,097.32 | -305,097.32 |

## ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කාර්යය හා කර්තව්‍යයන් වඩාත් පුළුල්ව මේ වසරේද මහා පරිමාණ ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදි. විශේෂයෙන් දැයට කිරුළ - 2013, ජාතික නිදහස් දින සැමරුම, විජයග්‍රහණ පෙළපාළිය වැනි අවස්ථාවන්හිදී මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුකරන ලදි. තවද, මානව සම්පත/වෘත්තිය සෙබළුන් යෙදවීම, සැලසුම් කිරීම, කළමණාකරනය හා සංවර්ධනය කිරීම විශාල අභියෝගාත්මක මෙන්ම සංකීර්ණ කර්තව්‍යයක් වන අතර, ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය එකී සියළුම අභියෝග ජයගැනීමටත් සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව අවසන් කිරීමටත් හැකි විය.

### වගකීම්

2. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත පරිදි වේ.

අ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියළුම ඉංජිනේරු සේවා කටයුතු සඳහා යුද්ධ හමුදාධිපති තුමා වෙත තාක්ෂණික උපදෙස් ලබාදීම.

ආ. ඉංජිනේරු උපකරණ පිළිබඳව තොග පවත්වා ගැනීම, ඉංජිනේරුමය උපකරණ නඩත්තුව, ඉංජිනේරු සේවා බලකා ඒකකයන් හි තොග තත්වය අධීක්ෂණය සහ ඇණවුම් පිළිබඳව පුරෝකථනය කිරීම.

ඇ. ඉංජිනේරු සේවා බලකා ඒකකයන් හී ප්‍රධාන ගිණුම අධීක්ෂණය කිරීම

ඈ. සියළුම ඉංජිනේරු සේවා සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා යුද්ධ හමුදාධිපති තුමා වෙත උපදෙස් ලබාදීම.

ඉ. ඉංජිනේරු සේවා භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම, තොග නඩත්තු කිරීම, ගබඩා කිරීම, බෙදාහැරීම හා අයෝග්‍ය කිරීම ආදී කටයුතු සඳහා පිළිවෙත් සකස් කිරීම.

ඊ. ඉංජිනේරු සේවා පිළිවෙතට අනුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් ස්ථාන ගත කිරීම හා සැලසුම් කිරීම, මිනුම් කටයුතු සිදුකිරීම, ඇස්තමේන්තු සැකසීම, ගොඩනැගිලි සහ කාර්යයන් හි පිරිවිතරයන් සකස් කිරීම සිදුකිරීම ආදී කටයුතු සඳහා පිළිවෙත් සකස් කිරීම.

### කාර්යයන්

2. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය හා කර්තව්‍ය පහත පරිදි වේ.

අ. යුද්ධ හමුදාවේ සියළුම ගොඩනැගිලි ආශ්‍රිත අනෙකුත් පහසුකම් එනම් විදුලිය, ජලය සැපයීම, කසළ අපවහන පද්ධති වැනි ඒ ආශ්‍රිත නඩත්තු සේවාවන් සිදුකිරීම.

ආ. මූලධන සේවාවන් ඉටුකිරීම සහ කොන්ත්‍රාත් සේවාවන් අධීක්ෂණය කිරීමෙහි වගකීම.

ඈ. සියළුම යුද හමුදා ඉංජිනේරු ඉදිකිරීම් සබැඳි ඉංජිනේරු නිර්මාණ සඳහා සැලසුම් සකස් කිරීම, සැලසුම්පත් සැකසීම සහ පිරිවිතරයන් සැකසීම සඳහා වගකීමකි.

ඇ. යුද්ධ හමුදාවේ සියළුම තාවකාලික කඳවුරු, ස්ථිර කඳවුරු සඳහා විදුලිය, ජල සම්පාදනය සහ සනීපාරක්ෂක සේවා සැපයීම වගකීම.

ඉ. යුද්ධ හමුදාවේ සියළු ගොඩනැගිලි ඉතා හොඳ තත්වයෙන් පවත්වා ගැනීම සඳහා ඉසේරෙ පිලිවෙතට අනුව අඛණ්ඩව පරීක්ෂාවට ලක්කිරීම.

ඊ. හදිසි අවස්ථාවකදී/ජාතික අවශ්‍යතාවන්හිදී ජලය සම්පාදනය, විදුලිය සැපයීම සහ ඒවායේ නඩත්තු කටයුතු සඳහා සිවිල් ආයතන වෙත සහාය ලබාදීම.

<u>වාර්ෂික කාර්ය සාධනය</u>

4. **2013** වර්ෂය ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ වඩාත් ඵලදායි වර්ෂය ලෙස නම් කල හැක. 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතියෙහි කොළඹ හා අනුරාධපුර ඉදිකිරීම් කටයුතු, තුරඟ තරඟ පිටිය අන්තර් ජාතික ක්‍රිඩාංගණයේ ප්‍රධාන ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම් අවසන් කොට මහජනතාව වෙත විවෘත කරලීම, එම මුදල් වර්ෂයේදී සිදුකරන ලදි. ඊට අමතරව රටේ සංවර්ධන ක්‍රියාදාමයට සහය දීමක් වශයෙන් ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘතියක් ලෙස කොළඹ ස්වර්ණාභරණ වෙළඳසැලහි අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම, පුරාවිද්‍යා කෞතුකාගාරය අනුරාධපුර ප්‍රදේශයේ දී අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීම, පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙනේ මහල් **06** කින් යුත් ගොඩනැගිල්ල නිමකිරීම මේ වසරේදී සනිටුහන් විය.

5. දැයට කිරුළ - **2013** අම්පාර ප්‍රදේශයේදී පැවැත්වූ අතර, ඒ සඳහා ඉංජිනේරු සේවා සහාය ලබාදීම, ඊට සමගාමීව **64** වන නිදහස් දින ඉංජිනේරු සේවා කටයුතු සිදුකරන ලදි. තවද, කොළඹදී පැවති මානුෂීය මෙහෙයුම විජයග්‍රහණ උත්සවය සාර්ථකව අවසන් කිරීමටත් හැකිවිය.

<u>වාර්ෂික සමාලෝචනය</u>

6. මෙම වර්ෂය තුලදී සිවිල් දෙපාර්තමේන්තු වෙත 'වෝටර්පෝල්' මෙහෙයුම 'ක්ලීන් අප්' මෙහෙයුම හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ කොළඹ සංවර්ධන සැලැස්ම සඳහා ඉංජිනේරු සේවා සහාය ලබාදෙන ලදි.

7. <u>ජාතික සංවර්ධන ව්‍යාපෘතීන්</u>. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිදුවන ඉදිකිරීම් හී සාරාංශ සටහනක් පහත පරිදි දක්වා ඇත.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ඒකකය | ඇස්තමේන්තු ගත මුදල | ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| 1. | අනුරාධපුර පුරාවිද්‍යා කෞතුකාගාරයේ නවීකරණ කටයුතු | **2** වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | මිලියන **53** | ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
|---|---|---|---|---|
| 2. | ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ප්‍රදේශයේ සංඝාවාස 11ක් ඉදිකිරිමේ සේවාව (නන්දිමිත්‍රගම, සැලලිහිණිගම, නාමල්ගම, බෝගස්වැව) | 2 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | මිලියන 14 | බෞද්ධ කටයුතු අමාත්‍යාංශය |
| 3. | පොලොන්නරුව රාජකීය විද්‍යාලයේ නවීකරණ කටයුතු | 3 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | මිලියන 55.81 | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4. | ‘අපි වෙනුවෙන් අපි’ නිවාස ව්‍යාපෘතිය - අනුරාධපුර | 4(සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 103 | අපි වෙනුවෙන් අපි අරමුදල |
| 5. | ‘අපි වෙනුවෙන් අපි’ නිවාස ව්‍යාපෘතිය - කොළඹ | 4(සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 94 | අපි වෙනුවෙන් අපි අරමුදල |
| 6. | ලායා ලෙපර් හි පිළිගැනීමේ ශාලාවේ නවීකරණ කටයුතු - කුකුලේගඟ | 4 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | අමුද්‍රව්‍ය මිලදී ගැනීම - සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩ | සුහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය |
| 7. | කොළඹ - රේස් කෝස් ක්‍රීඩාංගණයේ ප්‍රධාන ප්‍රේක්ෂකාගාරයේ නවීකරණ කටයුතු | 6 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 500 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 8. | පැපිලියාන විහාරස්ථානයේ සයමහල් සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම | 6 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 44 | පැපිලියාන විහාරස්ථානය |
| 9. | උඩමළුවේ සංඝාවාස ඉදිකිරීම | 9 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 31.07 | |
| 10. | ගාල්ල - පැරණි ලන්දේසි රෝහල නවීකරණය කිරීම | 10 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 40 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 11. | වීරකැටිය වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීම | 10 (සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 06 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 12. | ඩී. ඒ. රාජපක්ෂ විද්‍යාලයේ වැට ඉදිකිරීම | 10(සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 3.5 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 13. | කතරගම, කිරිවෙහෙර හි භූගත ජල ටැංකිය හා පොකුණ ඉදිකිරීම | 10(සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව | මිලියන 4.9 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 14. | සෙල්ල කතරගම හි රථ ගාල ඉදිකිරීම | 10(සෙවේච්ඡා) ඉංජිනේරුසේවා රෙජිමේන්තුව) | මිලියන 01 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 15. | තිප්පුම 105' x 22' ප්‍රමාණයේ නිලධාරීන් 100 දෙනෙකු සඳහා ඉඩපහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම - බුත්තල | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 6,921,422.00 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
|---|---|---|---|---|
| 16. | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාව 96' x 34' දෙමහල් බැරැක්/සැර නිවස්නය ඉදිකිරීමේ ඉතිරි සේවාවන් | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 13,628,190.00 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 17. | රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය මීටර් 31.5 x මීටර් 7.5 දෙමහල් බැරැක්/සැර නිවස්නය ඉදිකිරීමේ ඉතිරි සේවාවන් | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 4,877,761.41 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 18. | නිලධාරි විවාහක නිවාස - මැනිං ටවුන් හි ජලාපවාහන පද්ධතිය නවීකරණය කිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 4,315,734.50 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 19. | රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය ගැමුණු හේවා බලකාය 100' x 20' ප්‍රමාණයේ තෙමහල් නිලධාරි ඉඩපහසුකම් ගොඩනැගිල්ල ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 3,877,365.33 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 20. | පානළුව වෙඩිපිටිය ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 1,401,790.50 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 21. | රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 95' x 40' ප්‍රමාණයේ මුළු තැන්ගෙය ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 13,155,367.63 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 22. | රෙජිමේන්තු මූලස්ථාන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව 33' x 15' ප්‍රමාණයේ වැසිකිළි පද්ධති 02 ක් ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 899,329.00 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 23. | 5(සෙවේච්ඡා) ශ්‍රීලංකා යුද හමුදා පොදුසේවා බලකායහි 30' x 120' ප්‍රමාණයේ පතුරම් ගබඩාව ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 3,156,369.70 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 24. | ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යා පීඨය හි 80' x 20' ප්‍රමාණයේ සෙසුනිල භට නිවාසය ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 1,999,977.10 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |
| 25. | කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසල හි 80' x 25' ප්‍රමාණයේ සෙසුනිල භට නිවාස ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය ඉදිකිරීම | 1 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව | 1,176,666.60 | යුද්ධ හමුදා ප්‍රතිපාදන |

8. ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ අනෙකුත් ජාතික සංවර්ධන ව්‍යාපෘතින්ට අමතරව ඉටු කරන ලද ප්‍රදාන ව්‍යාපෘති පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තර | කොන්ත්‍රාත් ආයතනය | ස්ථානය | සේවාව ප්‍රධානය කිරීමේ වටිනාකම |
|---|---|---|---|---|
| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
| | **1 ඉසේරෙ** | | | |
| 1. | වෙයන්ගොඩ වහලය අළුත්වැඩියා කිරීමේ අමතර/ වැඩිපුර සේවාවන් | හිරු කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් එන්ටර්ප්‍රයිසස් | මධ්‍යම අවි හා පතුරම් ගබඩාව - වෙයන්ගොඩ | 2,442,771.83 |
| 2. | 520 කේවීඒ විදුලි තොග සැපයුම ලබාදීම - රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය | ලංවිම - කොළඹ | රොක් හවුස් | 4,410,895.00 |
| 3. | 96' - 0" x 34' - 0" ප්‍රමාණයේ දෙමහල් හඨ නිවාසය ඉදිකිරීම යුද්ධ හමුදා රෝහල - පනාගොඩ | හිරු කන්ස්ට්‍රක්ෂන් හා එන්ටර්ප්‍රයිසස් | යුද්ධ හමුදා රෝහල (පනාගොඩ) | 24,646,388.48 |
| 4. | ක්‍රීඩා හා සුහසාධන සංවර්ධන ගොඩනැගිල්ලේ වහලය, දොරවල් හා ජනෙල් ඉදිකිරීම - රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු රෙජිමේන්තුව | ආර්එන් කන්ස්ට්‍රක්ෂන් (ප්‍ර) ලිමිටඩ් | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු රෙජිමේන්තුව - බෝයගනේ | 19,989,574.83 |
| 5. | දෙමහල් අධ්‍යාපන ගොඩනැගිල්ල ඉදිකිරීම (අදියර 1) (ව්‍යුහාත්මක ඉදිකිරීම්) - වියාඉබ ගන්නොරුව | නන්දිනු එන්ටර්ප්‍රයිසස් | ශ්‍රීලංකා යුධ හමුදා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණු පාසල - ගන්නෝරුව | 21,505,204.00 |
| 6. | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ දැව පොළව සපයා සවිකිරීමේ සේවාව | ආර්ක් හෝල්ඩින්ස් (ප්‍ර) ලිමිටඩ් | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු රෙජිමේන්තුව | 5,440,254.40 |
| 7. | සෙසුනිල පස්මහල් හට නිවාසය සඳහා ගිණි ආරක්ෂණ පද්ධතිය සපයා සවිකිරීමේ හා ප්‍රධානය | පෙන්ටන්ස් ලිමිටඩ් | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 3,678,640.00 |
| 8. | ගෘහස්ත ක්‍රීඩාගාරයේ දොරවල් හා ටෙම්පඩ් ග්ලාස් සපයා සවිකිරීම | කොමාර්ක් ඉංජිනියරින් (ප්‍ර) ලිමිටඩ් | රෙජිමේන්තු මධ්‍යස්ථානය විජයබාහු | 4,530,741.60 |
| 9. | තෙමහල් නිලධාරි නිවස්නයේ පෝසිලේන් ටයිල් හා ග්‍රැනයිට් සපයා ඇතිරීම | යුනිවසල් මාබල් ඇන්ඩ් ග්‍රැනයිට් (ප්‍ර) ලිමිටඩ් | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 20,156,359.95 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
|---|---|---|---|---|
| 10. | නිලධාරි නිවස්නයේ අත්වැට සකස් කිරීමේ සේවාව | නිව් සිරි ඉන්දු ඇන්ඩ් ක්‍රාෆ්ට්ස් | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා සන්නාහ සන්නද්ධ බලකාය | 2,363,732.49 |
| 11. | මීටර් 20 x මීටර් 18.3 සිවිමහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | අමිල් බිල්ඩර්ස් | යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය පනාගොඩ | 4,700,000.00 |
| 12. | ආඥාපුහුණු මූලස්ථානය හි 120’ x 30’ ප්‍රමාණයේ මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | ආඥා පුහුණු මූලස්ථානය - දියතලාව | 20,000,000.00 |
| 13. | යුගපති නිවාඩු බංගලාව හි දැව පොළව සපයා සවිකිරීමේ සේවාව | මර්කන්ටයිල් ෆෝචූන්ස් (ප්‍ර) ලිමිටඩ් | යුගපති නිල නිවස - දියතලාව | 5,873,418.32 |
| 14. | අභ්‍යන්තර මාර්ග පද්ධතියේ අමතර සේවාවන් | කසුන් එන්ටර්ප්‍රයිසස් | රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා සන්නාහ සන්නද්ධ බලකාය - රොක්හවුස් | 2,867,536.84 |
| 15. | 100’ x 40’ x 20’ ප්‍රමාණයේ ගුදම සැලසුම් කිරීම, ගැලපීම, ඉදිකිරීම | වින්සෙන් ඉංජිනියරින් (ප්‍ර) ලිමිටඩ් | මූලක යුධෝපකරණ ගබඩාව - රාගම | 35,167,118.58 |
| 16. | 630 කේවීඒ තොග විදුලි සැපයුම ලබාගැනීම | ලංවිම | අභිමංසල III | 5,387,095.00 |
| 17. | විවාහක නිවාස 24 කින් යුත් කොටස් 09 ක් ඉදිකිරීම (පැකේජ් 1) | ගුණතිලක කන්ස්ට්‍රක්ෂන් (ප්‍ර) ලිමිටඩ් | මැනිං ටවුන් | 11,325,609.76 |
| | **2 ඉසේරෙ** | | | |
| 1. | 90' - 0" x 36' - 0" x 22' - 0" ප්‍රමාණයේ සවිගැන්වූ කොන්ක්‍රීට් ගුදම් ගොඩනැගිල්ල ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 22,246,185.10 |
| 2. | නෙකලා විදුලි සැපයුම ලබාගැනීම | ලංවිම | 53 සේනාංක මූලස්ථානය | 6,197,250.00 |
| 3. | පිහිණුම් තටාකයේ සැලසුම්, ඉදිකිරීම් පිරිනැමීමේ අමතර සේවාවන් | වෝටර්වේස් ඉංජිනියරින් | 21 සේනාංක මූලස්ථානය | 2,514,823.36 |
| | **3 ඉසේරෙ** | | | |
| 1. | විදේශ නිලධාරි නිවස්න 02ක් ඉදිකිරීම(කොටස් 01) | බ්‍රයිට් බිල්ඩර්ස් | හය කාර්ය සම්පාදක විද්‍යාලය - ත්‍රිමලය | 13,732,148.48 |
| 2. | ජ්‍යෙෂ්ඨ නිලධාරි නිවස්න 06 ක් ඉදිකිරීම (කොටස් 03) | බ්‍රයිට් බිල්ඩර්ස් | හය කාර්ය සම්පාදක විද්‍යාලය - ත්‍රිමලය | 24,982,051.12 |

| (අ) | (ආ) | (ඇ) | (ඈ) | (ඉ) |
|---|---|---|---|---|
| 3. | කණිෂ්ඨ නිලධාරි නිවසන 06 ක් ඉදිකිරීම (කොටස් 03) | බ්‍රයිට් බිල්ඩර්ස් | හය කාර්ය සම්පාදක විද්‍යාලය - ත්‍රිමලය | 24,982,051.12 |
| 4. | 90' - 0" x 36' - 0" x 22' - 0" ප්‍රමාණයේ සවිගැන්වූ කොන්ක්‍රීට් ගුදම් ගොඩනැගිල්ල ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 23 සේනාංක මූලස්ථානය | 22,246,185.10 |
| | **5 ඉසේරෙ** | | | |
| 1. | 90' - 0" x 36' - 0" x 22' - 0" ප්‍රමාණයේ සවිගැන්වූ කොන්ක්‍රීට් ගුදම් ගොඩනැගිල්ල ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 22,246,185.10 |
| | **11 ඉසේරෙ** | | | |
| 1. | 90' - 0" x 36' - 0" x 22' - 0" ප්‍රමාණයේ සවිගැන්වූ කොන්ක්‍රීට් ගුදම් ගොඩනැගිල්ල ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | කොකාවිල් | 22,246,185.10 |
| | **6 ඉසේරෙ (සෙව්)** | | | |
| 1. | පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව සඳහා බස් නැවතුම් 57ක් ඉදිකිරීම | සැප් ප්‍රොජෙක්ට් ඩිවලෝප්මන්ට් ඇන්ඩ් සර්විසස් | කොළඹ | 19,419,834.00 |
| | **8 ඉසේරෙ (සෙව්)** | | | |
| 1. | නාරාහේන්පිට හමුදා රෝහල ඉදිකිරීම | | නාරාහේන්පිට | 1,039,641,903.47 |
| | **10 ඉසේරෙ (සෙව්)** | | | |
| 1. | අභිමංසල II කඹුරුපිටිය දැනට පිහිටුවා ඇති සෘජු අකුණු සන්නායක පද්ධතිය ස්ථිර ලෙස පිහිටුවීම සහ නවතමයෙන් වක්‍ර අකුණු සන්නායක පද්ධතිය ස්ථාපනය | මයික්‍රෝ පවර් ඉංජිනියරින් (ප්‍ර) ලිමිටඩ් | අභිමංසල II | 2,115,243.03 |
| 2. | 156' x 42' ප්‍රමාණයේ දෙමහල් මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 12 සේනාංක මූලස්ථානය | 20,000,000.00 |

**මූල්‍යමය විස්තරය**

9. **2013** වර්ෂය සඳහා මූලධන ප්‍රතිපාදන වෙන්කිරීම් පහත පරිදි වේ.

අ. <u>ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම</u>

| අනු අංකය | වැය ශීර්ෂය | 2013 වර්ෂයේ වෙන්කල මුදල | වියදම |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| 1. | 222-01-1-2001 - ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම් | 210,934,596.81 | 199,287,522.56 |
| 2. | 222-01-3-2001 - ගොඩනැගිලි පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම් | 91,625,083.00 | 78,479,247.15 |
| 3. | 222-01-3-2002II - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම | 2,500,000.00 | 352,093.00 |
| 4. | 222-01-1-2502I - වෙනත් ආයෝජන | 1,230,725,000.00 | 1,284,018,276.49 |
| 5. | 222-01-1-2502II - යුහරෝ(නාරා) | 600,000,000.00 | 634,654,092.03 |
| | එකතුව | 2,135,784,679.81 | 2,196,791,231.23 |

ආ. <u>ගොඩනැගිලි ඉදිකිරීම්</u>

| අනු අංකය | වැය ශීර්ෂය | 2013 වර්ෂයේ වෙන්කල මුදල | වියදම |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| 1. | 222-01-1-2104 - ඉදිකිරීම් | 761,279,307.48 | 663,827,059.57 |
| 2. | 222-01-3-2104 - ඉදිකිරීම් | 294,850,479.00 | 262,631,659.34 |
| | **එකතුව** | 1,056,129,786.48 | 926,458,718.91 |

.

ඇ. **2013** වර්ෂය පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පහත පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | 2013 වර්ෂයේ වෙන්කල මුදල | වියදම |
|---|---|---|---|
| | | රු. ශත | රු. ශත |
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |
| 1. | 222-01-2-1205XIX ජනක යන්ත්‍ර සහ ජලපොම්ප අමතර කොටස් මිලදී ගැනීම | 23,529,064.00 | 16,693,927.45 |
| 2. | 222-01-2-1205XX ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනීම | 181,227,607.84 | 118,457,491.52 |
| 3. | 222-01-2-1302II ජනක යන්ත්‍ර සහ ජලපොම්ප අළුත්වැඩියා කිරීම් | 13,854,218.00 | 9,936,423.49 |
| (අ) | (ආ) | (ඇ) | (ඇ) |

| | | | |
|---|---|---|---|
| 4. | 222-01-2-1303I<br>ගොඩනැගිලි හා වෙඩිතලා නඩත්තු | 4,601,579.00 | 4,456,730.54 |
| 5. | 222-01-2-1303II<br>(භූමි නඩත්තු) | 6,560,000.00 | 4,969,645.32 |
| 6. | 222-01-2-1405VIII<br>කසල ශෝධනය හා සනීපාරක්ෂාව | 1,000,000.00 | 339,813.48 |
| 7. | 222-01-2-1405XI<br>නොනිර්මාණ සේවා | 28,926,894.00 | 33,552,363.19 |
| 8. | 222-01-2-1403I<br>විදුලිය | 844,000,000.00 | 676,030,857.70 |
| 9. | 222-01-2-1403 IV<br>ජලය | 396,000,000.00 | 303,354,464.22 |
| | එකතුව | 1,449,699.84 | 1,167,791,716.91 |

## <u>සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය</u>

### <u>හැඳින්වීම</u>

1. සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා එහි අධ්‍යක්ෂ වන අතර ඔහු බ්‍රිගේඩියර් නිලය දරන්නෙකු වේ. යුද්ධ හමුදාවට අවශ්‍ය සැපයුම් හා ප්‍රවාහන කටයුතු මෙමගින් ඉටුකරනු ලබයි. මුහුදුබඩ ප්‍රවාහණය, ගුවන්, ආහාර, ජලය, ඉන්දන, ලිපිකරු අවශ්‍යතා රියදුරු හා රියදුරු බලපත්‍ර නිකුත් කිරිම සහ හදිසි අවශ්‍යතා වලිදි යුද්ධ හමුදාවට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයා ගැනිමට ද මෙම අධ්‍යක්ෂ මණ්ඩය මගින් සිදුකරනු ලබයි.

### <u>වගකිම</u>

2. සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය වනුයේ සමස්ත යුද්ධ හමුදාවේ සැපයීම් හා ප්‍රවාහන අවශ්‍යතාවයන් හා ආවරණ සේවාවන් සාම කාලයේදි හා යුද්ධ කාලයේදි ඉටුකිරිමයි. එම කාර්යයන් හා වගකීම් පහත පරිදි වේ.

අ. <u>සැපයීම්</u> සැපයීම් සේවාව ප්‍රධාන වශයෙන් කොන්ත්‍රාත් කැඳවීම, සලාක මිලදි ගැනිම, තොග රුස් කිරිම, තොග කලමනාකරණය කිරිම හා ඉන්ධන නිකුත් කිරිම, සලාක නිකුත් කිරිම හා ගිණුම් තැබීම යන කාර්යන්ගෙන් සමන්විත වේ. එසේම ආපසු ගෙවීමෙ පදනම මත අනෙකුත් හමුදා, ව්‍යාපෘති සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ හා ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත සලාක හා ඉන්ධන ලබාදෙනු ලැබේ.

ආ. <u>ප්‍රවාහන</u> සමස්ත යුද්ධ හමුදාවට අවශ්‍ය පළමු පෙළ/දෙවන පෙළ හා තුන්වන පෙළ ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ලබන අතර, එසේම අනෙකුත් හමුදාවන්, සංවර්ධන ව්‍යාපෘති සහ අනෙකුත් සංවිධාන වෙත යුද්ධ හමුදා මූලස්ථාන හා ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් මත ප්‍රවාහන පහසුකම් ලබාදෙනු ලබයි, එසේම “බී” වාහන නඩත්තුවද සිදු කරනු ලබයි.

ඇ. <u>ආවක්ෂණ සේවා</u> යුද්ධ හමුදාවේ භඨපිරිස් වෙත ලබාදෙනු ආවක්ෂණ සේවා පහත දැක්වේ.

(1) අවමංගල්‍ය බිල්පත් නිරවුල් කිරිම.

(2) වියලි දර, ගෑස් හා පිසුම් ඉන්ධන ලබාදිම හා ගිණුම් කටයුතු සිදුකිරිම.

(3) රජක සේවාව.

(4) “බී” වාහන රියදුරන් පුහුණු කිරිම.

(5) “බී” වාහන රියදුරන් පරික්ෂා කිරිම හා රියදුරු බලපත් නිකුත් කිරිම.

(6) ලිපිකරුවන් පුහුණු කිරිම.

(7) සූප සහයකයින් පුහුණු කිරිම.

(8) සූප සහයක උපදෙස් යුද හමුදා ඒකක වෙත ලබා දීම.

(9) බේකරි අවශ්‍යතා සපුරාලීම

### <u>සැපයීම් (ආවක්ෂණ සේවාවන් ඇතුලුව)</u>

3. සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අධික්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකා ඒකක 07 (නිත්‍ය ඒකක 06 හා ස්වේච්ඡා ඒකක 01) තම ආවේණික රාජකාරි ඉටු

කරනු ලබයි. එසේම එම ඒකකයන් විසින් 122"382 (යුද්ධ හමුදා සක්‍රිය සේවයේ සිටින සියලු භට පිරිස්) පමණ වූ භට පිරිස් වෙත පෝෂණ අවශ්‍යතා සපුරාලනු ලබයි. 2013 ප්‍රසම්පාදන ක්‍රියා පිළිවෙල පහත පරිදි වේ.

| අනු අංකය | විෂය | ප්‍රසම්පාදන වර්ගීකරණය | ප්‍රසම්පාදන කමිටුව | ප්‍රසම්පාදන වත්මන් තත්වය (2011) | ස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | වියලි සලාක | වාර්ෂිකව | කැබිනට් මණ්ඩල | කැඳවීම් කර ඇත | 7 |
| 2. | අමු සලාක | වාර්ෂිකව | කැබිනට් මණ්ඩල | කැඳවීම් කර ඇත | 78 |
| 3. | ආනයනික සලාක මලු | වාර්ෂිකව | කැබිනට් මණ්ඩල | කැඳවීම් කර ඇත | 1 |
| 4. | ඉන්ධන/ලිහිසි තෙල් | වාර්ෂිකව | සුලු ප්‍රසම්පාදන | අවසාන වී ඇත | 7 |
| 5. | එල්පී ගෑස් | වාර්ෂිකව | සුලු ප්‍රසම්පාදන | අවසාන වී ඇත | 19 |
| 6. | දර | වාර්ෂිකව | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන | අවසාන වී ඇත | 73 |
| 7. | අවමංගල්‍ය සේවා | වාර්ෂිකව | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන | අවසාන වී ඇත | 29 |
| 8. | රජක සේවා | වාර්ෂිකව | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන | අවසාන වී ඇත | 72 |

**ප්‍රවාහන**

4. පළමු පෙළ වාහන පාලන රාජකාරි සඳහා ලබාදෙන අතරම මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අමතර වාහන විශේෂ රාජකාරි හා පාලන රාජකාරි සඳහා මෙම කාලසීමාව තුළදී ලබාදී ඇත. එසේම මෙම දෙවන පෙළ අවශ්‍යතාවය සපුරනු ලැබුවේ 2 වන පෙළ වාහන සංචිතයෙන් හා කුලී ගෙවීමේ පදනම මත සිවිල් සැපයුම් කරුවන්ගෙන් ලබාගෙන ඇත.

**අනෙකුත් සේවාවන්**

5. පුහුණු. වෘත්තීය හා ආධුනික පාඨමාලා සේබපා මගින් සිදු කරනු ලබයි.

6. රියදුරු බලපත් 2013 වර්ෂය සඳහා යුද්ධ හමුදා රියදුරන් හට නව ඩිජිටල් ක්‍රමයකට සැකසූ රියදුරු බලපත්‍රයක් හඳුන්වා දුන් අතර, එය "බී" වාහන රියදුරන් වෙත ලබාදෙනු ලබයි. දැනට 8352 ක ප්‍රමාණයක් නිකුත් කර ඇති අතර, ඉතිරි ප්‍රමාණය අවශ්‍යතාවය පරිදි ලබාදෙනු ඇත. දැනට රියදුරු බලපත් නිකුත් කිරීමේ වත්මන් තත්වය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අ. | අයදුම්පත් ලැබී ඇති ප්‍රමාණය | - 10972 |
| ආ. | රියදුරු බලපත් නිකුත් කර ඇති ප්‍රමාණය | - 8352 |
| ඇ. | ප්‍රතික්ෂේපිත රියදුරු බලපත් සංඛ්‍යාව | - 1807 |
| ඇ. | මුද්‍රණයෙන් පසු ලබා ගැනීමට ඇති රියදුරු බලපත් සංඛ්‍යාව | - 813 |

**<u>මූල්‍යමය විස්තර</u>**

7. 2012 වර්ෂය සඳහා වෙන්වූ ප්‍රතිපාදන, මුදල් හා වියදම් වාර්තා පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ප්‍රථිපාදන විස්තරය | | මුළු බෙදාදීම | 2013.12.31 දක්වා වියදම් තත්ත්වය |
|---|---|---|---|---|
| | | | රු මි | රු මි |
| 1. | 222-01-2-1202 (i) | ඉන්දන | 3,733.8 | 5,375.2 |
| 2. | 222-01-2-1202 (ii) | ලිහිසි තෙල් | 248.7 | 181.6 |
| 3. | 222-01-2-1203 (ii) | සලාක (නිත්‍ය) | 11,733.2 | 10,907.4 |
| 4. | 222-01-4-1203 (ii) | සලාක (සෙවි) | 2,750.0 | 1,897.5 |
| 5. | 222-01-2-1203 (iii) | රෝහල් සලාක | 106.5 | 118.8 |
| 6. | 222-01-2-1401 (vi) | සිවිල් පවාරාගත් වාහන සඳහා ගෙවීම් | 1,152.0 | 1,062.5 |
| 7. | 222-01-1-1401 (vii) | ලංගම රියදුරු සඳහා අයකිරීම් | 20.0 | 13.5 |
| 8. | 222-01-2-1403 (ii) | වියලි දර | 50.7 | 68.7 |
| 9. | 222-01-2-1403 (iii) | ගෑස් | 660.0 | 233.0 |
| 10. | 222-01-2-1405 (iv) | රජක සේවා | 26.5 | 30.4 |
| 11. | 222-01-3-1405 (ix) | අවමංගල්‍ය සේවා | 5.5 | 4.5 |

## යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව

**හැඳින්වීම**

1. යුද හමුදාවට අවශ්‍ය භාණ්ඩ සහ උපකරණ නියමිත ප්‍රමාණයන්ගෙන් නියමිත වේලාවට නියම ප්‍රමාණයෙන් නියමිත ස්ථානයට නියමිත තත්වයෙන් නිවැරදිව සැපයීම යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ වගකීම වේ. මෙම ක්‍රියාවලියේදී යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාවලියන් සඳහා උපලේඛනය කිරීමට සිදුවේ. එසේම මෙම ශාඛාවට අයත් යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය/විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය හා ඇතිවන ගැටලු හා විෂය සම්බන්ධ කරුණු සබැඳිව පර්යේෂණ සහ ප්‍රවර්ධනයන් සඳහා මාණ්ඩලික සම්බන්ධිකරණ ආයතනයක් ලෙස ක්‍රියා කිරීමටද මෙම ශාඛාව වෙතින් සිදුවේ.

2. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවෙන් පාලනය වන අධ්‍යක්ෂ මණ්ඩල විස්තරය.

අ. <u>යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය</u>. යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ මිළදීගැනීම, නිකුත් කිරීම, තොගගත කිරීම හා ගබඩාකරණය කිරීම, භාණ්ඩ නඩත්තු කිරීම හා නිසි පරිදි බෙදාහැරීම, භාණ්ඩ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, වාර්ෂික තොග සමීක්ෂණය සහ භාණ්ඩ නිකුත් කිරීම වේ.

ආ. <u>විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය</u>. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වනුයේ යුද්ධ හමුදාවේ පවතින යන්ත්‍රෝපකරණ, විද්‍යුත් උපකරණ සහ දෘෂ්‍ය උපකරණ නඩත්තුව අලුත්වැඩියාව සහ අධීක්ෂණය කිරීම වේ.

**වගකීම**

3. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවේ වගකීම පහත පරිදි වේ.

අ. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවට අයත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩලයන්හි ක්‍රියාකාරිත්වය පිලිබඳ යුධ හමුදාපති හට උපදෙස් ලබාදීම.

ආ. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව හා අධ්‍යක්ෂ මණ්ඩල අතර නිසි සම්බන්ධතාවයකින් යුතුව ක්‍රියාකාරිත්වයක් පවත්වාගෙන යාම.

ඇ. මුදල් රෙගුලාසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශණය හා භාණ්ඩාගාර චක්‍රලේඛණ හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් අනුව ප්‍රතිපත්තීන් සකස්කිරීම හා ඒවාට අදාල අධ්‍යක්ෂ මණ්ඩල හා මූලස්ථාන වෙත යොමුකර ඒවායේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම.

ඈ. අත්‍යවශ්‍ය මොහොතකදී මෙම ශාඛාවට අයත් සීමාව තුල මුදල් රෙගුලාසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශක හා භාණ්ඩාගාර චක්‍රලේඛණ හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය අනුව යුද්ධ හමුදාධිපති වෙනුවෙන් තීරණ ගැනීම.

ඉ. මෙම ශාඛාවට අයත් අධ්‍යක්ෂ මණ්ඩයන්හි නියමිත ඉලක්කය හා ඒවායේ ක්‍රියාකාරිත්වය හා අයිතිය පිලිබඳව යුද්ධ හමුදාධිපති දැනුවත් කිරීම.

ඊ. යුද්ධ හමුදාපති විසින් පනවන ලද ප්‍රතිපත්තීන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩල සඳහා නිසි මාර්ගෝපදේශණයක් හා උපදෙස් ලබාදීම.

ඖ. යුධෝපකරණ භාණ්ඩ සැපයීමේ ක්‍රියාවලිය කාර්‍යක්‍ෂමතාව හා ඵලදායිත්වය තහවුරු කරගැනීමට හා නියමිත ක්‍රමවේදයන්ට අනුව භාණ්ඩ ගිණුම් කරණය පිලිබඳව තහවුරු කරගැනීමට හා යුධෝපකරණ ගබඩා/ඒකක/වැඩපලවල්හි වරින් වර ක්‍ෂේත්‍ර පරීක්‍ෂණ පැවැත්වීම.

ඖෟ. භාණ්ඩ කලමණාකරණය හා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ප්‍රතිපත්තීන් හා ක්‍රියාවලි පිලිබඳ නිරන්තරයෙන් අවධානයෙන් සිටීම හා අවශ්‍ය නම් ප්‍රතිපත්තීන් හඳුන්වාදීම.

ඵ. වාර්ෂික ඇස්තමේන්තු සකස්කිරීමට ප්‍රථම පුරෝකථනය කරන ලද ඇස්තමේන්තු සමීක්‍ෂණය කොට අවසාන සැලැස්ම සැකසීම.

ඵ්. වාර්ෂිකව වෙන්කරන ලද මුදල් ප්‍රතිපාදන පරිපාලනය කිරීම සඳහා ප්‍රථිපත්ති පාලකයෙක් වශයෙන් කටයුතු කිරීම.

ෂ. අභ්‍යන්තර දූෂන වලක්වාගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සැකසීම.

ෂී. මුරෙ 137/138 අනුව අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් බලය පවරන ලද බිල්පත් නිරවුල් කලයුතු ආයතනයන්හි ක්‍රියාකාරිත්වය අධීක්‍ෂණ කිරීම.

ක. සැලසුම් කරන ලද අරමුණ ශාක්සාත් වී ඇති ප්‍රමානය විමර්ෂණය කිරීම.

ග. යුමාජෙහි පැවැත්වෙන සුලු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ලෙස කටයුතු කිරීම.

ජ. මුදල් ප්‍රථිපාදන නියමිත පරිදි වෙන්කරලීම සහ සුභසාධක භාණ්ඩ නියමිත පරිදි බෙදාදීම.

<u>සාක්ෂාත් කරගැනීම</u>

4. <u>බැරැක්ක භාණ්ඩ සහ ප්‍රාග්ධන භාණ්ඩ පිලිබඳ යුද හමුදා පොදු පරිපාලනයක් හඳුන්වාදීම</u>. යුධ හමුදා විකාශනයත් සමග යුද හමුදා ඒකක වලද වැඩි වීමක් සිදුවූ අතර බැරැක්ක සහ ප්‍රාග්ධන අයිතමයන් නිකුත් කිරීමේදී නිශ්චිත පරිමාණයක් නොමැතිවීම ගැටලුවක් විය. යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහයෝගයත් සමග මෙම ගැටලු විසඳීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් යුධ හමුදාධිපති තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

5. <u>අධීක්‍ෂණ හා ලේඛණ අංශ හඳුන්වාදීම</u>. නිසි අධීක්‍ෂණය ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්‍යක්‍ෂම වීමට හේතු වේ. මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා යුමාජෙශා තුල අධීක්‍ෂණ සහ ලේඛණ අංශයන් ස්ථාපනය කරන ලදී.

6. <u>සියලුම නැතිවීම් හා අලාභහානි පරීක්‍ෂණක ගතකිරීම</u>. වත්කම් කලමණාකරන අධ්‍යක්‍ෂ මණ්ඩලය ප්‍රතිස්ථාපනය කිරීමට පෙර යුද හමුදාව තුල නැතිවීම් හා අලාභහානිවීම් පිලිබඳ වාර්තා සංරක්‍ෂණය කරන ලද්දේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාවෙනි. මෙම වාර්ථා සංග්‍රාමික තත්වයක් තුල යුධ හමුදාව තුල උපකරණ හා භාණ්ඩ නැතිවීම් හා අලාභහානි වේ. මෙම ලේඛණවල පවතින වැදගත්කම සහ මතු පරිශීලනය කිරීමේ පහසුව සඳහා විශේෂ සංරක්‍ෂණය කරන ලදී.

**වාර්ෂික සමාලෝචනය**

7. 2013 වර්ෂය සඳහා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව විසින් සුලු ප්‍රසම්පාදන කමිටු 19 ක් සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු 16 ක් පවත්වා ඇත.

8. 2013 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වල සීමිත බව නිසා අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමුඛත්වය මත අවශ්‍යතා සපුරාලන අතර සමහර අවශ්‍යතා අඩු ප්‍රමුඛතාවය නිසා ඉවත්කරන ලදී. කෙසේ වුවත් සියලුම අවශ්‍යතා සපුරාලීමට යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව කටයුතු කරන ලදී.

9. පොදුරාජ්‍ය මණ්ඩලීය සැසිවාරය සාර්ථක කරගැනීම සඳහා විවිධ පහසුකම් සපයන ලදී.

10. නව යුද හමුදා රෝහල ස්ථාපනය කිරීම සහ ඖෂධ මිළදී ගැනීම සඳහා කටයුතු කරන ලදී.

11. ලෙබනන් හා හයිටි රාජ්‍ය වල ස්ථානගතව සිටින එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදාපිරිස් සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රමුඛත්වය මත ලබාදෙන ලදී.

12. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව හා යටතේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල කාලෝචිතව ගත්තා ලද තීරණ නිසා වෙන්කරන ලද ප්‍රතිපාදන නැවත ලබාදීමකින් තොරව වෙනත් අරමුදල් තුලින් යොදාගෙන අත්‍යවශ්‍ය භාණ්ඩ අවශ්‍යතා සපුරාගැනීමට කටයුතු කරන ලදී.

**මූල්‍යමය විස්තරය**

13. මූල්‍යමය තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | වැය ශීර්ෂ විස්තරය | මුදල් ප්‍රතිපාදන ප්‍රමාණය රු: | මුලු වියදම (බැඳීම් සමග) රු: |
|---|---|---|---|---|
| 1. | 222-01-2-1302 (iii) | බැරැක්ක නඩත්තු | 11,000,000.00 | 6,255,111.71 |
| 2. | 222-01-2-1205(xxiv)<br>222-01-4-1205(xxiv) | පවිත්‍රතා හා සනීපාරක්ෂක ද්‍රව්‍ය | 13,000,000.00 | 11,549,491.73 |
| 3. | 222-01-2-1405(xx) | තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා සහ ප්‍රසම්පාදන කමිටු දීමනා ගෙවීම | 3,050,000.00 | 9,442,175.33 |
| 4. | 222-01-3-2103(i)a | යන්ත්‍රෝපකරණ වැය ශීර්ෂය | 229,393935.47 | 235,696,688.07 |
| 5. | 222-01-3-2103(vii) | යුධ කණ්ඩායම් වලට පහසුකම් සැපයීමේ වැය ශීර්ෂය | 7,000,000.00 | 8,585,474.00 |
| 6. | 222-01-1-2502(2) | නව රෝහල් ව්‍යාපෘතිය | 700,000,000.00 | 1,654,208,279.02 |

## යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂක මණ්ඩලය

**හැඳින්වීම**

1. යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය යුද්ධ හමුදා මූලස්ථානයේදී 1980 දී ස්ථාපිතකල අතර හමුදා චර්යා නියෝග 18/94 ගිවිසීම අනුව සියලුම යුධෝපකරණ කාර්මික කටයුතු සඳහා වගකීම දැරිය යුතුය. මෙහි දේශීය/විදේශීය මිලදීගැනීම්, වරාය හා මුදල් අංශයකින් සමන්විත වේ.

2. යුද්ධ හමුදා මූලස්ථානය ප්‍රතිසංවිධානය වීමත් සමගම යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය යුධෝපකරණ මාස්ටර් ජෙනරල් ශාඛාව යටතේ ස්ථාපිත විය. නිලධාරි 17 ක් හා සෙසුනිල 217 ක සංඛ්‍යාවකින් සමන්විත සංස්ථාවක් අනුමත වූ අතර සැලසුම් අංශය, මිලදීගැනීම් අංශය, ප්‍රගති සමාලෝචන අංශය, විධායක අංශය, වරාය අංශය, මුදල් අංශය හා තොරතුරු තාක්‍ෂණ අංශ යනුවෙන් නව සංස්ථාවක් හඳුන්වාදෙන ලදි.

**වගකීම්**

3. යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය සියලුම විදේශීය හා දේශීය මිලදීගැනීම් විදේශයන් වෙතින් ලැබෙන භාණ්ඩ නිශ්කාශනය කිරීම් සහ බිල්පත් සහතික කිරීම් සැබැඳි යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් වෙතින් යුද්ධ හමුදාධිපති වෙත වගකිව යුතුය.

4. යුධෝපකරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය සතුව ඇති වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. යුධෝපකරණ සේවාවට අදාල සියලුම කාර්මික කටයුතු විධිමත්ව ප්‍රතිපත්ති වලට අනුව පවත්වාගෙන යෑම පිලිබඳ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් වෙතින් යුද්ධ හමුදාධිපතිට වගකිව යුතු වේ.

ආ. යුද්ධ හමුදාවේ වර්තමාන අවශ්‍යතාවයන් නිර්ණය කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව යුධෝපකරණ භාණ්ඩ ඝණයට අයත් සියලුම විෂයන් සඳහා වාර්ෂික හා අතිරේක ඇස්තමේන්තු පිලියෙල කිරීම.

ඇ. මූල්‍ය කලමණාකරණ ප්‍රතිපත්තීන් අනුව වාර්ෂික සැලසුම් පිලියෙල කිරීම. නිරීක්‍ෂණය කිරීම හා යුධෝපකරණ ගබඩාහල් හා භාණ්ඩ කාලානුරූපීව ප්‍රගතිය වාර්ථා කිරීම.

ඈ. යුද්ධ හමුදා මූලස්ථානයේ පොදු පරිපාලන හා හටකාර්‍ය ප්‍රතිපත්තීන්වලට අනුරූපීව සියලුම යුධෝපකරණ භාණ්ඩයන්. අවි. පතුරොම් හා වෙඩි ද්‍රව්‍ය නව එකතු කිරීම් හා ඉදිරි සැලසුම් සිදුකිරීම.

ඉ. යුධෝපකරණ උපකරණ පරිමාණයන් පිලියෙල කිරීම.

ඊ. යුද්ධ හමුදා ආයිත්තම්, බොත්තම්, නිල ලාංජන හා පදක්කම් සැබැඳි පිරිවිතරයන් සැකසීම හා යාවත්කාලීන කිරීම.

උ. වෙළඳපොල පිරික්සුම හා සැපයුම්කරුවන් තෝරා ගැනීම.

ඌ. යුධෝපකරණ ගබඩා සංචිතයන්හි පවත්වාගෙනයන භාණ්ඩයන්හි නිරන්තර නිවැරදිතාවය පිරික්සුම් සිදුකිරීම, ඒ හා සැබැඳි ප්‍රතිපත්ති නිරීක්‍ෂණය කිරීම හා යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් විසින් නිකුත් කරනු ලබන ප්‍රතිපත්තීන් ක්‍රියාවට නැංවීම.

එ. වාර්ෂික තොග ගණනය කිරීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම හා තොග ගණනය කිරීමේ කණ්ඩායම් විසින් එහි නිවැරදිතාවය සිදුකිරීම නිරීක්ෂණය කිරීම.

ඒ. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් හට වාර්ෂික තොග ගණනය කිරීමේ වාර්ථා ඉදිරිපත් කිරීමත් නිවැරදි පිළිවෙත් ක්‍රියාවට නැංවීම.

ඔ. විෂය පරිපථයෙහි ඇති යුධෝපකරණ අයිතමයන්ගේ කේතකරණය හා වර්ගීකරනය සිදුකිරීම.

ඕ. යුද්ධ හමුදා මූලස්ථානය විසින් නිකුත්කර ඇති ප්‍රතිපත්ති සැකසුම් සැබැඳිව පරීක්ෂණයන් හා සංවර්ධනයන් සිදු කිරීම.

ක. පතුරොම් හා වෙඩිද්‍රව්‍ය පරීක්ෂණ සැලසුම් කිරීම පරීක්ෂණ වාර්ථා ඇගයීම හා ක්‍රියාත්මක කිරීම.

ග. සියලුම යුධෝපකරණ භාණ්ඩයන්හි පරීක්ෂණ සැලසුම් කිරීම, පරීක්ෂණ වාර්තා ඇගයීම හා ක්‍රියාත්මක කිරීම.

න. සියලුම යුධෝපකරණ ඒකකයන්හි තොගගත කිරීම් හා සැබැඳි ක්‍රියාවලිය විදිමත්ව සිදුකිරීමත් තොග අගයන් පවත්වාගෙන යාම.

ත. යුධෝපකරණ කාර්‍යයන්හි නියලෙන මානව සම්පත් තක්සේරුකරනය හා ඔවුන්ගේ සේවා දායකත්වය ඇගයීම.

ද. පවත්නා ගබඩාහල්/ගබඩාකරණ පිළිවෙත් ක්‍රියාත්මකවීම අඛණ්ඩව සුපරීක්ෂාවට ලක් කිරීම හා අවශ්‍ය වූ විටෙක සුදුසු පරිදි යාවත්කාලීන කිරීම.

ම. බලකායෙහි සෙබලුන්ගේ වෘත්තිය පුහුණුව සැබැඳි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

ය. යුධෝපකරණ විෂයන් හා සැබැඳි වාර්ෂික සමීක්ෂණ මණ්ඩල ක්‍රියාත්මක කිරීම.

<u>වාර්ෂික ප්‍රගතිය</u>

**5**. නවතමයෙන් ස්ථාපිත කරන ලද

අ. <u>ආරක්ෂවට අවශ්‍ය නිෂ්පාදන</u>. යුද්ධ හමුදාවට අවශ්‍ය බැරුක්ක, ගෘහ උපකරණ සහ හණෝපකරන විශාල ප්‍රමාණයක් වාර්ෂිකව මිලදීගනු ලබන අතර එම අවශ්‍ය ප්‍රමාණයන් සැපයුම්කරුවන්ගෙන් ලබාගැනීම දුෂ්කරවී ඇත. එබැවින් යුද්ධ හමුදාධිපතිගේ උපදෙස්මත දැනට ක්‍රියාත්මක වැඩහල් තවදුරටත් වැඩිදියුණුකර යුධෝපකරණ කර්මාන්ත ශාලාවක් විෘතකර දැනට යුද්ධ හමුදාවට අවශ්‍ය බැරුක්ක, හණෝපකරන ආදිය නිෂ්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවති.

ආ. <u>බැරුක්ක පරිමාණයන් සකස් කිරීම</u>. යුද්ධ හමුදාවේ සියලුම ආයතනයන් සඳහා ඇවැසි බැරුක්ක භාණ්ඩයන් සඳහා පරිමාවක් සකස්කර යුද්ධ හමුදාධිපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇත.

ඇ. <u>පතුරොම් නැවත පිරවීම</u>. කාලතුවක්කු ආචාර වෙඩිමුර පතුරොම් සහ සුථ අවි පතුරොම් වර්ග කිහිපයක් නැවත පිරවීම සිදුකරනු ලබයි.

ඇ. <u>රෙදිපිලි අවශ්‍යතා සැපයීම සැලසුම් කිරීම</u>. අතිරේක තොගයක් නඩත්තු කරනු ලබන අතර, 2013 වසරේ මිලදීගැනීමට සැලසුම් කරන ලද අවශ්‍යතාවයන්ගෙන් මිලදීගෙන ඇත.

5. ඉහත සඳහන් තොරතුරුවලට අමතරව යුධෝපකරණ සැපයුම්ජාලය වැඩිදියුණුකොට පවත්වාගෙනයාම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

**<u>යුධෝපකරණ පරීක්ෂණ සහ තොග ගණන්ගැනීම</u>**

6. යුධෝපකරණ පරීක්ෂණ සහ තොග ගණන්ගැනීම් වසර පුරා යුද්ධ හමුදාවේ සියලුම ආයතනයන්හි සිදුකරනු ලබන අතර මාණ්ඩලික ප්‍රධානගේ පරීක්ෂණයටද ප්‍රථම පරීක්ෂණ කටයුතු සිදුකරනු ලබයි. යම් නිරීක්ෂණයන් වේ නම් ආයතන ප්‍රධානී හට ඒ බැව් දැනුම්දී නිරීක්ෂණ සමතයකට පත් කිරීමට කටයුතු කරනු ලැබේ.

7. මෙම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ රාජකාරි කරනු ලබන තොග ගණන්ගැනීමේ කණ්ඩායම් මගින් යුද්ධ හමුදාවේ සියලුම යුධෝපකරණ ඒකකයන්හි යුධෝපකරණ භාණ්ඩ තොග ගණන්ගැනීම සිදුකරනු ලබයි.

**<u>යුධෝපකරණ ගබඩාවන්හි ඉදිකිරීම් සහ ගබඩාකරුවන්ගේ කාර්මික දැනීම වර්ධනය කිරීම</u>**

8. ඒකක යටතේ ඇති යටිතල පහසුකම් දියුණු කිරීමටත් කාර්මික පහසුකම් වැඩිදියුණු කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇත.

අ. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් අනුව දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අක්කර 10 ක භූමියක් රාගම ප්‍රදේශයෙන් වෙන්කර මූලික යුධෝපකරන ගබඩාව එම ස්ථානයේ පිහිටුවීම කටයුතු සිදුකරන ලදි.

ආ. සියලුම කාර්මික සෙබලුන්ගේ කාර්මික දැනීම ඉහල නැංවීම සඳහා වැඩමුලු පැවැත්වෙන අතර මධ්‍යම අවි සහ පතුරොම් ගබඩාව වෙතින් යුද්ධ හමුදාවේ සියලුම ආයතනයන්හි පතුරොම් ගබඩා කිරීම සැබැඳි වැඩමුලු පවත්වනු ලැබේ.

ඇ. මධ්‍යම අවි හා පතුරොම් ගබඩාවට අයත් ගබඩාවන් අලුත්වැඩියා කරමින් පවතින අතර මේවනවිට මෙ:ටො: 443 ක පතුරොම් කොස්ගම ගබඩාවේ සිට වේයන්ගොඩ ගබඩාව දක්වා ප්‍රවාහනය කර ඇත.

ඈ. යුධෝපකරණ කර්මාන්ත ශාලාව ස්ථාපිත කිරීම සඳහා යුද්ධ හමුදාධිපති අනුමැතිය ලබාගැනීම සඳහා සැලසුම්පත් සකස්කර ඉදිරිපත්කර ඇත.

ඉ. මධ්‍යම අවි හා පතුරොම් ගබඩාව වෙතින් පතුරොම් හා වෙඩි ද්‍රව්‍ය භාවිතය හා ආරක්ෂාව සැබැඳිව සැලකියයුතු කරුණු හා එම ද ඇ භාරදීමේදී කටයුතු කලයුතු ආකාරය සැබැඳි පිලිවෙත් දැනුම ආරක්ෂක සේනා මූලස්ථාන මට්ටමින් නිලධාරින්/සෙනින් වෙත ලබාදී ඇත.

ඊ. ගිනි නිවන හමුදාව සමග සම්බන්ධතාවයෙන් ගිනි නිවීමේ පාඨමාලා පවත්වා ඇත.

**<u>වෙඩි ද්‍රව්‍ය පරීක්ෂණ</u>**

9. පානු පතුරොම් සහ වෙඩිද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කාර්මික නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ පරීක්ෂණයට ලක්කර ඉන් අනතුරුව අනුමත මණ්ඩල වාර්ථාවන්ට අනුකූලව විනාශ කිරීමට කටයුතු කර ඇත.

**<u>යුධෝපකරණ භාණ්ඩ සඳහා පිරිවිතර සකස් කිරීම</u>**

13. සියලුම යුධෝපකරණ භාණ්ඩයන්හි පිරිවිතරයන් යාවත්කාලීන කිරීම් ආරම්භකර ඇත.

**<u>අවි අංකයන් පරිගණකගත කිරීම</u>**

14. මඅපග විසින් අවි අංකයන් පරිඝණකගත කිරීම සිදුකරනු ලබයි. මුලු සංඛ්‍යාවෙන් 90% මෙම වසර තුල අවසන් කිරීමට නියමිතය.

15. ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 8.11 ට අනුව කාර්‍ය සාධක ඇප බැදුම්කර, ලංසු සුරක්ෂිත ඇපබැදුම්කර හා ප්‍රමාද ගාස්තු අයකරගැනීමට ක්‍රියාකර ඇති අතර එය පහත සඳහන් ආකාරයට සකස් කර ඇත.

| අනු අංකය | යුධෝපකරණ ඝණය | ලංසු සුරක්ෂිත ඇපබැදුම්කර මුදල | කාර්‍යසාධක ඇපබැදුම්කර මුදල | ප්‍රමාද ගාස්තු |
|---|---|---|---|---|
| 1. | යුධෝපකරණ ඝණය I | | 2,072969.00 | 137,361.00 |
| 2. | යුධෝපකරණ ඝණය II | | 987,749.05 | 80,947.00 |
| 3. | යුධෝපකරණ ඝණය III | | - | - |
| 4. | යුධෝපකරණ ඝණය IV | 100,000.00 | 2,736,951.10 | 3,171,818.51 |
| 5. | යුධෝපකරණ ඝණය V | 14,500.00 | 106,950.00 | 443,392.00 |
| 6. | යුධෝපකරණ ඝණය VI | 386,150.00 | 1,060,039.00 | 2,933,303.00 |
| | එකතුව | 500,650.00 | 6,964,658.15 | 6,765,821.51 |
| | සම්පූර්ණ එකතුව | | | 14,231,129.66 |

**<u>මූල්‍යමය තොරතුරු</u>**

16. <u>වාර්ෂික ප්‍රතිපාදන කළමණාකරණය කිරීම සඳහා මෙහෙයුම් පාලන ක්‍රියාකාරකම්</u>

අ. යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් පාලනය/ මිලදීගැනීම් සිදුකරන වැයශීර්ෂය සඳහා වෙන්කළ වාර්ෂික ප්‍රතිපාදනය හා ඊට අදාළ වියදම් විස්තරය පහත දක්වා ඇත.

ආ. **2013** වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදන වලින් 99% ට අදාලව පිරිමැසුම්දායී ලෙස මිලදීගැනීම් සිදුකර ඇති අතර ඊට අදාළ ගෙවීම් වවුචර මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත්කර ඇත.

ඩියදටි වාර්තාව 2013.12.31 දිනට යුධෝපකතරණ සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය

| වැය ශීර්ෂය | ඩිස්තරය | මුහ වාර්ෂික ප්‍රථිපාදන | මුහ ඩියදම | බැදීටි | මුහ ඩියදටි හා බැදීටි | ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්ථන වැයශීර්ෂය | | | | | | |
| 222-01-2-1201 | ලිපි ද්‍රව්‍ය | 105,130,000.00 | 146,800,842.03 | - | 146,800,842.03 | 139.64 |
| 222-01-2-1203(I) | තිල ඇදුම් | 3,700,000,000.00 | 2,469,117,155.26 | 1,552,820,200.27 | 4,021,937,355.53 | 108.70 |
| 222-01-2-1205 (I) | යාප්‍ර අ/කොටස් | 142,286,730.40 | 241,289,154.24 | 23,059,681.87 | 264,348,836.11 | 185.79 |
| 222-01-2-1205 (II) | ෆැටීටෝ | 225,000,000.00 | 293,404,089.70 | 36,310,279.46 | 329,714,369.16 | 146.54 |
| 222-01-2-1205 (III) | සංගීත අමතර කොටස් | 1,200,000.00 | 1,418,479.50 | - | 1,418,479.50 | 118.21 |
| 222-01-2-1205 (IV) | ඒ වාහන අමතර කොටස් | 25,000,000.00 | 24,855,167.83 | 3,558,788.20 | 28,413,956.03 | 113.66 |
| 222-01-2-1205 (V) | කාතු අමතර කොටස් | 20,000,000.00 | 21,347,399.15 | 3,899,947.52 | 25,247,346.67 | 126.24 |
| 222-01-2-1205 (VI) | සංඥා අමතර කොටස් | 40,000,000.00 | 20,417,425.34 | 12,118,354.11 | 32,535,779.45 | 81.34 |
| 222-01-2-1205 (VII) | සුලු අවි අමතර කොටස් | 6,000,000.00 | 1,114,813.51 | - | 1,114,813.51 | 18.58 |
| 222-01-2-1205 (IX) | පරිගණක අමතර කොටස් | 15,000,000.00 | 19,564,687.27 | 2,655,483.60 | 22,220,170.87 | 148.13 |
| 222-01-2-1205 (X) | බැරැක්ක භාණ්ඩ | 187,882,500.00 | 386,287,855.06 | 64,860,482.98 | 451,148,338.04 | 240.12 |
| 222-01-2-1205 (XI) | පොදු භාණ්ඩ | 78,000,000.00 | 165,846,198.65 | 19,113,966.19 | 184,960,164.84 | 237.13 |
| 222-01-2-1205 (XII) | කදවුරු ආරක්‍ෂිත | 47,857,154.88 | 9,945,838.00 | 5,153,016.96 | 15,098,854.96 | 31.55 |
| 222-01-2-1205 (XIII) | වෙඩි ද්‍රව්‍ය | 84,312,732.00 | 60,509,736.77 | 44,860,737.60 | 105,370,474.37 | 124.98 |
| 222-01-2-1205 (XXIII) | ෆැටීටෝ සී වාහන | 75,000,000.00 | 83,619,182.05 | 24,317,165.60 | 107,936,347.65 | 143.92 |
| 222-01-2-1302 (III) | බැරැක්ක නඩත්තු | 11,000,000.00 | 7,488,791.10 | 1,364,077.32 | 8,852,868.42 | 80.48 |
| 222-01-2-1405 (XX) | ප්‍රසටිපාදන දීමනා | 3,737,000.00 | 1,507,240.00 | - | 1,507,240.00 | 40.33 |
| 222-01-2-1204 (IV) | රෝහල් රෙදි පිළි | 41,000,000.00 | 9,151,317.92 | 11,834,004.38 | 20,985,322.30 | 51.18 |
| 222-01-2-1204 (VII) | සුභ සාධක හා පුනරුත්ථාපන | 121,400,000.00 | 57,237,445.47 | 11,089,107.40 | 68,326,552.87 | 56.28 |
| එකතුව | | 4,929,806,117.28 | 4,020,922,818.85 | 1,817,015,293.46 | 5,837,938,112.31 | 2,192.79 |
| පුනරාවර්ථන ස්ධෛබ්ජා | | | | | | |
| 222-01-4-1201 | ලිපි ද්‍රව්‍ය | 25,000,000.00 | 21,558,824.31 | 14,319,183.07 | 35,878,007.38 | 143.51 |
| 222-01-4-1203 (I) | තිල ඇඳුම් | 250,000,000.00 | 52,862.50 | 221,097,138.00 | 221,150,000.50 | 88.46 |
| 222-01-4-1205 (X) | බැරැක්ක භාණ්ඩ | 35,000,000.00 | 21,174,584.82 | 21,934,039.04 | 43,108,623.86 | 123.17 |
| එකතුව | | 310,000,000.00 | 42,786,271.63 | 257,350,360.11 | 300,136,631.74 | 355.14 |
| මූලධන වැයශීර්ෂය | | | | | | |
| 222-01-3-2002 (IV) | පුනරුත්ථාපන හා වැලූ දියුණු කිරීම | 35,000,000.00 | 46,201,841.42 | 473,148.00 | 46,674,989.42 | 133.36 |
| 222-01-3-2003 (I) | වාහන | 3,400,000.00 | 12,979,509.23 | 2,473,865.14 | 15,453,374.37 | 454.51 |
| 222-01-3-2101 (I) | ඒ වාහන | - | - | | - | |
| 222-01-3-2101 (II) | බී වාහන | 94,996,420.00 | 304,291.00 | 10,075,261.00 | 10,379,552.00 | 10.93 |
| 222-01-3-2101 (III) | සී වාහන | - | - | - | - | |
| 222-01-3-2101 (17) | වාහන | - | 15,845,000.00 | - | 15,845,000.00 | |
| 222-01-3-2102 | කාර්යාල උපකරණ | 150,000,000.00 | 217,732,785.05 | 32,212,563.63 | 249,945,348.68 | 166.63 |
| 222-01-3-2103 (I) a | යන්ත්‍රෝපකරණ - යුමාජෙශා | 229,393,935.47 | 287,120,742.36 | 55,455,276.06 | 342,576,018.42 | 149.34 |
| 222-01-3-2103 (I) b | යන්ත්‍රෝපකරණ - උමාජෙශා | 32,329,908.61 | 27,920,731.25 | 16,551,210.88 | 44,471,942.13 | 137.56 |
| 222-01-3-2103 (I) c | යන්ත්‍රෝපකරණ - ප්‍රමාශා | 7,160,491.97 | 16,790,741.97 | 151,900.00 | 16,942,641.97 | 236.61 |
| 222-01-3-2103 (II) | ආයුධ හා ආම්පන්න | 39,877,411.00 | 33,433,793.59 | 23,048,792.17 | 56,482,585.76 | 141.64 |
| 222-01-3-2103 (III) | සංඥා උපකරණ | 88,000,000.00 | 126,369,212.85 | 57,967,485.95 | 184,336,698.80 | 209.47 |
| 222-01-3-2103 (IV) | සුනකයින් මිළදීගැනීම | 1,000,000.00 | 692,148.00 | 322,091.80 | 1,014,239.80 | 101.42 |
| 222-01-3-2103 (V) | සංගීත උපකරණ | 10,500,000.00 | 40,007,371.20 | 1,844,920.00 | 41,852,291.20 | 398.59 |
| 222-01-3-2103 (VI) | යුධ කණ්ඩායම්වල පහසුකම් | 10,952,347.53 | 1,282,897.48 | - | 1,282,897.48 | 11.71 |
| 222-01-3-2103 (VII) | සුභ සාධක භාණ්ඩ | 7,000,000.00 | 13,827,976.92 | 713,357.00 | 14,541,333.92 | 207.73 |
| 222-01-1-2502-(2) | නව රෝහල් ව්‍යාපෘතිය | 700,000,000.00 | 1,396,646,926.59 | 605,899,310.68 | 2,002,546,237.27 | 286.08 |
| එකතුව | | 1,409,610,514.58 | 2,237,155,968.91 | 807,189,182.31 | 3,044,345,151.22 | 2,645.59 |
| මුහ එකතුව | | 6,649,416,631.86 | 6,300,865,059.39 | 2,881,554,835.88 | 9,182,419,895.27 | 5,193.52 |

**වැය ශීර්ෂගත වියදම**

17. වැය ශීර්ෂගත වියදම පහත සඳහන් පරිදි වේ.

| | | **වෙන්කළ වටිනාකම** | **වියදම** |
|---|---|---|---|
| (1) | පුහුණු දීමනා | රු: 10,000.00 | රු: 10,000.00 |
| (2) | සඟරා සහ ප්‍රකාශන | රු: 5,000.00 | රු: 5,000.00 |
| (3) | පත්තර | රු: 21,890.00 | රු: 21,890.00 |

**ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකා ඒකක තුළ නිෂ්පාදන සහ අලුත්වැඩියා කිරීම් - හෙල්මට් අලුත්වැඩියාව, නිදන මලු, යකඩ ඇඳන්, වාහන කැනපි, වාතේ මේස, වාතේ පුටු, ලියුම් කවර, ධජ සහ තිල ඇඳුම් නිෂ්පාදනය/අලුත්වැඩියාව**

18. ඉහත දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදනය කිරීම, අලුත්වැඩියා කිරීම් තුලින් රාජ්‍ය මුදල් අනවශ්‍ය වැයවීම අඩුකල අතර යුද්ධ හමුදාවට අවශ්‍ය භාණ්ඩ නියමිත වේලාවට ලැබීම තහවුරු කර ඇත. 2013 වර්ෂයේ යුධෝපකරණ කර්මාන්ත ශාලා මගින් ඉහත සඳහන් නිෂ්පාදන හේතුවෙන් පහත සඳහන් පරිදි රාජ්‍ය මුදල් ඉතිරි කිරීමට හැකියාව ලැබී ඇත.

| අනු අංකය | ඒකකය | අමුද්‍රව්‍ය පිරිවැය | ව්‍යාපෘති ගණන | වෙළඳපල මිල | ඉතිරිය |
|---|---|---|---|---|---|
| 1. | මධ්‍යම අවි හා පතුරොම් ගබඩාව | 362,164.59 | 09 | 3,902,126.27 | 3,865,911.54 |
| 2. | 1 වන ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකාය | 37,615,756.20 | 48 | 11,797,860.00 | 18,329,404.30 |
| 3. | 2 වන ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකාය | 10,216,111.00 | 20 | 12,865,114.00 | 2,830,128.00 |
| 4. | 3 වන ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකාය | 735,043.00 | 09 | 47,991.00 | 2,115,870.00 |
| 5. | 5 වන ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකාය | 706,011.00 | 33 | 982,250.00 | 473,877.00 |
| 6. | 6 වන ශ්‍රීලංකා යුධ හමුදා යුද්ධෝපකරණ බලකාය | 547,904.00 | 01 | 1,300,000.00 | 752,000.00 |
| | එකතුව | 50,182,989.79 | | 30,895,341.27 | 28,367,190.84 |

**භාණ්ඩ නිෂ්කාශණය**

19. යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ සිදුකරන කාර්‍යයන් අතර ගුවන්, නාවික හා තැපැල් මාර්ගයෙන් ලැබෙන භාණ්ඩයන් ප්‍රමාදයකින් තොරව නිශ්කාශනය කර අදාල ස්ථානයන් වෙත භාරදීම සිදුකරනු ලබයි. මෙයට ඇමුණුම වශයෙන් 2013 වර්ෂයට අදාල ගුවන් මගින් හා නාවික මගින් නිශ්කාෂණයකර ඇති භාණ්ඩ විස්තරය ඉදිරිපත්කර ඇත. ඒ අනුව නාවික මාර්ගයෙන් ලැබී ඇති මුලු භාණ්ඩයන්හි බර කි:ගැ: 404327.16 (ටොන් 919) හා ගුවන් මාර්ගයෙන් ලැබීඇති මුලු භාණ්ඩයන් හි බර කි:ගැ: 5407.81 කි.

## විදුලි හා යන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය

### හැඳින්වීම

1. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය 1949 දෙසැම්බර් මස 12 වන දින සුළු ආධාරක බණ්ඩයක් ලෙස ආරම්භ කෙරිනි. එතැන් පටන් ක්‍රමක් ක්‍රමයෙන් ව්‍යාප්ත වූ මෙම බලකාය මේ වන විට නිලධාරින් 186 දෙනෙක් ගෙන්ද සෙසුනිලයින් 4484 දෙනෙකු ගෙන්ද යුත්ත වේ. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය වෙතින් විදුලි, යාන්ත්‍රික, දෘශ්‍ය හා ජෛව තාක්ෂණ උපකරණ නඩත්තුවට හා අලුත්වැඩියාවට අවශ්‍ය උපදෙස් ලබාදීම හා අලුත්වැඩියා කිරීම සිදුකරයි. 2009 වර්ෂයෙහි එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසු රටේ වේගවත් සංවර්ධන ක්‍රියාදාමයට ඇපකැප වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය මේ වන විට එම කටයුතු සාර්ථකව සිදුකරමින් සිටී.

### වගකීම

2. විදුලි හා යන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. මාණ්ඩලික නිලධාරින් අනෙකුත් සන්නද්ධ හා සේවා ආයතන සඳහා වෘත්තීමය ඉංජිනේරු කාර්‍යයන් සහ උපකරණයන්හි නඩත්තු හා විශ්වාසනීයත්වය පිළිබඳ උපදෙස් ලබා දීම.

ආ. සියලු විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වගකීම සහිත උපකරණයන්හි අලුත්වැඩියා සහ නඩත්තු සඳහා වන වාර්ෂික වැය ශීර්ෂයන් පිළිබඳව අයවැය හා මුදල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උපදෙස් ලබා දීම.

ඇ. උපකරණ නඩත්තුව, පරික්ෂා කිරීම, අලුත්වැඩියා කිරීම, සහ අයෝග්‍ය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සැකසීම සහ අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම.

ඈ. උපකරණ ආපදාහරණය.

ඉ. විදුලි, යාන්ත්‍රික, විද්‍යුත් දෘශ්‍ය, ජෛව ඉංජිනේරු උපකරණයන්හි අලුත්වැඩියාව, පරීක්ෂණ, වෙනස් කිරීම් සිදුකිරීම (සංඥා උපකරණ හා ඉංජිනේරු සී වාහන හැර).

ඉ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කාර්මිකයන් සහ අනෙකුත් සේවා කාර්මිකයන් පුහුණු කිරීම

ඊ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වගකීම් සහිත සියලු උපකරණයන් අයෝග්‍ය කිරීම.

උ. අමතර කොටස් සහ වැයද්‍රව්‍ය සඳහා පරිමාණනයන් සැකසීම.

ඌ. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු උපකරණ සහ වැඩපල උපකරණ සඳහා සැකසුම් සකස් කිරීම.

**<u>ක්‍රියාකාරිත්වය</u>**

3. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ පාලනය වන අතර පාලනයේ පහසුව සඳහා පහත සඳහන් පරිදි අංශ කිහිපයකට වෙන් කර ඇත.

- අ කාර්මික පාලන අංශය.
- ආ ප්‍රා/ජ් අංශය.
- ඇ ප්‍රාදේශිය මිලදී ගැනිම් අංශය.
- ඈ වැයද්‍රව්‍ය පාලන අංශය.
- ඉ මුදල් අංශය.
- ඊ පාලන / කාර්මික පුහුණු අංශය.
- එ අධීක්ෂණ අංශය/පරියේෂණ අංශය.
- ඒ වාහන සේවා කිරිම් හා පරීක්ෂණ අංශය.
- ෙ රිය අනතුරු අංශය.
- ඔ ව්‍යාපෘති අංශය.
- උ සුළු ආධාරක අංශය - යුද හමුදා මූලස්ථානය.
- ඌ ප්‍රකාශන වාර්තා/යාන්ත්‍රික සැලසුම් ඇදිමේ අංශය.

**<u>කාර්‍යභාරය</u>**

4. යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව යටතේ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරි ඇති වාහන හා උපකරණ අලුත්වැඩියාවන් හා නඩත්තුව පිළිබඳ වගකීම් පහත දක්වා ඇත.

අ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිසි ක්‍රියාකාරිත්වය පිළිබඳ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව වෙත වගකිව යුතු වේ.

ආ යුද හමුදාව තුල ඇති වාහන හා උපකරණ නඩත්තුව පිළිබඳ ක්‍රමවේදයක් හදුන්වා දීම.

ඇ එමෙන්ම.

(1) යුද හමුදාවේ වාහන සේවා සිදුකිරිම හා ඒවායේ අලුත්වැඩියාවන් හා නඩත්තුව සිදුකිරිමට අවශ්‍ය පහසුකම් සැලසීම.

(2) යුද හමුදාව තුල ඇති වාහන හා උපකරණ නඩත්තුව පිළිබඳව යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව වෙත උපදෙස් ලබාදීම.

(3) ඒ හා බී වාහන අලුත්වැඩියාව සම්බන්ධයෙන් සැලසුම් සැකසීම හා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරිම.

(4) නිරන්තර වාහන පරීක්ෂාවන් පවත්වා ගෙන යාම.

(5) සැමවිටම යුද්ධ හමුදාවේ වාහන හා උපකරණ සූදානමින් තබා ගැනීම.

(6) කඩිනමින් අලුත්වැඩියාවන් සිදුකල හැකි පරිදි වැඩපලවල් සැලසුම් කර පවත්වා ගෙන යාම.

(7) තාක්ෂණික පුහුණුව සැපයීම සිදුකල හැකි පරිදි වැඩපලවල් සැලසුම් කර පවත්වා ගෙන යාම.

(8) කලින් කලට ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පිළිවෙත කෙරෙහි සොයා බැලීම් සිදුකිරීම.

<u>වාර්ෂික සමාලෝචනය</u>

6. <u>බි" වාහන වාර්ථාව</u>. එක් එක් බලසේනාවට/වැඩපලයන්ට අයත් "බි" වාහන වාර්ථාව පහත දක්වා ඇත.

| අනු අංකය | කාර්මික පාලන ප්‍රදේශය | බර වාහන | සැහැල්ලු වාහන | ධාවන පැදි | වෙනත් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | 1 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 535 | 753 | 539 | 241 | 2068 |
| 2. | 3 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 283 | 215 | 376 | 431 | 1305 |
| 3. | 4 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 203 | 195 | 306 | 372 | 1076 |
| 4. | 5 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 401 | 266 | 272 | 518 | 1457 |
| 5. | 6 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 171 | 138 | 151 | 325 | 785 |
| 6. | 7 වන බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 176 | 145 | 156 | 324 | 801 |
| 7. | 2 (සෙවේච්ඡා) බලඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 99 | 87 | 141 | 87 | 414 |
| | එකතුව | 1868 | 1799 | 1941 | 2298 | 7906 |

7. <u>බලඇණි/වැඩපලයන් වෙතින් අලුත්වැඩියාව නිමකර ඇති වාහන සංඛ්‍යාව</u>

අ. උපකරණ හා විවිධ අලුත්වැඩියා හැර 2013 වසර තුල බලඇණි වැඩපල තුල සිදුකරන ලද අලුත්වැඩියාවන් පහත දක්වා ඇත.

ආ. 2 වන වගුව මගින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලඇණි මගින් සිදුකල අලුත්වැඩියාවන් වෙන වෙනම දක්වා ඇති අතර සටහන 1 මගින් වාහන වර්ග අනුව සිදුකල අලුත්වැඩියාවන් දක්වා ඇත.

| අනු අංකය | ශිල්පවියාලු බළඇණිය | බර වාහන | සැහැල්ලු වාහන | ධාවන පැදි | වෙනත් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1. | 1 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 328 | 166 | 221 | 56 | 771 |
| 2. | 3 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 315 | 389 | 192 | 190 | 1086 |
| 3. | 4 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 620 | 484 | 300 | 443 | 1847 |
| 4. | 5 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 105 | 138 | 89 | 99 | 431 |
| 5. | 6 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 231 | 398 | 133 | 181 | 943 |
| 6. | 7 වන බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 268 | 351 | 103 | 263 | 985 |
| 7. | විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු (සන්නද්ධ) බළඇණිය | 40 | 27 | 21 | 374 | 462 |
| 8. | විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු (කාතු) බළඇණිය | 82 | 51 | 2 | 130 | 265 |
| 9. | වියාලු මූලික වැඩපොළ - කොළඹ | 40 | 3334 | | | 3374 |
| 10. | වියාලු මූලික වැඩපොළ - උඩවලව | 32 | 2 | | 27 | 61 |
| 11. | වියාලු මූලික වැඩපොළ - කටුබැද්ද | 47 | 141 | 42 | 11 | 241 |
| 12. | 2 (සෙවේච්ඡා) බළඇණිය ශ්‍රීලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය | 19 | 48 | 37 | 11 | 115 |
| | එකතුව | 2127 | 5529 | 1140 | 1785 | 10581 |



**<u>පුහුණු පඨමාලා</u>**

8. <u>සිවිල් කාර්මික ආයතන මගින් පැවැත්වූ පාඨමාලාවන්.</u> පහත සඳහන් තාක්ෂණික පාඨමාලා පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලය සමග සම්බන්ධතාවයෙන් සිදුකරන ලදි. 2013 වර්ෂයේදී සිවිල් ආයතන මගින් පැවැත් වූ පාඨමාලා සඳහා නිලධාරි/සෙසුනිළ සහභාගිත්වය පහත වගුව මගින් පෙන්නුම් කෙරේ.

| අනු අංකය | ආයතනය | පාඨමාලාව | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | මෝටර් රථ වායුසමීකරණ කාර්මික ශිල්පි | 10 |
| 2. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | ඉලෙටොනික් ෆුවෙල් ඉංජෙක්ෂන් | 10 |
| 3. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | එන්ජිම සුසර කිරිම | 10 |
| 4. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | මොටර් රථ විද්‍යුත් තාක්ෂණය | 10 |
| 5. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | ස්වයංක්‍රිය ගියර් පෙට්ටි නඩත්තුව හා අලුත්වැඩියාව | 10 |
| 6. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | වාහන ශිල්පි | 10 |
| 7. | ඔටෝ මොබයිල් ඉංජිනියරින් පුහුණු ආයතනය - ඔරුගොඩවත්ත | මොටර් රථ ඉලෙක්ටොනික තාක්ෂණය | 10 |
| 8. | ජර්මන් කාර්මික තාක්ෂණ පුහුණු ආයතනය - කටුබැද්ද | මොටර් රථ විද්‍යුත් තාක්ෂණය (ඊ3) | 20 |
| 9. | ජර්මන් කාර්මික තාක්ෂණ පුහුණු ආයතනය - කටුබැද්ද | ෆුවෙල් ඉංජෙක්ෂන් | 8 |
| 10. | ජර්මන් කාර්මික තාක්ෂණ පුහුණු ආයතනය - කටුබැද්ද | මොටර් රථ කාර්මික තාක්ෂණය (එම්10) | 10 |
| 11. | ජර්මන් කාර්මික තාක්ෂණ පුහුණු ආයතනය -කටුබැද්ද | ඉන්ධන පොම්ප කාර්මික ශිල්පි 2 (එම් 5) | 8 |
| 12. | ජර්මන් කාර්මික තාක්ෂණ පුහුණු ආයතනය -කටුබැද්ද | ඔටෝඉලෙක්ට්සිටි සහ ඉලෙක්ටොනික් ඉන් ඔටෝ මොබයිල් (ඊඒ) | 15 |
| 13. | ශ්‍රිලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - අනුරාධපුර | ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනි උපකරණ අලුත්වැඩියා කිරිමේ තාක්ෂණය | 6 |
| 14. | ශ්‍රිලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - අනුරාධපුර | ධාවන පැදි කාර්මික | 6 |
| 15. | ශ්‍රිලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - අනුරාධපුර | තුන් රෝද රථ කාර්මික | 6 |
| 16. | ශ්‍රිලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - අනුරාධපුර | මොටර් රථ ඉලෙක්ට්‍රිකල් | 10 |
| 17. | ශ්‍රිලංකා වෘත්තිය පුහුණු අධිකාරිය - අනුරාධපුර | ධාවන පැදි කාර්මික | 10 |
| එකතුව | | | 169 |

9. ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු පුහුණු පාසල මගින් පවත්වන පාඨමාලා පහත සඳහන් පරිදි වේ.

අ. <u>සියළු රෙජිමේන්තු පාඨමාලාව</u>.

(1) ප්‍රවාහන නිලධාරි පාඨමාලාව 1.

(2) පූර්ව විශ්‍රාමික විදුලි පාඨමාලාව.

(3) රාත්‍රි දුර දක්න පාඨමාලාව.

(4) ප්‍රවාහන සැරයන් පාඨමාලාව 1.

(5) ප්‍රවාහන සැරයන් පාඨමාලාව 2.

(6) කාර්යාල උපකරණ නඩත්තු පාඨමාලාව.

ආ. <u>ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වෘත්තිය පාඨමාලා</u>

(1) වාහන ශිල්පි.

(2) විදුලි ශිල්පි.

(3) පැස්සුම්කරු/ලෝහ තහඩු.

(4) මූලික වැද්දුම්.

(5) සන්නාහ සන්නද්ධ රථ පාඨමාලාව (ටි 56, බිඑම්පි, බිටිආර්).

(6) ආපදා රථ පාඨමාලාව - සෙසුනිල.

(7) වායුසමිකරණ / ශිතකරණ පාඨමාලාව.

(8) අවිගාරක.

ඇ. <u>ප්‍රාදේශිය අලුත්වැඩියා අංශය.</u> ප්‍රාදේශිය ඒජන්තවරුන් මාර්ගයෙන් 2013 වසර තුළදි නිමකරන ලද වාහන පිලිබඳ විස්තර පහත දක්වා ඇත.

(1) <u>වාහන</u>

| අනු අංකය | වර්ගය | රාජකාරින් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | බර වාහන | 170 |
| 2. | සැහැල්ලු වාහන | 1151 |
| 3. | ධාවන පැදි | 62 |
| 4. | ට්‍රැක්ටර් | 02 |
| 5. | වෙනත් | 15 |
| | **එකතුව** | **1400** |

(2) උපකරණ

| අනු අංකය | වර්ගය | රාජකාරිත් සංඛ්‍යාව |
|---|---|---|
| 1. | පොටෝ කොපි මැෂින් | 62 |
| 2. | වායුසමීකරන යන්ත්‍ර | 62 |
| 3. | මුද්‍රණ යන්ත්‍ර | 02 |
| 4. | රයිස් බොයිලර් | 06 |
| 5. | වීඩියෝ කැමරා | 02 |
| 6. | ස්කෑන් මැෂින් | 01 |
| 7. | පෙට්‍රල් ඉන්ධන මීටර | 02 |
| 8. | විදුලි ජනක යන්ත්‍ර | 02 |
| 9. | වතුර මැෂින් | 07 |
| 10. | වෙන්ටිලේටර් | 11 |
| 11. | ඇනලයිසර් | 05 |
| 12. | ඇනස්ට්‍රීෂියා මැෂින් | 01 |
| 13. | ඔක්සිජන් මැෂින් | 02 |
| 14. | මොනිටර් | 12 |
| 15. | ස්කෑන් මැෂින් (වෛද්‍ය උපකරණ) | 07 |
| 16. | ඩයලොග් ඩයලිසිස් | 04 |
| 17. | වායුසම්පීඩන | 05 |
| 18. | වෙනත් | 19 |
| 19. | **එකතුව** | **207** |

11 විදුලි හා යන්ත්‍රක ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රාදේශිය මිලදී ගැනිම මගින් 2013 වර්ෂය තුල සිදුකල අමතර කොටස් සැපයුම් පහත වගුව මගින් දක්වා ඇත.

| අනු අංකය | වර්ගය | වැඩ ප්‍රමාණය |
|---|---|---|
| 1. | බර වාහන | 174 |
| 2. | සැහැල්ලු වාහන | 413 |
| 3. | ධාවන පැදි | 109 |
| 4. | වෙනත් | 78 |
| 5. | එකතුව | 774 |

12. විදුලි හා යන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ප්‍රාදේශිය ඒජන්ත වරුන් වෙතින් සේවා සිදුකල වාහන පිළිබඳ විස්තරයක් පහත වගුව මගින් දක්වා ඇත.

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | බර වාහන | 71 |
| 2. | සැහැල්ලු වාහන | 1755 |
| 3. | ධාවන පැදි | 103 |
| 4. | ට්‍රැක්ටර් | 02 |
| 5. | තුන් රෝද රථ | 06 |
| | එකතුව | **1937** |

13. <u>රිය අනතුරු අංශය</u>. **2013** වසර තුළදී යුද්ධ හමුදා වාහනයන්හි සිදුවූ රිය අනතුරු සඳහා යුආපෙදු **33** ආ නිකුත් කිරීම් විස්තරය පහත වගුවේ සඳහන් පරිදි වේ.

| අනු අංකය | වාහන වර්ගය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | බර වාහන | 45 |
| 2. | සැහැල්ලු වාහන | 71 |
| 3. | ධාවන පැදි | 10 |
| 4. | ට්‍රැක්ටර් | 01 |
| 5. | ට්‍රැක්ටර් ට්‍රේලර් | 02 |
| 6. | තුන් රෝද රථ | 01 |
| | එකතුව | **130** |

**<u>සාක්ෂාත් කරගැනීම</u>**

14. විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සියලුම විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායන් හා මූලික වැඩපල විසින් ඔවුන්ගේ මූලික රාජකාරීන් කාර්යක්ෂමව හා සාර්ථකව ඉටුකිරීමට සමත්ව ඇත.

15. බොහොමයක් ඉන්දියාවේ නිෂ්පාදිත හා පරණ වාහන වලින් යුතු යුද හමුදාවේ රථ වාහන අලුත්වැඩියා කිරීම හා නඩත්තුව සාර්ථකව ඉටුකිරීමට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය සමත්ව ඇත. සෑම විටම ධාවනය කිරීමට නොහැකි රථ වාහන ප්‍රමාණය **5** කට වඩා අඩුවෙන් තබාගැනීමට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍ර බළඹයන් සමත්ව ඇත.

16. පසුගිය **2013** වර්ෂය තුළදී විශාල නිලධාරීන් හා සෙසුනිලයින් පිරිසක් ඔවුනට අදාල ක්ෂේත්‍ර ඔස්සේ පුහුණු කල අතර එමගින් ශ්‍රී ලංකා යුද හමුදාවේ ඵලදායිතාව වැඩි කරන්නට සමත්ව ඇත.

17. පසුගිය වසර තුල නිලධාරීන් **16** දෙනෙක් සෙබළු **459** දෙනෙකු බලකාය වෙතට අලුතින් බඳවා ගෙන ඇත.

18. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශය මගින් පවරන ලද ව්‍යාපෘති කිහිපයක් ද සාර්ථකව නිම කිරීමට ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු ඒකක සමත් විය. ඒ අතර දියත උයනේ ඉදි වූ කුඩාරම් **164** මාළු ටැංකි හා බස් නැවතුම් පොල **57** විශේෂයෙන් දැක්විය හැක.

19. **2013** වසරේ පැවැති ආරක්ෂක සමුළුව සඳහා භාවිතා වූ වාහන **691** හි අලුත්වැඩියා අපදා හරන හා නඩත්තු කටයුතු සිදුකිරීම ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය වෙතින් ඉටු වූ ප්‍රසංසනිය කාර්‍යභාර්යකි.

**<u>මූල්‍යමය විස්තර</u>**

20. 2013 වසරට රණවිරු නිවාස අරමුදල වෙත නිලධාරි/සෙසුනිලයන්ගේ වැටුප් හා දීමනා අඩුකිරීම් මගින් ලද ආදායම පහත සදහන් පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | විස්තරය | ඉදිරියට ගෙන යාම 2012 | ප්‍රමාණයෝ මගින් වෙන් කිරීම 2013 |
|---|---|---|---|---|
| | | | (රු: මිලියන | රු: මිලියන |
| | පුනරාවර්තන වියදම් | | | |
| 1. | 222-01-2-1205 (i) | ප්‍රවාහන අමතර කොටස් | 82.82 | 142.71 |
| 2. | 222-01-2-1205 (viii) | වැය ද්‍රව්‍ය | 22.15 | 50.00 |
| 3. | 222-01-2-1301 | වාහන නඩත්තුව හා අලුත්වැඩියාව | 108.71 | 200.14 |
| 4. | 222-01-2-1302 (i) | අලුත්වැඩියාව හා නඩත්තුව කාර්යාල උපකරණ හා විදුලි උපකරණ | 14.27 | 25.50 |
| 5. | 222-01-2 -1302-(vii) | ජ් වාහන | 5.17 | 10.50 |
| 6. | 222-01-2 -1302-(viii) | කාලතුවක්කු හි අලුත්වැඩියාව | - | 5.50 |
| 7. | 222-01-2-1302 (xi) | ජිව වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව | 2.49 | 11.00 |
| 8. | 222-01-2-1302 (xiii) | වැඩපල උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව | 1.62 | 4.00 |
| 9. | 103-01-7-1301 | වාහන නඩත්තු - වැය ශීර්ෂය | 0.11 | 7.62 |
| 10. | 105-02-3-1-2502 | ඉංජිනේරු වාහන | - | 7.50 |
| 11. | 222-01-2-2003 | ආරක්ෂක සමුළු වාහන | - | 44.00 |
| 12. | 103-01-07-2003 | වාහන නඩත්තු - වැය ශීර්ෂය | - | 0.55 |
| | ප්‍රධාන වියදම් | | | |
| 13. | 222-01-3-2002 (iii) | කාර්මික උපකරන අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරිම | 5.28 | 7.50 |
| 14. | 222-01-3-2003 (ii) | වාහන අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරිම | 60.66 | 100 |

## ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු

### හැඳින්වීම

1. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණු (ආමුයුහපු) 2012.01.29 වන දින ස්ථාපිත කරන ලදි. මෙහි ආයතන ආඥාපති වශයෙන් මේජර් ජෙනරල් නිලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරි අයෙකු ආඥාපති තනතුර හොබවන අතර, යුද්ධ හමුදා සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරියෙකි.

2. පහත සඳහන් යුද්ධ හමුදා පුහුණු පාසල් මෙම ආඥා මූලස්ථානය විසින් පාලනය කෙරේ.

අ. ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යාපීඨය.

ආ. නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය.

ඇ. යුද හමුදා පුහුණු පාසල.

ඈ. පාබල පුහුණු මධ්‍යස්ථානය.

ඉ. සටන් පුහුණු පාසල.

ඊ. යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල.

උ. ස්වේච්ඡා පුහුණු පාසල.

ඌ. ප්‍රගුණ වෙඩිකරු පුහුණු පාසල.

එ. කොම්පනි නොලත් නිලධාරි පුහුණු පාසල.

ඒ. සාම සාධක මෙහෙයුම් පුහුණු පාසල.

ඔ. හඨකාර්ය සම්පාදන පුහුණු පාසල.

### වගකීම්

3. ආඥා මූලස්ථානය යුද්ධ හමුදා පුහුණුහි වගකීම් නම් යුද හමුදා පුහුණුවීම් සංවර්ධනය කිරිම හා යුද හමුදාව සඳහා උපක්‍රමික හා මූලධර්ම හඳුන්වාදීම.

### දැක්ම

4. යුද හමුදාවේ ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු පුහුණුවීම් තුලින් දැනුම, කුසලතා හා ආකල්ප වැඩි දියුණු කර යුද්ධ හමුදා අනාගතයට උසස් ඵලදායිතාවයකින් හෙබි සෙබලුන් බිහිකිරීම.

### ඉටුකල කාර්යයන්

5. පහත සඳහන් සම්මන්ත්‍රණ මෙම මූලය වෙතින් වර්ෂය තුල පවත්වන ලදි.

අ. ඉංග්‍රීසි උපදේශක සම්මන්ත්‍රණය.

ආ. වාර්ෂික පුහුණු සමාලෝචන සම්මන්ත්‍රණය.

**<u>මූල්‍යමය විස්තර</u>**

6. මෙම මූලය වෙත පහත සඳහන් මුදල් ප්‍රතිපාදනයන් වෙන් කරදී ඇත.

| | | |
|---|---|---|
| අ. | පුනරාවර්ථන වියදම | රු: 25,000.00 (වැය වූ මුදල රු: 10,980.00) |
| ආ. | පත්තර සඳහා | රු. 90,000.00 (වැය වූ මුදල රු: 81,990.00) |
| ඇ. | අභ්‍යාස දීමණා ගිණුම | රු: 35,000.00 (වැය වූ මුදල රු: 35,000.00) |
| ඈ. | ක්‍රීඩා | රු: 15,000.00 (වැය කර නොමැත) |
| ඉ. | පවිත්‍රතා ද්‍රව්‍ය | රු: 40,000.00 (වැය වූ මුදල රු: 30,000.00) |
| ඊ. | භූමි නඩත්තු | රු: 40,000.00 (වැය වූ මුදල රු: 40,000.00) |
| උ. | ලිපි ද්‍රව්‍ය | රු: 350,000.00 (වැය වූ මුදල රු 197,255.20) |

## හකාස අණසක මූලස්ථානය

**හැඳින්වීම**

1. හකාස අණසක මූලස්ථානය යුධ හමුදා මූලස්ථානයට යටත්ව පවත්වාගෙන යන අතර, යුද්ධ හමුදාධිපති තුමා වෙතින් දෙනු ලබන වගකීම් හා රාජකාරි ඉටු කිරිමට බැදී සිටී.

2. හකාස අණසක මූලස්ථානය සාලාව, කොස්ගමහි ස්ථානගතව ඇත. සියලුම නිත්‍ය හමුදා සේවා රෙජිමේන්තු සහ ඉදිරි නඩත්තු ප්‍රදේශයන්හි පාලන කටයුතු මෙම මූලස්ථානය වෙතින් සිදු කරනු ලබයි.

**වගකීම්**

3. හකාස අණසක මූලස්ථානය වෙත සියලුම ඉදිරි නඩත්තු ප්‍රදේශයන් නිත්‍ය හමුදා සේවා ඒකකයන්හි පාලනමය කටයුතු රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා පාලනය කිරිමට වගකීම පැවරී ඇත.

**කාර්‍යයන්**

4. හකාස අණසක මූලස්ථානයේ කාර්යයන් පහත සදහන් පරිදි වේ.

අ. සෙබලුන් හා භාණ්ඩ නඩත්තු කිරිම් බෙදාහැරීම් ප්‍රතිපූර්ණය කිරිම.

ආ. මූලික සේවා සහ සැපයුම් නියමිත වේලාවන්වලට නියමිත ස්ථානයන් වෙත අවශ්‍ය ලෙස සහ ආර්ථිකමය වාසිදායක ලෙස අවශ්‍ය කාර්‍යයන් ඉටුකිරිම.

ඇ. හකාස අණසක මූලස්ථානය යුද්ධ හමුදාවේ සියලුම සේවා ඒකකයන්හි පාලනමය සහ පුහුණුවීම් කටයුතු කිරිමට බැදී සිටී.

ඈ. සියලුම සේවා ඒකකයන්හි වෘතීමය සෙබළුන් සඳහා පාලනමය කටයුතු සහ සම්බන්ධීකරණය කිරිම රෙජිමේන්තු මධ්‍යස්ථාන හරහා මෙම මූලස්ථානය වෙතින් සිදුකරනු ලබයි.

ඉ. සියළුම සේවා ඒකකයන් වෙත නියමිත පරිමාණයන්ට අනුව සම්පත් බෙදාහැරිම සිදුකරනු ලබයි.

ඊ. සියළුම සේවා ඒකකයන්වල වෘත්තීමය සෙබළුන් බඳවා ගැනීම් සහ වෘත්තීන් සඳහා ඉඳුරාම බඳවා ගැනීම් පිරිස් පාලන අධ්‍යක්ෂ තුමාගේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

උ. නීති සහ ප්‍රථිපත්තීන් වලට අනුව හය කාර්‍ය සම්පාදනයන්හි නිවැරදි ගබඩා කිරිම්, නඩත්තු කිරිම්, ලිපිලේඛණ නඩත්තුව සහ බෙදාහැරීම්/නිකුත් කිරිම් ආදී පරීක්ෂාවට ලක් කිරිම.

ඌ. සියළුම වෘත්තිය පුහුණු, වෘත්තිය පරීක්ෂණ සහ වෘත්තියගත කිරිම් වලට අදාල ප්‍රථිපත්ති හා සම්බන්ධීකරණ කටයුතු ඉටු කිරිම.

එ. වෘත්තිය පුහුණු පාඨමාලා සහ වෘත්තිය පරීක්ෂණ නියමිත ප්‍රතිපත්ති වලට අනුව විධිමත්ව සකස් කිරීම.

ඒ. සියළුම ඒකකයන්හි කාර්මික සෙනින්ගේ ඇතුලත් කිරීම්/යා කිරීම් අනුමත සංස්ථාවට අනුව සම්බන්ධීකරණය කිරීම.

ඔ. සියළුම සේවා ඒකකයන්හි සෙනින්ගේ නිල ස්ථිර කිරීම් සහ ස්ථිර ඇතුලත් කිරීම්/යා කිරීම් ප්‍රමිතියකට අනුව සිදුකිරීම.

ඕ. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල හා සම්බන්ධතාවයෙන් සලාක සහ ගබඩා යන ආදිය සබැඳිව විටින් විට පරීක්ෂා කිරීම සහ උපදෙස් ලබාදීම.

ක. සියළුම සේවා රෙජිමේන්තුවල අරමුදල් සහ ගිණුම් පිලිබඳ පරීක්ෂා කිරීම.

ග. සියළුම සේවා ඒකකයන්හි වාර්ෂික හරි වැරදි බැලීම/අයෝග්‍ය කිරීම/විනාශ කිරීම පිලිබඳව සොයා බැලීම.

ච. සේවා ඒකකයන්හි සියළුම කමිටු හා මණ්ඩල පත්කිරීම් සිදුකිරීම.

ට. වෘත්තිය සෙබළුන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සහ නඩත්තු කිරීම.

ඩ. මීට අමතරව යුද හමුදාධිපතිතුමා වෙතින් දෙනු ලබන උපදෙස් අනුව ක්‍රියා කිරීම.

<u>**වාර්ෂික සමාලෝචනය**</u>

5. අභිනවයෙන් ඉදිකරන ලද 1 වන ශ්‍රීලංකා යුධ හමුදා සේවා බලකා ඉන්ධන පිරවුම්හල විවෘත කිරීම.

6. නිලධාරි නිවස්න සංකිර්ණයේ නාන කාමර 08 ක් අලුත්වැඩියා කරන ලදි.

<u>**මූල්‍යමය විස්තරය**</u>

7. මූල්‍යමය තොරතුරු පහත සදහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | ප්‍රතිපාදන | වියදම් | ඉතිරිය |
|---|---|---|---|---|
| 1. | භූමි නඩත්තු | 40 000.00 | 40 000.00 | - |
| 2. | පවිත්‍රතා ද්‍රව්‍යන් | 35 000.00 | 35 000.00 | - |
| 3. | බැරැක්ක භාණ්ඩ අලුත්වැඩියාව | 300 000.00 | 299 555.04 | 444.96 |
| 4. | පුවත්පත් | 31 200.00 | 31 200.00 | - |
| 5. | ලිපිද්‍රව්‍ය | 375 000,00 | 374 503.30 | 496.70 |
| 6. | අභ්‍යාස දීමනා | 8 000.00 | 8 000.00 | - |
| 7. | දුම්රිය ගමන් බලපත්‍ර | 15 000.00 | 6 340.00 | 8 660.00 |
| 8. | බස් ගමන් බලපත්‍ර | 5 000.00 | 2 693.00 | 2 307.00 |
| 9. | ක්‍රීඩා භාණ්ඩ | 11 500.00 | 11 430.00 | 70.00 |

## ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය

### හැඳින්වීම

1. යුධ හමුදාධිපති තුමාගේ උපදෙස් පරිදි යුධ හමුදා අවශ්‍යතාවය පරිදි ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් කාර්‍යක්ෂමව ඉටුකිරීම සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය 2007 මාර්තු මස 12 වන දින ආරම්භ කර ඇත. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානයේ වගකීම වනුයේ ක්ෂේත්‍ර රජකාරි සහ ව්‍යාපෘති රාජකාරි බළකාය වෙත පැවරීම සහ අධීක්ෂණය කිරීමයි. යුද්ධ හමුදාධිපති තුමා සහ යුධ හමුදා මූලස්ථානය ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් පිළිබඳව උපදේශකත්වය ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු විසින් ලබාදිය යුතුය. රජය විසින් ඉටු කරනු සිඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමය සඳහා ඉංජිනේරු බළකාය විසින් ක්ෂේත්‍ර ඉංජිනේරු/යන්ත්‍ර රාජකාරීන් මෙන්ම මානුෂිය බිම්වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇත.

### වගකීම

2. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු වගකීම වනුයේ ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් පිළිබඳව හමුදාධිපති තුමා දැනුවත් කිරීම සහ ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු යටතේ පාලනය වන සමස්ත ඉංජිනේරු නිලධාරි/සෙසු නිලයන්ගේ විනය කටයුතු පිළිබඳ සොයා බැලීමයි.

### කාර්යය

4. ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානයේ වගකීම හා රාජකාරීන් පහත සඳහන් පරිදි වේ.

අ. ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් හා වෙස්වලා ගැනීමේ රාජකාරි සඳහා ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම.

ආ. න්‍යෂ්ඨික ජීව විද්‍යාත්මක රසායනික සහ විකිරන උපකරණ සබැඳිව උපකරණ නිර්මාණය කිරීම, එවැනි ප්‍රහාරයකට මුහුණදීම සඳහා අවශ්‍ය සැලසුම් සිදුකිරීම.

ඇ. මාණ්ඩලික රාජකාරි, ක්‍රියාන්විත සැලසුම් සහ ඉංජිනේරු රාජකාරීන් ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් කිරීම හා අධීක්ෂණය කිරීම.

ඈ. ඉංජිනේරු රාජකාරීන් වලදී සිවිල් ආයතන වෙත යුද හමුදා මූලස්ථානය නියෝජනය කරමින් උපදෙස් ලබාදීම.

ඉ. ඉංජිනේරු උපකරණ හා වෙඩි ද්‍රව්‍ය ගබඩා කිරීම පිළිබඳ ප්‍රතිපත්ති පිළිබඳ වගකීම.

ඊ. අනෙකුත් යුද හමුදා ආයතන වල ක්ෂේත්‍ර ඉංජිනේරු හා පස්කණින යන්ත්‍ර අවශ්‍යතාවයන් ඉටුකරදීම.

උ. ඉංජිනේරු බුද්ධි තොරතුරු එක්රැස් කිරීම පාලනය කිරීම හා වසන් කිරීම.

ඌ. ඉංජිනේරු බළකායේ ආයතනයන්හි කාලිනව සිදුවිය යුතු වෙනස්වීම් අනාගත සැලසුම් අනුව වෙනස් කිරීමට සැලසුම් කිරීම.

එ. මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සබැඳිව අධීක්ෂණය හා ඒ සබැඳිව වගකීම දැරීම.

ඒ. ඉංජිනේරු බලකායේ සිදුකරනු ලබන පුහුණුවීම් සබැඳිව සැලසුම් කිරීම සහ සොයාබැලීමේ වගකීම දැරීම.

ඔ. ඉංජිනේරු රාජකාරින්ට අදාල පුහුණුවීම් සඳහා අවශ්‍ය උපකරණ ද්‍රව්‍ය දේශීය සහ විදේශීය ආයතන වෙතින් යුධ හමුදා මූලස්ථානයේ උපදෙස් මත ලබා ගැනීම.

ඕ. ඉංජිනේරු රාජකාරීන් පිළිබඳ තාක්ෂණික තොරතුරු ලබාදීම.

ක. ක්ෂේත්‍ර ඉංජිනේරු රාජකාරීන් සිවිල් ආයතන සමග සම්බන්ධව වගකීම.

ග. ස්වභාවික විපත් සහ හදිසි ආපදා තත්වයන් වලදී අවශ්‍ය ඉංජිනේරු හට පිරිස් සහය ලබාදීම පිළිබඳ සොයා බැලීම හා යුධ හමුදාපති තුමාට ඒ පිලිබඳ උපදෙස් ලබාදීම.

ජ. බෝම්බ නිෂ්ක්‍රිය කිරීමේ නිවැරදි පිළිවෙත් අනුගමනය කරවීම හා ඒ සබැඳිව පුහුණුවීම් සිදුකරවීම

__වර්ෂික සමාලෝචනය__

5. පසුගිය වසර තුල ප්‍රධාන වශයෙන් දිවයිනේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති රාජකාරීන් සඳහා සහය ලබාදීම මෙන්ම යුද හමුදා ව්‍යාපෘතීන් ඉටුකිරීම සිදුකරන ලදී. එමෙන්ම මානුෂ්‍යවාදී බිම් වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා සෙනින් යොදවා කඩිනමින් සිදුකරනු ලබන නැවත පදිංචි කිරීම සහ එම ප්‍රදේශයන්හි සංවර්ධන ක්‍රියාදාමයන්ට සහය වන ලදී.

6. ඉංජිනේරු සෙබලුන් විසින් පසුගිය වසර තුල සිදුකරන ලද රාජකාරීන් අතුරින් ශ්‍රීපාදය වෙත ගමන් කරනු ලබන හැටන් නල්ලතන්න මාර්ගයේ රතු පාලම ප්‍රතිසංස්කරණය කිරීම ශ්‍රීපාද රජමාවත ප්‍රතිසංස්කරණය කිරීම එම මාර්ගයේදී හමුවන අම්බලන් 04 ක් ඉදිකිරීම ප්‍රධාන තැනක් ගනී රජයේ කඩිනම් සංවර්ධන වැඩපිළිවෙල යටතේ වැව් ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම පාසැල් ක්‍රීඩාපිටි සැකසීම අනෙකුත් ආයතන වලට අවශ්‍ය ඉදිකිරීම් සඳහා භූමිය සකසාදීම ප්‍රධාන වශයෙන් සිදුකරන ලද පස්වැඩ රාජකාරීන් යටතේ ආබාධිත රණවිරුවන් වෙනුවෙන් ඉදිකරනු ලබන අභිමංසල ව්‍යාපෘතිය සහ අපි වෙනුවෙන් අපි නිවාස ව්‍යාපෘතිය ඉටුකරන ලදී.

__2013 වර්ෂයේ මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ විස්තරය__

7. යුධ හමුදා මානුෂ්‍යවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකකය වෙත රාජකාරීන් ඉටුකිරීම සඳහා වන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් 2013 වර්ෂය සඳහා පහත දක්වා ඇති එක් එක් විෂයන් වෙනුවෙන් රු.මි. 100 ක ප්‍රතිපාදනයක් යුධ හමුදාව වෙත වෙන් කර දෙන ලදී.

| අනු අංකය | ප්‍රතිපාදන | මුදල (රු) |
|---|---|---|
| 1. | ඉන්ධන සහ ලිහිසි තෙල් සඳහා | 15,000,000.00 |
| 2. | මාබිඉකි උපකරණ | 27,898,880.00 |
| 3. | මාබිඉකි වාහන අලුත්වැඩියා/සේවා සඳහා | 7,500,000.00 |
| 4. | MV4 & BOZENA අලුත්වැඩියා/නඩත්තු සඳහා | 45,201,120.00 |
| 5. | මාබිඉකි සුණඛයින්ගේ අවශ්‍යතා සඳහා | 300,000.00 |
| 6. | වෙනත් අවශ්‍යතාවයන් සඳහා | 4,100,000.00 |
| | මුලු එකතුව (රු) | 100,000,000.00 |

8. මේ වන විට මානුෂවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා 1, 5, 6, 7, 8, 9, 10, 11, 12 සහ 14 කාරක ඉංජිනේරු රෙජිමේන්තු යොදවා ඇති අතර, ඒ යටතේ සෙනින් 1286 දෙනෙකු ඉංජිනේරු බලසේනා මූලස්ථානයේ අධීක්ෂණය මත ආර්ථික සංවර්ධන අමාත්‍යංශය යටතේ තත් රාජකාරීන් ඉටුකරනු ලබයි.

9. දිවයිනේ උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි 2013 වර්ෂය වන විට බිම්වෙඩි ඉවත් කිරීම සඳහා ඉතිරිව ඇති භූමි ප්‍රමාණය වර්ග මීටර් 83,852,382 ක් වන අතර, යුධ හමුදා මානුෂවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකකය වෙතින් මේ දක්වා වර්ග මීටර් 1,610,345,618 ක් වන අතර, 2013 ජනවාරි මස 01 දින සිට 2013.12.31 දින දක්වා දිස්ත්‍රික් වශයෙන් භූමිය නිසැක කර ඇති ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | දිස්ත්‍රික්කය | නිසැක කර ඇති සම්පූර්ණ ප්‍රමාණය | සොයා ගැනීම් | | |
|---|---|---|---|---|---|
| | | | පුද්ගල නාශක | යුධ ටැංකි නාශක | පුපුරා නොගිය වෙඩි ද්‍රව්‍ය |
| 1. | මඩකලපු | 42,436 | 350 | | 56 |
| 2. | අම්පාර | 5,752 | 17 | | 15 |
| 3. | යාපනය | 36,857 | 105 | 3 | 17 |
| 4. | මන්නාරම | 112,255 | 580 | 2 | 14 |
| 5. | කිලිනොච්චි | 105,187 | 42 | | 25 |
| 6. | මුලතිව් | 3,656,406 | 1,411 | | 943 |
| 7. | වව්නියාව | 110,690 | 174 | | 4 |
| 8. | අනුරාධපුරය | 248 | 26 | | |
| 9. | පොළොන්නරුව | 23,709 | 29 | | |
| 10. | ත්‍රිකුණාමලය | 12,514 | 16 | | |
| | එකතුව | 4,106,054 | 2,750 | 5 | 1,074 |

10. එක්සත් ජාතීන්ගේ ලෝක ළමා ආරක්ෂණ අරමුදල සහයෝගය ඇතිව බිම්වෙඩි අවධානම පිළිබඳ සිවිල් පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩසටහන යටතේ යුධ හමුදා මානුෂවාදී බිම්වෙඩි ඉවත් කිරීමේ ඒකකය වෙතින් බිම්වෙඩි අවධානම ඇති ප්‍රදේශයන්හි 2013 වර්ෂය තුළ දිස්ත්‍රික් අනුව සිදුකර ඇති වැඩසටහන් සඳහා සහභාගි වූ පුද්ගලයින් සහ ළමුන් ප්‍රමාණය පහත දක්වා ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | සහභාගි වූවන් | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | වැඩිහිටි | | ළමුන් | | |
| | | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | |
| 1. | යාපනය | 1,042 | 897 | 1,140 | 1,034 | 4,113 |
| 2. | කිලිනොච්චි | 379 | 385 | 576 | 559 | 1,899 |
| 3. | නැගෙනහිර පළාත | 311 | 235 | 179 | 199 | 924 |
| 4. | වව්නියාව | 46 | 68 | 36 | 38 | 188 |
| 5. | මුලතිව් | 644 | 543 | 387 | 484 | 2,058 |
| | එකතුව | 2,422 | 2,128 | 2,318 | 2,314 | 9,182 |

**වාර්ෂික සමාලෝචනය**

12. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක කරනු ලබන ජාතික සංවර්ධන ව්‍යාපෘති නැවත ඉදිකිරීම් හා නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘති වෙනුවෙන් ක්ෂේත්‍ර ඉංජිනේරු වෙතින් සමීප සම්බන්ධතාවයක් ලබාදේ. ශ්‍රීලංකා ඉංජිනේරු බලකාය වෙතින් සංවර්ධනය සඳහා යටිතල පහසුකම් සැපයීම, මාර්ග නවීකරණය කිරීම, අභ්‍යන්තර අවතැන්වූවන් නැවත පදිංචිකරවීම සඳහා වගා සංවර්ධන කටයුතු සිදු කිරීමෙන් ජීවන තත්වය නංවාලීමේ අරමුණින් යුතුව කැලෑ එළිපෙහෙළි කිරීම හා මාර්ග සැකසීම සිදු කෙරේ. ඊට අමතරව දිවයින පුරා මාර්ග සැකසීම ක්‍රීඩාංගණ ඉදිකිරීම වාරි මාර්ග කටයුතු නංවාලීමේ අරමුණින් ඇළ මාර්ග නවීකරණය කරදීම වැනි කටයුතු තුළින් මනා දායකත්වය සංවර්ධනය සඳහා ඍජුව/වක්‍රව ලබාදෙනු ලබයි. මෙම කටයුතු ඉටුකිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙතින් තාවකාලිකව **"උතුරු වසන්තය වැඩසටහන"** යටතේ ලබාදෙන ලද පස් කණින යන්ත්‍ර/වාහන හා උපකකරණ සියල්ල යුද හමුදාව වෙත ස්ථිර වශයෙන්ම මෙම වර්ෂයේදී ලබාදී ඇත. අදාළ යන්ත්‍ර/වාහන වාර්ථාව පහත පරිදි වේ.

| අනු අංකය | යන්ත්‍ර/වාහන වර්ගය | එකතුව |
|---|---|---|
| 1. | ඩම්ප් ට්‍රක් රථ | 29 |
| 2. | ඩෝසර් යන්ත්‍ර | 22 |
| 3. | මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර | 37 |
| 4. | එක්ස්කැවේටර් යන්ත්‍ර | 12 |
| 5. | මිනි එක්ස්කැවේටර් යන්ත්‍ර | 8 |
| 6. | බැක්හෝ ලෝඩර් යන්ත්‍ර | 46 |
| 7. | වීල් ලෝඩර් යන්ත්‍ර | 17 |
| 8. | රෝඩ් රෝලර් යන්ත්‍ර | 9 |
| 9. | මිනි රෝඩ් රෝලර් යන්ත්‍ර | 26 |
| 10. | වෝර්ක් බිහයින්ඩ් රෝලර් යන්ත්‍ර | 10 |
| 11. | දොඹකර රථ | 7 |
| 12. | වතුර බවුසර් රථ | 15 |
| 13. | කාගෝ බූම් ට්‍රක් රථ | 4 |
| 14. | හයිබෙඩ් රථ (ට්‍රේලර් සමග) | 8 |
| 15. | ඉන්ධන බවුසර් | 2 |
| මුළු එකතුව | | 252 |

13. ඉංජිනේරු බලකාය වෙතින් ඉටුකරන ලද ප්‍රධාන ගණයේ ව්‍යාපෘති සබැඳිව විස්තර පහත දක්වා ඇති පිරිදි වේ.

අ. ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය බත්තරමුල්ල.

ආ. ශ්‍රීපාද රජමාවතේ ශ්‍රී පලාබද්දල දක්වා වූ මාර්ග සැකසීම - අදියර III

ඇ. ශ්‍රීපාද මාර්ගයේ හැටන් - නල්ලතන්නි රතු පාලම ඉදිකිරීම.

ඈ. පූර්ණ රණක්ෂිතයට පත් රණවිරුවන් උදෙසා 'අභිමන්සල' පාන්ගොල්ල ව්‍යාපෘතිය - අදියර III.

ඉ. 'සඳහිරුසෑය' ව්‍යාපෘතිය ඉදිකිරීම - අනුරාධපුරය.

ඊ. කිරමලේ ඉදිකරනු ලබන ජනාධිපති කාර්යාලීය විශේෂ ව්‍යාපෘතිය සඳහා පස් කියුබ් **9000** ක් ප්‍රවාහනය කරදීම.

උ. දියවන්න පුරා යුධ හමුදා සහ පොලිස් පෙරහැර ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භූමිය සකසාදීමේ ව්‍යාපෘතිය.

ඌ. විදේශ රැකියා, ප්‍රවර්ධන හා සුභසාධක කටයුතු අමාත්‍යාංශය වෙත ද්විත්ව යකඩ ඇඳන් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය.

එ. දකුණු පළාත් සභාව වෙතින් මුදල් ප්‍රතිපාදන ලබාගෙන බද්දේගම මාකරුගොඩවත්ත ක්‍රීඩාපිටිය ඉදිකිරීම.

ඒ. මැදවච්චිය බෝගහවැව හා කුලික්කඩා වැව නවීකරණය කිරීම.

ඔ. කොළඹ විශ්ව විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම.

ඕ. වැලිඔය ප්‍රදේශයෙ නැවත පදිංචිකිරීමේ කටයුතු සඳහා කැළෑ එළිපෙහෙළි කිරීම.

ක. ගාල්ල නෙළුව මාර්ග සැකසීමේ ව්‍යාපෘතිය.

ග. සූරිය වැව දක්ෂින මණ්ඩපය කොතලාවල ආරක්ෂක විද්‍යාපීඨය ඉදිකිරීමේ පස්වැඩ රාජකාරි.

ජ. පොළොන්නරුව රාජකීය විද්‍යාලයේ පස්වැඩ රාජකාරි.

ට. බදුල්ල කසල එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය සැකසීම.

ඩ. නැවත පදිංචිකරවීමේ කටයුතු සඳහා අවරන්තුලාව හා සෙට්ටිකුලම ප්‍රදේශයේ කැළෑ එළිපෙහෙළි කිරීම.

න. අම්පාර හාඩි කාර්මික විද්‍යාලයේ පැවති 'දැයට කිරුළ' ජාතික ප්‍රදර්ශණය සඳහා භූමිය සැකසීම.

ප. ගල්නෑව හා දිගම්පතන රණවිරු නිවාස ව්‍යාපෘති සඳහා භූමිය සැකසීම.

බ. යුධ හමුදා රෝහල (නාරාහේන්පිට) භූමි පරිශ්‍රයේ පස්වැඩ රාජකාරි.

ම. විවිධ යුධ හමුදා රෙජිමේන්තු වලින් සිදුකරනු ලබන කැවල්රි සුපර්ක්‍රොස්, ගනර් සුපර්ක්‍රොස්, 4x4 ජිම්පෝ සුපර්ක්‍රොස්, ගජබා සුපර්ක්‍රොස්, විජයබා සුපර්ක්‍රොස්, වලව සුපර්ක්‍රොස් සහ ෆොක්සිහිල් සුපර්ක්‍රොස් සඳහා ධාවන පථ නවීකරණය කරදීම.

ය. වාර්ථමානයේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන අධිකරණය වෙතින් ක්‍රියාත්මක සංවර්ධන සැළසුම් සඳහා යන්ත්‍රෝපකරණ හා යාන්ත්‍රික ඉංජිනේරු සහය ලබාදීම.

14. ශ්‍රීලංකා ඉංජිනේරු බලකාය වෙතින් මෙම වසර තුල ක්‍රියාත්මක කරනු ලැබූ යුද හමුදා සහ ජාතික සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තුගත වියදම් සාරාංශය පහත පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වියදම |
|---|---|---|
| 1 | යුධ හමුදා ව්‍යාපෘති | 249,661,749.35 |
| 2 | ජාතික සංවර්ධන ව්‍යාපෘතිය | 333,756,881.28 |
| මුළු එකතුව | | 583,418,630.63 |

**<u>මූල්‍යමය විස්තරය</u>**

15. **2013** වර්ෂය සදහා ප්‍රධාන ක්ෂේත්‍ර ඉංජිනේරු මූලස්ථානය වෙත වෙන්කර ඇති විවිධ වැය ශීර්ෂයන් යටතේ ලබාදුන් ප්‍රථපාදනයන් වියදම් පහත පරිදි වේ.

| අනු අංකය | වැය ශීර්ෂය | මුලු ප්‍රථිපාදන | මුලු වියදම් | වැය ශීර්ෂයේ ඉතිරි මුදල |
|---|---|---|---|---|
| 1. | **222-01-3-2002**(i) යන්ත්‍රෝපකරණ පුණරුත්තාපනය හා වැඩි දියුණු කිරිමේ වැය ශීර්ෂය | 65,000,000.00 | 64,990,773.43 | 9,226.57 |
| 2. | **222-01-2-1205** (xxii) යන්ත්‍ර සදහා අමතර කොටස් මිලදී ගැනිමේ වැය ශීර්ෂය | 45,000,000.00 | 44,996,992.34 | 3,007.66 |
| 3. | **222-01-2-1205** (xxiii) දැම්ටෝ සී වාහන සදහා යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ගනු ලබන ටයර් ටියුබ් හා බැටරි වෙනුවෙන් වන වැය ශීර්ෂය | 75,000,000.00 | 74,785,687.20 | 214,312.80 |
| 4. | **222-01-2-1302**(v) යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරිම හා නඩත්තු කිරිමේ වැය ශීර්ෂය | 19,000,000.00 | 18,427,469.36 | 5,850.14 |
| 5. | **222-01-2-1401** (iv) කුලි ගෙවිමේ පදනම මත යන්ත්‍ර වාහන පවරා ගැනිමෙ/ වැය ශීර්ෂය | 5,000,000.00 | 115,584.00 | 4,884,416.00 |

# ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය

## හැඳින්වීම

1. යුද්ධ හමුදාවේ අණ හා පාලන, සන්නිවේදන, පරිගණක, බුද්ධි තොරතුරු හා පරිපාලනය සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීම සහ තොරතුරු හා විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානයේ ප්‍රමුඛ රාජකාරි වේ. මෙම භාරදූර කර්තව්‍යයට සාර්ථකව මුහුණදීම සඳහාද, සංවිධානාත්මක කටයුතු සම්බන්ධීකරණය සඳහා ද 44/2007 යන යුද්ධ හමුදා චර්යා නියෝග මගින් අවැසි කාර්යභාරය හා කාර්යයන් ඉදිරිපත් කර ඇත.

2. ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය යටතේ පාලනය වනු ලබන අනිකුත් මූලස්ථාන පහත පරිදි වේ.

අ. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය.

ආ. සංඥා බලසේනා මූලස්ථානය.

ඇ. 11 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව.

ඈ. සංඥා මූලික වැඩපල.

## වගකීම්

3. <u>තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය</u>. ප්‍රධාන සංඥා නිලධාරිගේ මගපෙන්වීම යටතේ ශ්‍රීලංකා යුද්ධ හමුදාවේ තොරතුරු තාක්ෂණික රාජකාරි ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම.

4. <u>සංඥා බලසේනා මූලස්ථානය</u>. යුධමය අවස්ථාවන්හිදී සහ සාමය පවතින අවස්තාවන්හිදී ප්‍රධාන සංඥා නිලධාරිගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ, පාලනය හා පරිපාලනයට ඇවැසි සංඥා සම්බන්ධතා සහ විද්‍යුත් සංග්‍රාම අවශ්‍යතාවයන් සපයා දීම.

5. <u>11 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව</u>. ප්‍රධාන සංඥා නිලධාරිගේ මගපෙන්වීම යටතේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ හා පාලනයට ඇවැසි තොරතුරු තාක්ෂණ අවශ්‍යතාවයන් සපයා දීම.

6. <u>සංඥා මූලික වැඩපල</u>. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සියලුම සන්නිවේදන උපාංග අලුත්වැඩියා කිරීම, පවත්වාගෙන යාම, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති කරගෙන යාම සහ තාක්ෂණික උපදෙස් ලබාදීම.

## සංඥා බලකායේ අරමුණ

7. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ හා පාලනයට අවැසි සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්ෂණය සහ විද්‍යුත් සංග්‍රාම අවශ්‍යතාවයන් සපයා දීම.

**ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයේ කාර්යභාරය**

8. ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයේ කාර්ය්‍ය භාරයන් පහත පරිදි වේ.

අ. යුද්ධ හමුදාධිපති වෙත අණ හා පාලනය, සංඥා, පරිගණක, තොරතුරු (C4I) සහ විද්‍යුත් සංග්‍රාමික කටයුතු ඇතුලු සියලුම සංඥා සම්බන්ධතා පිළිබඳ උපදේශ අවශ්‍ය වූ විට ලබා දීම.

ආ. අණ හා පාලනය, සංඥා, පරිගණක, තොරතුරු (C4I) සහ විද්‍යුත් සංග්‍රාමික කටයුතු වලට සම්බන්ධ සියලුම සංඥා සම්බන්ධතා කටයුතු සැලසුම් කිරීම, ඇගයීම සහ පරීක්ෂා කිරීමේ කටයුතු සිදුකිරීම.

ඇ. සියලු සංඥා වැය ශීර්ෂ පාලනය කිරීම, ඉදිරි වාර්ෂික මිලදී ගැනීම් සැලසුම් කිරීම, සියලු සංඥා උපකරණ (සංඥා, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික) තොගයට ගැනීම, බෙදාහැරීම, පවත්වාගෙන යාම හා අලුත්වැඩියා සිදුකිරීම.

ඈ. සියලු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාම උපකරණ සබැඳිව පර්යේෂණ හා සංවර්ධන කටයුතු හඳුනා ගැනීම සහ එම කටයුතු ක්‍රියාවට නැංවීම.

ඉ. සියලු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික උපකරණ හා කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති, නියෝග, උපදෙස් හා ක්‍රියාපටිපාටි ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

ඊ. ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ගුවන්, නාවික, පොලිස්, පොදු සහ පුද්ගලික අංශ සමග සහයෝගයෙන් සංඛ්‍යාත පරාස කළමණාකරණය කිරීම.

උ. ජාතික ආරක්ෂාව පිළිබඳ සියලු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්ෂණ සහ විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාකාරකම් පිළිබඳ ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යංශයට අවශ්‍ය පරිදි උපදෙස් ලබාදීම.

ඌ. සංඥා සහ තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳ සියලු රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා අවැසි උපදෙස් අවශ්‍යතාවය අනුව ලබාදීම.

එ. විදුලි සංදේශ හා සංඛ්‍යාත පරාස සම්බන්ධයෙන් පැන නගින ගැටලුවලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය සහ සහයෝගීව කටයුතු කිරීම.

ඒ. සංඥා බලකායේ පුහුණු ප්‍රතිපත්ති ක්‍රමවත්ව සැකසීම සහ ඇගයීමට ඇවැසි පුහුණු අරමුණු ඉටුවන අයුරින් සිදුකිරීම.

ඔ. සංඥා බලකායේ ප්‍රධාන කාර්ය්‍යයන් හා අනෙකුත් අතිරේක හා උප කාර්ය්‍යයන් සංඥා බලසේනා මූලස්ථානය සහ අනෙකුත් ඒකක මගින් නිවැරදිව සිදුවන බවට තහවුරු කරගැනීම.

<u>**වාර්ෂික සමාලෝචනය**</u>

10. <u>ගුවන් විදුලි සන්නිවේදනය</u>. ඉන්දියාවේ එම්එස් භාරත් ඉලෙක්ට්‍රොනික් ආයතනය විසින් ලබා දුන් LHP 265DE අධි සංඛ්‍යාත ට්‍රාන්සිවරය භාවිතයෙන් අධි සංඛ්‍යාත ගුවන් විදුලි ජාලය ස්ථාපනය කිරීම සහ යුධ හමුදා මූලස්ථානයේ උපදෙස් පරිදි CHOGM වැනි විශේෂ අවස්ථාවන් ඇතුලු විවිධ අවස්ථා 240 ක් සඳහා සංඥා සම්බන්ධතාවයන් ලබාදී ඇත.

11. <u>රැහැන් දුරකථන සන්නිවේදනය</u>. අලුතින් ඉදිකරන ලද මූලස්ථාන, ආයතන හා පුහුණු ආයතන සඳහාද දුරකථන පහසුකම් ලබාදෙන ලදි. සීමිත සම්පත් ප්‍රයෝජනයට ගනිමින් දුරකථන හුවමාරු සහ දුරකථන මාර්ග ධාරිතාව වර්තමාන ග්‍රාහක අවශ්‍යතාවයන් මත වැඩිදියුණු කිරීමේ ක්‍රියා පිළිවෙතක් දියත් කරන ලදි.

අ. 2013 වර්ෂයේදී ලබාදුන් නව දුරකථන හුවමාරු පහසුකම් පහත සඳහන් පරිදි වේ.

(1) සෙනෙහස අධ්‍යාපන ආයතනය.

(2) රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලංකා යුධ හමුදා යුධෝපකරණ බලකාය - දොඹගොඩ.

(3) රණවිරු සෙවන - රාගම.

(4) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල- කොළඹ.

(5) ආරක්ෂක මාණ්ඩලික ප්‍රධාන නිළ නිවස.

(6) 1 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය.

ආ. නැවත සකස් කරන ලද හා අලුත්වැඩියා කරන ලද හුවමාරුවන් පහත සඳහන් පරිදි වේ.

(1) 2 වන ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකාය - ගිරිතලේ.

(2) රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය.

(3) 57 සේනාංක මූලස්ථානය.

(4) 53 සේනාංක මූලස්ථානය.

(5) 56 සේනාංක මූලස්ථානය.

(6) රෙජිමේන්තු මධ්‍යස්ථානය සන්නද්ධ බුද්ධි බලකාය.

(7) ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලය - මත්තේගොඩ.

(8) ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය).

(9) ඉංජිනේරු පාසල - ඇඹිලිපිටිය.

(10) මූලික යුධෝපකරණ ගබඩාව - මරදාන.

(11) 512 බලසේනා මූලස්ථානය.

(12) 6 වන ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය.

(13) ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපල- කටුබැද්ද.

(14) ත්‍රිපොලි යුධ හමුදා කඳවුර - මරදාන.

12. <u>යුධ හමුදා දත්ත ජාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය</u>. යුධ හමුදා දත්ත ජාලය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ වූයේ අනාගත අවශ්‍යතාවයන්ට සරිලන ලෙස යුද්ධ හමුදා මූලස්ථානය සහ සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සමග අනෙකුත් ක්ෂේත්‍ර මූලස්ථාන සහ පුහුණු මධ්‍යස්ථාන ජාලගත කිරීම තවදුරටත් සංවර්ධනය කිරීම සඳහායි. 2012 වසරේ ආරම්භ කල මෙම ව්‍යාපෘතිය 2013 වසර තුළදී පහත සඳහන් පරිදි වැඩිදියුණු වන ලදී.

අ. ශ්‍රී ලංකා යුධ හමුදා දත්ත ජාල සම්බන්ධතාවය ලබාදෙන ලද ස්ථාන.

(1) වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) යුධ හමුදා යහසාධක අධ්‍යක්ෂ මණ්ඩලය.

(3) ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම).

(4) 59 වන සේනාංක මූලස්ථානය.

(5) 64 වන සේනාංක මූලස්ථානය.

ආ. ප්‍රාදේශීය කොට්ඨාශ ජාලයන් ක්‍රියාවට නැංවීම.

(1) සිවිල් පාලන අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) නිලධාරි ප්‍රගණන ප්‍රවර්ධන මධ්‍යස්ථානය - බුත්තල.

(3) සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය - කුකුලේගඟ.

(4) ඉංජිනේරු බලසේනා මූලස්ථානය.

(5) 212 බලසේනා මූලස්ථානය.

(6) 222 බලසේනා මූලස්ථානය.

(7) 231 බලසේනා මූලස්ථානය.

13. <u>ජංගම සන්නිවේදන ජාලය</u>. ආරක්ෂක අමාත්‍යංශය හා ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය විසින් සීමාසහිත ඩයලොග්, මොබිටෙල්, සීමාසහිත භාරතී එයාටෙල් සහ එටිසලාට් යන පුද්ගලික ආයතන එකමුතුව ජංගම සම්ප්‍රේෂණ ස්ථාන (කුලුණු) යුධ හමුදා කඳවුරු තුළ පිහිටුවීමත්, එමගින් ජංගම සන්නිවේදන ජාලය උතුරේ සිට නැගෙනහිර දුෂ්කර ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීමටත්, අනෙකුත් ජංගම සන්නිවේදන සේවාවන් සඳහා අවශ්‍යතාවයන් සපයා දෙමින් එම ජාලයන් ව්‍යාප්ත කිරීම තව දුරටත් කරගෙන යන ලදී.

14. <u>ජංගම ජාලය ව්‍යාප්ත කිරීමේ ව්‍යාපෘතිය සඳහා සහාය දැක්වීම</u>. මොබිටෙල් පුද්ගලික ආයතනයෙහි ඉල්ලීම මත යුද්ධ හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි 2013 වර්ෂයේදී මොබිටෙල් සමාගම විසින් ආරම්භ කල ව්‍යාපෘතියේ 7 වන අධියරය උදෙසා ශ්‍රී ලංකා හමුදා කාර්මික අනුග්‍රහයකත්වය ලබාදෙමින් පවතී. මෙම ව්‍යාප්පෘතිය 2014 වර්ෂයේදී නිම කිරීමට නියමිතව ඇත.

15. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය</u>. වර්තමානයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දැනුමෙහි අවශ්‍යතාවය සලකා බැලීමේදී 2001 වර්ෂයේදී රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය පිළිබඳ සංකල්පය ප්‍රමුඛස්ථානයක් ගන්නා ලදී. රණවිරු පවුල්වල දරුවන්ගේ සහ සේවයෙන් විශ්‍රාමලත් නිලධාරින්ගේ සහ සෙසු නිලයින්ගේ පවුල් සඳහා සුභ සාධක වැඩ පිළිවලක් ලෙස තොරතුරු තාක්ෂණ පුහුණුවක් සලසා දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරන ලදී.

16. **2013** වර්ෂයේ කාලසීමාව තුළ පහත දක්වා ඇති පාඨමාලාවන් රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය මගින් සිසුන් හට හැදෑරීමට අවස්ථාවන් ලබා දෙන ලදි.

අ. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය - පනාගොඩ</u>.

(1) පරිගණක භාවිතා කිරීම සඳහා නිපුනතා සහතිකය.

(2) පරිගණක දෘඩාංග.

(3) ග්‍රැෆික් නිර්මාණකරනය.

(4) තොරතුරු තාක්ෂණය දැනුවත් කිරීමේ පාඨමාලාව.

(5) හමුදා කාර්‍ය මණ්ඩලය සඳහා මයික්‍රොසොෆ්ට් ඔෆිස්.

ආ. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය - අනුරාධපුරය</u>.

(1) තොරතුරු තාක්ෂණය පිළබඳ දැනුවත් කිරීමේ පාඨමාලාව.

(2) පරිගණක භාවිතා කිරීම සඳහා නිපුනතා සහතිකය.

(3) පරිගණක දෘඩාංග.

(4) හමුදා කාර්‍ය මණ්ඩලය සඳහා මයික්‍රොසොෆ්ට් ඔෆිස්.

ඇ. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය - මහනුවර</u>.

(1) පරිගණක භාවිතා කිරීම සඳහා බලපත්‍රය.

(2) තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ දැනුවත් කිරීමේ පාඨමාලාව.

ඈ. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය - කුරුවිට</u>.

(1) තොරතුරු තාක්ෂණය දැනුවත් කිරීමේ පාඨමාලාව.

(2) පරිගණක භාවිතා කිරීම සඳහා නිපුනතා සහතිකය.

(3) ලේඛනනය සඳහා සහභාගී වන නිලධාරි/සෙසුනිලයින් හට පරිගණක පාඨමාලව.

(4) ග්‍රැෆික් නිර්මාණකරනය.

(5) තොරතුරු තාක්ෂණය දැනුවත් කිරීමේ පාඨමාලාව.

(6) හමුදා කාර්‍ය මණ්ඩලය සඳහා මයික්‍රොසොෆ්ට් ඔෆිස්.

ඉ. <u>රණවිරු තොරතුරු තාක්ෂණික පුහුණු ආයතනය - කොකාවිල</u>.

(1) යුධ හමුදා කාර්‍ය මණ්ඩලය සඳහා මයික්‍රොසොෆ්ට් ඔෆිස්.

17. <u>අභිමංසල</u>. පාන්ගොල්ල අභිමංසල ව්‍යාපෘතිය අංක - **03** හි වැඩ කටයුතු සැලසුම් කල පරිදි ආරම්භකොට ක්‍රියාත්මක වෙමින් පවතී.

18. <u>LED තිර සේවාවන්</u>. අවුරුද්ද පුරා පැවැති හමුදා උත්සව **33** ක් සඳහා සේවා සපයමින් භාවිත කල LED තිර (දෙක) මගින් යුද්ධ හමුදාව සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගන්නා ලදි.

19. ජන ඇමතුම් උපකරණ සේවා සැපයීම. ප්‍රධාන වශයෙන් යුද හමුදාවේ උත්සව සඳහා ජන ඇමතුම් සේවාව සැපයීම සිදුකරනු ලබන්නේ සංඥා මූලික වැඩපල මගින් වන අතර, ක්ෂේත්‍ර මූලස්ථාන සඳහා අනෙකුත් ජන ඇමතුම් අවශ්‍යතාවයන් මධ්‍යම සංඥා වැඩපල හා සංඥා ඒකක යටතේ ඇති ක්ෂේත්‍ර සංඥා වැඩපල අංශ මගින් ලබාදෙන ලදී. පහතින් දැක්වෙන්නේ 2013 වර්ෂයේ ජන ඇමතුම් ලබාදීම සම්බන්ධ විස්තරයකි.

අ. ප්‍රභූවරුන් සහභාගී වූ උත්සව සඳහා ජන ඇමතුම් ලබාදීම -105

ආ. සේනාංක මූලස්ථාන/බලසේනා මූලස්ථාන/රෙජිමේන්තු මධස්ථාන යන අංශයන්හි (ඒකක) උත්සව සඳහා ජන ඇමතුම් ලබාදීම - 82

20. තොරතුරු තාක්ෂණික ව්‍යාපෘති. 2012 වර්ෂයේදී ආරම්භ කර 2013 වර්ෂයේදී සම්පූර්ණ කරන ලද ප්‍රධාන සහ අප්‍රධාන (සුලු) ව්‍යාපෘති පහත පරිදි වේ.

අ. ප්‍රධාන ව්‍යාපෘති

(1) මධ්‍යම මානව සම්පත් කළමණාකරන පද්ධතිය. මෙම පද්ධතිය සමස්ථ හමුදාවේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක කර දැනට 2 වන අධියර නිම කර ඇති අතර, 3 වන අධියර වැඩි දියුණු කරමින් පවතී. මානව සම්පත් කාර්‍යාල කළමණාකරන පද්ධතිය මෙම ව්‍යාපෘතියට අනුබද්ධිත කල කොටසක් වන අතර, එය මේ වන විට වැඩිදියුණු කිරිම ආරම්භ කර ඇත.

(2) ද්‍රව්‍ය කළමණාකරන පද්ධතිය. ද්‍රව්‍ය කළමණාකරන පද්ධතිය යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවයන් මත සංවර්ධනය කර භාරදී ඇත.

(3) ඒකාබද්ධ ප්‍රතිසම්පාදන කළමණාකරන පද්ධතිය. ඒකාබද්ධ ප්‍රතිසම්පාදන කළමණාකරන පද්ධතිය මූල්‍ය කළමණාකරන ශාඛාව, යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් ශාඛාව සහ යුධෝපකරණ සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිතා කරන අතර, තව දුරටත් සංවර්ධන කටයුතු කරමින් පවතී.

(4) රෝහල් තොරතුරු කලමණාකරන පද්ධතිය, මෙම පද්ධතිය සාර්ථක ලෙස නාරාහෙන්පිට යුද්ධ හමුදා රෝහලේ බාහිර රෝගී අංශය, කාඩ්පත් අංශය හා ඖෂධ බෙදා හැරීමේ අංශය තුල ක්‍රියාත්මක කරමින් පවතී.

(5) අවිආයුධ කළමණාකරන පද්ධතිය. මෙම පද්ධතිය මධ්‍යම අවි හා පතුරම් ගබඩාවේද, ක්‍රියාන්විත අධ්‍යක්ෂ මණ්ඩලය හා රෙජිමේන්තු මධ්‍යස්ථාන සඳහා ප්‍රධාන මාණ්ඩලික ශාඛාව මගින් අනුමත කර ඇත. දත්ත සංක්‍රමණය කිරීම මධ්‍යම අවි ගබඩාවේ තොරතුරු සංසන්දනය කිරීමේ ක්‍රියා මාර්ගය මත සිදුවෙමින් පවතී.

(6) ප්‍රවාහන කළමණාකරන පද්ධතිය. මෙම කළමණාකරන පද්ධතිය දැනට සැපයුම් සහ ප්‍රවාහන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ භාවිතා කරයි.

(7) සුභ සාධන රක්ෂණ කළමණාකරන පද්ධතිය. මෙහි පද්ධතිය සංවර්ධන කිරීමේ කටයුතු ආරම්භ වූයේ 2013 වර්ෂයේ සැප්තැම්බර් මස වන අතර, මධ්‍යම මානව සම්පත් කළමණාකරන පද්ධතියට සමගාමීව මෙම පද්ධතිය සංවර්ධනය කිරීම අරඹන ලදී.

(8) <u>බිල්පත් පියවීම (අධීක්ෂණය/නිරීක්ෂණය) පද්ධතිය</u>. මෙම පද්ධතිය ප්‍රාදේශීය ගිණුම් නිලධාරින් සහ ප්‍රධාන ගිණුම් කාර්‍යාල මගින් භාවිතා කරනු ලබයි.

(9) <u>බුද්ධි තොරතුරු කලමණාකරණ පද්ධතිය</u>. ඉතා රහිසිගත තොරතුරු කලමණාකරණය සඳහා මෙම පද්ධතියේ මූලික කටයුතු සිදුවෙමින් පවතී.

ආ. <u>සුලු පරිමාණයේ ව්‍යාපෘති</u>

(1) <u>පුද්ගලික තොරතුරු කලමණාකරන පද්ධතිය</u>. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරීන් සඳහා යොදවා ඇති අයගේ විස්තර ලබා ගැනීම සඳහා සංවර්ධනය කර ඇත.

(2) යුද හමුදා නොවන පාඨමාලා කලමණාකරන පද්ධතිය.

(3) ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ව්‍යපෘති අධීක්ෂණ කලමණාකරණ පද්ධතිය.

(4) සියලු රෙජිමේන්තු සහ ඒකක සඳහා ඒකක යහසාධක අරමුදල් කලමණාකරන පද්ධතිය.

(5) යාල නිවාඩු නිකේතනය සඳහා හෝටල් කලමණාකරන පද්ධතිය.

ඇ. <u>වෙබ් අඩවි</u>

(1) ශ්‍රී ලංකා යුධ හමුදා ස්වෙච්ඡා බලසේනා මූලස්ථාන වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(2) ශ්‍රී ලංකා ඉංජිනේරු වෙබ් අඩවියේ ධාරකය සහ නඩත්තු කිරීම.

(3) ශ්‍රී ලංකා සංඥා බලකායේ වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(4) කාන්තා බලකායේ වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(5) 2013 වර්ෂයේ ආරක්ෂක සමුළුවේ වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(6) ආරක්ෂක සේනා මූලස්ථාන (කිලිනොච්චිය) වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(7) ආරක්ෂක සේනා මූලස්ථාන (මධ්‍යම) වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

(8) නිලධාරි ප්‍රගමන ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා වෙබ් අඩවිය නඩත්තු කිරීම් සහ සංවර්ධන කටයුතු කිරීම.

ඇ. තොරතුරු තාක්ෂණයට අදාළ පුහුණුවීම්. පහත සඳහන් මූලස්ථානයන්හි තොරතුරු තාක්ෂණ නිලධාරීන් හා අනෙකුත් සෙසුනිලයන් සඳහා පුහුණුවීම් ලබාදෙන ලදී.

| අනු අංකය | ස්ථානයේ නම | සහභාගි වූ ගණන | |
|---|---|---|---|
| | | (නිලධාරී) | (සෙසුනිල) |
| 1. | මූල්‍ය කළමණාකරන ශාඛාව | - | 1 |
| 2. | මුදල් අධ්‍යක්ෂ මණ්ඩලය | 6 | 6 |
| 3. | ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) | 1 | 2 |
| 4. | ආරක්ෂක සේනා මූලස්ථානය (වවුනියාව) | 2 | 3 |
| 5. | ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) | 1 | 2 |
| 6. | ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) | 1 | - |
| 7. | ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) | 1 | 2 |
| 8. | ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) | 2 | 2 |
| 9. | ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) | 1 | - |
| එකතුව | | 15 | 18 |

21. සියලුම සන්නිවේදන කාර්‍යයන්ට අමතරව විවිධ වැඩසටහන් සඳහාද මෙම මූලස්ථානය වෙතින් දායකත්වය දක්වන ලදී. ඒ අතරින් දියකාවා මෙහෙයුම, විජයග්‍රහන පෙළපාලිය, නිදහස් දින පෙළපාලිය, දැයට කිරුළ ප්‍රදර්ශණය යනාදිය ප්‍රධාන තැනක් ගනී. 2013 අගෝස්තු මාසයේ ඇමෙරිකානු පැසිපික් අණ හා ඇමරිකානු තනාපති කාර්‍යාල සමග එකමුතුව යුධ හමුදා මූලස්ථනයේ මග පෙන්වීම යටතේ බහුජාතික අන්තර් ක්‍රියා සන්නිවේදන වැඩසටහන (MCIP) යන විශේෂ අන්තර්ජාතික මට්ටමේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. ක්ෂේත්‍ර මූලස්ථානයන් විශාල ප්‍රදේශයක් ආවරණය වන පරිදි ස්ථිරවම ස්ථාන ගතවීමත් සමග මුලු දිවයිනම ආවරණය වන අයුරින් සංඥා සම්බන්ධතා සැපයීම, එක් සංක්‍රමණ සන්ධිස්ථානයකට පැමිණීමක් ලෙස සඳහන් කල හැක.

**මූල්‍යමය විස්තරය**

22. වාර්ෂික වැය ශීර්ෂ වෙන් කිරීම. ගිණුම් සම්මන්ත්‍රණය/ගිණුම් සමීක්ෂණ සම්මන්ත්‍රණ සම්බන්ධව ස්ථිර තීරන යුද්ධ හමුදාධිපතිතුමන් විසින් ලබාදෙනු ලබන අතර, වාර්ෂික වැය ශීර්ෂ වෙන්කිරීම් අයවැය හා මුදල් පාලන අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ සිදුකෙරේ.

23. වර්ෂය සඳහා වාර්ෂික වැය(ශීර්ෂය) වෙන්කිරීම හා වත්මන් තත්වය පහත පරිදි වේ.

අ. ප්‍රතිසම්පාදන වැයශීර්ෂය

| අනු අංකය | වැයශීර්ෂය | 2013 සදහා වෙන්කිරීම් | 2012 වර්ෂයෙන් ඉදිරියට ගෙන යන ලද |
|---|---|---|---|
| 1. | සන්නිවේදන වියදම් වැයශීර්ෂය (222-01-3-2013 (iii) | 88,300,000.00 | 81,956,530.17 |
| 2. | අනෙකුත් මූලික වත්කම් (222-01-3-2002 (iv) | 35,000,000.00 | 12,068,191.43 |
| 3. | සන්නිවේදන කොටස් සඳහා වියදම් (වැය) (222-01-2-1205(vi) | 40,000,000.00 | 7,660,257.31 |
| 4. | පරිඝණක උපකරණ සඳහා අමතර කොටස් වියදම් (වැය) (222-01-02-1205(iii) | 15,186,569.00 | 6,193,337.53 |

ආ අලුත්වැඩියා වැයශීර්ෂ

| අනු අංකය | වැයශීර්ෂය | වෙන්කිරීම 2013 | 2012 වර්ෂයෙන් ඉදිරියට ගෙන යන ලද |
|---|---|---|---|
| 1. | සන්නිවේදන උපකරණ අලුත්වැඩියා වැයශීර්ෂය (222-01-2-1302(iv)) | 5,800,000.00 | 1,999,317.34 |
| 2. | සන්නිවේදන උපකරණ ජාල අලුත්වැඩියා වැයශීර්ෂය (222-01-2-1302 (vi)) | 5,800,000.00 | 1,547,495.28 |
| 3. | පරිඝණක උපකරණ අලුත්වැඩියා හා නඩත්තු වැයශීර්ෂය (222-01-2-1302(x)) | 6,500,000.00 | 2,325,582.01 |
| 4. | උපකරණ බදු/කුලී වැයශීර්ෂය (222-01-2-1401(v)) | 893,400.00 | |

ඇ තැපැල් සේවා වැය ශීර්ෂය තැපැල් සේවා පාලනය, ක්‍රියාත්විත අධ්‍යක්ෂ මණ්ඩලය මත රැඳුනද විවිධ ක්ෂේත්‍ර මූලස්ථානයන් සඳහා මුදල් වෙන්කිරීම භාරවන්නේ ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය වෙතයි. 2013 වර්ෂයේදී වෙන්කරන ලද මුදල් වල එකතුව රු. 2,200,000,000 වේ. පළමුව වෙන්කරන ලද මුදල අවශ්‍යතා සැපයීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, අමතර රු. 1,500,000,000 මුදලක් වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රධානය කරන ලදී.

## වෛද්‍ය සේවා උපදේශක කාර්යාලය

**හැඳින්වීම**

1. යුද්ධ හමුදාධිපති තුමාගේ නියෝගය අනුව 2011 ජුනි මස 13 දින වෛද්‍ය සේවා උපදේශක කාර්යාලය ස්ථාපිත කරන ලද අතර වෛද්‍ය සේවා උපදේශක නිලයෙන් මේජර් ජෙනරල් වරයෙකු විය යුතුය. යුද්ධ හමුදා මූලස්ථානය යටතේ වෛද්‍ය සේවා උපදේශක කාර්යාලය පාලනය වන අතර අණදීම, රාජකාරි හා වගකීම් පිළිබඳව යුද්ධ හමුදාධිපති තුමාට වගකිව යුතු වේ.

**වගකීම**

2. වෛද්‍ය සේවා උපදේශකගේ වගකීම් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සෞඛ්‍ය කටයුතු හා සම්බන්ධ ගැටලු පිළිබඳව යුද්ධ හමුදාධිපති තුමා වෙත උපදෙස් ලබාදීම.

ආ. සෞඛ්‍ය සේවාව ඉහළ තැබීම සඳහා පුහුණුවීම් කටයුතු සිදුකිරීම, ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නැංවීම හා අධීක්ෂණය කිරීම.

**කාර්යය**

3. වෛද්‍ය සේවා උපදේශක කාර්යාලයේ කාර්යය පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම හා ඒ පිළිබඳ ගැටලු සබැඳිව යුද්ධ හමුදාධිපතිතුමා දැනුවත් කිරීම.

ආ. වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, දන්ත වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය කාර්යභාරය අධීක්ෂණය කිරීම.

ඇ. යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පුනරුත්ථාපන කටයුතු සොයා බැලීම හා උපදෙස් ලබාදීම.

ඈ. යුද්ධ හමුදාධිපති තුමාගේ මගපෙන්වීම අනුව දේශීය හා විදේශීය ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධ වෙමින් වෛද්‍ය සේවාවන් ඉහළ නැංවීම, පුහුණුවීම් කටයුතු ක්‍රියාත්මක කිරීම්, වෛද්‍ය පර්යේෂණ යනාදිය සිදුකිරීම.

උ. සෞඛ්‍ය කටයුතු සංවර්ධනය කිරීම උදෙසා ප්‍රතිපත්ති සැලසුම් කිරීම.

**වාර්ෂික සමාලෝචනය**

4. යුද්ධ හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් විශ්‍රාමික යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා වෛද්‍ය සේවාවන් සැපයීම පිළිබඳව 2013 වර්ෂයේ වෛද්‍ය සේවා අධ්‍යක්ෂ වෙත නිසි උපදෙස් ලබාදෙන අතර ඒවා අධීක්ෂණය කිරීම සිදුකරන ලදී.

5. යුද්ධ හමුදාධිපති තුමාගේ අනුමැතිය මත සෞඛ්‍ය අමාත්‍යාංශය සමග සම්බන්ධවී විශේෂ ජාතික ඩෙංගු මර්ධන වැඩසටහන් මැලේරියා, ඉන්ෆ්ලුවන්සා හා හෙපටයිටිස් නිවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6. එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි සඳහා ශ්‍රී ලංකාවෙන් යන යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා වෛද්‍ය පහසුකම් පිළිබඳව උපදෙස් ලබාදීම හා අධීක්ෂණය කිරීම.

7. රණක්ෂිතයට පත් රණවිරුවන්ට හා වෙනත් හේතූන් මත තුවාල ලබා ඇති යුද්ධ හමුදා සාමාජිකයින්ගේ පුනරුත්ථාපන කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම හා ඒවා අධීක්ෂණය කිරීම.

__වෙනත් තොරතුරු__

8. යුද්ධ හමුදා නව රෝහල නාරාහේන්පිට ඉදිකිරීම කඩිනම් කිරීම.

9. නව රෙජිමේන්තු මධ්‍යස්ථානය වේරහැර ඉදිකිරීම ආරම්භ කිරීම.

10. එච්අයිවී/ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අ. යුද්ධ හමුදා මූලස්ථානයේ සාමාජිකයින් 249 ක් සඳහාද.

ආ. යුද්ධ හමුදා කඳවුර පුත්තලම සාමාජිකයින් 311 ද දැනුවත් කිරීම.

11. වෛද්‍ය සේවා අධ්‍යක්ෂ හා වෛද්‍ය බලකා සේවා වනිතා ශාඛාව සම්බන්ධකර ගනිමින් පහත සඳහන් ස්ථානයන්හි වෛද්‍ය කඳවුරු හා වෛද්‍ය උපකාරක සේවා ක්‍රියාත්මක කිරීම.

අ. යුද්ධ හමුදා සාමාජිකයින් හා ඔවුන්ගේ පවුල් 203 ක් සඳහා කොස්ගම - සාලාව යුද්ධ හමුදා කඳවුරු තුළදී.

ආ. අභිමංසල කඹුරුපිටියහිදී ආබාධිත සොල්දාදුවන් 46 ක් සඳහා.

12. 2013 මාර්තු 05 දින මුලතිව් හිදී යුද්ධ හමුදා මූලික රෝහලක් ස්ථාපිත කිරීම.

13. 2013 අගෝස්තු මස 03 දින මින්නේරිය හි යුද්ධ හමුදා මූලික රෝහලක් ස්ථාපිත කිරීම.

__මූල්‍යමය තොරතුරු__

14. මූල්‍ය තොරතුරු පහත සඳහන් පරිදි වේ.

අ. සුභ සාධන ගිණුම - රු: 10000.00

ආ. පුහුණු වැය ශීර්ෂය - රු: 10000.00

ඇ. සනීපාරක්ෂක කටයුතු - රු: 18000.00

ඈ කාර්යාලීය උපකරණ/ලිපිද්‍රව්‍ය- රු: 20000.00

## විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය

**හැඳින්වීම**

1. සංග්‍රාමික නීතියට යටත් යම් තැනැත්තෙකු විසින් සිදු කරනු ලබන සංග්‍රාමික (හෝ සිවිල් වරදක්) විනිශ්චයට භාජනය කිරීම පිණිස යුද්ධ හමුදාපතිවරයා විසින් යුද්ධාධිකරණ කැඳවීම සිදු කරනු ලබයි. මෙම යුද්ධාධිකරණ ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට වර්ගීකරණය කළ හැක. එනම් මහා යුද්ධාධිකරණ සහ දිස්ත්‍රික් යුද්ධාධිකරණ වශයෙනි. යුක්ති මූලධර්මයන්ට හා යුද්ධ හමුදා පනතට අනුකූලව නියමිත පිළිවෙලට යුද්ධාධිකරණය මෙහෙයවීම විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයේ වගකීම වේ. එකී නඩු කෘත්‍යයන් හිදී උද්ගත වනු ලබන ඕනෑම නීතිමය කරුණක් සම්බන්ධයෙන් නීතිමය උපදෙස් ලබා දෙමින් යුද්ධාධිකරණ කටයුතු සිදු කරගෙන යාම සඳහා විනිසුරු අධිනීතිඥවරයා විසින් සිය සහයෝගය ලබාදෙනු ලබයි. එසේම යුද්ධාධිකරණයන් හි වාර්තාගත කරනු ලබන සාක්ෂි සටහන්හි නිරවද්‍යතාවය සම්බන්ධයෙන් විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලය වගකීමට යටත් වේ.

**වගකීම්**

2. විනිසුරු අධිනීතිඥ ජෙනරාල්වරයාගේ වගකිම් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධ හමුදාපතිවරයා වෙත නීතිමය උපදෙස් ලබා දීම.

ආ. යුද්ධාධිකරණයන්හි විනිසුරු අධිනීතිඥ වශයෙන් කටයුතු කිරීම.

ඇ. නිලධාරීන් සම්බන්ධයෙන් වන පුහුණු වැඩ සටහන් හිදී සංග්‍රාමික නීතිය සම්බන්ධයෙන් මග පෙන්වීම් සිදු කිරීම සහ ඒ සබැඳිව අධීක්ෂණය කිරීම.

ඈ. සංග්‍රාමික නීතිය සම්බන්ධයෙන් විධායක ජෙනරාල්වරයාට ඇතිවන ගැටලු සඳහා අවශ්‍ය අවස්ථාවන් හිදී උපදෙස් ලබාදීම සහ සහය දීම.

**කාර්ය භාරය**

3. නීතිමය කාරණාවන් සබැඳිව සහ යුද්ධාධිකරණ පැවැත්වීම පිළිබඳ යුද්ධ හමුදාපතිවරයාට උපදෙස් ලබාදීම.

**වගකීම**

4. විනිසුරු අධිනීතිඥ ජෙනරාල් කාර්යාලයෙහි වගකිම් පහත සඳහන් පරිදි වේ.

අ. යුද්ධාධිකරණ සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම හා යුද්ධ හමුදාව තුළ සංග්‍රාමික යුක්තිය ඉෂ්ට කිරීමේ පද්ධතිය ක්‍රියාවෙහි යෙදවීම පිණිස කටයුතු කිරීම.

ආ. යුද්ධ යමුදාපතිවරයා හට නීතිමය උපදෙස් ලබා දීම.

ඇ. නීතිමය ගැටලු සම්බන්ධයෙන් සංග්‍රාමික නීතියට යටත් තැනැත්තන් හට දේශණ වැඩසටහන් පැවැත්වීම සඳහා මග පෙන්වීම සහ ඒවා අධීක්ෂණය කිරීම.

**<u>වාර්ෂික දළ සංඛ්‍යා ලේඛණ</u>**

5. 2013 වර්ෂය තුළදී යුධ හමුදා පනත යටතේ චෝදනා ලබන ලද නිලධාරින් හා සෙබළුන් සැබැදිව පවත්වා ඇති මුළු යුධ අධිකරණ සංඛ්‍යාවන් 10 ක් වේ.

| අනු අංකය | කරන ලද වරද සහ ඊට අදාලව යුධ හමුදා පනතේ සදහන් වගන්තිය | යුද්ධාධිකරණ පවත්වන ලද නැතැත්තන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 103(1)(අ) - යුද්ධ හමුදාවෙන් පැනයාම | 07 |
| 2 | 100(2) - ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට අකීකරු වීම හා<br>103(1)(අ) - යුධ හමුදාවෙන් පැනයාම | 01 |
| 3 | 109(ඉ) - අපකීර්තිසහගත ලෙස හැසිරීම<br>129(1) - සංග්‍රාමික විනයට හානිකර ලෙස හැසිරීම | 01 |
| 4 | 102(1) - ආරක්ෂක සේනා ආඥාවලට හෝ සෙසු ආඥාවලට කීකරුවීම පැහැර හැරීම | 01 |
| | එකතුව | 10 |

## සමාප්තිය

1. **2013** වර්ෂය වෙනුවෙන් පැවරුණු අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා සමස්ථ යුද්ධ හමුදාව විසින් ඉමහත් මෙහෙයක් දරා ඇත. වැඩිවන දැඩි ආර්ථික තත්ත්වය යටතේ වුවද බොහෝ දුෂ්කර කාර්යයන් මනාව ඉටුකර ඇත. සුවිශේෂී ජාතික අවශ්‍යතා වෙනුවෙන් පුහුණුවලත් යුද්ධ හමුදාවක් සූදානම් කර තැබීම වෙනුවෙන් මහත් වෑයමක් දරා ඇත.

2. හමුදා විනය, ස්වං පාලනය, චරිතවත බව සහ අණදීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂම පාලනය දියුණු කරයි. සියලු තලයන්හි අණදෙන්නන් උසස් තත්ත්වයේ විනය පවත්වා ගැනීම වෙනුවෙන් කැප විය යුතු අතර යුද්ධ හමුදාවේ පවතින තිතිරිති මනාව පිළිපැදීම පක්ෂපාතීත්වය, අවංකබව රාජකාරිය, අවංක සේවය හා ධෛර්යසම්පන්න බව ආදි වශයෙන් වූ පුද්ගල වටිනාකම් වැඩිකිරීමෙහිලා සමත් වී ඇත.

3. පසුගිය වසර ගත් කල යුද්ධ හමුදාවේ ඵලදායිත්වය හා කාර්යක්ෂමතාවය වැඩි අරමුණින් පුහුණුවීම් වෙනුවෙන් ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. දේශිය හා විදේශිය පුහුණුවීම් සඳහා වූ අවස්ථාවන් වැඩි කර ඇත. සාමූහික අභ්‍යාසයන් ආදි ප්‍රයෝගික පුහුණු වැඩසටහන් මනාව සංවිධානය කර ඇත.

4. එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරි, යුද තිරීක්ෂණ හා මාණ්ඩලික රාජකාරි වෙනුවෙන් ස්ථාපනය කරන ලද භටපිරිස් හා නිලධාරීන් එම රාජකාරීන්හි කරන ලද උසස් මෙහෙවර සහ කැපකිරීම රටෙහි කීර්තිනාමය වැඩිවීම කෙරෙහි මහත් දායකත්වයක් ලබාදී ඇත.

5. "යුද්ධයෙන් පසු ශ්‍රී ලංකාව අභියෝග සහ කලාපීය ස්ථාරත්වය" යන තේමාව යටතේ තෙවැනි වරටත් 'ආරක්ෂක සමුළුව 2013' පවත්වන ලදි. සුප්‍රසිද්ධ දේශකයන් සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සැදුම්ලත් මේ තුලින් ත්‍රස්ථවාදය පරාජය කිරීමෙහිලා වූ යුධෝපායාත්මක උපක්‍රම පිළිබඳව අදහස් හුවමාරු කරගත් අතර අන් රටවලටද මෙහි අදාලත්වය සහ අයදුම් පිළිබඳව පුළුල්ව සාකච්ජා කරන ලදි. බොහෝ විදෙස් ආරාධිත දේශකයින්ද සමුළුව අමතන ලදි.

6. සේවයේ යෙදී සිටින සහ ආබාධිත පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු සඳහා අවධානය යොමුකර ඇත. තවද ක්‍රියාන්විතයේදී මිය ගිය පුද්ගලයින්ගේ පවුල්වල සුභසාධනය වෙනුවෙන් වැඩි අවධානයක් යොමුකර ඇත.

7. වැඩිදුරටත් මෙම විෂය විශ්ලේෂණය කිරීමේදී මෙම වාර්ථාව ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ඉදිරි තක්සේරු කිරීම් වෙනුවෙන් භාවිතා කල හැකි මූලික සමාලෝචන වාර්ථාවක් ලෙස යොදාගත හැක.